ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු භවාතැන

Pages 52 JANUARY 2018 Issue : 98 මාසික සංග්‍රහය 2018 ජනවාරි, 98 කලාපය 50 ¢

සුභ නව වසරක් වේවා .....!

කවුළු පියන් හැර තබන්න ඇලුත් ඉරට ඇතුළු වන්න
හදේ කොණක ඉඩ තියන්න ඇලුත් මලට පෙති අරින්න
මිලින පැතුම් තබා යන්න ගිය වසරට එකතු වෙන්න
පුරා නෙතින් හිනා වෙන්න නැවුම් වසර වැළඳ ගන්න.....!

ටොරොන්ටෝ - යෝර්ක් උමං දුම්රිය මග

ටොරොන්ටෝ සිට වෝන්ග් කරා දිව යන පළමු උමං දුම්රිය මාර්ගය මහජනයා වෙත පැවරීම පසුගිය දෙසැම්බර් 17 වෙනිදා සිදු කෙරුණි.

මෙම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ කටයුතු 2010 පෙබරවාරි මාසයේදී ඇරඹුණු අතර ටොරොන්ටෝ උමං දුම්රිය පද්ධතිය තුළ වසර 15 කට පසු සිදුකෙරුණු පළමු මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය මෙය වේ. කිලෝ මීටර 8.6 ක දුර ප්‍රමාණයකට මෙහිදී දුම්රිය මග දීර්ඝ කර ඇති අතර නගරයෙහි ස්ථාන රැසක් යටින් දුම්රිය ගමන් කරයි.

දීර්ඝ වූ දුම්රිය මාර්ගයත් සමගම නව දුම්රිය ස්ථාන හයක් ස්ථාපිතව ඇති අතර ඒවා අතර ගමන් කිරීමට දුම්රියට ගතවන කාලය විනාඩි 14 ක් ලෙස සඳහන් වේ. එම අලුත් දුම්රිය ස්ථාන හය මෙසේය. Downsview Park station, Finch West station, York University station, Pioneer Village station, Highway 407 station, and Vaughan Metropolitan Centre station. මෙම දුම්රිය ස්ථාන අතරින් Pioneer Village station හි රථ ගාල තුළ මෝටර් රථ 1881 ක්ද Highway 407 station හි මෝටර් රථ 583 ක්ද Finch West station හි මෝටර් රථ 347 ක්ද නවතා තැබීමට පහසුකම් ඇත. මේ වසරේ අප්‍රේල් මාසය වනතුරු මෙම රථ නැවතුම්පොළවල්හි නොමිලේ රථ නැවතීමේ පහසුකම සලසා ඇත. මෙහි ඇති ඩවුන්ස්වීව් පාක් දුම්රිය ස්ථානය GO Station ලෙසද ක්‍රියාත්මක වීමේ කටයුතු දෙසැම්බර් 30 වෙනිදා සිට ආරම්භ විය.

මෙම දුම්රිය ගමන් වාර සඳහා ගෙවීම් කිරීමේදී දෙවරකට එය සිදුකළ යුතු නොවන අතර එකම TTC ගාස්තු මඟින්

7 වන පිටුව බලන්න

ප්‍රවේසම් වන්න !
නගර රැසක හොර නෝට්ටු

GTA හි නගර කීපයකින් ඩොලර් 100 ව්‍යාජ නෝට්ටු කිහිපයක් සොයා ගැනීමත් සමග ඒ පිළිබඳව මහජන අවධානය යොමුකරන ලෙස පොලිසිය අනතුරු අඟවා සිටියි.

ගතවූ 2017 නොවැම්බර් මාසයේ සිට දෙසැම්බර් මැද භාගය දක්වා පීල් (Peel) පළාත් පොලිසිය වෙත ව්‍යාජ ඩොලර් 100 නෝට්ටු 50 ක් පිළිබඳව වාර්තා වී ඇති අතර ඔක්තෝබර් 1 දා සිට දෙසැම්බර් 10 දක්වා කාලය තුළ ඩර්හැම් (Durham) පළාත් පොලිසියට ඩොලර් 100 යේ ව්‍යාජ නෝට්ටු 17 ක් පිළිබඳව වාර්තා වී ඇත.

මේ පිළිබඳව සුපරීක්ෂාකාරී වන

7 වන පිටුව බලන්න

නිසල් මුදල් හුවමාරුව
CASH
THISAL BUSINESS SERVICES INC
විශ්වාසවන්ත හා සුහදශීලී සේවයක් සමගින් ශ්‍රී ලංකාවට මුදල් යැවීමට පහසු මගක්
Registered office: 1315 Lawrence Ave. E, Suit # 509 Toronto, ON, M3A 3R3 Tel: 416 546 4488

බ්‍රින්දාවන් සුපර්මාර්කට්
BRINTHAVAN SUPERMARKET
SRI LANKAN FRESH FRUIT, VEGETABLE AND GROCERIES
An excellent news to our beloved customers! We are excited to announce that your favourite
BRINTHAVAN SUPERMARKET ! NOW OPEN AT NEW LOCATION
New establishment with a brand new look and brand new facilities
13 Fisherman Dr, Unit 11 & 12, Brampton, ON L7A 2X9 TEL : 905 495 3755

දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

www.dasatha.com

වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

Gamini - 416 822 2789

All Ads & Classified Ads are also Published in the ONLINE Edition at

WWW.DASATHA.COM

For NO ADDITIONAL CHARGE

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

ඔබේ නිවසටම දසත Dasatha

සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම
තැපැල් මගින් ගෙන්වා ගැනීමේ
අවස්ථාව දැන් සලසා ඇත.

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට
අදාළ චෙක්පත යොමු කරන්න.

දසත දායකත්ව ගාස්තු
Subscription Rates
for Dasatha

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to Dasatha Publications

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

Opioid අවදානම ඉහළට

ලෝකයේ දියුණු යැයි සම්මත රටවල සිදුවන හදිසි මරණ පිළිබඳව සොයා බැලීමේදී Opioid වර්ගයේ ඖෂධ අධිමාත්‍රාවලින් ගැනීමෙන් සිදුවී ඇති මරණ සංඛ්‍යාව වර්තමානයේදී බෙහෙවින් ඉහළ ගොස් ඇති බව පැහැදිලි වේ. මෙම තත්ත්වය කැනඩාව තුළද ඉතාමත් ව්‍යසනකාරී ලෙස පැතිරෙමින් පවතින අතර 2017 වසරේ මුල් භාගයේදී පමණක් කැනේඩියානුවන් 1460 දෙනෙකු Opioid නිසා මරු වැළඳගෙන ඇත. වසර අවසානය දක්වා වූ දත්ත වාර්තා පිළිබඳව මෙතෙක් ගණනයක් කර නොමැති නමුත් 2017 වසර පුරා සිදුවී ඇති මෙබඳු මරණ සංඛ්‍යාව දළ වශයෙන් 4000 ඉක්මවිය හැකි බව කැනඩා මහජන සෞඛ්‍ය ඒජන්සිය (PHAC) පවසා සිටියි. එසේම මෙම මරණ සංඛ්‍යාව තුළ පසුගිය වසරේ පළමු මාස හයේදී ඔන්ටාරියෝ, ක්විබෙක් හා මැනිටෝබා යන පළාත්වල Opioid විෂ වීමෙන් සිදුවූ මරණ පිළිබඳ දත්තයන්ද ඇතුළත් වී නොමැත.

දිනෙන් දින ඉහළ යන මෙම තත්ත්වය පිළිබඳව විශේෂඥ වෛද්‍යවරයකු පවසන්නේ මෙය කැනඩාවේ පොදු මහජන සෞඛ්‍ය අර්බුදයක් වන තරමට සංකීර්ණ සමාජ ගැටලුවක් වී ඇති බවයි.

ප්‍රබල වේදනා නාශක රැසක් (morphine, methadone, Buprenorphine, hydrocodone, oxycodone වැනි වූ) Opioid ගණයට අයත් වන අතර නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අතර පවතින Heroin හා හෙරොයින් මෙන් 50 ගුණයකටත් වඩා ප්‍රබල බලපෑම් වල්ල කළ හැකි fentanyl වැනි මත්ද්‍රව්‍යද Opioid ගණයට අයත් වේ. මේ වන විට කැනඩාව තුළ මෙම අධික විෂ සහිත මත්ද්‍රව්‍යවල විශාල සැපයුමක් පවතින බව පැහැදිලි කරුණකි. මේවා වීථි ඖෂධ වන තරමට සුලභව ඇති අතර මෙම මාරාන්තික උවදුර පිළිබඳව ජනතාව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වී ඇත.

2017 සිදුව ඇති Opioid මරණ සංඛ්‍යාව පිළිබඳව සලකා බැලීමේදී Fentanyl මත්ද්‍රව්‍ය නිසා මියගොස් ඇති සංඛ්‍යාව විශාල ලෙස ඉහළ ගොස් ඇත. එය 2016 වසර හා සැසඳීමේදී සියයට 75 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

Fentanyl පිළිබඳ සඳහන් කළ කැනඩාවේ මහජන සෞඛ්‍ය නිලධාරිනිය තෙරේසා ටෑම් පවසා ඇත්තේ "It's such a toxic drug that there is no second chance" (එය කෙනෙකුට නැවත අවස්ථාවක් නොලැබෙන තරම් ඉතාමත් දරුණු විෂ සහිත ද්‍රව්‍ය වර්ගයක්) ලෙසයි.

බ්‍රිටිෂ්කොලොම්බියාව සහ ඇල්බර්ටා මෙම Fentanyl මත්ද්‍රව්‍යයට දැඩිව ගොදුරුව ඇති පළාත් ලෙස හඳුනාගෙන ඇති අතර ඔන්ටාරියෝවද මෙම මාරක මත්ද්‍රව්‍යයේ ප්‍රතිවිපාකවලට නිතර ලක් වන පළාතකි. ඉහත පළාත්වලට අමතරව සමස්ත කැනඩාව පුරාම Fentanyl ඇබ්බැහියට ගොදුරු වන පිරිස් දිනෙන් දින වැඩි වන බව වාර්තා වේ. Opioid නිසා මරු වැළඳ ගන්නා බහුතරය පිරිමි පාර්ශ්වය වන අතර ඔවුන්ගෙන් වැඩි පිරිසක් වයස අවුරුදු 30-39 ත් අතර පසුවන්නන් වේ.

කැනඩාව තුළ පවතින මෙම මත්ද්‍රව්‍ය අර්බුදය ඉතා දුෂ්කර සාමාජීය අභියෝග රැසක් මත පදනම්ව ඇති බවත් දරිද්‍රතාව හා සමාජ තත්ත්වයන්වල පවතින පරස්පරතාව මෙවැනි දේවල් වැඩිවීමට බලපා ඇති බවත් තෙරේසා ටෑම්ගේ අදහසයි.

මේ පිළිබඳව තවදුරටත් කරුණු දැක්වූ ඇය පැවසුවේ, "මෙය අතිශය සංකීර්ණ ගැටලුවක්. 2018 වසර කරා යන මේ මොහොතේ මෙය විසඳාග නීමට මුළු කැනඩාවම සූදානම් විය යුතුයි" යනුවෙනි.

'ස්වස්තික' විරෝධය !

ටොරොන්ටෝවේ සිට කිලෝමීටර 75 ක දුරින් පිහිටි Puslinch නගරයෙහි Swastika Trail නමැති මාර්ගයේ නාමය වෙනස් කරන ලෙස එහි පදිංචිකරුවන් පිරිසක් විසින් පළාත් නගර සභාවෙන් ඉල්ලීමක් කර තිබුණත් නගර සභිකයන්ගේ වැඩි ඡන්දයෙන් එය ප්‍රතික්ෂේප වී ඇත.

එහෙත් ස්වස්තික නම වෙනස් කර ගැනීම සඳහා එම කුඩා වීථියේ පදිංචි ජනතාව අතරින් පිරිසක් දිගින් දිගටම බල කරමින් සිටී. මෙහිදී ඔවුන් පවසන්නේ මිලියන සංඛ්‍යාත ජනතාවක් විනාශ කළ ලොව කෘරතම මිනිසෙකු විසින් භාවිත කරන ලද ස්වස්තික යන නාමය තමා ජීවත් වන මාර්ගයේ යොදා තිබීම පිළිකුල් සහගතව හෙළා දකින බවයි. එහෙත් මේ පිළිබඳව කරුණු දක්වන ප්‍රකාශකයකු පවසා ඇත්තේ මෙම කුඩා වීථියට ස්වස්තික ට්‍රේල් යනුවෙන් යොදා ඇත්තේ 1920 දී බවයි. එකල ඇඩොල්ෆ් හිට්ලර්ගේ නැගී සිටීමක් පිළිබඳ සලකුණු නොතිබුණු බව ඔහු පෙන්වා දේ.

මෙම මාර්ගය ස්වස්තික ට්‍රේල් ලෙස හැඳින්වීම සම්බන්ධයෙන් කිප වරක්ම මත ගැටුම් පැන නැගී ඇති අතර එහි ජීවත් වන බහුතරයක් පිරිස් මෙම නම තබාගැනීමට පක්ෂව කටයුතු කර ඇත. මීට මාස කීපයකට ඉහත ස්වස්තික නම ඕනද/එපාද යන්න තෝරා බේරා ගැනීම සඳහා පැවති මත විමසීමකදී 25-20 ලෙසින් එම නම තබා ගැනීම ස්ථිර වී ඇත. ස්වස්තික නමට කැමැත්ත පළ කරන පිරිස පවසන්නේ දෙවන ලෝක යුද්ධයටත් පෙර එම පාරට තබා ඇති මෙම නමත් සමගම දීර්ඝ ඉතිහාසයක් පිළිබඳ තොරතුරු පවතින බවයි.

තදබදය අවම කරන්න අධිවේගී උමං මගක් !

එක් දිනකදී ලක්ෂ සංඛ්‍යාත රථ වාහන සංඛ්‍යාවක් ටොරොන්ටෝවට ඇතුළු වීම සහ පිටවීම සිදුවන බව මහ මග බැස යන කවුරුත් දන්නා කරුණකි. නගරය පුරා ඉතාමත් දියුණු තත්ත්වයෙන් හා අතිවිශාල ලෙස මාර්ග සකසා තිබුණත් මෙතරම් අධික වාහන සංඛ්‍යාවක් එහා මෙහා ගෙන යාමට තරම් දැන් දැන් ඒවා ප්‍රමාණවත් නොවන බව දවසේ සෑම වෙලාවකම එම මාර්ග තුළ පවතින තදබදයෙන් පෙනී යයි. මෙම වාහන ප්‍රමාණය දිනෙන් දින වැඩි වනවා මිස එහි අඩු වීමක් වේ යැයි සිතීමටද සාධාරණ හේතු සාධක නොමැත.

එම නිසා පවතින මේ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කළ ටොරොන්ටෝ ප්‍රවාහන කමිටුව, වාහන තදබදය අවම කිරීම සඳහා විසඳුමක් ගෙන ඒමේ යෝජනාවක් පසුගියදා ඉදිරිපත් කර තිබුණි. මං තීරු හයකින් සමන්විත අධිවේගී උමං මාර්ග යක් නගරයට යටින් ඉදි කළ යුතු බව එම යෝජනාව වේ.

මෙය Hwy 401 සහ Hwy 2A සිට Hwy 400 සහ 427 පසුකරමින් Hwy 402 දක්වා විහිදෙන ආකාරයට සෑදීමට යෝජිත වී ඇත. මාර්ගයේ සම්පූර්ණ දුර කිලෝමීටර 62 කින් යුක්ත වන අතර එය මුදල් ගෙවා යා යුතු මාර්ගයක් (toll highway) ලෙස මහජනයා වෙත ලබාදීමට සැලසුම් කිරීම එහි යෝජනා වී ඇත.

ප්‍රවාහන කමිටුව විසින් ගෙන ආ මෙම අධිවේගී උමං මාර්ග යෝජනාවට අනුව එහි වැඩ කටයුතු නිම වුවහොත් එය මුදල් ගෙවා යා යුතු ලොව දිගම අධිවේගී උමං මාර්ගය බවට පත්වනු ඇත.

වීථි ජනයාට Better Living Centre

කැනඩාවේ ජීවත්වන අයට මෙරට ශීත ඍතුව ගැන කියා දීමට දිග විස්තර ලිවිය යුතු නැත. ඒ කවුරුත් එහි ඇති දුෂ්කරතාව, සුන්දරත්වය ආදී සියල්ල හොඳින්ම අත්විඳ අත්දැක ඇත. උෂ්ණත්වය ඍණ 10 ට 15 ට හෝ ඇතැම් විට ඊටත් අඩු වීමට පවා හැකි කාලගුණ තත්ත්වයක් පවතින මෙහි ශීත ඍතුව නිතර එළිමහනට යන අයට නම් ගෙන දෙන්නේ නොමඳ පීඩාවකි. එසේ එළිමහනට ගියත් ශීත කබා, තොප්පි, බූට් සපත්තු, අත් මේස් ආදි සියල්ලෙන්ම සන්නද්ධව යාමට කවුරුත් හුරුව ඇති අතර ඉතාමත් ඉක්මනින් ආවරණ සහිත උණුසුම් ස්ථානවලට යාමටද උත්සුක වෙති.

ශීත ඍතුවේ සැබෑ ස්වභාවය එසේ වද්දී නිරතුරුව වීථිවල ජීවත් වන්නන්ගේ තත්ත්වය මේ කාලයේදී ඉතාමත් කටුක වන බව අමුතුවෙන් කිව යුතු නැත. ටොරොන්ටෝවේ හා වෙනත් පළාත්වල නගරවල ගමන් කරද්දී මෙසේ වීථිවල ජීවත් වන ජනතාව සිය ගණනින් අප අසල ගැටේ. පොළොවට කාඩ්බෝඩ් කැබැල්ලක් එළා ඒවායේ නිදමින්, සීතලට ඔරොත්තු නොදෙන වැරහැළි වූ ඇඳුම් අදගෙන දිවි ගෙවන මේ පිරිස ශීත කාලය ගත කරන්නේ කෙසේද යන ගැටලුව ඒ බොහෝ අවස්ථාවල අප සිතට නැඟේ.

මේ වන විට ටොරොන්ටෝවේ වීථිවල ජීවත් වන්නන්ගේ සංඛ්‍යාව පන්දහස ඉක්මවා ඇති බව ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන හෙළිදරව් කරයි. මේ පිරිස අතර කාන්තාවන් සහ ළමුන්ද සිටී.

නගරයේ පවතින මෙම තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කළ ටොරොන්ටෝ නගර සභාව ශීත කාලය තුළ මේ මිනිසුන් සඳහා ආරක්ෂාකාරී නවාතැන් සැපයීම කෙරෙහි වැඩපිළිවෙළවල් සකස් කිරීම ගැන අවධානය යොමු කොට ඇත. ඒ සඳහා නගරයේ ප්‍රධාන ස්ථානයක් වන කැනේඩියානු ජාතික ප්‍රදර්ශන (CNE) භූමියෙහි මේ වන විටත් ඉඩකඩ වෙන් කොට ඇති අතර එහි ඇඳුන් 20 කින් යුත් තාවකාලික නවාතැනක් ආරම්භ කොට ඇත. මෙය තවදුරටත් පුළුල් කරමින් ජනවාරි මැද භාගය වන විට තවත් ඇඳුන් 80 ක් ඊට එක් කිරීමට නගර සභාව බලාපොරොත්තු වේ.

මීට අමතරව වීථි ජනයා වෙනුවෙන් නගරයෙහි ස්ථාන 400 ක තාවකාලික නවාතැන් 400 ක් ඉදිකිරීමටද ජෝන් ටොරි නගරාධිපතිවරයා බලාපොරොත්තු වේ. මෙම වැඩ පිළිවෙළ සඳහා නගර රක්ෂිත අරමුදලෙන් ඩොලර් මිලියන 10.6 ක් වැය කිරීමට නගර සභාව අදහස් කර ඇත.

Pot Shop එපා...!

2018 ජූලි මාසයේ සිට ඔන්ටාරියෝවේ නගර රැසකම නීත්‍යනුකූල මරිජුවානා වෙළඳසල් විවෘත කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී. ඒ අනුව ශ්‍රීෂ්ම ඍතුවේ සිට ඔන්ටාරියෝ මත්පැන් පාලක මණ්ඩලය (LCBO) මඟින් පාලනය කෙරෙන වෙළඳසල් මඟින් වයස අවුරුදු 19 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට මරිජුවානා මිල දී ගැනීමේ අවස්ථාව සැලසේ.

මේ වන විට එසේ මරිජුවානා වෙළඳසල් විවෘත කරන නගර පිළිබඳව රජය විසින් දැනුම් දීම අරඹා ඇති අතර තම තමන්ගේ නගර ඊට දක්වන අනුකූලතාව පිළිබඳව නගරාධිපතිවරුන් ප්‍රතිචාර දක්වමින් සිටී.

එහිදී රව්මන්ඩ්හිල් නගරාධිපතිවරයා සහ නගර සභිකයන් තම නගරයෙහි මරිජුවානා වෙළඳසල් ආරම්භ කිරීම සම්බන්ධයෙන් ඍජුවම අකමැත්ත ප්‍රකාශ කර තිබුණි.

එහෙත් එසේ තීබියදීත් මුදල් අමාත්‍යාංශය විසින් නොවැම්බර් 28 වෙනිදා ලිපියකින් දන්වා ඇත්තේ නීත්‍යනුකූල මරිජුවානා වෙළඳසලක් පිහිටුවීමට රව්මන්ඩ්හිල් නගරයද හඳුනාගෙන ඇති බවයි. මේ පිළිබඳව අදහස් දක්වන නගරාධිපතිවරයා පවසන්නේ, රජයේ මෙම තීරණය පිළිබඳව තමාත් තම සභිකයනුත් විමතියට පත්ව ඇති බවයි. නගර සභා කමිටු රැස්වීම්වලදී නීත්‍යනුකූල පොට් වෙළඳසල් පිළිබඳව සාකච්ඡා කොට එය තම නගරයට පිළිනොගන්නා බවට තීරණයකට පැමිණ තිබියදී මෙසේ දැනුම් දීම පිළිබඳව ඔහු කණස්සල්ල පළ කරයි.

මාර්කම් නගරාධිපති Frank Scarpitti ද නීත්‍යනුකූල මරිජුවානා වෙළඳසල් ඔහුගේ නගරයේ ආරම්භ කිරීම සම්බන්ධයෙන් මෙසේ අදහස් දක්වා තිබුණි. "පළමු වටයේදීම නීත්‍යනුකූල මරිජුවානා වෙළඳසලක් මගේ නගරයෙත් ආරම්භ කිරීමට රජය මගෙන් කරුණු විමසුවා. එහිදී මම පැවසුවේ, මේ අලුත් දේ සම්බන්ධයෙන් පිළිතුරු නොලැබුණු ගැටලු රාශියක් අප වෙත ඇති බවයි. ප්‍රජාවගේ ආරක්ෂාව, එය දරුවන්ට බලපාන ආකාරය ආදිය ගැන අපට ගැටලු තියෙනවා. ඒ නිසා පළමු වටයේදී මගේ නගරයේ මරිජුවානා වෙළඳසලක් ආරම්භ කිරීමට මගේ අකමැත්ත පළ කළා. පළමු වටයේ විවෘත වන වෙළඳසල් ක්‍රියාත්මක වන ආකාරය දෙස බැලීමෙන් පසු අපට එහි සුදුසු නුසුදුසු බව පිළිබඳ තීරණයක් ගැනීමට පහසු වෙයි"

මේ නගර දෙක සම්බන්ධයෙන් රජයේ තීරණය කුමක් වුවත් ලබන ජූලි මාසයේ සිට ස්ථිර වශයෙන්ම ඔන්ටාරියෝවේ නගර 14 ක නීත්‍යනුකූල මරිජුවානා වෙළඳසල් විවෘත වන බව රජය පවසා සිටියි.

SRC

SCARBOROUGH REHABILITATION CLINIC

2950 Eglinton Avenue E., Suite 04
Scarborough, ON. M1J 2E7

- PHYSIOTHERAPY
- CHIROPRACTIC
- LASER THERAPY
- MASSAGE THERAPY
- ACUPUNCTURE
- PHYSICAL THERAPY
- PSYCHOTHERAPY
- REFLEXOLOGY
- CHRONIC PAIN MANAGEMENT
- OCCUPATIONAL THERAPY

WE SPECIALIZE IN
SPORTS AND WORK INJURIES

- CUSTOM ORTHOTICS
- ORTHOPEDIC SHOES
- ORTHOPEDIC MATTRESS
- COMPRESSION STOCKINGS
- TENS MACHINE
- ASSISTIVE DEVICES

- EXTENDED HEALTH CARE
- WSIB
- MOTOR VEHICLE ACCIDENT
- SLIP AND FALL
- ODSP
- ACCEPT ALL TYPES OF WORK BENEFITS

ඔබට අවශ්‍ය උපදෙස් සිංහල භාෂාවෙන් ලබාගත හැක.

Tel: 416-335-1424 | Fax: 416-335-4542

Email: scarrehab@bellnet.ca

Please contact Rosemarie Jude for more information 416-569-7523

ඖෂධ මිල නගී !

මාධ්‍ය මගින් මහ හඬ නගමින් අඩු කළ ශ්‍රී ලංකාවේ ඖෂධ මිල යාන්ත්‍රණ වසරක් ඉක්ම යත්ම නැවතත් වැඩි කර ඇති බව වාර්තා වේ.

අත්‍යවශ්‍ය ඖෂධ වර්ග 48 ක මිල ගණන් මෙසේ අඩු කර තිබුණේ 2016 ඔක්තෝබර් 21 වෙනි දිනයි. 'සේනක බිඹිලේ ඖෂධ ප්‍රතිපත්තියට' අනුකූලව යමින් අංක 1989/61 දරණ ගැසට් නිවේදනයෙන් රජය මේ මිල අඩුවීම ප්‍රකාශයට පත් කොට තිබුණි.

එහෙත් 2017 දෙසැම්බර් 14 වෙනි දින අංක 2049/31 දරණ ගැසට් නිවේදනයෙන් නැවතත් එම ඖෂධ වර්ග 48 හි මිල සියයට 5 කින් වැඩි කරන බව රජය ජනතාව වෙත දැනුම් දී ඇත.

මේ ගැන අදහස් දක්වමින් සෞඛ්‍ය ඇමතිවරයා පවසා ඇත්තේ, මෙම වැඩිවීම සිදුවූයේ ඩොලරයට සාපේක්ෂව ලෝක වෙළඳපොළ තුළ ඖෂධ මිල ඉහළ යෑම නිසා බවයි. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ලෝක වෙළඳපොළේ සිදුව ඇති බෙහෙත් මිල ඉහළ යෑම නිසා බෙහෙත් ආනයනකරුවන්ට පාඩු සිදුව ඇති නිසා මෙසේ බෙහෙත් මිල සියයට 5 කින් වැඩිකිරීමට සිදුවූ බව ඇමතිවරයා පවසයි. ඖෂධ ආනයනකරුවන් සහ ඖෂධ ආනයනකරුවන්ගේ වාණිජ මණ්ඩලය විසින් රජය වෙත කළ ඉල්ලීමක් සලකා බලමින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය සිදුකළ අධ්‍යයනයකින් පසු මෙසේ බෙහෙත් මිල ගණන් වැඩි කිරීම සිදුකර ඇතැයි පැවසේ.

මෙම මිල වැඩිවීමට අනුව මෙතෙක් රුපියල් 1 යි ශත 30 කට අලෙවි වූ පැරසිටමෝල් පෙත්තක මිල රුපියල් 1 යි ශත 37 දක්වා වැඩිවී තිබේ.

2017 දෙසැම්බරයේ නිකුත් කළ ගැසට් නිවේදනයට අනුව මෙම මිල වැඩිවීම වසරක කාලයක් සඳහා බලපැවත්වෙන බවත් එම කාලයේදී ලෝක වෙළඳපොළෙහි බෙහෙත් මිල ඉහළ ගියත් ලංකාවේ බෙහෙත් මිලෙහි කිසිදු වෙනසක් සිදු නොවන බවත් ඇමතිවරයා පවසයි.

නව ගැසට් පත්‍රයෙහි සඳහන් මිල ගණන්වලට අනුව බෙහෙත් අලෙවි නොකරන ඔසුසල් වැටලීමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය කටයුතු කරන බව සෞඛ්‍ය අමාත්‍යාංශය නිවේදනය කර ඇත.

සංශෝධනය වන අල්ලස් පනත

1994 වසරේදී සම්මත කරගනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත පළමු වරට සංශෝධනය කෙරෙමින් පවතින බව එහි අධිකක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කර ඇත.

ආරම්භයේ සිට මේ දක්වා කිසිදු සංශෝධනයකට ලක් කර නොමැති මෙම පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට නව සංශෝධන සහිත පනත් කෙටුම්පතක් ලෙස සකස් කෙරෙමින් පවතී.

මේ වන විට, පවතින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත මඟින් රාජ්‍ය ආයතන පමණක් ආවරණය කෙරෙන අතර නව සංශෝධන තුළින් එම තත්ත්වය වෙනස් කිරීමට අදහස් කොට ඇත. ඒ අනුව පෞද්ගලික අංශය මෙන්ම විදේශිකයන්ද අවාරණය වන පරිදි නව සංශෝධනය සැකසෙනු ඇත.

තවද මෙම නව සංශෝධනයට මුදල් විශුද්ධිකරණයට එරෙහිව කටයුතු කිරීම සඳහා නව නීති එකතු කිරීමටද අදහස් කරයි. මෙහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, මූල්‍ය අපරාධ කොට්ඨාසය වැනි සමාන්තර පරීක්ෂණ සිදුකරන ආයතන හා එක්ව සම්බන්ධීකරණයකින් කටයුතු කිරීමට අවශ්‍ය වගන්තිද රීට ඇතුළත් කෙරෙනු ඇත.

මේ වන විට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ විමර්ශන නිලධාරීන් ලෙස පොලිස් නිලධාරීන් 200 ක් පමණක් සේවය කරන බවත් මෙම නව සංශෝධනය තුළින් ඒ සඳහා වෙනත් ක්ෂේත්‍රවල විශේෂඥතා සහිත විමර්ශකයන් 200 දෙනෙකු සහ නිවාරණ නිලධාරීන් 50 දෙනෙකු බඳවා ගැනීමට අවස්ථාව හිමිවන බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසා සිටී.

අලියෙක් මැරුවොත් සඳහටම ඇතුළේ !

ගල්ගමුවේ දළ පූට්ටුවා ඇතාගේ කෲර ඝාතනයත් සමගම අලි ඇතුන් ඝාතන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දැඩි කතාබහක් මතුව තිබේ. පසුගිය නොවැම්බර් 29 දා දළපූට්ටුවාගේ සිරුර හමුවීමෙන් පසු ගෙවුණු සුළු කාලය තුළ තවත් වන ඇතුන් හතර දෙනෙකු සහ අලියෙකු ඝාතනය වී ඇති අයුරු පසුගිය දිනවල මාධ්‍ය මඟින් හෙළිදරව් කොට තිබුණි.

එක දිගට සිදුවූ මෙම වන අලි ඝාතනත් සමගම මෙම අලි මරුවන්ට විරුද්ධව දැඩි පියවර ගැනීම කෙරෙහි රජයේ අවධානයද යොමු කිරීමට අදහස් කර ඇත.

ඒ අනුව වන අලි ඝාතනයක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරුවකු වන අයෙකුට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නියම කළ හැකි වන ලෙස සත්ව හා වෘක්ෂලතා පනත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබේ. තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යවරයා විසින් පසුගිය මාසයේදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ එම යෝජනාව මෙසේ අනුමත වී ඇත.

වනජීවී රක්ෂිත තුළ සහ ඉන් බැහැර ප්‍රදේශවලදී වනජීවී සම්පත්වල ආරක්ෂාව තහවුරු කොට සිදුවන අපරාධ වැළැක්වීමට අවශ්‍ය නීතිමය බලතල වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ වනජීවී නිලධාරීන් හා පොලිස් නිලධාරීන් වෙත මේ වන විට පවරා ඇති බවද සඳහන් වේ.

එසේම අලි සහ මිනිසුන් අතරත් වෙනත් වන සත්වයින් හා මිනිසුන් අතරත් ඇතිවන ගැටුම් කළමනාකරණය හා බැඳුණු රාජකාරිද වනජීවී නිලධාරීන් වෙත පවරනු ලැබ ඇත.

සෑම වසරකම අලි-මිනිස් ගැටුම නිසා වන අලි 240 ක් පමණ මරු වැළඳගන්නා බව ඒ පිළිබඳ දත්ත වාර්තා පෙන්වා දේ.

බන්ධනාගාරවලට කායවර්ධන මධ්‍යස්ථාන

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ගතවූවන් පුනරුත්ථාපනය සඳහා කායවර්ධන පුහුණුව සහ ක්‍රීඩාව යොදාගැනීමට අපේක්ෂා කරන බව බන්ධනාගාර කොමසාරිස්වරයා පවසා සිටී.

ඒ අනුව ලංකාව පුරා පවතින සියලුම බන්ධනාගාරවල කායවර්ධන පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අදහස් කර ඇති අතර මුල්ම පුහුණු මධ්‍යස්ථානය පසුගියදා 'පවර් ෂෙල්' නමින් මහර බන්ධනාගාරයේදී විවෘත කෙරුණි. මෙම කායවර්ධන පුහුණ මධ්‍යස්ථාන ඒ සම්බන්ධයෙන් පුහුණුව ලත් නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කෙරෙන බව සඳහන් වේ.

සංහිඳියාවේ නාලිකාව

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් උතුරු නැගෙනහිර ජනතාව වෙනුවෙන් 'සංහිඳියාවේ නාලිකාව' නම් වූ නවතම රූපවාහිනී නාලිකාවක් ඇරඹීමට තීරණය කර ඇත.

මෙම නාලිකාව ඇරඹීම සඳහා වෙනමම සංඛ්‍යාතයක්ද මේ වන විට ලබා දී ඇතැයි සඳහන් වන අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණද ඇණවුම් කර ඇත.

සංහිඳියාවේ නාලිකා මැදිරි සංකීර්ණය ඉදිකිරීම සඳහා යාපනයේ මීසාලේ වීරසිංහම් මධ්‍ය මහා විද්‍යාලයට අයත් පර්චස් 100 ක් යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මේ වන විට වෙන් කර දී ඇත.

මෙම නාලිකාව ඇරඹීම සඳහා 2016 වසරේ අයවැයෙන් රුපියල් මිලියන 180 ක මුදලක් වෙන් කරනු ලැබ ඇති අතර ඒ පිළිබඳ අවබෝධතා ගිවිසුම 2017 ජනවාරි මාසයේදී අත්සන් තබා තිබුණි.

මෙම 'සංහිඳියාවේ නාලිකාව' ආරම්භ කිරීමෙන් ජාතික සංහිඳියාව ගොඩ නැංවීමට වඩාත් පහසු වනු ඇතැයි රජය බලාපොරොත්තු වේ.

තේ තහනම ඉවතට !

රුසියානු රජය විසින් පසුගිය දෙසැම්බර් 18 දා සිට ශ්‍රී ලංකාවේ තේ සහ කෘෂි නිෂ්පාදන සඳහා පනවා තිබූ තහනම දෙසැම්බර් 30 දා සිට ඉවත් කිරීමට එරට බලධාරීන් තීරණය කොට ඇත.

ශ්‍රී ලංකාවෙන් රුසියාවට අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑම් 18,000 ක් අඩංගු කන්ටේනරයක් පරීක්ෂා කිරීමේදී එහි සිට කුරුමිණියෙකු හසුවීමත් සමඟ මෙම අපනයන තහනම පනවා තිබුණි.

Khapra Beetle නමැති කෘමි විශේෂයකට අයත් මෙම කුරුමිණියා රුසියාවට විශාල හානියක් ගෙන දුන් සතෙක් ලෙස එරට ප්‍රචලිත වූවෙකි. මීට වසර 15 කට පමණ පෙර මේ කුරුමිණියා නිසා එරටට සිදුව ඇති හානිය රූබල් මිලියන 500 ක් පමණ වෙතැයි පැවසේ.

මේ පිළිබඳව කරුණු දැක්වූ ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපතිවරයා පවසා ඇත්තේ එම කුරුමිණි විශේෂයේ සුහුඹුළා හමුවී ඇත්තේ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ අඩංගු බහලුමක තිබී බවයි. එසේ නොමැතිව ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේවල හෝ තේ අසුරා තිබූ අදාළ ඇසුරුම්වල මේ සුහුඹුළා නොසිටි බව ඔහු පවසයි. එසේම මෙම කප්රා බීට්ල් කුරුමිණි විශේෂය ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ හෝ වෙනත් කිසිම වගාවක වාර්තා වී නැති නිසා එම සත්ව විශේෂය අපේ තේ බහලුමට ආවේ කෙසේදැයි යන ගැටලුව ඇති බවද ඔහු පෙන්වා දේ.

මේ අතර රුසියාවෙන් ශ්‍රී ලංකාවට පැනවූ තේ තහනම ඉවත් කර ගැනීමට රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පුටින් වෙත ලිඛිත ඉල්ලීමක් කිරීමට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා කටයුතු කර තිබුණි. එම ලිපි හුවමාරුවේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ නියෝජිත කණ්ඩායමක් රුසියාවට පිටත්ව ගිය අතර ඔවුන් හා රුසියානු බලධාරීන් අතර සාකච්ඡා ආරම්භ වී ඇත. එහිදී මෙවැනි අතපසුවීම් නැවත සිදුනොවීමට වගබලාගන්නා බවට එරට බලධාරීන්ට සහතික වීමෙන් පසු රුසියාව තේ තහනම ඉවත් කිරීමේ තීරණය ගෙන ඇත.

රුසියාව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම තේ ගැනුම්කරුවා වන අතර ශ්‍රී ලංකාව අපනයනය කරන තේවලින් සියයට විසිපහක්ම මිල දී ගන්නේ රුසියාවයි.

ජන 1 දා සිට කොළඹ සිඟමන් තහනම් !

2018 ජනවාරි 01 දා සිට කොළඹ නගරයේ මාර්ගවල සහ පොදු ප්‍රවාහන සේවා තුළ සිඟමන් යැදීම තහනම් කර ඇති බව මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා පවසා සිටියි.

ඉහත අමාත්‍යාංශයත් කොළඹ මහ නගර සභාවේ මහජන ආධාර දෙපාර්තමේන්තුවත් සමග සමාජ සුබ සාධන අමාත්‍යාංශය එක්ව කළ සම්ක්ෂණයකදී කොළඹ නගර සීමාව තුළ සිඟමන් යදින්නන් 600 ක් පමණ සිටින බව හෙළිදරව් කර ගැනුණි. නගරය තුළ මෙසේ යාචකයින් බහුල වීම නිසා මහජනතාව විවිධ හිරිහැර, දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත් මේ තත්ත්වය නගරයේ අලංකාරය නැති වීමට හේතුවක් බවත් ඇමතිවරයා පවසයි.

මේ නිසා කොළඹ යාචකයින් ඉවත් කිරීමට පියවර ගෙන ඇති අතර පසුගිය දෙසැම්බර් මස අවසන් වීමට පළමු සියලුම යාචකයින් කොළඹ මහ නගර සභාවේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත රැගෙන යාමට නියමිත විය. මෙහිදී ඔවුන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව සහ සමාජ පුහුණුව ලබාදීමටත් පාසල් යන වයසේ පසුවන යාචක දරුවන් වෙනුවෙන් පාසල් අධ්‍යාපනය ලබාදීමටත් විවිධ රෝගී තත්ත්වයන්ගෙන් පීඩා විඳින දරුවන් ජීවිත කාලය පුරා රැක බලා ගැනීමට අවශ්‍ය ක්‍රම සම්පාදනය කිරීමටත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව ඇති දරුවන් සහ වැඩහිටියන් පුනරුත්ථාපනය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළවල් යෙදීමටත් බලාපොරොත්තු වේ.

මෙම රදීගම පුනරුත්ථාපන මධ්‍යස්ථානය රුපියල් මිලියන 80 ක වියදමින් රජය විසින් ඉඳි කොට ඇත.

දිසත Dasatha
2018 ජනවාරි January 2018

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editor - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada.
«Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

ශ්‍රී ලංකා දේශපාලනයේ කාන්තා නියෝජනය

ශ්‍රී ලංකා කාන්තා දේශපාලන ඉතිහාසයේ නව පිටුවක් මෑතකදී පෙරලුණි. ඒ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තාවන්ට මැතිවරණයකදී සියයට 25 ක නියෝජනයක් ලබාදෙමින් සම්මත වුණු නව පනතත් සමගය.

ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයෙහි මීට පෙර කාන්තාවන් නොසිටියේම යැයි කිව නොහැකිය. ක්‍රි.පූර්ව යුගයේ සිටම රජකම් කළ කාන්තාවන් ගැන අපට අසන්නට ලැබේ. ක්‍රි.පූර්ව 47 ත් 42 ත් අතර අවුරුදු 05 ක් අනුරාධපුරයේ රජකම් කළ අනුලා බිසවගේ පටන් සීවලී, කල්‍යාණවතී ආදි කාන්තාවන්ගේ නම් ඉතිහාසයට එක්ව තිබේ. එහෙත් මෙහි රජ කළ රජුන්ගේ සංඛ්‍යාව හා සසඳන කල ඒ අතැඟිලි ප්‍රමාණයටවත් සම නොවන සුලු සංඛ්‍යාවකි.

රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේදී එනම් 1931 දී ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට පුරුෂයන්ට සමානවම ඡන්ද බලය හා මැතිවරණ ආදියට ඉදිරිපත් වීමේ අයිතිය හිමි වූ අතර එතැන් සිට පාර්ලිමේන්තු මැතිවරණවලට තරඟ කළා වූත් ඉන් ජය ලැබුවා වූත් විවියන් ගුණවර්ධන, කුසුමා ගුණවර්ධන, තමරා ඉලංගරත්න, කුසුමා රාජරත්න, වීමලා විජයවර්ධන, කුසලා අබේවර්ධන ආදි කාන්තාවන් පිරිසක්ම ඉතිහාසයට එක්ව සිටිති. 1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ලෝකයේ ප්‍රථම අගමැතිනිය ලෙස කාන්තා නියෝජනය ඔසවා තැබූ අතර 1994 දී ලෝකයේ ප්‍රථම විධායක ජනාධිපතිවරය වෙමින් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග දේශපාලන ක්ෂේත්‍රයෙහි කාන්තාවට හිමි තැන ප්‍රදර්ශනය කළාය. කෙසේ වෙතත් 1931 සිට 2015 දක්වාම ශ්‍රී ලංකා දේශපාලන ක්ෂේත්‍රයෙහි මතුව ආ මේ කාන්තාවන්ගේ ප්‍රමාණය සංඛ්‍යාවෙන් 50 නොඉක්මවන තරම්ය. මිනිදු බහුතරයක් පියාගේ, ස්වාමිපුරුෂයාගේ, සහෝදරයාගේ අභාවයෙන් පුරප්පාඩු වූ තැනට පැමිණි අය මිස කාන්තා නියෝජනය සනිටුහන් කරමින් දේශපාලනයට පැමිණි අය නොවූහ.

මින් වසර 06 කට පෙර එනම් 2011 ශ්‍රී ලංකා ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රතිශතය සියයට 51 ඉක්මවා ගොස් තිබියදීත් කාන්තාව සාක්ෂරතාවෙනුත් අධ්‍යාපනයෙනුත් ඉහළ තැන් ගෙන රජයේත් පෞද්ගලික අංශයේත් උසස් නිලතල දරමින් පුරුෂයන් අභිභවා සිටියදීත් දේශපාලන සහභාගිත්වය අතින් මෙතරම් අවම ස්ථානයක පසුවීම තරමක මවිතකර කරුණක් වේ. මෙවන් තත්ත්වයක් උද්ඝතව ඇත්තේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මූලික අයිතිවාසිකම් වරප්‍රසාද යටතේ පුරුෂයින්ට සමානවම මැතිවරණයකදී අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීමේ සිට සියලු දේශපාලන හිමිකම් ලබා දී තිබියදීය. එපමණක්ද නොවේ, ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය අනුවද එම හිමිකම් තහවුරු කොට තිබියදීය.

මෙබඳු තත්ත්වයක් උද්ඝත වීමට බල පෑ කරුණු කීපයක්ද නැතුවාම නොවේ. ශ්‍රී ලංකාවේ පුරුෂෝත්තමවාදී සමාජය තුළ අනාදිමත් කාලයක සිට පවත්නා 'කාන්තාව යනු ගෘහස්ත කාර්යභාරයට සීමා වූ තැනැත්තියක මිස දේශපාලන සහභාගිත්වයට යෝග්‍ය තැනැත්තියක නොවේය' යන සාම්ප්‍රදායික විශ්වාසය ඉන් ප්‍රධාන තැන ගනී. ශ්‍රී ලංකාවේ දේශපාලන සංවිධානවල (පක්ෂවල) කාරකයින් විසින්ද මේ මතයම දරමින් කාන්තාවන්ට ඒ තුළ හිමි තැන ලබාදෙන්නට දැක්වූ මැළි කමද ඒ හාම බැඳුණු තවත් එකකි. ඒ හැරත් ස්වභාවිකවම දරුවන් වැදීම, දරුවන් හැදීම ආදි පිරිමියාට නැති ඇය විසින්ම ඉටු කළ යුතු කාර්යභාරයක්ද ඇය වෙත පැවරී තිබීම නිසා ඇගේ නිදහස ඇහිරී තිබීමද හේතුවක් විය හැකිය. තවද ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලන සංස්කෘතිය තුළ දක්නට ලැබෙන පෙර නොපැවති ප්‍රචණ්ඩත්වය, දැඩි තරඟකාරී ස්වභාවය, නිර්ලජ්ජී බව හා දූෂිත බව, චරිත ඝාතනය, ව්‍යාජ බව ආදි කාන්තාවකට ඔරොත්තු නොදෙන ලක්ෂණද දේශපාලන සහභාගිත්වයෙන් ඇය ඈත් කරන්නට හේතු වූවා විය හැකිය. 1978 සිට ආසන ඡන්ද ක්‍රමය වෙනුවට ආරම්භ වූ දිස්ත්‍රික් මට්ටමේ ඡන්ද ක්‍රමයට මුහුණ දීමේදී දරන්නට වන වියහියදම් හා වෙහෙස හා ජය ගත්තද නිසි ලෙස තම කාර්යය කිරීමේදී ඇති වන අපහසුතා ආදි බාහිර සාධකද තවදුරටත් මීට බලපෑවා විය හැකිය.

එහෙත් කාන්තාව සතු මේ අයිතිය රටේ ප්‍රයෝජනය සඳහා කෙසේ හෝ දිරිගන්වාලීමේ අවශ්‍යතාව අප විසින් සැලකිල්ලට ගත යුතුමය. කාන්තාවන් සඳහා මැතිවරණවලදී සියයට 25 ක ඉඩකඩක් සලසාලීමේ ඒ නව නීතිය ලංකා කාන්තා දේශපාලන ඉතිහාසයේ නව පිටුවකැයි මෙහි මුලදීම අප සඳහන් කළේ ඒ උත්තේජනය සලකාය. සැබවින්ම මෙය ආරම්භයේදීම එකවර ජයගත හැකි කාර්යයක් නොවනු ඒකාන්තය. මෙතෙක් හුරුපුරුදුව නොතිබුණු මේ සඳහා කාන්තාවන්ගේ ඉදිරිපත් වීමද සිතන තරම් සුලභ නොවනු ඇත. මේ පිළිබඳව පෙර සඳහන් කළ පරිදි කිසිදු අවධානයක් යොමු නොකළ දේශපාලන පක්ෂ මෙය පළමුවරට ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන මැතිවරණයේදීම සියයට 25 ක කාන්තා නියෝජනයක් සලසන්නේ කෙසේදැයි මැසිවිලි නගන්නට පටන් ගෙන ඇති සැටියෙන්ම එය පැහැදිලි වෙයි. එසේ කියමින් තම බිරිඳ, දූවරුන්, සහෝදරියන්, ඥාතීන්, අසල්වාසීන්ගෙන් සියයට 25 පුරවන්නට පක්ෂ උත්සාහ ගතහොත් ලත් තැනම මෙය ජනතා කෝපයට ලක්වනු ඇති අතර උගත්, බුද්ධිමත්, දක්ෂ, සුදුසු කාන්තාවන්ටම මේ අවස්ථාව ලබාදීමට පක්ෂ උත්සුක විය යුතුමය.

වර්තමානයේ ජරාජීර්ණ වී ඇති බහුතරයක් පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජිතයින්ගේ තත්ත්වය සලකන කල ඒ තත්ත්වයට දේශපාලනයට පැමිණෙන මේ අයද පත්වුවහොත් එයද රටේ අවාසනාව වන අතරම මෙම නීතිය සම්මත කළවුන්ට ජනතාවගේ ශාපයට ලක්වීමට සිදුවනුද නොඅනුමානය. තම දෑත පිරිසිදුව තබාගනිමින් තමන් ලජ්ජා සහගත බව උරුම කරගත්, දූෂණය පිටු දකින පිරිසක් බව අමතක නොකරමින් තම ක්ෂේත්‍රයේ සිටින පුරුෂ පක්ෂයද යහමගට ගැනීමට ඔවුන් සමත් වුවහොත් එය අතිශය ජනතා ප්‍රසාදයට හේතු වනු නියතය.

මෙම තනතුරුවලට පත්වීමෙන් පසු කාන්තාවන්ට මුහුණ පාන්නට වන ගැටලු ගැනද දැනටමත් මැති ඇමතින්ගේ අවධානය යොමුව ඇති බවක්ද පෙනෙන්නට ඇත. පසුගියදා මනෝ ගනේෂන් ඇමතිවරයා එබඳු යෝජනා රාශියක් ඉදිරිපත් කර තිබුණු අතර මතු එබඳු ගැටලු පැන නඟින අයුරින් ඒවාට විසඳුම් ලබාදීමටද රජය කටයුතු කළ යුතු වෙයි.

සෞභාග්‍යය උදාකරලනු වස් කැප වුණු විහාරමහාදේවි වැනි මවුවරුන්, සෝමාදේවි වැනි බිරින්දෑවරුන් මෙම තනතුරුවලට පත්වීමෙන් රටට සෞභාග්‍යය උදාවනු ඇත යනු ජනතා අපේක්ෂාවයි.

නව වසරේදවත් මවුබිමට සෞභාග්‍යය උදා වේවා!

■ දූරදර්ශී විසිනි

ශ්‍රී ලංකාව නිදහස ලබා තව මාස දෙකකින් 70 වන වසරට පා තබයි. මේ සා විශාල කාලයක් ගත වුවද තවමත් ශ්‍රී ලංකා ජනතාවට (අතළොස්සකට හැර) සෞභාග්‍යයේ අරුණළු දකින්නට නොලැබුණු බව රහසක් නොවේ. රටේ බහුතරය යන්තම් යැපෙන තත්ත්වයකත් තවත් කොටසක් අන්ත දිළිඳු තත්ත්වයකත් පසුවන බව රාජ්‍ය සංඛ්‍යාලේඛනවලින්ම හෙළිදරව් වෙයි. මේ තත්ත්වය වර්තමාන පාලකයන් පමණක් නොව, වසර 70 මුළුල්ලේම පාලනය ගෙන ගිය සියලුම පාලකයන් හෑල්ලුවට ලක්වන කරුණක් නොවන්නේද? එදා නිදහස ලැබූ දා "අප දේශපාලන නිදහස ලැබූ පමණින් උදම් අනමින් නොසිට අපේ ජනතාව ඉතා ඉක්මනින් ආර්ථික වශයෙන්ද නිදහස ලැබූ ජනතාවක් කිරීමට සියලු අනාගත පාලකයන් කටයුතු කළ යුතුයැ" යි දේශපාලන නිදහස දිනා දීමට මුල් වූ ඩී. එස්. සේනානායක අගමැති තුමන් කළ කතාව ඉන්පසු සිටි සියලු පාලකයන් විසින් කණකටවත් නොගත් බවක් මින් නොහැඟේද? ඒ වෙනුවට ඉතිරව ඇත්තේ මෙතෙක් සිටි සියලු පාලකයන් විසින් රටේ ජනයා බරපතල ලෙස ලෝකයේ ණයකරුවන් කොට ඇති බව නොවේද?

මේ වන විටත් රටේ ජනතාවගෙන් සියයට 40 කට ආසන්න සංඛ්‍යාවක් දුප්පත් කමේ කඩඉම පසුකර නැති බව මහ බැංකුව පසුගියදා අනාවරණය කොට තිබුණි.

දුප්පත් කම යනු කුමක්ද? මෙයට ආර්ථික විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන් විසින් විවිධ අර්ථකථන සපයා තිබේ. ඉන් බහුතර පිළිගැනීමට ලක්ව ඇති අර්ථකථනය වනුයේ 'තමන් ජීවත් වන සමාජය තුළ පිළිගත් ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට පුද්ගලයෙකුට හෝ පවුලකට පවතින්නා වූ සම්පත් හිඟ කම දුප්පත් කමය' යන්නයි.

මේ අතර ශ්‍රී ලංකා දේශපාලනඥයන්ද ඉඳහිට සපයන අර්ථකථන අපට අසන්නට ලැබේ. පසුගිය අවදියේ එබදු එක්තරා දේශපාලනඥයකු රැස්වීමකදී පළ කොට පුවත්පතක පළව තිබූ අදහසක් මෙහිදී මගේ සිහියට නැගේ. ඔහු කියා තිබුණු හැටියටම කිවහොත්, 'ලංකාවේ දුප්පතුන් ගැන කොතෙකුත් කතා කරනවා. ඒත් නොකා නොබී මිය ගිය එක මිනිහෙක් ගැනවත් පුවත්පතක පළ වී තිබෙනවා ඔබ දැක තිබේද?' ඔහු මේ ප්‍රකාශය කොට ඇත්තේ සාගතය හා දුප්පත්කම පටලවා ගැනීමෙනැයි මට සිතේ. නැතහොත් ශ්‍රී ලංකාවේ දුප්පත්කම ගැන කතා කිරීම ලජ්ජාවකැයි සිතා විය යුතුය. නැතිනම් නොකා නොබී මියගිය මිනිසෙකු නැති වූ තරමින් රටේ දුප්පත්කම මනින්නට ඔහු අඳබාල වූයේ කෙසේද? නොකා නොබී මිය යාම පමණක් නොව, කෙනෙකුට පරම්පරාවෙන් උරුම වූ දිරා ගිය නිවසක් ඇතද එය අලුත්වැඩියා කොට ගත නොහැකිව ළතවෙන මිනිසාද සමාජ විද්‍යාඥයින් විසින් හඳුන්වන්නේ පීඩිත දුප්පතෙකු හැටියටය.

මිනිසෙකුට ජීවත් වීමේදී අවශ්‍ය ආහාර, ඇඳුම්පැළඳුම්, නිවහන්, ඖෂධ ආදි මූලික අවශ්‍යතාවලින් තොර වූ විට ඔහු දුප්පතෙකැයි නොකියා ඔහුට වෙන කුමක් කියන්නද? දුප්පත්කම ශ්‍රී ලංකා සමාජය තුළ දිගටම රඳා පැවතීමට එක් හේතුවක් වන්නේද ඉහත සඳහන් දේශපාලනඥයා වැනි මානසිකත්වයක් ඇති වුන් අපේ දේශපාලනයට අරක් ගෙන සිටින නිසා නොවේද?

දුප්පත් කමේ ලක්ෂණ ලෙස බොහෝ ආර්ථික විද්‍යාඥයන් සහ සමාජ විද්‍යාඥයන් දක්වන තවත් කරුණු රැසකි. විරැකියාව, රෝගී තත්ත්වයන්, ස්වභාවික විපත් ආදියෙන් පීඩාවට ලක් වීම, දරුවන් පෝෂණයට අසමත් වීම, දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට ඇති සම්පත් හිඟ කම ආදි කරුණු රැසක් මේ අතර වෙයි.

දිළිඳු කම යනු හුදකලාව ගෙන කතා කළ හැකි තත්ත්වයක් නොවේ. දුප්පතුන් එම තත්ත්වයේ සිටින්නේ ඔවුන්ගේ අලස කම නිසාය, සමාජ විරෝධී හැසිරීම් නිසාය, ආත්මශක්තියෙන් හීන නිසාය, තරඟකාරී වීමට අසමත් නිසාය, පසුගාමී අදහස් ඇත්තවුන් නිසාය ආදි විවිධ හේතු සාධක අපට ප්‍රතිපාදනය කළ හැකිය. එහෙත් මේ සියල්ල දුප්පත්කම සමඟ එකට බැඳුණු පරිවාර හේතු සාධක වන බව අප අවබෝධ කොට ගත යුතුය. දුප්පත්කම පිටුදකින්නවුන් විසින් මෙම විකල්ප තත්ත්වයන් කෙරෙහිද අවබෝධයෙන් යුතුව කටයුතු කළ යුතු යැයි විද්වත් සමාජ විද්‍යාඥයෝ පවසති. දිළිඳු බව නිසාම උත්පාදනය වී ඇති මෙකී චර්යා රටා ගැන සැලකිලිමත් නොවී වාර්ෂිකව අසරණ කමට පිහිට වීමට

20 වන පිටුව බලන්න

■ බී. බී. සී. සිංහල පුවත්

ඩිජිටල් මුදල් (digital money/emoney) නැතහොත් ක්‍රිප්ටොකරන්සි (cryptocurrency) වර්ග අතර වර්තමානයේ ඉතා ප්‍රචලිතව තිබෙන බිට්කොයින් (Bitcoin) සාම්ප්‍රදායික මුදල් ඒකක වෙනුවට අන්තර්ජාලය හරහා ගනුදෙනු කිරීම පිණිස පමණක් භාවිත කළ හැකි මුදල් වර්ගයකි. මෙම මුදල් ඒකකය සම්පූර්ණයෙන්ම සංසරණය වන්නේ අන්තර්ජාලය තුළය. මෙය රුපියල්, ඩොලර්, පවුම්, යුරෝ වැනි තවත් මුදල් ඒකකයක් වුවද Bitcoinවල හැසිරීම පාලනය කිරීමට බැංකුවක්, පුද්ගලයෙක් හෝ ආයතනයක් නැත.

එය දිනෙන් දින වැඩිවන මුදල් අවශ්‍යතා පාලනය කිරීම පිණිස නිර්මාණය කර ගන්නා ලද මුදල් ඒකකයකි. Bitcoin එයටම අනන්‍ය වූ ජාලයක් තුළ සැරිසරන අතර, මෙම මුදල් වර්ගය පරිහරණය කරනු ලබන්නේ එම ජාලයේ පරිශීලකයන් විසිනි.

ආරම්භ කළේ කවුද?

Bitcoin පිළිබඳව ප්‍රථම යෝජනාව ඉදිරිපත් කළ සතොෂි නකමොටෝ (Satoshi Nakamoto) නම් මෘදුකාංග ඉංජිනේරුවරයා, මෙය අන්තර්ජාලයෙන් ගනුදෙනු කළ හැකි මුදල් ඒකකයක් ලෙස 2009 වර්ෂයේදී හඳුන්වා දුන්නේය. පාලනාධිකාරියකට යටත් නොවී මුදල් භාවිත කිරීම මෙහි මූලික අරමුණ විය. ඒ පිළිබඳව උනන්දුව දක්වන ලොව පරිගණක විද්‍යාඥයන් සහ තොරතුරු ආරක්ෂණ විශේෂඥයන් මෙය ක්‍රියාත්මක වන Bitcoin source code ජාලය පිළිබඳව නිරන්තරයෙන් අවධානයෙන් පසු වන බව වාර්තා වේ.මෙය ව්‍යාපාරික ලෝකයේ නවතම ආයෝජන රැල්ල ලෙසද හඳුන්වා දිය හැකිය.

Bitcoin මෘදුකාංග පිටපත් කළ නොහැකිද?

ලෝකයේ අවධානය දිනා ගත් මේ ඩිජිටල් මුදල් වර්ගය ඉතා සංකීර්ණ මෘදුකාංගයක් වීම හේතුවෙන් එය පිටපත් කිරීම සහ ව්‍යාප ලෙස නිපදවීම කළ නොහැකි බව විශේෂඥයන්ගේ මතය වී තිබිණ.

එහෙත් පසුගිය දා ස්ලෝවේනියානු Bitcoin ජාලයකට අනවසරයෙන් ඇතුළු වූ හැකරුන් Bitcoin 4,700 ක් සොරා ගෙන ඇති අතර එහි වටිනාකම ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 80 ක් පමණ වන බවට වාර්තා වේ. මෙම මහා සොරකම මගින් Bitcoin වල වටිනාකම පහළ වැටිය හැකි බවට අනාවැකි පළ වුවත්, ඉන් අනතුරුවත් දිනෙන් දින එහි අගය ඉහළ යාම පිළිබඳව ලොව ආර්ථික විශේෂඥයෝ විස්මය පළ කරති.

ගබඩා කරන්නේ කෙසේද?

එදිනෙදා සිදු කෙරෙන මූල්‍යමය ගනුදෙනු පිණිස අවශ්‍ය මුදල් අප බොහෝ විට රඳවා තබා ගන්නේ පසුම්බියකය. එම සරළ අදහස ඩිජිටල්කරණය වී, මෘදුකාංගයකින් නිර්මාණය කළ පසුම්බියක Bitcoin රඳවා තබා ගත හැකිය. මෙය Bitcoin Wallet ලෙස හඳුන්වනු ලැබේ. එය 'ඇප්' (App) එකක් වන අතර එම Bitcoin Wallet සේවාවන් ලබා දෙන ආයතන සහ සංවිධාන මේ වන විට ලෝකය පුරා විශාල ප්‍රමාණයක් ආරම්භ කර තිබේ.

ඒ අතරින් සිය ආයෝජන සඳහා විශ්වසනීය ආයතනයක් තෝරා ගැනීම පාරිභෝගිකයා සතු වගකීමකි. කිසිවෙකු Bitcoinවලින් ගනුදෙනු කිරීම ආරම්භ කළ පසු ඒ සියලු ගනුදෙනු පිළිබඳ විස්තරාත්මක සටහන් මෙම Bitcoin Wallet හි සඳහන් වේ.

Bitcoin මිල දී ගන්නේ කෙසේද?

ක්‍රෙඩිට් කාඩ් පත භාවිත කරමින් Bitcoin මිල දී ගත හැකි වුවත්, මේ වන තුරු ශ්‍රී ලංකාවට එම පහසුකම ලබා දී නැත. මේ හේතුවෙන් ශ්‍රී ලාංකික ආයෝජකයෙකුට දැනට Bitcoin මිල දී ගත හැකි වන්නේ ඒවා හුවමාරු කරන (Exchange) ආයතනයක් හෝ සංවිධානයක් හරහා පමණි.

ඩිජිටල් මුදල් වලට ඇති ඉතා ඉහළ ඉල්ලුම හේතුවෙන් පැය ගණනක් ඇතුළත Bitcoinවල වටිනාකම ඉහළ ගිය අවස්ථා දැකිය හැකි විය. වරක් Bitcoin එකක මිල ඇමරිකානු ඩොලර් 18,000 ක් ලෙස වාර්තා වුවත් පසුව එම අගය නැවත ඇමරිකානු ඩොලර් 13,963 දක්වා පහත වැටී ඇති බව දකින්නට ලැබිණ.

Bitcoin ඒකකයක් සෑදී ඇත්තේ කුඩා කොටස් 100,000,000 කිනි. මෙය සත හෝ පැන්සවල එකතුවකින් ඉහළ අගයක් ඇති මුදලක් සෑදෙනවා හා සමානය.

මේ හේතුවෙන් Bitcoin ඉතා කුඩා ප්‍රමාණයක් පවා මිල දී ගැනීමේ හැකියාවද තිබේ. කිසිවෙකුට මිල දී ගත හැකි කුඩාම Bitcoin ප්‍රමාණය 0.00000001 ක් වන අතර මෙම කුඩාම ඒකකය හඳුන්වනු ලබන්නේ Satoshi යන නමිනි.

එදිනෙදා ගනුදෙනු කළ හැකිද?

තමන් මිල දී ගන්නා භාණ්ඩ හෝ සේවාවන්ට Bitcoin වලින් ගෙවීම් කළ හැකි ආයතන, අවන්හල් සහ වෙබ් අඩවි ගණනාවක් තිබෙන අතර දුරකථනය හෝ පරිගණකය භාවිත කර ගිණුම් අතර මුදල් මාරු කර (transfer) ඒ සඳහා ගෙවීම් කළ හැකිය.

Bitcoin විශේෂ ලක්ෂණ

ඉතා සංකීර්ණ ඩිජිටල් තාක්ෂණික ක්‍රියාවලියක් වන Bitcoin mining හරහා Bitcoin නිර්මාණය කරන ආයතන හෝ පුද්ගලයන් හඳුන්වන්නේ Bitcoin miners යන නමිනි. Bitcoin source code හරහා පනවා ඇති සීමාවන්ට අනුව ලෝකයේ සංසරණය විය යුත්තේ මිලියන 21 ක Bitcoin ප්‍රමාණයක් පමණය.

Bitcoin කිසිම පුද්ගලයෙකුට, බැංකුවකට, ආයතනයකට හෝ සංවිධානයකට අයත් නොමැති වීම මෙහි ඇති විශේෂත්වයය.

Bitcoin හි ප්‍රධාන ලෙජරය Block Chain නමින් හඳුන්වනු ලබන අතර එම ජාලය ඇතුළත සිදුවන සියලු ගනුදෙනු මෙම ලෙජරයේ ස්වයංක්‍රීයව සටහන් වේ. මේ හේතුවෙන් ලෝකයේ නන් දෙස සිදුවන Bitcoin ගනුදෙනු එහි සිටින සියලු ආයෝජකයන්ට 100% ක්ම විවෘතව දැක ගත හැකිය. නමුත් Block Chain ලෙජරයේ තිබෙන ගිණුම් හිමියන්ගේ විස්තර කිසිදු ආකාරයකින් හෙළිදරවු නොවේ. අන්වර්ථ නාමයක් යටතේ වුවද Bitcoin ගිණුමක් පවත්වාගෙන යා හැකිය. මෙම ජාලය Bitcoin ගිණුම් හිමියන් හඳුනාගන්නේ එම මෘදුකාංගයට අනන්‍ය වූ විශේෂ ක්‍රමවේදයක් හරහාය.

කිසිම මූල්‍ය ආයතනයක හෝ බැංකුවක සහාය නොමැතිව ලෝකයේ ඕනෑම රටකට ඕනෑම මුදල් ප්‍රමාණයක් සැණින් යැවීමේ හැකියාව Bitcoin වල තවත් සුවිශේෂී ලක්ෂණයකි. රටකින් රටකට මුදල් ගෙන්වා ගැනීමේදී හෝ මාරු කිරීමේදී අනුගමනය කරන සාමාන්‍ය ක්‍රම සහ නීති රීති Bitcoin ගනුදෙනුවලට අදාළ නොවේ. මේ හේතුවෙන් Bitcoin වලින් ගනුදෙනු කිරීමේදී කිසිවෙකුට සේවා ගාස්තු හෝ අතිරේක ගෙවීමක් සිදු කළ යුතු නොවේ.

මේ ආකාරයෙන් Bitcoin වලින් සිදුවන ගනුදෙනුවක් ආපසු හැරවීමක් නැතහොත් නැවත ඉල්ලා ගැනීමක් කළ නොහැකිය. වැරදි Bitcoin ප්‍රමාණයක් යම් අයකුට ලබා දුන්නේ නම් එම පුද්ගලයා සිය කැමැත්තෙන් නැවත එය ලබා දීමකදී හැර, අන් අවස්ථාවකදී පාඩුව දරා ගැනීමට සිදු වේ.

"වේගයෙන් ආරෝපණය වෙමින් තිරිංග නොමැතිව ධාවනය වන දුම්රියකට" සමාන කර ඇති Bitcoin හි ඉහළ යන අගය පිළිබඳ ලෝකයේ ආර්ථික විශේෂඥයන් අනතුරු අඟවා ඇත. එය වේගයෙන් පිම්බෙන බෝලයකට සමාන කරන සමහරු මෙම බෝලය කෙදිනක හෝ පිපිරීමකට ලක් වෙනු ඇතැයි සැක පහළ කරති.

මෙහි තිබෙන අවදානම නිසාම Bitcoin ආයෝජනය එක්තරා 'සූදු කෙළියක්' ලෙසින්ද විග්‍රහ කෙරේ. මුදල් බිලියන ගණනක් මෙහි ආයෝජනය කර ඇති නමුත් Bitcoin ජාලයේ සම්පූර්ණ වටිනාකම වන ඇමරිකානු ඩොලර් බිලියන 268 ලෝක ආර්ථිකයත් සමග සංසන්දනය කිරීමේ දී ඉතා කුඩා අගයකි. එබැවින් කිසියම් අවස්ථාවකදී මෙය බිඳ වැටුනහොත් එයින් ලෝක ආර්ථිකයට බල පෑමක් නොවන බව එක් ආර්ථික විශ්ලේෂකයෙකුගේ මතය වී තිබේ.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය ඇතුළු රටවල් කිහිපයක් මේ වන විටත් Bitcoin ආයෝජකයන්ට අනතුරු අඟවා ඇති අතර, චීනයේ ප්‍රධාන පෙළේ Bitcoin හුවමාරු කරන (Exchange) ආයතනයක් වන BTCC පසුගිය සැප්තැම්බර් මස අවසානයේදී සියලු ගනුදෙනු නතර කිරීමට පියවර ගත්තේය. කෙසේ වෙතත් පසුගියදා ඇමරිකාවේ චිකාගෝ නුවර ප්‍රධාන පෙළේ මුදල් හුවමාරු කරන CBOE ආයතනය Bitcoin ගනුදෙනු ආරම්භ කිරීමත් සමගම මෙම පෙරළිකාර ඩිජිටල් මුදල් වර්ගයට තවත් වටිනාකමක් සහ වැඩි ආරක්ෂාකාරී බවක් අත් වී තිබේ.

1 වන පිටුවෙන්

ටොරොන්ටෝ - යෝර්ක්....

වෝන්ග් දක්වා subway දුම්රියෙන් ගමන් කළ හැක.

එහෙත් ඔබ යෝර්ක් පළාතට අයත් බස් රථයකට මාරු වන්නේ නම් ඒ සඳහා පෙර පරිදිම අමතර ගාස්තු ගෙවිය යුතු වේ.

මෙම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම නිසා ටොරොන්ටෝවේ උතුරු දිගින් පදිංචි පොදු ප්‍රවාහන සේවා පාවිච්චි කරන අතිවිශාල පිරිසකට ඉමහත් පහසුවක් සැලසෙන බව බොහෝ දෙනෙකු පෙන්වා දේ. විශේෂයෙන්ම යෝර්ක්, ටොරොන්ටෝ, රයසන් ඇතුළු විශ්වවිද්‍යාල රැසකට යන සිසුන් සඳහා පහසුවෙන්ම ගමන් කිරීමේ අවස්ථාව මෙයින් සැලසේ.

ප්‍රවේසම් වන්න....

ලෙසත් මුදල් නෝට්ටුවල ඇති අනුක්‍රමික අංක (serial numbers) පිළිබඳව අවධානය යොමුකරන ලෙසත් සහ පොලිසිය මහජනයාට පවසා සිටියි. මෙසේ පොලිසිය විසින් සොයාගත් ව්‍යාප හොර නොට්ටු පොලිමර් කඩදාසියේ මුද්‍රණය කර ඇති බවත් ඒවායෙහි අනුක්‍රමික අංකය FKW4346846 ලෙසත් සටහන් කර ඇති බව වාර්තා වේ.

මෙම හොර නෝට්ටුවලින් බහුතරයක් බැම්ප්ටන් සහ මිසසාගා ප්‍රදේශයෙහි සිල්ලර වෙළඳසල් හා ආහාර වෙළඳසල් වෙතින් මාරු කර ඇති අතර එම වෙළඳසල වෙත ලැබුණු 100 යේ නෝට්ටු ව්‍යාප ඒවා බව දැනගැනීමත් සමග ඔවුන් ඒවා පොලිසිය වෙත භාර දී ඇත. ඩර්හැම් ප්‍රදේශයට අයත් Pickering, Ajax, Whitby, Oshawa, Clarington and the Township of Scugog යන ප්‍රදේශවලින්ද හොර නෝට්ටු පිළිබඳ තොරතුරු ලැබී ඇත.

මෙම හොර නෝට්ටු ග්‍රොසරි වෙළඳසල්, කොෆි වෙළඳසල් සහ ක්ෂණික ආහාර වෙළඳසල් (Tim Hortons, Country Style, McDonald), රෙස්ටොරන්ට්, Toys"R"Us වැනි ස්ථානව වෙත ලැබී ඇති බව වාර්තා වේ.

පීල් හා ඩර්හැම් පළාත් දෙකෙහිම සංසරණය වන මෙම ව්‍යාප නෝට්ටු අතර සමාන අනුපිළිවෙළක් පවතින නිසා මේ පළාත් දෙකටම එකම වංචනික පුද්ගලයකු හෝ කල්ලියක් විසින් හොර මුදල් නෝට්ටු බෙදාහරින බවට පොලිසිය සැක කරයි.

සැබෑ නෝට්ටු හා සැසඳීමේදී විතරම් වෙනසක් නොපෙන්නුවද සැලකිලිමත් වුවහොත් ව්‍යාප නෝට්ටුවක් හඳුනාගැනීම පහසු බව පොලිසිය පවසයි. ඔබේ ඇඟිල්ලකින් මෙම නෝට්ටුවක් මඳක් තදින් පිරිමැදූ විට එහි තීන්ත ගැළවී ගොස් විනිවිද පෙනෙන ප්ලාස්ටික් කොළය පමණක් ඉතිරි වන බව පොලිසිය පෙන්වා දේ. එසේම සියයේ මුදල් නෝට්ටුවක් විවිධ කෝණවලින් පරීක්ෂා කිරීමේදී එය ව්‍යාප නෝට්ටුවක් නම් රන් පැහැයේ සිට කොළ වැනි පැහැයකට හැරෙන බව ඔබට දැක ගත හැකිවේ. එසේම ව්‍යාප මුදල් නෝට්ටු සෑම විටෙකම පාහේ එකම සීරියල් නොම්මරයක් සහිතව මුද්‍රණය කර ඇත. ඔබ අතට මුදල් නෝට්ටුවක් ලද විට එය නිසි ලෙස පරීක්ෂා කිරීමට තත්පර කිහිපයක් වැය කළහොත් මෙවැනි හොර නෝට්ටුවකට අසුවීමෙන් වැළකිය හැකිය.

නිතරම මුදල් සමඟ ගනුදෙනු කරන සෑම පුද්ගලයෙකුම කැනේඩියානු මුදල් නෝට්ටුවේ ආරක්ෂණ ලක්ෂණ පිළිබඳව දැනුවත් වී සිටීම තුළින් මෙබඳු ව්‍යාප මුදල්වලට හසු නොවී සිටිය හැකි බව පොලිසිය පවසයි. එසේම යම් කිසි පුද්ගලයෙකු ඔබ අතට ව්‍යාප මුදල් නෝට්ටුවක් පත් කළ බව හැඟී ගියහොත් එම තැනැත්තාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම හෝ ඒ පිළිබඳව හැකි ඉක්මනින් පොලිසිය වෙත දැනුම්දීම සිදුකරන ලෙස පොලිසිය මහජනයාගෙන් ඉල්ලයි.

ගෝලීය උණුසුමෙන් උඩුකුරු වී යන මිහිතලයේ හෙට දවස

■ අසංකා ශ්‍යාමලී ජයවර්ධන

මිහිතලය මත ජීවයේ ආරම්භය වූ දා සිට අද දක්වාම ජීවීන්ගේ පැවැත්මට සෘජුව හෝ වක්‍රව බලපාන ප්‍රධානතම ස්වාභාවික සාධකය වන්නේ දේශගුණයයි. දේශගුණික සංසිද්ධිවල ස්වාභාවික සමතුලිතතාවය ජීව ගෝලයේ පැවැත්ම තීරණය කරනු ලබයි. මෙම සමතුලිතතාවය බිඳවැටීම කෘෂිකර්මාන්තය, ජල සම්පත, මානව සෞඛ්‍යය, පරිසර පද්ධති හා පෙළ විවිධත්වය කෙරෙහි මෙන්ම අයිස් දියවීම සහ සාගරවල ජල මට්ටම ඉහළ යෑම, දේශගුණ වෙනස්වීම් හා සමාජ දේශපාලන අස්ථාවරත්වය, වනාන්තර පද්ධතියට සිදු වන බලපෑම වැනි විවිධ අංශ ඔස්සේ විහිදී යන ආකාරය හඳුනාගත හැක.

පසුගිය දශක කිහිපය තුළ දේශගුණය වෙනස් වීම පිළිබඳ ලෝක ප්‍රජාව වැඩි අවධානයක් යොමු කරනු ලැබිණි. ස්වාභාවික හා මානව බලපෑම හේතු කොට ගෙන දේශගුණික සාධකයන්හි සමතුලිතතාවය බිඳ වැටීම මෙම වෙනස්කම් ඇති වීමට තුඩු දුන් ප්‍රධාන හේතු සාධකය වේ. මේ අනුව දේශගුණය මිනිසා සහ පරිසරය අතර පවතින සබඳතාවයට බෙහෙවින්ම බලපාන්නා සේම දේශගුණයේ වෙනස්වීම් හේතුකොට ගෙන එම බලපෑම්වල අහිතකර තත්ත්වයන්ට මුහුණ දීමට වර්තමාන ලෝක ප්‍රජාවට සිදුවී තිබේ. දේශගුණික වෙනස්වීම් තුළින් ඇතිවන පාරිසරික උපද්‍රව වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් බවට මේ අනුව පත්වී තිබේ. දේශගුණික විපර්යාස සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ගිවිසුම (UMFCC) 'දේශගුණික විපර්යාස' යන්න නිර්වචනය කර ඇත්තේ මෙසේය.

'සැලකිය යුතු කාලයක් තුළ කර ඇති නිරීක්ෂණයන්ට අනුව සෘජුව හෝ වක්‍රව මානව ක්‍රියාකාරකම්වල බලපෑමෙන් සිදු වෙතැයි සැලකෙන දේශගුණික විපර්යාස ස්වාභාවික වෙනස්වීම්වලට අමතරව ගෝලීය වාතාවරණයේ සංයුතිය වෙනස් කරවයි'

මිනිසාගේ විවිධ ක්‍රියාවලීන් හේතු කොටගෙන පෘථිවි උෂ්ණත්වය ඉහළ යන බව බොහෝ විද්‍යාඥයින් නිගමනය කොට ඇත. මිනිස් ක්‍රියාදාමයන් නිසා වායු ගෝලයට එකතුවන්නා වූ හරිතාගාර වායු හේතු කොටගෙන පෘථිවියේ දේශගුණික පද්ධතියට සිදුවිය හැකි වෙනස් වීම් වර්තමානයේ පවා අපට අත් විඳීමට සිදුව තිබේ. පොසිල ඉන්ධන දහනය, ඉඩම් පරිහරණය වෙනස් වීම, කෘෂිකාර්මික ක්‍රියා, වන විනාශය, නෂ්ටික අත්හදා බැලීම් මෙම මිනිස් ක්‍රියාදාමයන් අතර ප්‍රධාන වේ. මෙම ක්‍රියාවලීන්වල පාලනයක් සිදු නොවුණහොත් ලබන සියවස අග භාගයේදී ලෝකයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් 1-3.5 ත් අතර ප්‍රමාණයකින්ද සාමාන්‍ය මුහුදු මට්ටම සෙන්ටිමීටර් 15 - 90 අතර ප්‍රමාණයකින්ද ඉහළ යනු ඇතැයි නිගමනය කර ඇත. වර්ෂාපතනයේ සිදුවන වෙනස් වීම්, ජල ගැලීම්, නියඟ, සුළි සුළං ඇති වීම, වෙරළ බාදනය ආදියෙහි සැලකිය යුතු විපර්යාසයන් සිදුවිය හැකි යැයි විශ්වාස කෙරේ. එමෙන්ම මානව ක්‍රියාවලීන් නිසා වායුගෝලයට එකතු වන හරිතාගාර වායූන් නිසා වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමෙන් දැනටමත් අපි පාරිසරික වෙනස්කම් රාශියකට මුහුණදී සිටින්නෙමු.

ස්වභාවික විවිධ දේශගුණික හේතු සාධක යටතේ පෘථිවියේ දේශගුණය වෙනස් විය හැක. වැඩිවෙමින් පවතින සූර්ය තාපය, වායු ගෝලීය සංයුතීන් වෙනස් වීම්, භූමිය සැකැස්ම හා සාගර ද්‍රෝණිවල ක්‍රියාකාරිත්වය, හිරු ලප ක්‍රියාකාරිත්වය, ගිනි කඳු පිපිරීම, එල්නිනෝ (EL-NINO) ලානිනෝ (LA-NINO) ක්‍රියාවලි පසුගිය වකවානුවල පෘථිවියේ දේශගුණික වෙනස්වීම් ඇති කිරීම කෙරෙහි දායක වූ සංසිද්ධීන්ය.

දේශගුණික විපර්යාසයන් තීව්‍ර කිරීම සඳහා සංවර්ධිත රටවල් කරනු ලබන බලපෑම විශාල වුවද ඉන් සිදුවන අයහපත් බලපෑමට වැඩිවශයෙන් මුහුණ දෙනුයේ සංවර්ධනය වෙමින් පවතින රටවල්ය. 2010 වන විට සාමාන්‍ය වායුගෝලීය උෂ්ණත්වය සෙල්සියස් අංශක 1.4 - 5.8 දක්වා ඉහළ යන අතරම වාතයේ ඇති කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රණය මිලියනයකට කොටස් 370 සිට මිලියනයකට කොටස් 540 - 970 දක්වා වැඩි විය හැකි බව දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (Intergovernmental Panel on Climate Change-IPCC) තෙවන ඇගයීම් වාර්තාව මඟින් පෙන්වා දී තිබේ. සිව්වන තත්ත්ව වාර්තාවට අනුව 2100 වන විට සෙල්සියස් අංශක 1.8 - 4.0 අතර වූ ප්‍රමාණයකින් උෂ්ණත්වය වැඩි වීමට හාජනය විය හැකි බව IPCC විසින් දේශගුණික විපර්යාස නිසා ඇතිවන පාරිසරික අර්බුද පිළිබඳ පූර්ව අනාවැකි පලකර ඇත.

මේ ආකාරයට වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමට කාර්මිකරණයත් සමඟ වායුගෝලයට එකතුවන හරිතාගාර වායු සාන්ද්‍රණය, එහි සමතුලිත මට්ටම ඉක්මවීමට පටන් ගැනීම හේතු වේ. මේ අතර කාබන්ඩයොක්සයිඩ්, මීතේන්, නයිට්‍රස් ඔක්සයිඩ්, ක්ලෝරෝ ෆ්ලූවොරින් කාබන් CFC-11, ක්ලොරෝ ෆ්ලූවොරින් කාබන් CFC-12 ආදී වායු වර්ග කිහිපයක් මේ සඳහා මූලික වශයෙන් දායක වේ.

වායු ගෝලය තුළ උණුසුම වැඩි වීම නිසා විසිවන ශත වර්ෂය තුළදී නිරීක්ෂණය කළ හැකි වූ දේශගුණික විපර්යාස මෙසේය.

- ජල චක්‍රය වේගවත් වීම හා උත්තර අර්ධගෝලයේ මධ්‍යම හා උස් අක්ෂාංශවල වර්ෂාපතනය දශකයකට 0.5-1.0% දක්වා වර්ධනය වීම.
- ආසියාවේ හා අප්‍රිකාවේ සමහර කොටස් වල මෑත දශකයේ දැඩි නියං තත්ත්ව ඇති වීම.
- උප නිවර්තන ප්‍රදේශවල දශකයකට 0.3% කින් වර්ෂාපතනය අඩු වීම.

උෂ්ණත්වය අධික වීමත් සමඟ සාගර ජලය රත් වී විශාල වන අතර මුහුදු මට්ටම ඉහළ ගොස් මාලදිවයින්, මාෂල් දූපත්, කිරිබාති හා ටොන්ගා වැනි දූපත් රාජ්‍යයන් ජලයෙන් යටවනු ඇත. වර්ෂ 2030 වන විට සෙ. මී 20 කින් පමණද මීළඟ ශතවර්ෂය අවසන් වන විට සෙ.මී. 65 කින් පමණද ලෝකයේ සාගර ජල මට්ටම් ඉහළ නැගිය හැකි බව දේශගුණික විද්‍යාඥයන් පෙන්වා දී තිබේ. උෂ්ණත්වය ඉහළ යාම හේතුවෙන් ඇති වූ දේශගුණික විපර්යාස ඇන්ටාක්ටික්, ආක්ටික් වැනි අයිස් තලාවන් කෙරේ ඇති කරනුයේ සෘණාත්මක බලපෑමකි.

මේ අනුව දේශගුණික වෙනස්වීම් හේතුවෙන් ඇන්ටාක්ටික්, ආක්ටික් වැනි අයිස් තලාවන් සම්පූර්ණයෙන් දියවීමට පත් වුවහොත් මුහුදු මට්ටම මීටර් 7.4 කින් පමණ ඉහළ යෑමට ඉඩ තිබේ. එමෙන්ම උෂ්ණත්වය සෙල්සියස් අංශක 6 කින් පමණ ඉහළ යෑමද මෙම අයිස් තලාවන් දිය වීමට හේතු වේ. මේ නිසා අධි ශීත කලාපයේ ඇති වෙමින් පවතින අසාමාන්‍ය තත්ත්වයන් එම කලාපයේ ජීවත්වන ඇස්කිමෝවරුන් වැනි ජන කණ්ඩායම්වල මිනිසුන්ගේද සතුන්ගේද ජීවන රටාව කෙරෙහි තදින්ම බලපා තිබේ. හිම වලසුන්ට ජීවත් වීම සඳහා දඩයම් කිරීමට ඇති පරිසරය වෙනස් වීමෙන් ආහාර හිඟයක් ඇතිවී තිබේ. එමෙන්ම හිමේ ජීවත්වන සීල් මසුන් වඳ වී යාමත් හේතු කොට ගෙන ඒ ආශ්‍රිතව ජීවත් වන මිනිසුන්ට සීල් මත්ස්‍යය දඩයම දුෂ්කර වී තිබේ.

මුහුදු ජල මට්ටම ඉහළ යෑම පරිසර පද්ධතිවල වෙනස්කම් ඇති කිරීම සඳහා බලපානු ලබයි. වෙරළ බාදනය, වෙරළාශ්‍රිත සියුම් පරිසර පද්ධති බිඳ වැටීම, පෘථිවිය උණුසුම් වීම, කොරල් පර විනාශ වීම, මෝය කලාපවල භූමියේ ලවණතාවය ඉහළ යෑම මුහුදු ජල මට්ටම ඉහළ යෑමෙන් සිදුවන පාරිසරික වෙනස්වීම්වලින් බිඳකි.

පෘථිවිය උණුසුම්වන විට වර්ෂාපතන රටාවන් වෙනස් වේ. ලෝකයේ ඇතැම් පෙදෙස් වියළි කාන්තාර ලක්ෂණ පහළ වීමත් නියඟ ප්‍රදේශයේ සමාජ ආර්ථික පාරිසරික අංශ කෙරෙහි බලපෑම් කිරීමත් අප්‍රිකානු, මධ්‍යයම ආසියානු රටවල් ආශ්‍රයෙන් අඳුනාගත හැකිය. එමෙන්ම අධික වර්ෂාව ඇති වීමෙන් වැසි ජලය පොළොවට උරා ගැනීමෙන් තොරව පිටතට ගලා යාමත්, ගංගා සහ තැනිතලා බිම් වතුරෙන් යට වී පිටාර ගැලීමත් නිසා ගංවතුර තර්ජන ඇතැම් ප්‍රදේශ ආශ්‍රිතව හඳුනාගත හැකි වේ. මෙම තත්ත්වයට හේතුව වායුගෝලීය උණුසම වැඩිවීම නිසා ජල චක්‍රයෙහි සිදුව ඇති වෙනස් වීමිය.

උෂ්ණත්වය ඉහළ යාමේ ප්‍රථිඵලයක් ලෙසින් පෘථිවි පෘෂ්ඨියේ ඇති ජලය වාෂ්ප වී යාම නිසා පෘථිවි වායුගෝලය තුළ අධික සුළං තත්ත්වයන් ඇති වේ. මේ නිසා උණුසුම වැඩිවත්ම ඉතා දරුණු සුළි සුළං තත්ත්ව ඇතිවේ. දේශගුණික සාධකයක් වූ සුළං රටාවේ ඇති වන වෙනස්කම් හේතු කොට ගෙන ඇතැම් ප්‍රදේශවල ගං වතුර තර්ජනද තවත් ප්‍රදේශයකට දිගටම වර්ධනය වන නියඟ තත්ත්වයන්ද මේ නිසා ඇතිවේ.

පෘථිවිය උණුසුම් වීම දේශගුණික පරාමිතීන් කෙරෙහි සෘජුවම බලපානු ලබයි. මෙලෙස ගෝලීය උණුසුම මඟින් ඇති වී ඇති දේශගුණික වෙනස්කම් හේතු කොට ගෙන ලෝකයේ විවිධ පාරිසරික ගැටලු ඇති වී තිබේ. මෙම ගැටලු අතර කාළගුණයේ හා දේශගුණයේ විචල්‍යතා ශාක හා සත්ව ව්‍යාප්තියේ වෙනස් වීම්, අයිස් යායන් දියවීම, මුහුදු මට්ටම ඉහළ යාම, සාගරික ආම්ලික මට්ටම වෙනස් වීම, මැලේරියා ඩෙංගු වැනි රෝග තත්ත්වයන් වර්ධනය වීම කොරල්පර විනාශ වීම, පාංශු ගුණාංගවල ඇතිවන වෙනස්කම් වැනි අර්බුද කැපී පෙනේ.

කෘෂිකාර්මික කටයුතුවල දේශගුණික වෙනස්වීම්වල අහිතකර ප්‍රතිඵල බලපාන්නා සේම කෘෂිකාර්මික කටයුතුවලින් සිදුවන බලපෑම්ද දේශගුණික තත්ත්වයන් වෙනස් කිරීමට හේතුවන බව හඳුනාගෙන ඇත. වායුගෝලයේ උණුසුම වැඩි වීම බෝග වර්ධනයේ විවිධ අවස්ථාවලට බලපායි. එමෙන්ම දේශගුණික විපර්යාස නිසා එක් කලාපයක අස්වැන්න වැඩි වීමටත් තවත් කලාපයක අස්වැන්න අඩු වීමත් හේතු වේ.

දේශගුණික විපර්යාස ජල සම්පත කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකරනු ලබයි. එමඟින් ජල සම්පතේ ප්‍රමාණය හා පසේ තෙතමනය වෙනස්කළ හැකිය. ඒ තුළින් ප්‍රාදේශීය වර්ෂාපතන රටාවේ වෙනස්කම් ඇති වීමෙන් මානව සමාජ ආර්ථික කටයුතු කෙරෙහි මෙන්ම ශාක හා සත්ව ප්‍රජාව කෙරෙහිද වැඩි බලපෑමක් ඇති කරනු ලබයි.

කාබන් තීව්‍ර කිරීම සම්බන්ධයෙන් වනාන්තරවලට හිමිවනුයේ වැදගත් ස්ථානයකි. නමුත් දේශගුණික විපර්යාස හේතුවෙන් ලෝකයේ වනාන්තර බොහොමයක් විනාශ වෙමින් පවතී. සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 01 ට වඩා වැඩි වුවහොත් එය වනාන්තරවල ක්‍රියාකාරිත්වය, සංයුතිය කෙරෙහි බලපානු ලබයි. ඇමරිකාවේ ඇමේසන්, ගිණිකොණදිග ආසියානු වනාන්තරවල උෂ්ණත්වය වැඩිවීමෙන් හා වර්ෂාපතනය අධික වීමෙන් ඒවායේ පැවැත්ම මන්දගාමී වී තිබේ. එමෙන්ම සෞම්‍ය කලාපීය වනාන්තර උෂ්ණත්වය අධික වීමෙන් ලැව්ගිනිවලට හසුවී ඇති අතර බොහෝ වනාන්තර ප්‍රමාණයක් මේ නිසා වාර්ෂිකව විනාශවට ලක් වේ. මෙසේ වනාන්තර ප්‍රමාණය විනාශවට ලක් වීම හේතුවෙන් ඒ ආශ්‍රිත පෙළෙව ප්‍රජාවද දිනෙන් දින විනාශයට පත්වනු ඇත. 2080 වන විට යුරෝපීය කලාපයේ ශාකවලින් 40% ක්ද 2085 වන විට අප්‍රිකානු වනාන්තරවලින් 25% ක්ද විනාශවන බවට ගණන් බලා තිබේ. ගෝලීය උණුසුම හේතුවෙන් ඇති වී පවතින දේශගුණික විපර්යාසයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විටත් ලෝකයේ විවිධ රටවල් විවිධ අර්බුදවලට මුහුණ පා ඇති අතර යුරෝපා රටවල් මුහුණ පා ඇති ප්‍රධානතම ගැටලුව වන්නේ ලැව් ගිනි ඇති වීමයි.

යුරෝපය තුළ ලැව් ගිනි හේතුවෙන් ඉතාලිය, ස්පාඤ්ඤය යන රටවල වැඩි හානි සිදුවී ඇත. 2009 මාර්තු මාසයේදී

20 වන පිටුව බලන්න

අද කොළඹ සිට එදා කොළඹට

■ සුගත් විරසූරිය

කොළඹ නැතහොත් කොළොම්පුරය මුලින්ම එතරම්ම පුළුල් නොවූ පටු බිම් කඩෙකට සීමා වී පැවතුණේය. එම සියලු සීමාවන් බිඳ වැටී සුවිසල් බිමක් මෙන් එය පැතිර පළල් වූයේ පෘතුගීසීන් පමණක් නොව ඕලන්ද කාරයන් හා බ්‍රිතාන්‍යයන් හෙවත් ඉංග්‍රීසි ජාතිකයන්ද නිසාය. එනම් මෙම විදේශිකයෝ පමණක් නොව අරාබි ජාතිකයෝද අනාදිමත් කාලයක පටන් විවිධ වෙළෙඳාම් කටයුතුවල නිරත වූවෝ ඒ මේ කොළඹ ප්‍රදේශය කේන්ද්‍ර කරගෙනය. මේ ආදි වශයෙන් තම වෙළඳහෙළඳාම් කටයුතු සම්බන්ධයෙන් වූ ආගමන විගමන මධ්‍යස්ථානය ලෙසින් පමණක් නොව ශ්‍රී ලංකාවේ අග නගරය ලෙසද කොළඹ මෙම සියලු විදේශිකයන්ගේ නොමඳ පිළිගැනීමට ලක් වූයේය.

පෘතුගීසි යුගයෙහි ආරම්භයේ සිට කොළඹ නගරය විමසුමට ලක් කිරීමේදී අපට හමුවන්නේ එය වාස භූමිය කොටගෙන ජීවත් වූ මේ ජාතීන් අතළොස්ස පමණක් නොවේ. බෙංගාල ජාතිකයන්, බර්මර් ජාතිකයන් මෙන්ම කොරමණ්ඩල් හා ඈත මලබාර් වෙරළබඩ ප්‍රදේශවලින් පැමිණියෝද ඒ අනුව එදා එතරම් සංකීර්ණ සෙයක් නොදැරූ මේ කාර්ය බහුල වෙළෙඳ නගරය වාස භූමිය කොටගෙන සිටියෝය. සිංහල ධීවර මිනිසුන් අතරේම නොයෙකුත් වෙළඳහෙළඳාම් කටයුතුවල නිරතවීමට තරම් මොවුහු කාර්යශූර වූහ. ඉක්මන් හා කඩිසර බවෙකින්ද යුතු වූවෝය.

බංගසාල

පිම්බුණු චප්කානාවලින්ද පිජාමා සරොම්වලින්ද සැරසී මොවුන් මෙසේ කාර්යබහුල ජීවිතයක නිරත වී සිටින අතරතුරදී පෘතුගීසිහු ප්‍රථමවරට ශ්‍රී ලංකාවට ගොඩබටහ. ඒ ක්‍රිස්තු වර්ෂයේ එක්තරා දිනෙකදීය. එදා කොළඹ නිරිතදිග දිය කඩනය අසලට මෙසේ පැමිණි ඔවුන්ට එක්වරම දිස් වී පෙනුණේ පුළුල් ලෙස විහිදී ගිය කොළඹ වරායයි. එදා මේ වරාය වටා දක්නට ලැබුණේ තරමක් ලොකු නිල්වන් පැහැයෙන් බැබළුණු වනාන්තර පෙදෙසකි. මෙම පුංචි වන රොද වටා අතොරක් නැතිව විහිදි පැතිරී තිබුණු පොල් අතුවලින් අලංකාර ලෙස සකස් කළ පුංචි පුංචි ගබඩා කාමර රාශිය ඈතට දෘෂ්‍යමාන වී පෙනිණ. මෙම ගබඩා කාමර එදා හැඳින් වූයේ 'බංගසාල' යන නමිනි.

විවිධ විදේශයන්ගෙන් කොළඹට ගෙන ආ බෝට්ටුවලින් නිතර බෑ වෙළෙඳ ද්‍රව්‍ය ගබඩා කර තැබුයේ මෙකී බංගසාල නැතහොත් ගබඩා කාමර තුළය. බංගසාලවලට උතුරු දිගින් එකල අලංකාරතම නදී සුරංගනාවක් වූ කැලණි ගඟ දිය කොමළිය ගුළු ගුළු හඬින් මහ මුහුදු වෙත හෙමි හෙමින් ගලා ආවේය. එක නියං සමයෙක ඇඟපත වැහැරීගිය මැහැල්ලකගේ ඉබි ගමනින් මුහුදට ගලා ආ මේ ගඟ දිය කොමළිය මහ වැසි වැටුණු තවත් දිනයෙක ඇත්තෙන්ම පළ කළේ ඉමහත් වූ චණ්ඩ සැටියකි. මෙලෙස වරින් වර නොයෙක් ස්වරයෙන් ගලා ගිය කැලණි ගංගාවෙහි ගංගා මෝය අසලම එදාත් දුප්පතුන්ගේ පැල්පත් ගොන්න පිහිටා තිබුණේය.

එක්දහස් පන්සිය පහ වසරේ පෘතුගීසීන් පැමිණෙන විට මෙවැනි පාරිසරික පසුබිමෙකින් යුත් කොළඹ පිහිටියේ එකම එක ප්‍රධාන වීදියකි. මෙයද අප පෙර කී බඩු ගබඩාවල නමින්ම හැඳින් වූ අතර ඒ අනුව එකල කවුරුන් වුවද මේ විදියට ව්‍යවහාර කළේ 'බංගසාල වීදිය' යන්නයි. බංගසාල වීදියෙන් පටන් ගැනුණු කෙටි පටු මාවත් කොළඹ නගරයේ විවිධ ස්ථාන තෙක් විහිදී තිබුණේය.

රියෝ ඩිරෙක්ටෝ

කෙළවරක් නැතිව ඝෝෂා කරමින් එක පෙළට ඇදී යන නානාප්‍රකාර රථවාහන තොගයෙන් තොර වූ විටෙක සෘජුව නොපෙනෙන පීත්ත පටියක් සේ අද දිස්වන කොටුවේ සිට පිටකොටුව තෙක් දිවෙන කෙලින්වීදිය එදා පෘතුගීසි යුගයේ හැඳින්වූයේ 'රියෝ ඩිරෙක්ටෝ' වීදිය යනුවෙනි.

දහසය වැනි සියවසට අයත් කොරින්තීය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිකළ අති අලංකාර වූ දේවස්ථානයක් මෙම රියෝ ඩිරෙක්ටෝ වීදියට නුදුරෙන් පිහිටි අයුරු එදා ජීවත්ව සිටියකුට ඇතැම් විට අදත් සිහිවන්නට බැරි නැත. එදා කොළඹ නගර සභා ශාලාව පිහිටියේද මේ දේවස්ථානය ඉදිරිපිටය. මෙයටත් ළංව පිහිටි පුරාණතම ගොතික් ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ගොඩනංවා තිබූ සාන්ත ඩොමිනික් පල්ලියේ ආරුක්කු ගල් කැටයමක එක පුවරුවක් පමණක් අද කොළඹ ජාතික කෞතුකාගාරයේ ශෛලමය කෞතුක භාණ්ඩ අංශයෙහි තැන්පත් වී හිඳ නිහඬවම එහෙත් දුර ඈත අතීතයක තොරතුරු ප්‍රතිරාවය කරයි.

කළුකොටුව

පරංගි නැතහොත් පෘතුගීසී අවධියේම පැරැණි කොළඹ නගරය ආශ්‍රිතව ඉදිකළ 'කළුකොටුව' ලෙස පතලව තිබුණේ පෘතුගීසීන් ස්වකීය අසීමිත බල පරාක්‍රමය පෙන්වන්නට ලක්දිව මුලින්ම ගොඩනැඟූ බලකොටුවයි. සාන්ත ලෝරන්ස්ගේ පල්ලිය යනුවෙන්ද ව්‍යවහාර කළ මේ බලකොටුව ඇතුළේම එක තැනෙක පෘතුගීසීන් මෙරට මුලින්ම තැනූ දෙවිමැඳුරද පිහිටා තිබුණේය. වර්තමාන කොටුව හා පිටකොටුව ප්‍රදේශ ආවරණය වන පරිද්දෙන් එදවස පරංගීන් නිම කළ බලකොටු බැම්මට වැඩි වශයෙන් උපයෝගි කර ගැනුණේ කළු ගල් සහ හුණු බදාමයි. මෙය වටා දිය අගලක් හා තවත් ශක්තිමත් තාප්පයක්ද වූ අතර රෝහල්, කන්‍යාරාම, අධ්‍යාපනික මධ්‍යස්ථාන මෙන්ම තවත් ගෘහාංග ගණනාවක්මද මේ බලකොටු බැම්ම ආශ්‍රිතව පැවතියේය.

පූර්තෙ රෙයිනා

කොළඹ නගරයේ ඉහේ කෙස් ගණනින් කරක් ගැසූවකුට එහි වූ පැරැණි ඔරලෝසු කණුව අමුතු ස්මාරකයක් නොවනු ඇත. එකල ඔගස්ටීන් පල්ලිය පිහිටා තිබුණේ මෙතැනය.

සිංහලේ ප්‍රකට කෙටිකතාකරුවකු වන ජී. බී. සේනානායකයන්ගේ දුප්පතුන් නැති ලෝකය නමැති කෙටි කතා සංග්‍රහයෙහි එන 'කලහය' කෙටි කතාව ඔබට මතකද? ඒ කෙටි කතාව පටන් ගන්නේ කොළඹ 'කයිමන් දොරකඩ' හඳිසියේම නැවතූ ට්‍රෑම් රථයකින්ය. මෙම කයිමන් දොරකඩ යනු පරංගි සමයේ කොළඹ නගරයෙන් පිටතට යෑමට තිබූ එකම ප්‍රධාන ගේට්ටුවයි.

මෙය වනාහී එදා පෘතුගීසීන් නිර්මාණය කළ බලකොටුවේ නැගෙනහිර කොටු බැම්ම යටින් හාරා සැකසූ උමං මාර්ගයෙහි අති විශාලතම දොරටුවද විය. මෙයට ඇතුළු විය හැකි වූයේ ශාන්ත ජෝන් ගංගාව හරහා නිමවා තිබූ ඉහළට එසවිය හැකි වූ පාලමකිනිය. 'පූර්තෙ රෙයිනා' යනුවෙන් පෘතුගීසීන් හැඳින් වූ මෙය කයිමන් දොරටුව නමින් හැඳින්වූයේ නාගරික කුණු රොඩු ගිල දමන්නට මේ අසලට එක ඉත්තට රොක්වුණු කිඹුලන් හේතුවෙනි. 'කයිමන්' යනු කිඹුලන්ට කී තවත් නමකි. මහනුවර කඳුකර කඩවතක් තෙක් මෙම දොරටුව දිව ගියේය.

කුඩා වැවකින් වටවුණු අද දක්නට ලැබෙන කොළඹ ලේක්හවුස් ගොඩනැඟිල්ල තිබෙන තැන එදා තිබුණේ පෘතුගීසීන්ගේ ප්‍රධාන වෙඩි බෙහෙත් ගබඩාවයි.

කොළඹ ජන ජීවිතය

කෙසේ වෙතුදු මේ පාරිසරික පසුබිම මතින් ගොඩනැඟුණු පෘතුගීසී යුගයේ කොළඹ ජන ජීවිතයද බටහිර අධිරාජ්‍යවාදීත්වයේ පහස නොඅඩුව ලැබූ අමුතුම එකක් විය. බටහිර සොල්දාදුවන් ඇතුළු අනෙකුත් අවශේෂ ජන ජීවිත රාශිය කෙරෙන්ම නිරතුරුව පිළිබිඹු වී පෙනුණේ අසීමිත විනෝදකාමීත්වයයි. එසේම රළු පරළු බව හා ඝෝෂාවයි.

පෘතුගීසීන්ගෙන් පසුව කොළඹ නගරය හා ඒ ආශ්‍රිත වෙරළබඩ ප්‍රදේශ අත්පත් කර ගත්තේ ඕලන්දකාරයන් හෙවත් ලන්දේසීන්ය. ක්‍රිස්තු වර්ෂ 1656 න් ආරම්භ වූ මෙම කොළඹ යුගය ක්‍රිස්තු වර්ෂ 1796 පමණ වන තෙක් පැවතිණි. දෙවන රාජසිංහ රජතුමා මෙකල කන්ද උඩරට සිහසුන අරා සිටියේය. මේ වනතෙක්ම කොළඹ ආධිපත්‍යය තහවුරු කරගෙන සිටි පෘතුගීසීන්ගේ බලය මුලිනුදුරා දැමීමට රජු මේ වනවිටත් ලන්දේසීන්ගේ බලය ලබා ගැනීමට ඉටාගෙන තිබිණි. එහෙත් රජුගේ එම සිතුම් එලෙසින්ම ඉටු සිදුවූයේ නැත. ඒ වෙනුවට රජුට සිදුවූයේ 'ඉඟුරු දී මිරිස්ගත්තා' වැනි සිදුවීමකට මුහුණ දෙන්නටය. ක්‍රිස්තු වර්ෂ 1640 පමණ වන විට පෘතුගීසී බලය යටපත් කර කොළඹ හා නිරිත දිග වෙරළේ සෙසු බලකොටු රැසකම පාහේ ලන්දේසිහු බලය තහවුරු කර ගෙන සිටියහ. රාජසිංහ රජු මේ පිළිබඳ කෝපයෙන් පසු වූ අතර ලන්දේසීන් රජුට පවසා තිබුණේ රජුට සහාය පළ කළ පෘතුගීසීන් එළවීමට තමන් කළ යුද්ධයේ ණයට හිලව් ලෙස මෙම කොළඹ ආශ්‍රිත ප්‍රදේශයේ රැඳී සිටින බවයි.

ලන්දේසි යුගයේ කොළඹ

මේ අයුරින් ආරම්භ වූ ලන්දේසි පාලන සමයේ කොළඹ නගරයේ උතුරු, දකුණු හා නැගෙනහිර දිශාවන්හි සුලභ වශයෙන් දක්නට ලැබුණේ ඝන සැරේට වැඩුණු තුරුලතාවන්ගෙන් ගහන කැළෑවන්ය. මෙම කැළෑ අතර ගම්මාන සේම ඒ ආශ්‍රිත වගා බිම්ද දක්නට ලැබිණ. විශේෂයෙන් දහ අට වැනි සියවසට අයත් මුල්භාග

20 වන පිටුව බලන්න



නිශ්ශබ්ද නාව

ක්‍රිෂ්ණමූර්තීන් ගේ (The only Revolution) නමැති කෘතිය ඇසුරෙනි.

■ පරිවර්තනය
ආරියරත්න විජයසිංහ

භාවනාව වූ කලී නැවුම් ස්වභාවය නිරාවරණය වීමය. නැවුම් ස්වභාවය පිහිටියේ නැවත නැවතත් මතු වන අතීතයෙන් ඔබ්බෙහිය. එනම් එය අතික්‍රමණය කොට ගැනුණු තැනය. මේ පුනරාවර්තනයෙහි නිමාව යනු භාවනාවය.

එසේම භාවනාව හේතු කොට ගෙන සියල්ල නැසෙන සුලු වූ විටය නැවුම් ස්වභාවය එලෙසින්ම පවතිනුයේ. නැවුම් බව සිතුවිලි ඇසුරින් පවතින දෙයක් නොවේ. භාවනාව වනාහි සිතුවිලි නිහඬ වීමය. එසේම භාවනාව යනු කිසියම් මුදුන් පමුණුවා ගැනීමක් හෝ දෘෂ්ටියක් හසු කර ගැනීමක් හෝ නොවේ. එය හැඟීම් කුළු ගැන්වීමක්ද නොවේ. ඒ වනාහි පාලනය කර ගැනීමක් අවශ්‍ය නොවෙමින් යුහුසුලුව ගලා බස්නා මහා ජල ප්‍රවාහයක් බඳුය. එය නාදයෙන් වියුක්ත සංගීතයය. එය පුරුදු පුහුණු කොට වැඩට ගත නොහැකිය. නිරීක්ෂණය කරන්නා අතුරුදන්ව ගොස් ඇත්තේ එහි ආරම්භයේදීමය. භාවනාව වූ කලී නිහැඩියාවය.

තවමත් එළිය වැටී නැත. තුරු පතර අතරින් දිස්වනුයේ පහන් තරුවය. අවට පැවැති නිහැඬියාව අතිශයින්ම අසාමාන්‍ය වූවකි. ඒ වනාහි කිසියම් ශබ්ද දෙකක් අතර හෝ ස්වර දෙකක් අතර හෝ පවතින නිහැඬියාව නොවේ.

කිසිදු හේතු ප්‍රත්‍යයකින් තොරව ඇති වූ එය ලෝකාරම්භයේදී පැවැති නිහැඬියාව විය යුතුය. එය පිරී ඉතිරී ගොස් අවට කඳු වැටි හා මිටියාවත පුරා පැතිර ගොස් තිබිණ. විශාල බකමුහුණෝ දෙදෙනෙක් උනුත් වෙත මුමුණමින් සිටිති. එහෙත් නිහැඩියාවට එයින් කිසි විටෙකත් අවහිරයක් නොවීය. බොහෝ ඈතින් ඇසෙන බල්ලකුගේ උඩුබුරලන හඬද මේ අනන්ත වූ අප්‍රමාණයෙහිම කොටසක් වී තිබිණ. ඌ බැස යන සඳ මඬල වෙත බුරමින් සිටියේය. අවට පින්නෙන් බර වෙයි. හිමිදිරි උදෑසන කඳුවැටිය මුදුනින් හිරු උදාවෙත්ම අරුණලු හා මුසු වූ පිනි බිඳු නන් පැහැයෙන් දිලිහෙන්නට විය. සැබැවින්ම එය චමත්කාරජනකය.

මුදු මොළොක් පතින් ගැවසුණු ජැකරන්ඩා ගසද පිනි දියෙන් බර වී ඇත. එහි ඇදී එන නොයෙකුත් කුරුල්ලෝ තටු සලමින් පත් මත පිනි බිඳු ඇඟ පත තවරා ගනිති. කපුටුවෝ එක තැනක රැඳී නොසිටිති.

උහු අත්තෙන් අත්තට පනිතිත කොළ'තරින් එබිකම් කරති. තටු ගසමින් තුඩගින් පිහාටු පීරති. එහි එක් විශාල අත්තක් මත උන් හත්අට දෙනකුම ලැග සිටි අතර තවත් බොහෝ කුරුල්ලෝද පිනි දිය නහමින් ගස පුරා විසිර සිටියහ.

මේ වන විට පෙනී ගියේ අවට පැතිරෙමින් තිබූ නිහැඬියාව කඳු වැටියෙන් ඔබ්බටද ගමන් කරන්නාක් මෙනි. කුඩා ළමයින්ගේ සුපුරුදු කෑ කෝ ගැසීම් හා සිනා හඬ ඇසේ. ගෙදර දොර හා වතුපිටිවල දවසේ වැඩ කටයුතු ආරම්භ වෙමින් තිබිණ.

සිහිල් කාලගුණයක් පවතින දවසක ලකුණු පහල වෙයි. කඳු ගැට මතුයෙහි හිරු එළිය පතිත ව ඇත. ඒ කඳු ගැට බෙහෙවින්ම පැරැණිය. ඇතැම් විට ලොව ඉතාමත්ම
පැරැණි කඳු වැටි විය හැකිය.

කිසිදු හැඩයකට නැති එහි ගල් පරුවත එක පිට එක සමබර ව පිහිටා තිබුණේ මහත් පරිශ්‍රමයකින් හා සැලැකිල්ලකින් යුතුව කරන ලද කටයුත්තක් ලෙසිනි. එහෙත් සුළං පහරකින් හෝ අතකින් තල්ලු කොට හෝ එහි සමබරතාව බිඳිය නො හැකි විය.

ඒ වූ කලී නගරාශ්‍රයෙන් බොහෝ ඈත පිහිටි මිටියාවතකි. මිටියාවත හරහා දිවෙන මාවත වැටෙනුයේ තවත් ගම්බද පෙදෙසකටය. මාවත රළුය. වළ ගොඩැලි සහිතය. එහෙයින් ඈත අතීතයේ සිටම පැවැති නිශ්චලත්වයට හානියක් වනු පිණිස මෝටර් රථ හෝ බස් රථ හෝ එහි නැත.

ඉඳ හිට ගමන් කරන ගොන් බැඳි කරත්තද අවට කඳු යාය හා බැඳී වෙලී එහිම කොටසක්ව තිබිණ. පත්ලටම සිඳී ගිය ගංගාවෙහිද ජලය පිරී ඉතිරී ගලා බැස යනුයේ නොකඩවා ඇද හැළෙන මහ වැසිවලින් අනතුරුව පමණකි.

එවිට රතු, කහ සහ දුඹුරු මුසු පැහැයකට හැරෙන එහි මහා ජල කඳ කෙනකුට පෙනෙන්නේ කඳුකරයත් සමඟම ඇදී ගෙන යන්නාක් මෙනි. එහි ගැමියෝද ගල් පරුවත වැනිය. ඔවුහු නිහඬවම ගමන් බිමන් යති.

දවස ගෙවී යයි. පෑල දිග කඳු ගැට පිටුපසින් මළ හිරු බැස යත්ම බිම් කරුවල වැටෙමින් තිබිණ. එවේලෙහි බොහෝ දුර සිට කඳු මුදුනින් මතු වුණු නිහැඩියාව තුරු වදුලු අතරින් මෑත්ව, අවට කුඩා බිම් පඳුරුද පැරැණි මහා නුග රුක්ද වසාගෙන පැතිරිණ. අහසෙහි තාරකා දීප්තියෙන් වැඩි වෙත්ම නිහැඩියාවද දැරිය නො හැකි තරම් විය. එය එතරම්ම ප්‍රබලය.

මේ වන විට ගෙවල දැල්වෙමින් තිබූ කුප්පි ලාම්පු නිවා දමා තිබිණි. අනතුරුව එළැඹෙන නින්දත් සමග ඇති වූ නිහැඩියාව වූ කලී වඩාත් තියුණු වූවකි. එහි ගම්භීරත්වයද, පෘථුලත්වයද අති මහත්ය.

එසේම එයින් මතු වෙමින් තිබූ බල මහිමයද ඇදහිය නොහැකි තරම් විය. අවට කඳු ගැට පවා නිසලය. එයින් නික්මෙන හීන් කෙඳිරිලි හා ඉඟි බිඟි කිරීම්ද දැන් නැවතී ඇති බැවිනි. ඔවුන්ගේ මහා බර හෑල්ලු වී ගියා සේය.

නිහැඬියාවෙහි ස්වභාවය විවිධය. ශබ්ද දෙකක් අතරද ස්වර දෙකක් අතරද පවතිනුයේ නිහැඬියාවය. එසේම සිතුවිලි දෙකක් අතර තුර වූ විරාමය තුළ මතු වනුයේ බෙහෙවින් පුළුල් වන නිහැඬියාවකි.

හිරු අවරට යන සැඳෑ කාලයක ඈත එපිට පිටිසර ගම්මානයක එන නිහැඬියාව වනාහි ඊටම ආවේණික වූවකි. එය හෙමින් සීරුවේම අවට පැතිර යයි. ඈතින් ඇසෙන බල්ලකු බුරන හඬෙහිද බෙහෙවින් දුර්ග වූ බෑවුමක ඉහළට ඇදෙන දුම්රියක නළා හඬෙහිද ගැබ් වී තිබෙනුයේ නිහැඬියාවය. ගෙදරක සියල්ලන්ම නින්දට ගිය පසු ගෙතුළද පවතිනුයේ නිහැඬියාවය.

තවද ඒ නිහැඬියාවෙන් මතු වන පෙර නො වූ විරූ අර්ථවත් බව දැනෙනුයේ මැදියම් රැයෙහි අවදිව මිටියාවත දෙසින් එන බකමුහුණකුගේ හඬට සවන් යොමු කරගෙන සිටින විටය.

එසේම උගේ සහකාරියගේ පිළිතුරු හඬ එන්නට පෙරාතුව ඇත්තේද ඒ නිහැඬියාවය. ගරා වැටී පාළුවට ගිය පැරැණි නිවසකද මහා කඳු මුදුනකද ඇත්තේ නිහැඬියාවය. මිනිසුන් දෙදෙනකු එකම දෙයක් දැක ඇති විටත්, එකම දෙයක් ගැන හැඟීම් ඇතිව සිටින විටත්, ඒ පිළිබඳව කටයුතු කොට තිබෙන විටත් ඔවු'නතර ද ඇත්තේ නිහැඬියාවය.

කිසියම් ශබ්දයක හෝ සිතිවිල්ලක හෝ තාවකාලික අත්දැකීමක හෝ පහස කිසිවිටෙකත් නොලද සිතෙහිද පවතිනුයේ නිහැඬියාවය. මේ නිහැඬියාව අහිංසකය. අව්‍යාජය. එහෙයින් එහි කෙළවරක්ද නැත්තේය. සිත නිහඬ වූ විට හැම ක්‍රියාවකම මතු වනුයේ ඒ නිහැඬියාවෙනි. තවද ඒ ක්‍රියාව අවුලකට හෝ දොම්නසකට හේතු වන්නේද නැත.

භාවනාවෙහි පිළිපන් සිත මුළුමනින්ම නිහඬ වූවකි. ඒ වනාහි මිනිසා නිරතුරු සොයා යන ආශීර්වාදයය. නිහැඬියාවම ආවේණික වූ හැම ගති ස්වභාවයක්ම පවතිනුයේද මේ නිහැඬියාවෙහිය.

සංචාරකයන්ගේ හා වන්දනාකරුවන්ගේ ඝෝෂාවෙන් තොර වූ ඈත පිටිසර පන්සලක හෝ පාළුවට ඇරුණු දෙව් මැඳුරක හෝ පවතින නිහැඬියාව නුහුරුය. නුපුරුදුය. එසේම මහා ගංගාවක දිය මතු පිට රැඳුණු නිහැඬියාව වූ කලි අතිශයින්ම බරපතළ වූවකි. එය පිහිටියේ සිතෙහි නිහැඬියාවෙන් පිටතය.

නිහැඬියාවෙහි පවතින විවිධ වූ මේ සියලු වෙනස්කම් හා ඇවතුම් පැවතුම් අන්තර්ගත වනුයේ භාවනානුයෝගී වූ සිතෙහිය. සැබෑ ආගමික සිත වූ කලී සිතෙහි පවතින මේ නිහැඬියාවය.

එසේම උත්තරීතර වූ දේවත්වයෙහි ලා ගැනෙනුයේද මිහි මතු පිට පවතින මේ නිහැඬියාවය. භාවනාත්මක සිත වූ කලී මේ නිහැඬියාව ඇසුරු කොට ගෙනම මතු වන්නකි. ඒ හැර කරුණාව හා දයාවද මේ සිතටම ආවේණික වූවකි. නිරාමිස වූ සතුට සැනසුම ඇත්තේද මේ නිහැඬියාවෙහිය.

"පළමුවෙන්ම මා කැමතියි නිත්‍ය වූ පැවැත්මක් තිබෙනවාදැයි කියා දැනගන්නට. මරණින් පසුවද නොසිඳී පවත්නා මේ ස්වභාවය 'ආත්මය' නැතහොත් 'ප්‍රාණය' යන ඔබතුමා කැමැති කවර නමකින් හැඳින්වුවද කම් නැත. සැබැවින්ම මේ කියන නිත්‍ය වූ පැවැත්මක් මා තුළ තිබෙනවා ද?"

නිත්‍ය වූ ස්වභාවයක් ගැන කතා බහ කරන විට ඉන් අදහස් වනුයේ, එය වටා සිදු වන නිරන්තර වෙනස්වීම්, අත් දැකීම් හා සිත් තැවුල්, දුක් ගැහැට හා ක්‍රෑරකම් යනාදිය සිදුවන අතරතුරදීත් අවිච්ඡින්න වූ යම් කිසිවක් දිගටම පවතින බව නොවේද? සියල්ලට පළමුව මතුවන ගැටලුව නම්, ඒ ස්වභාවය හෙළිදරව් කර ගත හැක්කේ කෙසේද යනුයි.

සිතීමෙන් හෝ වචන මඟින් හෝ එය වටහා ගත හැකිද? නිත්‍ය වූවක් අනිත්‍ය වූ දෙයකින් අනාවරණය කර ගත හැකිද? නොවෙනස්ව පවතින දෙයක් නිරතුරුව වෙනස් වන දෙයකින් එනම්, සිතීමෙන් අවබෝධ කර ගත හැකිද? කිසියම් සංකල්පයකට 'ආත්මය' හෝ 'ප්‍රාණය' හෝ යනුවෙන් නිත්‍ය ස්වභාවයක් ආරෝපණය කොට 'මේ වනාහි සත්‍යයකි' යි කියා පෑමට සිතීමට පුළුවන.

මීට හේතුව වනුයේ නිරන්තර වෙනස්වීම ගැන සිතීම බියපත්ව සිටින බැවිනි. එසේම මේ බිය හේතු කොට ගෙන එය සොයා යන්නේද කිසියම් නිත්‍ය වූ ස්වභාවයකි. මිනිසුන් අතර නිත්‍ය සබඳතාවකි. නිත්‍ය ආදරයකි.

සිතීමම අනිත්‍යය. වෙනස් වන සුලුය. එබැවින් සිතීමෙන් යමක් නිත්‍ය වූවක් ලෙස නිර්මාණය කැරෙයි නම් එය සිතීම මෙන්ම අනිත්‍ය වන්නේය. සිතීමෙන් ජීවිත කාලය පුරාම කිසියම් මතයක එල්බ ගෙන සිටිය හැකිය.

ඒ මතකය ස්ථිර වූවකැයි හඳුන්වා ගත හැකිය. අනතුරුව සිතීමට අවශ්‍ය වනුයේ ඒ මතකය දිගටම පවතින්නේදැයි කියා දැන ගැනීමටය. මතකය නිර්මාණය කොට එයට අවිච්ඡින්නත්වයක් දෙමින්, දවසින් දවස එය සිතෙහි තැන්පත් කොට පෝෂ්‍ය කර ගන්නේද, එය දැඩි ග්‍රහණයෙහි තබා ගෙන සිටින්නේද සිතීමය. මේ වනාහි අති විශාල මුළාවකි. සිතීම පවතිනුයේ කාලය ඇසුරේ බැවිනි.

තමා ඊයේ අත් දුටු දෙයක් අද දවස හා හෙට දවස ඇසුරින් සිහිපත් කරන්නේද සිතීමය. කාලය උපදිනුයේ මේ හේතුවෙනි. මෙලෙස කාලය පිළිබඳ නිත්‍ය ස්වභාවයක්ද, අවසානයෙහි සත්‍ය පසක් කර ගැනීම නමැති සංකල්පයකට

22 වන පිටුව බලන්න

ANTON DHARMASEELAN

MORTGAGE AGENT

Available Till Midnight
Including Weekends & Holidays

CALL ME FIRST
FOR ALL YOUR MORTGAGE NEEDS

PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY

416 704 1200

MAJOR BANKS-BEST RATES

MORTGAGE ALLIANCE
BROKER #10530

පැරිසියේ රවුමක් යමු.....

"පාන් නැත්නම් කේක් කාපල්ලා" කී මේරි ඇන්ටනට් බිසවත් නැපෝලියන් අධිරාජයාත් හමුවන්නට අතීතයට ගිය ගමනක්.....

■ සටහන සහ සේයා රූ
අනුරුද්ධ වැලිගමගේ

ජයග්‍රහණයේ කුලුන - *Arc de Triompe*

මගේ මතකය දිවයන්නේ නැපෝලියන් රූපවාහිනී කතා මාලාව දිගේ. පසුගිය ලිපියේදී අප ලුවර් කෞතුකාගාරයේ නැපෝලියන් ඉතිහාසය බලා ඇවිද ගියේ සුපිරි විලාසිතා පිරි වීදිය දිගේ.

තම යුධ ජයග්‍රහණය සඳහා දායක වූ වීරෝධාර විරුවන් සැමරීම සඳහා නැපෝලියන් ඉදි කළ මේ සුවිසල් ඉදිකිරීමට 1806 - 1836 කාලයේදී ෆ්‍රෑන්ක් මිලියන 9.3 ක් වියදම් වූ බව සඳහන්. යුරෝපයේ බොහෝ රටවල් ප්‍රංශ පාලනයට නතු කරගත් නැපෝලියන් මේ ඉදිකිරීමට මූලික කරගත්තේ රෝමයේ ඇති Arch of Titus නම් ස්මාරකයයි. මීටර් 50 ක් උස මීටර් 45 ක් පළල මේ සුවිසල් ඉදිකිරීම පරිමාණයෙන් රෝමයේ ඇති කුලුන මෙන් තුන් ගුණයකටත් වැඩියි. මෙහි ඇති මනරම් කැටයම් විස්තර ඇතිව බලන්නට නම් දවසකුත් මදි වේවි. එහි ඇති කැටයම් බොහොමයක් යුධ ජයග්‍රහණ සම්බන්ධ වීවායි. යුද්ධවලදී මිය ගිය විරුවන්ගේ නම්, ජය ගත් යුද්ධ පිළිබඳවත් මෙහි කොටා තිබෙනවා. මේ සඳහා දායක වූ නිර්මාණ ශිල්පීන් රැසක් ඉන්නවා. පසුකාලීනව ජනප්‍රිය වූ නාදුනන සොල්දාදුවන්ගේ ස්මාරක සංකල්පයට අනුව මේ කුලුන පතුලේත් වීවැනි ස්මාරකයක් තිබෙනවා. මෙය වටා වටරවුමක් මෙන් වාහන ගමන් ගන්නා බැවින් පසෙකින් ඇති ඇතුළුවීමේ දොරටුවෙන් මෙය කරා යායුතු වෙනවා. රාත්‍රියේදී ආලෝකමත් වූ විට මෙය වඩාත් ප්‍රේමණීය වෙනවා.

ඉඩකඩ සීමා සහිත නිසා අප සඳහන් කරන්නේ ඉතා අල්ප තොරතුරු නිසා ඔබේ ගමන අර්ථවත් සහ ගෙවන මුදලට වටිනාකමක් දෙන එකක් කරගන්නට නම් ගමනට පෙර විස්තර සොයා දැනගෙන යාම හොඳයි. පොදුවේ ගත් විට නොනිදන නගරයක් වන පැරිසිය රාත්‍රියේදී වඩාත් ලස්සන බැවින් ඔබට ඇති කාලය අනුව දහවල විවේක ගෙන හවස් වරුවේ ගමන් ආරම්භ කළොත් මහන්සියකින් තොරව මධ්‍යම රාත්‍රිය වනතුරු එහි සිරි විඳින්නට බැරිවෙන එකක් නැහැ.

සෙයින් නදිය - *River Seine*

කිලෝමීටර 777 දිග සෙයින් නදිය පැරිසියේ බොහෝ සංචාරක කේන්ද්‍රස්ථාන සම්බන්ධ කෙරෙන ප්‍රධාන මාධ්‍යයක්. තැනින් තැන නැවතුම් ඇති 'බටෝබස්' (Batobus) එකක නැගී ලුවර් කෞතුකාගාරයට, අයිෆල් කුලුනට සේම නොට්‍රඩාම් මහ පල්ලියටත් යන්නට පුළුවන්. නැපෝලියන් ප්‍රමුඛ විවිධ ප්‍රංශ පාලකයින් ඉදි කළ කැටයම් සහිත පාලම් සහ ඉදිකිරීම් රැසක් මේ ගමනේදී දැකගන්නට පුළුවන්. රාත්‍රියක කරන බෝට්ටු අවන්හලක ගමන බොහොම ප්‍රේමාන්විත එකක් වනවාට කිසිදු සැකයක් නැහැ.

නොට්‍රඩෑම් මහ පල්ලිය
Notre-Dame Cathedral

ප්‍රංශයේ ප්‍රධාන දේවස්ථානය වන මෙහි ඉතිහාසය වර්ෂ 1163 තරම් ඈතට දිව යනවා. නැපෝලියන් විසින් තමාගේම රාජාභිෂේකය සිදු කල පරිශ්‍රය වන්නේත් මෙයයි. මෙහි උස මීටර් 69 ක් වෙනවා. කලින් කලට කොටසින් කොටස එකතු වූ විශාල සංකීර්ණයක් වන මෙය පැය ගණනාවක් ගත කරන්නට කදිම තැනක්. සුවිසල් කුලුනු, ආලින්ද, දේව ප්‍රතිමා, කැටයම් සහිත පාට පාට වීදුරු පිරුණු දේවස්ථානය තුළත් පරෙවියන්ට කෑම දෙමින් එහි උද්‍යානයේත් පේරාදෙණියේ වල වැනි සැකැස්මක් ඇති එළිමහනේත් ගැවසෙමින් නගරයේ අසිරිය විඳින දහස් සංඛ්‍යාත පිරිසක් මෙහිදී ඔබට දකින්නට පුළුවන්.

ඒ අසලම වීදි ජනාකීර්ණ වී තිබෙන්නේ පැරිසියට ආවේණික වූ රසයන්ගෙන් යුත් අයිස්ක්‍රීම් රස බලන, ප්‍රංශ බේකරි නිෂ්පාදනයක් කමින් කෝපි කෝප්පයක රස බලන ජනයාගෙන්. මේ අද්දරින් ඇති කුඩා පෙට්ටි කඩවල අතින් ඇඳි සිතුවම්වල පටන් බොහෝ සිහිවටන ඔබ එනතුරු බලා ඉන්නවා. ඔබට අවශ්‍ය නම් ඔබේ රුව විනාඩි කිහිපයකින් ඇද දෙන්නට චිත්‍ර ශිල්පීන් පාර දෙපස පුටු තබාගෙන සිටිනු දකින්නට පුළුවන්. ප්‍රංශයටම ආවේණික විවිධ මිශ්‍රණවලින් තැනෙන ක්‍රේප් (crepe) එවෙලේම තනා දෙන අවන්හල් නොට්‍රඩෑම් මහ පල්ලිය අසබඩ පටු මාවත්වල තිබෙනවා. බීර වීදුරුවක්, වයින් වීදුරුවක් තොල ගාන්නට උවමනා නම් ඒ සඳහා විවිධ මට්ටමේ අවන්හල් රැසක් මේ නුදුරේම තිබෙනවා.

ප්‍රංශ විප්ලවය සඳහා පාර කැපෙන්නේ ආර්ථික වශයෙන් පොදු ජනතාව අසරණ වූ කාලයකයි. ලුවී රජ පරපුරෙන් ජනතාවට බලය මාරු වන එම අවස්ථාවේදී "අපට පාන් කෑල්ලක්වත් නැහැ" කියූ ජනතාවට මේරි ඇන්ටනට් බිසව කීවේ "පාන් නැත්නම් කේක් කාපල්ලා" කියායි. 'මේරි ඇන්ටනට්' චිත්‍රපටයට පාදක වන්නේ ඕස්ට්‍රියාවේ සිට පැමිණි නව යොවුන් දැරියක ප්‍රංශයේ කිරුළ හිමි රජුගේ බිසව වන කතාන්තරයයි. එහි වූ මනරම් වර්සායි මැදුර බලන්නට කාලයක් තිස්සේ බලා සිටි අපට මේ ගමනේදී ඊට ඉඩ වෙන් කර ගත හැකි වුණා.

වර්සායි මහ මැදුර
The Palace of Versailles

පැරිසියේ සිට කිලෝමීටර 20 ක් පමණ දුරින් පිහිටි 'වර්සායි මහ මැදුර' පැරිස් ගමනේදී අත් නොහැරිය යුතු එකක්. විනාඩි 20 ක පමණ දුම්රිය ගමනකින් පසු අපට වර්සායි මහ මැදුර ඇති ඉසව්වට යා හැකි වුණා. ඉතා ජනාකීර්ණ සංචාරක කේන්ද්‍රස්ථානයක් වන මෙහි ප්‍රධාන රජ මාළිගාව බලන්නට ඉතා දිගු පෝලිමක් ඇති නිසා හැකිතාක් උදැසනින් යාම හොඳයි. පෝලිම දිගු බැවින් අප කළේ සුවිසල් උද්‍යානය සහ පරිවාර මන්දිර බලන්නට යාමයි. එම පරිශ්‍රය ඉතා විශාල බැවින් ඇවිදින්නට අසීරු නම් බයිසිකලයක් කුලියට ගැනීම හෝ ගොල්ෆ් කාරයක සේවය ලබා ගැනීම ගුණදායකයි.

එදා තැනින් තැන සංගීත කණ්ඩායම් රඳවා තිබූ සිංදු කියන මල්වත්තේ අඳ ඒ වෙනුවට ඇත්තේ තැන තැන සඟවා තබා ඇත්තේ ස්ටීරියෝ ශබ්ද පද්ධතියක්. සිත නිවන මියුරු සංගීත නාද අතරින් ඔබට මනස්කාන්ත වතුර මලින් පිරි කැටයම් පිළිම ඇති ජල තටාක දකින්නට පුළුවන්. විවිධ හැඩයට කප්පාදු කළ ගස් වැල් සහ කිරිගරුඬ ප්‍රතිමා එහි ලස්සන තවත් වැඩි කරනවා.

'මේරි ඇන්ටනට්' චිත්‍රපටයේ විස්තර කතා කෙරෙන මේරි ඇන්ටනට් බිසවගේ මාලිගාව, ඕස්ට්‍රියානු ගමක අසිරිය මවන ගොවිපොළ නිවස මෙහිදී අමතක නොකල යුතු තැන්. ප්‍රධාන රජ මාළිගාව දවසක් තරම් බලන්නට දේ ඇති තැනක්. නැපෝලියන් කතා මාලාව මට මැවී පෙනෙනවා. තැනින් තැන ඇති දේ විස්තර කෙරෙන කුඩා ශ්‍රව්‍ය විස්තර කථනය ඔබට ඉතිහාසය මවනවා සිකුරුයි. සේයා රූ කලාව නොදියුණු ඒ කාලයේ මාලිගාවේ සිටි විවිධ චරිත සහ පසුබිම් ඇතුළත් චිත්‍ර විශාල ඉතිහාස කතාවක් කියා පාන බව කිව යුතුයි. මෙහි තිබූ මොනාලීසා චිත්‍රය ඇතුළු බොහෝ දෑ ලුවර් කෞතුකාගාරයට ගෙන ගියත් තවමත් මෙහි ඉතිරිව ඇති දෑ මවන විචිත්‍රත්වය ඉතා ඉහළයි.

පැරිසියේදී දැකිය හැකි තවත් දේ....

කොන්කෝර්ඩ් චතුරශ්‍රය - ***Concorde Square***
බැසිලිකා දේවස්ථානය - ***Sacre-Coeur Basilica***
මොයුලින් නාට්‍ය ශාලාව - ***Moulin Rouge***
පැරිස් ඔපෙරා ශාලාව - ***Palais Garnier***
බැස්ටිල් චතුරශ්‍රය - ***Bastille Square***
ලාෆයෙට් සුපිරි වෙළඳසැල - ***Galeries Lafayette***
පැරිසියේ ඩිස්නිලන්තය - ***Disneyland Paris***

තවත් ගමනක් සමග මීළඟ කලාපයෙන් හමුවෙමු.

විස්තර සඳහා මගේ E-mail ලිපිනයට ලියන්න. ඉඩ ලැබෙන පරිදි පිළිතුරු ලියන්නම්.

anuruddhawe@yahoo.com

බූරුවාගේ වෙස් පෙරළිය

ඒ ලස්සන ගමේ ජීවත් වුණු බොහෝ දෙනෙක් ගොවියන්. හැමෝටම වගේ ගොඩ මඩ ඉඩකඩම් තිබුණා. ඔවුන් ඒවා වගා කරගෙන අගහිඟයක් නැතිව බොහොම සතුටින් සාමයෙන් ජීවත් වුණා.

ඔන්න එක දවසක් මේ ගමට ආගන්තුකයෙත් පැමිණුනා. බූරුවෙකු පිටේ බඩු පොදියකුත් ගැට ගසාගෙන ආව මේ මනුස්සයා ඒ ගමේම නිවසක් තනාගෙන පැළපදියම් වුණා. ඒත් ගමේ අනික් අය වගේ මෙයා ගොවිතැන් කළේ නෑ. එයාගෙ රැකියාව වුණේ හම් පදම් කිරීම. ඒ කියන්නෙ කොටි, වලස්සු, ගෝන්නු, මුවන්, හරක් වගේ මැරුණු සත්තුන්ගේ හම් පදම් කිරීම.

මීට කලින් ඒ ගමේ හම් පදම් කරන්නෙකු සිටියෙ නැති නිසා ගම්මුන් හැමෝම මේ කර්මාන්තය කරන ඒ මිනිසා තමන්ගේ ගමේම නතර වුණු එක ගැන හරියට සතුටු වුණා. මේ පදම් කළ සත්ව හම් ගමේ අයට නොයෙකුත් දේවල්වලදි ප්‍රයෝජනවත් වුණා. සපත්තු හැදීමටත්, ශීත කාලවලදි පෙරවීමටත්, බෙර සෑදීමටත් වගේ නොයෙක් කටයුතුවලදි මේ පදම් කළ හම් ඕන වුණා. ඒවා මිල දී ගැනීමට ගමේ මිනිස්සු හම් පදම් කරන්නා ළඟට ආවා. සල්ලි හිඟ පාඩු අය නොයෙකුත් බඩු භාණ්ඩ ඔහු වෙත ලබා දී හුවමාරු ක්‍රමයටත් හම් මිල දී ගත්තා. සමහර කාලවලදී වැඩිපුර පදම් කරගන්නා හම් බූරුවාගේ පිටේ පටවාගෙන ගොස් අසල ගම්වලට විකිණීමත් මේ මිනිසා විසින් කළා.

මේ හම් ව්‍යාපාරය නිසා ඔහු ළඟ යහමින් මිල මුදල් තිබුණා. ඒත් කොච්චර සල්ලි තිබුණත් මේ හම් පදම් කරන්නා හරිම ලෝභයි. නිතරම අනුන්ගේ වියදමෙන් ජීවත් වීමටයි සිතුවේ. ඔහු කොපමණ ලෝභදැයි කියනවා නම් තමන් ළඟ සිටින තමන්ගේ කර්මාන්තය කරගන්න උපකාර කරන බූරුවාට වත් හොඳහැටි සැලකුවේ කන්න බොන්න දුන්නේ නෑ.

ටික කලක් යන විට කෑම හොයාගෙන එහෙ මෙහෙ ඇවිදිමින් වතු පිටිවල, කුඹුරුවල තිබුණු වගාවන් කන එක බූරුවාගේ පුරුද්දක් වුණා. එකම වේලක් වත් බූරුවාට කන්න දෙන්න ඕන නැති නිසා බූරුවා එහෙම ගිහින් අනුන්ගේ දේවල් කාල හැදෙන එක ගැන හම් පදම් කරන්නා සතුටු වුණා.

ඒත් ගමේ මිනිස්සු මෙය ඉවසුවේ නෑ. තමන්ගේ ගොවිතැන් ආලපාළු කරන එක ගැන ඒ අය හරිම තරහින් හිටියෙ. ඒ නිසා බූරුවාට දුටු තැන තැලීමට ඒ අය පුරුදු වුණා. හුඟක් දවස්වලට බූරුවා අල්ලා ගුටි බැට දෙමින් හම් පදම් කරන්නාගේ ගෙදරටම ගෙනවිත් භාර දී ඔහුටද බැණ අඬගසමින් යාම සිදුවුණා.

බූරුවා ගමේ අයගේ කුඹුරු භවභෝග පාලු කිරීම නිසා ගමේ අය කියන අවලාද දෙස් දෙවොල් දිනෙන් දිනම වැඩි වුවත් හම් පදම් කරන්නා මේ සත්‍රාව බලා කියාගෙන ආහාර සැපයීම සිදුකළේ නෑ. ඒ නිසා බූරුවත් දිනපතාම කුඹුරුවලට බැස ගුටි කෑවා.

දිනක් හම් පදම් කරන්නාට දිවියෙකුගේ හමක් ලැබුණා. එය දැක්ක ගමන්ම හම් පදම් කරන්නාට අපූරු අදහසක් පහළ වුණා. ඔහුට ඉබේම මෙසේ කියවුණා.

"බූරුවටත් කාගෙන්වත් ගුටි නොකා මටත් කාගෙන්වත් බැණුම් නොඅසා සිටීමට ක්‍රමයක් පෑදුණා."

දිවි හමත් අරන් බූරුවා ළඟට ගියා හම් පදම් කරන්නා එය බූරුවාගේ ඇඟ වැසෙන සේ දැමුවා. එසේ කොට ටිකක් ඈතට ගොස් බූරුවා දෙස බැලුවා.

"අප්පේ... මූ නම් දැන් ඇත්තම දිවියෙක් වගේමයි"

ඉන්පස්සෙ දිවි හම බූරු පිට උඩ තිබියදීම බූරුවාව ගම දිහාවට යැව්වා. හෙමින් හෙමින් ගිය බූරුවා පුරුදු විදියටම කුඹුරකට බැහැල කිරි වැදුණු ළපටි ගොයම් කෑමට පටන් ගත්තා.

ටික වෙලාවකින් ඈත නියර දිගේ කුඹුරේ අයිතිකාරයා ආවා. ගොයම් අතරින් සතෙකුගේ සෙළවීමක් දකිද්දී "අදත් මේ බූරුවා ගොයම් කන්න ඇවිත් නේ... හිටපන් හොඳ වැඩක් කරන්නම්" කියමින් ලොකු පොල්ලක්ද රැගෙන කුඹුර පැත්තට ආවා.

ළං වන විටම ඒ නම් බූරුවා නොවෙයි කියා කුඹුරු අයිතිකාරයාට පෙනුණා. තවත් වඩාත් හොඳින් ළං වී බැලූ විට දිවියෙක් කුඹුරට බැස ඇති බව දැක්කා. මේ කුමන විපතක්දැයි සිතාගැනීමට බැරි වූ මිනිසා පණ එපෝ කියා ගම පැත්තට දිව්වා.

වෙනදාට තමා දුටු විට මාරාවේෂයෙන් කඩාපැන තලන මිනිහා අද මෙසේ පැන දිවීම ගැන බූරුවාටත් පුදුමයි. ඒත් ඒ ගැන වැඩිය නොසිතුව බූරුවා සිතේ හැටියට ගොයම් කා අසල දිය කඳුරෙන් දියත් බී නිවසට ගියා.

මේ විදියට දවස් ගණනාවක්ම බූරුවා කුඹුරුවලට පැන ගොයම් කෑවා. ඒ සෑම විටෙකම මිනිස්සු දිවියෙක් යැයි රැවටී පැන දිව්වා.

මෙහෙම කාලයක් ගතවන විට ඉස්සර තමන්ට තලා පෙළා හිරිහැර කළ මිනිස්සු දැන් තමාට බිය වී වෙව්ලන බව බූරුවාටත් දැනුණා. මෙයින් බූරුවා හරියට උඩඟු වුණා.

"මට දැන් හැමෝම බයයි. මම දැන් මොනාටද හැමදාම ගෙදර යන්නෙ. මේ කුඹුරු යාය අසලම කොහේ හරි ලැඟ සිටියා නම් හැම වෙලේම මේ රස කෑම කන්න පුළුවන්"

බූරුවාට එහෙම හිතුණා. ඊට පස්සෙ ඌ ගෙදර ගියේ නෑ.

ඒත් කුඹුරු අයිතිකාරයින්ට මෙය ලොකු හිසරදයක් වුණා. වෙනදාට ටික වේලාවක් සිට කුඹුරෙන් බැස යන දිවියා දැන් කුඹුරේම පදිංචි වෙලා. ඒත් බය නිසා ඌව එලවා දමන්නත් කිසිම කෙනෙක් ළං වුණේ නෑ.

මේ ගමේ මිනිස්සු අතර තරමක් නිර්භීත මිනිසෙක් හිටියා. ඔහුටත් මේ දිවියාගේ හැසිරීම මහ වදයක් වෙලා තිබුණේ. ඒ වගේම දිවියා ගැන සැකයකුත් මේ මිනිසාගේ සිතේ තිබුණා. ඉතිං දවසක් උදෑසනම හොඳින් සූදානම් වී පැමිණ කුඹුර අසළ තිබුණු ගසකට නැග දිවියා පැමිණෙන තුරු බලා සිටියා.

හෙමින් හෙමින් පැමිණුනු දිවියා කුඹුරට බැස්සා. ගසේ සිටිය මිනිසාට මේ අමුතු දිවියා ගැන තිබුණු සැකය වැඩි වුණා. 'මේ දිවියගෙ ගමන බිමන බූරුවෙක් වගේ. කන්නෙත් ගොයම්. හොඳයි බලමුකෝ...' මෙලෙස හිතපු මිනිසා හෙමින් හෙමින් ගසෙන් බැස්සා. ගමට ගිහින් අනික් හැමෝවමත් එකතු කර ගත්තා. ගමේ හිටපු මිනිහෙක්ගෙන් බූරු හමකුත් ඉල්ලා ගත්තා.

කට්ටියම ඈතින් සිට ගොයම් කකා හිටපු දිවි හම දාපු බූරුවා දෙස බලා සිටියා. ඊට පස්සෙ අර නිර්භීත මිනිහා බූරු හම පොරවාගෙන කුඹුරේ හිටිය බූරුවා ළඟට කිට්ටු කළා.

තමන්ගේ වරිගේ තවත් කෙනෙක් ගොයම් කෑමට පැමිණෙන බව දැක්කම කුඹුරේ හිටිය බූරුවට හරිම සතුටක් ආවා. යායට තියෙන ගොයම පාලුවක් නොමැතිව මින්පසු හවුලේ කෑ හැකි බව ඌට සිතුණා. සතුට වැඩි කමට තම අලුත් සගයා පිළිගැනීමට බූරුවා බූරු හඬ නැගුවා.

වට පිට සිටි ගමේ පිරිසට සතා කවුදැයි හඳුනාගැනීමට එයම ප්‍රමාණවත් වුණා. බූරු හම පොරවාගෙන සිටි මිනිසා වහා එය ඉවත් කොට නැඟී සිට බූරුවාගේ පිටේ තිබුණු දිවි හමත් ඇද ඉවතට දැම්මා. වටපිට සැඟවී සිටි හැමෝම පැමිණ බූරුවාට තලා පෙළා හම් පදම් කරන්නාත් සමගම ගමෙන් පන්නා දැමුවා.

ළමා කවි

ලෝ වැඩ සඟරාව

වෙත්වා සව්සත හැමකල්	නිදුකී	මුනිදුන් කී බණ කරමින්	පුහුණු
පත්වා සැපතට රෝ දුක්	වැළකී	දෙසමින් දනහට වඩවා	කුලුණු
යෙත්වා සමගිව නිවනට මුනි	කී	එපිනෙන් නොපැමිණ නිරයට	දරුණු
මෙත්බා වන නම් වැඩි පින්	කමෙකී	ලැබගත් මතු සගමොක් සිරි	දියුණු
යහපත නොසිතන සැටි මේ	දනයා	දිවමන් මුනිඳුන් දුටු මෙන්	තොසවා
කිපි සත උනුනට දෙති වේ	දනයා	බණ දන් නන් හට වැඳ අත්	ඔසවා
හැම සත වෙත කළ මෙත් බා	වනයා	පදයෙන් පදයට අදරින්	අසවා
සැක නැත සගමොක් සැප සාද	නයා	එපිනෙන් නිරයට යන මං	වසවා
දෙන්නන් දැන දුන් රන් සේ	පොළියට	දුරුකොට හැම විට සිත ඇති	මානේ
දුන් දුන් සේ තම කළ පින්	අනුනට	ගරු කොට වැඳ වැඳ දුටු තෙක්	මානේ
එන්නෙත් දියුණුව තියුණුව තම	හට	මුනිඳුට පුද කළ බත් මල්	පානේ
ඉන් දැන් නුකුසී වවු පින්	දීමට	සත හට සග මොක් මග එම	පානේ

විදාගම මෛත්‍රිය හිමියන් විසින් රචනා කරන ලද 'ලෝවැඩ සඟරාව' කෝට්ටේ යුගයේදී ලියවුණු වටිනා ග්‍රන්ථයකි. ජීවිතය යහපත්ව පවත්වා ගැනීමට වුවමනා දහම් කරුණු රැසක් මනරම් ලෙස කාව්‍යාකාරයෙන් මෙහි ඉදිරිපත් කර ඇත.

ළමා ගී

අපගේ ප්‍රාර්ථනා

සිරි සමනොළ සිරසින් මුදුන් වන
දහසක් අපගේ ප්‍රාර්ථනා
මහාවැලිය මහ ගඟ උතුරා යන
සුවිපුල් නිවහල් ප්‍රාර්ථනා

අලුත් ඉරෙන් මුළු රටට උදා වන
අමයුරු සුමියුරු ප්‍රාර්ථනා
යව්වනියන්ගේ හද තුළ නලියන
ආදරයේ රස ප්‍රාර්ථනා
ප්‍රාර්ථනා ප්‍රාර්ථනා
ආදරයේ රස ප්‍රාර්ථනා

මල් ගොමුවට බිඟු මිණි දැල් බන්දා
පිපී පිපී එන ප්‍රාර්ථනා
ගෙන් ගෙට යා වන බිළිඳු සිනාවෙන්
දිව එන සුරතල් ප්‍රාර්ථනා
ප්‍රාර්ථනා ප්‍රාර්ථනා
දිව එන සුරතල් ප්‍රාර්ථනා

ගායනය : පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව
පද රචනය : සුනිල් සරත් පෙරේරා
සංගීතය :පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව

■ **චමරි අබේසිංහ**

Flu එන්නතේ ඉතිහාසය

සාමාන්‍ය ව්‍යවහාරයේදී ෆ්ලූ ෂොට් ලෙස හැඳින්වෙන ඉන්ෆ්ලූවන්සා එන්නතේ (influenza vaccine) ඉතිහාසය 20 වන ශත වර්ෂයේ මුල් කාර්තුව තෙක් දිව යයි.

ඉන්ෆ්ලූවන්සා රෝගය මුලින්ම සොයාගෙන ඇත්තේ සත්වයින් පිළිබඳව කරන ලද අධ්‍යයනයකිනි. එනම්, ඌරු ගොවිපොළක ඌරන්ට තිබූ රෝගී ස්වභාවයක් මගිනි. 1918 දී හෙළි වූ මෙම රෝගය පිළිබඳව තවදුරටත් කරුණු සොයා බැලීමේදී එවැනිම වූ රෝග ලක්ෂණ ස්පාඤ්ඤ උණ රෝගය (Spanish flu) වැළඳුණු මිනිස් රෝගීන් තුළද පවතින බව හෙළිදරව් වී ඇත. එකල ස්පාඤ්ඤ උණ රෝගය වසංගතයක් ලෙස මිනිසුන් අතර පැතිර ගියද ඒ සඳහා නිශ්චිත ප්‍රතිකාරයක් සොයාගෙන නොතිබුණු නිසා බොහෝ දෙනෙකුට මරු වැළඳ ගැනීමට සිදුවුණි. උණ රෝගය සඳහා භාවිත කරනු ලබන සාම්ප්‍රදායික ක්‍රම ඇතුළුව නොයෙකුත් ප්‍රතිකාර ක්‍රම වෛද්‍යවරුන් විසින් මේ රෝගීන් සඳහා අත්හදා බලමින් ප්‍රතිකාර කළද ඒ කිසිදු දෙයක නිශ්චිත සාර්ථකත්වයක් පෙන්වා නොතිබුණි. එහෙත් අධෛර්යමත් නොවූ විශේෂඥයින් මේ රෝගය මැඩ පැවැත්වීම සඳහා තව තවත් අලුත් ක්‍රම අධ්‍යයනය කළ අතර එක් වරෙක යොදාගත්තේ 'විෂෙන් විෂ නැසීමේ' ක්‍රමවේදයයි. එනම්, ඉන්ෆ්ලූවන්සා වැළඳී සුව වූ රෝගීන්ගෙන් ලබාගන්නා රුධිරය අලුතින් රෝගය වැළඳුණු රෝගීන් වෙත ලබාදීමයි. මෙම ක්‍රමයෙහි කිසියම් සාර්ථකත්වයක ඉඟි දක්නට ලැබුණු නිසා එතැන් සිට ඒ ඔස්සේ පර්යේෂණ පැවැත් වූ විද්‍යාඥ කණ්ඩායම් ඉන්ෆ්ලූවන්සා රෝගය මැඩලීම සඳහා එන්නතක් සොයා ගැනීමට වෙහෙසුණි.

විද්‍යාඥවරු කීප දෙනෙකු විසින්ම දීර්ඝ කාලයක් පුරා සිදුකළ එම පර්යේෂණවල ප්‍රතිඵලයක් යම් තරමකට හෝ ලබාගැනීමට හැකි වූයේ 1931-33 වසරවලදීය. එහෙත් එම එන්නත් මිනිසුන් කෙරෙහි අත්හදා නොබැලූ අතර සත්වයින් වෙත ලබාදීම සිදුකර තිබුණි. ඉන්ෆ්ලූවන්සා රෝගය සඳහා සොයාගත් එන්නතක් මිනිසුන් කෙරෙහි අත්හදා බැලිය හැකි ලෙස වැඩිදියුණු කර ඇත්තේ 1938 දීය. ඒ Jonas Salk සහ Thomas Francis විද්‍යාඥයින් දෙදෙනා විසිනි. මෙම එන්නතෙහි පළමු මිනිස් භාවිතය දෙවන ලෝක සංග්‍රාමයේ යුද වැදුණු ඇමරිකානු මිලිටරි සෙබළුන් සඳහා සිදුකර ඇති අතර එකල ඇමරිකානු යුද කඳවුරු තුළ දරුණු ලෙස පැතිර ගිය ඉන්ෆ්ලූවන්සා රෝගය මැඩ පැවැත්වීම සඳහා යම් සහනයක් ලබාගැනීමට එයින් හැකි වී ඇත. ඉන්පසුව කලින් කලට මිනිසුන් වෙත වැළඳුණු ඉන්ෆ්ලූවන්සා වෛරසවල ස්වභාවයට අනුව මෙම එන්නත වැඩිදියුණු කිරීමත්, යාවත්කාලීන කරලීමත් සිදුකොට ඇත.

වර්තමානයේදී ෆ්ලූ ෂොට් යනුවෙන් ලබාදෙන එන්නත්ද ඒ ඒ කාලවලදී වැඩියෙන්ම දක්නට ලැබෙන ඉන්ෆ්ලූවන්සා වෛරසයට ගැළපෙන ආකාරයට සකසනු ලබයි.

කැනඩාවේ Flu Shot

නොවැම්බර් සිට මාර්තු දක්වා දිවෙන කාලය කැනඩාව තුළ උණ වසංගතය (Flu) බහුලව පැතිරෙන කාලයයි. මෙයිනුත් දෙසැම්බර් අග භාගය ඉන්ෆ්ලූවන්සා වැඩියෙන්ම හිස ඔසවන කාලය ලෙස ඒ සම්බන්ධව ඇති වාර්තා පෙන්නුම් කරයි.

මෙම තත්ත්වය යම් පමණකට හෝ පාලනය කර ගැනීම සඳහා කැනඩාවේ සෞඛ්‍ය අංශ සෑම වසරකදීම දැඩි පරිශ්‍රමයක් දරන අතර ඒ වෙනුවෙන් විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරයි. ඒ අතරින් Seasonal Flu Vaccine ව්‍යාපෘතිය ප්‍රධාන ස්ථානයක් ගනී. මෙහිදී වයස මාස 6 ක ළදරුවාගේ පටන් ඉන් ඉහත සියලුම වයස් කාණ්ඩවලට අයත් පිරිසට නොමිලේම ෆ්ලූ වැක්සීනය ලබා ගැනීමට රට පුරා ඇති වෛද්‍ය මධ්‍යස්ථාන හා විශේෂ සායන මගින් පහසුකම් සලස්වා තිබේ.

ෆ්ලූ එන්නත ශරීරගත කොට සති දෙකක පමණ කාලයකින් එහි ක්‍රියාකාරිත්වය ඇරඹෙයි. එන්නත ලබා ගැනීමෙන් සති දෙකකට පමණ පසු ශරීරය තුළ ප්‍රතිදේහ (antibodies) වර්ධනය වීම ආරම්භ වන අතර මෙම ප්‍රතිදේහ අප ශරීරයට ඇතුළුවන වෛරස් සමග සටන් කොට අප වෙත ආරක්ෂාවක් ලබා දේ. සෑම වසරකම නොවැම්බර් මාසයේදී මෙම එන්නත ලබා දීම ආරම්භ කෙරෙන අතර රට පුරා වෛරස උණ පැතිරෙන කාලය ආරම්භ වන විට එන්නතෙහි ක්‍රියාකාරිත්වයද වර්ධනය වී ශරීරයට ප්‍රතිශක්තිකරණය ලබාගැනීමට අවස්ථාව සැලසේ. (මෙම ලිපිය ජනවාරි මාසයේ පළවන්නක් නිසා මෙවර මෙම එන්නත ලබා ගැනීමට ඔබ දැන් පමා වූවා වැඩි විය හැකියි. එහෙත් උණ කාලය මාර්තු තෙක් පවතින නිසා ඔබේ වෛද්‍යවරයා සමග මේ පිළිබඳව සාකච්ඡා කළ හැක.)

"ෆ්ලූ ෂොට් එක අරගෙනත් මට හොඳටම උණ හැදුණානෙ..."

බොහෝ දෙනෙකු මෙසේ මැසිවිලි නගනු අප කොතෙකුත් අසා ඇත. එන්නත ලබාගැනීමෙන් පසුව මෙසේ ලෙඩ වූ ඇතැම් පිරිස් එන්නත කෙරෙහි ඇති විශ්වාසය පළුදු කොට ගනිමින් ඉන්පසු වසරවලදී එන්නත නොගෙන සිටින අවස්ථාද කෙතෙකුත් අප දැක ඇත. සැබවින්ම ශීත කාලයත් සමග වැළඳෙන උණ හෝ සෙම්ප්‍රතිශ්‍යා තත්ත්වයන් මෙම එන්නත ලබා ගැනීමෙන් පසු සම්පූර්ණයෙන්ම පාලනය වී එම රෝග අප වෙත නොසෑදෙන්නේ යැයි මතයක සිටී නම් එය මුලාවකි. මෙම එන්නත මගින් සිදුවන්නේ අපට වැළඳෙන සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යා, උණ රෝගී තත්ත්වයන් වැළැක්වීම නොව, ඉන්ෆ්ලූවන්සා වැනි භයානක වෛරස ආසාදන වැළැක්වීමයි. එසේ හෙයින් එන්නත ගත්තා යැයි කියා ඔබ සෞඛ්‍ය පිළිබඳව කිසිදු පරිස්සමක් නොමැතිව කටයුතු කරනවා නම් මේ ශීත කාලයේදී උණ හෝ සෙම්ප්‍රතිශ්‍යාව වැළඳීමෙන් ගැලවී සිටිය නොහැක. මෙහිදී පරිස්සම් වීම යනු, ශීතල දේශගුණයට ඔරොත්තු දෙන ආකාරයට ඇඳ පැළඳ සිටීම, බැහැරක ගොස් පැමිණි විට අත් සෝදා ගැනීම, සෙම්ප්‍රතිශ්‍යා වෛරස ආසාදිත පුද්ගලයින් හා ගැවසීම අවම කිරීම ආදි කටයුතු වේ.

සෑම වසරකම කැනඩාවේ උණ සමය (Canadian flu season) ලෙස ප්‍රචලිත නොවැම්බර් - මාර්තු කාල සීමාව තුළ මෙරට වැසියන් අතරින් සියයට 10 සිට සියයට 20 දක්වා වූ ප්‍රතිශතයක් ඉන්ෆ්ලූවන්සා රෝගයට (මෙය සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යා තත්ත්වය නොවන බව මතක තබා ගන්න) ගොදුරු වන බව සෞඛ්‍ය දත්ත වාර්තා පෙන්නුම් කරයි. එයින් සැලකිය යුතු පිරිසකට රෝහල්ගතව ප්‍රතිකාර ලැබීමට සිදුවන අතර එසේ රෝගී වන පිරිස අතරින් ඇතැමෙකුට සිය දිවියෙන් සමුගැනීමට සිදුවන බවද එහි දැක්වේ.

අප ඉහත දැක්වූ ආකාරයට ඉන්ෆ්ලූවන්සා ආසාදනය ඍතුවෙන් ඍතුවට වෙනස් වන අතර එම වෛරසයේ ස්වභාවය අනුව මිනිසුන් වෙත ගෙන එන බලපෑම්ද අඩු වැඩි වේ. කෙතරම් නිරෝගී පුද්ගලයෙකුට වුවත් ඉන්ෆ්ලූවන්සා රෝගී තත්ත්වයන් හටගත හැකි අතර ඔවුන්ගෙන් එය බොහෝ දෙනෙකු වෙත පැතිර යා හැකිය. ෆ්ලූ එන්නත ලබාගැනීම තුළින් එම තත්ත්වය අඩුකර ගැනීමට පහසුවෙන් අවස්ථාව සැලසේ.

එසේම මිනිස් සිරුරට මාරාන්තික බලපෑම් එල්ල කළ හැකි ඉන්ෆ්ලූවන්සා තත්ත්ව කිහිපයක් සඳහාම මෙම එන්නත මගින් ආරක්ෂාව සැලසේ. ඉන්ෆ්ලූවන්සා A (H1N1) , ඉන්ෆ්ලූවන්සා A (H3N2) ඉන්ෆ්ලූවන්සා B මගින් වැළඳෙන ආසාදන තත්ත්වයන් මෙම එන්නත මගින් මර්ධනය කිරීම සිදුවේ.

විශේෂයෙන්ම ළදරුවන්, ගර්භනී මවුවරුන් සහ වැඩිහිටියන් ඉන්ෆ්ලූවන්සා රෝගී තත්ත්වයන්ට ගොදුරු වීමත් සමග වැඩි අවදානමක් පෙන්වන නිසා වෛද්‍ය උපදෙස් මත ඔවුන් ෆ්ලූ එන්නත ලබාගැනීම අනිවාර්යයෙන්ම කළ යුත්තකි. එසේම හෘදය, පෙණහලු, වකුගඩු, අක්මාව සහ රුධිරයේ නිදන්ගත රෝග තත්ත්වයන් සහිත ඕනෑම වයසක පසුවන පුද්ගලයින් සහ දියවැඩියාව, පිළිකා සහ ප්‍රතිශක්තිකරණ පද්ධතියේ දෝෂ සහිත පුද්ගලයින් සෑම වසරකම මෙම ෆ්ලූ එන්නත ගැනීම ඉතාමත් සුදුසු බව වෛද්‍ය නිර්දේශයයි.

ඉතාමත් පහසුවෙන් බෝ වන රෝග කාණ්ඩයට අයත් වූවක් වන ඉන්ෆ්ලූවන්සා රෝගය මහජනතාව වෙත පැතිර යාම අවම කිරීම සඳහා පහත සඳහන් විශේෂිත පුද්ගලයින්ද වසරක් පාසා මෙම එන්නත ලබා ගැනීම වඩාත් සුදුසු වේ. සෞඛ්‍ය-වෛද්‍ය ක්ෂේත්‍රවල රැකියා කරන්නන්, ගුරු වෘත්තියේ නිරතව සිටින්නන්, වැඩිහිටියන් සඳහා වන ආයතනවල සේවය කරන පුද්ගලයින්, ඍජුවම මහජනතාව සමග සම්බන්ධ වෙමින් අත්‍යවශ්‍ය සේවා සපයන ප්‍රජා සේවකයින්, අවදානමට ලක් විය හැකි රෝගීන් සිටින නිවෙස්වල පුද්ගලයින් ආදි ලෙසයි. ෆ්ලූ එන්නත සම්බන්ධයෙන් මිථ්‍යා මත රැසක් ගොඩ නැගී ඇති අතර මේ ඇතැම් කරුණු ඔබත් මින් පෙර අසා ඇතිවා විය හැකියි.

'ෆ්ලූ එන්නත ගත්ත ගමන් උණ හැදුණා'. මෙය බොහෝ දෙනෙකු පවසන්නකි. එහෙත් එහි සත්‍යතාවක් නොමැති බව වෛද්‍යවරුන්ගේ මතයයි. වැක්සීනය ලබා ගැනීමෙන් පසු උණ හෝ සෙම්ප්‍රතිශ්‍යාව වැළඳුණු බව පවසන බොහෝ දෙනෙකු පිළිබඳව පරීක්ෂා කර බැලීමේදී පෙනී ගොස් ඇත්තේ ඔවුන් තුළ උණ, සෙම්ප්‍රතිශ්‍යා තත්ත්වයන් එන්නත ගන්නා අවස්ථාවේදීද පැවති ඇති බවයි. මෙම එන්නත ලබා දෙන කාල සීමාව Fall allergies සමග එන සෙම්ප්‍රතිශ්‍යා රෝග තත්ත්වයන්ද බහුලව පැතිරෙන කාලයක් නිසා බොහෝ දෙනෙකු එන්නත ගැනීමෙන් පසු එන්නත නිසා ඇති වූ සංකූලතාවන් මත රෝගී වූ බව වරදවා වටහා ගනී. එන්නත ලබාගැනීමේදී එම විදීම සිදුකළ තැන සියුම් වේදනාවක් සහ ඇතැම් අයට ශරීරයෙහි උණ ගැනෙන විට දැනෙන කෙඩේතු ගතිය වැනි අපහසුතාවක් ඇතිවිය හැක. මෙම තත්ත්වයන් පැය 24 ක් වැනි සුළු කාලයක් තුළ සම්පූර්ණයෙන්ම පහව යන අතර බහුතරයකට කිසිදු රෝග ලක්ෂණයක් පහළ නොවේ.

'අපි තරුණයි. ශක්තිමත්. සෞඛ්‍ය සම්පන්නයි. ෆ්ලූ ෂොට් මොකටද?' මෙයත් බොහෝ දෙනෙකු තුළ පවතින වැරදි මතයකි. ඔව්.... නිරෝගී තරුණ පුද්ගලයන් හට ඉන්ෆ්ලූවන්සා රෝගී තත්ත්වයන් හා සටන් කිරීමේ ශක්තිය මහලු හා රෝගී පුද්ගලයන්ට වඩා වැඩි බව සත්‍යයකි. එහෙත් රෝගයක ස්වභාවය දරුණු වීමට තරුණ බව හෝ සෞඛ්‍ය සම්පන්න බව සෑම විටෙකම සාධකයක් නොවිය හැකියි. එසේම මෙවැනි රෝගයක් තරුණ ඔබට වැළඳුනහොත් ඔබගේ ශක්තිසම්පන්න බව නිසා එයින් මිදීමට ඔබට හැකිවුවත් ඔබ අවට සිටින ළමා, වැඩිහිටි, රෝගී, දුර්වල පුද්ගලයින්ට එම රෝගය පැතිර යා හැකියි. එම නිසා ඔබ ගැන මෙන්ම ඔබ අවට සිටින අය ගැනද අවධානය යොමු කොට

22 වන පිටුව බලන්න

පළතුරු ලොව රජ කරන සුපිරි පානය

KING COCONUT WATER තැම්බිලි

Native to the tropical isle of Sri Lanka, King Coconuts are a natural treasure of the tropics and known for their exquisite taste and nutritional richness. Unlike carbonated drinks, that are packed with caffeine, sugars and artificial flavours, **Organic King Coconut Water** is full of essential minerals, electrolytes (it naturally contains **5 Essential Electrolytes : Potassium, Sodium, Magnesium, Calcium & Phosphorus** to help you stay hydrated), & deliciously refreshing.

This natural water is extracted from the bright orange coloured coconut and used exclusively as a beverage, unlike green coconuts that have multiple uses. There is no use of fertilizers or pesticides starting from the initial growing, all the way till the harvesting stage and they are hand-plucked during optimum maturity. Organic King Coconut Water contains organic compounds possessing healthy growth promoting properties to help keep your body cool when over exhausted and maintain the proper temperature. With a sweeter taste than traditional coconut water, King Coconut water is the perfect drink to quench your thirst - and you don't have to take a trip to Sri Lanka to enjoy this tropical delicacy.

SHOPPING TIP

Buy "The Good Stuff"
- 100% Raw, Organic with NO Added Water, Sugar, Artificial Preservatives, Additives, Flavours / Colours and enjoy all of the Natural Health Benefits of **Organic King Coconut Water.**

DEHYDRATED?
HANGOVER?

Rehydrate Your Body Naturally

QUALITY GUARANTEE ASSURANCE

KING COCONUT WATER

ORGANIC KING COCONUT WATER

✓ Raw
✓ Vegan
✓ Paleo

(Thambilli)
100% PURE
100% ORGANIC
100% NATURAL
NO SUGAR ADDED

PRODUCT OF SRI LANKA

ALSO AVAILABLE WITH:

ORGANIC MANGO PULP

ORGANIC PINEAPPLE PULP

NOW AVAILABLE IN CANADA!

SERVE CHILLED & SHAKEN.

MARKETED AND DISTRIBUTED BY GEESHAFOODS INTERNATIONAL INC. FOR MORE INFO 416.804.0762 WWW.GEESHAFOODS.COM

දැනුම සමග කටට රසට

■ තිසරි ශිබා - shikifood

ඒ මා ලංකාවෙන් පැමිණීමට පෙර දිනයයි. එය බොහෝ දිගු දිනයක් වන්නේ නම් කෙතරම් කදිමදැයි මට සිතුණි. මා ආත්තම්මා සමග මගේ ලෝකයේ තනි වී ආලින්දයේ හිඳගෙන සිටින විට බත් පිඟානක් අතැතිව පැමිණි චූටි චම්මා නිසා දැහැන බිඳී ගියේය. බත් පිඟානෙන් ආ සුවඳ බඩගින්නක් දැනවීය. මා සිත අදුනන ඕ ළඟට විත් බත් කටක් කැව්වාය. චූටි චම්මාගෙන් බත් කටක් කෑවේ බොහෝ කලකට පසුය.

වේලපු අඹ සමග තෙල් දමා තිබූ කරවල බැදුමත්, කලවම් පලා මැල්ලුමත්, දෙල් ආනමත්, ලේන් හතු මාලුවත් මට දිව්‍ය භෝජනයක් මෙන් විය. ඉස්සර සීයාට කරවල නැතිවම බැරි නිසා ආත්තම්මා නේක ආලවට්ටම් යොදා කරවල සාදන අතර වේලපු අඹ එකතු කර සාදන කරවල බැදුමට අප කවුරුත් ආසා කලෙමු.

"අද කරවල බැදුම නම් පන්කාදු පහයි හාමිනේ" යැයි පවසමින් එකල කෑම මේසයෙන් නැගිටින සීයා, ආත්තම්මා දෙස බලා සිනාවෙන විට,

"මහත්තයට කරවල තියෙනව නම් ඉතින් වෙන මුකුත් ඕන නෑ නොවැ" යැයි පවසමින් ඇය මඳ සිනාසලන්නීය.

ඔවුන් දෙදෙනා එක මේසයේ ඉඳගෙන කෑම ගන්නවා මා කිසි දිනෙක දැක නැති මුත් සීයා කෑම කන සෑම විටකම ආත්තම්මා සෙවණැල්ලක් සේ ඔහු අසල ඉදිමින් සියලු ඕනෑ එපා කම් ඉටු කරන්නීය.

"මොනවද ඔච්චර කල්පනා කරන්නෙ? තව කටක් ඕනෙද චූටියෝ"

චූටි චම්මාගේ කටහඬින් නැවතත් අතීතයෙන් ගැලවුණු මා එදා කරවල හට්ටියෙන් භාගයක් ඉවර වෙනතෙක්ම බත් ගිල දැමුවේ සත් අවුරුද්දක් සාගතෙන් සිටියෙකු මෙනි.

එදින වෙනදාට වඩා කලියෙන් අප නින්දට ගිය මුත් මට එය නිදි නැති රැයක් විය. හෙට ඉර පායන්නේ නැත්නම් කෙතරම් හොඳදැයි මට සිතුණි. ඊට පසු දින අප පාන්දරින් ලක ලෑස්ති වූයේ ගුවන් ගමන යෙදී තිබුණේ හිමිදිරියේ බැවිනි. සැමගෙන් සමුගැන්මට මත්තෙන් මා සියලු ගමන් මලු ආලින්දයට රැගෙන එන විට පසු පසින් පැමිණි ආත්තම්මා,

"කෝ අර මම දීපු පෙට්ටිය ගත්තද?" යි ඇසුවාය.

සිදුවන්නට යන දේ ඉවෙන් මෙන් වටහා ගත් මා අම්මා දෙස බැලූ විට අම්මා අසරණව බලා සිටියාය. වෙනදා යුද්ධ ප්‍රකාශ කළත් මා කිසිවක් පැවසුවේ නැත. අප වත්තේ වැඩ කරන තිලකෙ මාමා විශාල කාඩ්බෝඩ් පෙට්ටියක් ඔසවා ගෙන විත් මා අසලින් තැබුවේය. වෙනදා මෙන්ම එහි අඩුම කුඩුම රැසක් විය. වේලපු අඹ, වේලපු බිලින්, අච්චාරු බෝතල්, මෝජු බෝතල් පමණක් නොව වංගෙඩියක්, කොකිස් අච්චුවක්, ආප්ප තාච්චියක් ආදී කී නොකී බඩු රැසකි.

"මෙතන කිලෝ විසි පහක් විතර තියනවනේ? මේ සේරම ගෙනියන්නෙ කොහොමද?" යි මා ඇසූ විට ආත්තම්මා පැවසුවේ එය කෙසේ හෝ රැගෙන ගිය යුතු බවකි.

අවසාන තීරණය ඈ සතුවන බව දන්නා නිසා මම මුනිවත රැක්කෙමි. නැවතත් ගමන් මලු විවර කළ මා, මගේ අගනා සපත්තු කුට්ටම් කිහිපයක්, ඇදුම් කිහිපයක් මෙන්ම තවත් බඩු රැසක් නොරිස්සුමෙන් ඉවත් කළ විට චූටි චම්මා කට වසා සිනාසුණාය. මාගේ සියලු තරහා මා ඈ පිටින් යැව්වේ අන් කළ හැක්කක් නොවුණු බැවිණි.

"එක ඇඳුමක් හරි ඇඳලා තිබුණොත් බලා ගෙනයි චූටි චම්මා" ඕ තව තවත් සිනාසුණාය.

ආත්තම්මාගේ කාඩ්බෝඩ් පෙට්ටියේ වූ සියලු බඩු මා මගේ ගමන් මලු තුළ පුරවා ගත්තත් වේලපු අඹ බෝතලයත්, බිලින් අච්චාරුවටත් ඉඩ මදි විය. අම්මා පැවසුවේ අත්බෑගයේ දමා ගෙන ගොස් අවශ්‍ය නැත්නම් මගදී එය ඉවත් කරන ලෙසය. ආත්තම්මාගේ සිත නොරිදන්නැයි ඕ මගෙන් ඉල්ලා සිටියාය.

කෙසේ වෙතත් දීර්ඝ ගුවන් ගමනකින් පසු ලන්ඩනයේ හීතෘ ගුවන්තොටුපළේදී මගේ අත් බෑගය පරීක්ෂාවට බඳුන් විය. මට හීන් දාඩිය දැම්මේ බෑගය ඇතුළත ඇති අච්චාරු බෝතල් මතක් වීමෙනි. බෑගය අරින විටම එයින් ආ අච්චාරු සුවඳ මා මනස කළඹවාලීය. සුදු ජාතික ආරක්ෂක නිලධාරිනිය වේලපු අඹ සහ බිලින් අච්චාරු බෝතලය ඇර මේ මොනවාදැයි මගෙන් ඇසුවාය. බිලින් යැයි කීමට සිතුනත් ඈ දන්නා බිලිමක් නැති නිසා ඒ 'ඩ්‍රයි වෙජිටබල්' යැයි මම පැවසුවෙමි. දෙවුර අකුලුවා ලූ ඇය නැවතත් මා දෙස බලා බෝතල් දෙකම අත් බෑගයට රුවාලීය.

ඉන්පසුව මාස හයක පමණ කාලයක් ගත වුවත් මට ඒ බෝතල් දෙකම අමතකව ගිය අතර එය මතක් කළේ චූටි චම්මාය. ආත්තම්මා තරම් රසට කෑම සෑදීමට මා නොදන්නා මුත් වේලපු අඹ එකතු කර සෑදූ කරවල බැදුම මට අපූරු රසයක් හැම විටම ගෙන එන්නේ කුඩා කල අප එක්ව ගෙවූ අතීතය ඒ සුවඳ හා මුසු වී මට සිහිවන නිසාය.

Shikifood
thisu.shika@gmail.com



වේලපු අඹ මිශ්‍ර කරවල බැදුම

අවශ්‍ය දේ

කරවල
වේලපු අඹ
තලා ගත් සුදු ලූනු
සිහින්ව ලියූ රටලූනු
සිහින්ව කපා ගත් අමු මිරිස්
කරපිංචා, රම්ප
කෑලි මිරිස්
කහ
තුනපහ ස්වල්පයක්
රස අනුව ලුණු
තෙල්

සාදා ගන්නා ආකාරය

පළමුව වේලපු අඹ සාදා ගමු. ඒ සඳහා තරමක් පැසුනු අඹ තීරු කපා ගෙන (ඇටය ඉවත් කරන්න) ලුනු කුඩු තවරා වට්ටියක අතුරා තද අව්වේ සති කිහිපයක් වේලා ගන්න.

මැට් බාජනයක් ගෙන තෙල් දාන්න. තෙල් රත් වීගෙන එන විට එයට කරවල කැබලි එකතු කරන්න. ටික වේලාවක් කරවල තෙලේ බැද ගන්න. ඉන්පසු සුදු ලූනු, රට ලූනු , අමු මිරිස්, රම්ප කරපින්චා එකතු කරන්න. එයට කෑලි මිරිස්,කහ සහ තුනපහ එකතු කරන්න. රස අනුව ලුණු දමන්න. (වේලපු අඹවල වගේම කරවල වලත් ලුණු තියන නිසා ලුණු එකතු කිරීමේදී පරිස්සම් වෙන්න) දැන් හොඳින් කරවල බැදුම කලවම් කර මද ගින්නේ ටික වෙලාවක් ලිපේ තියන්න.

NOVA
Immigration Solutions Inc.
A CANADIAN IMMIGRATION CONSULTANCY FIRM

100% PARENTAL SUPER VISA AND 98% STUDENT VISA SUCCESS RATES

416 298 0990
shani.hanwella@novaim.ca

SHANI HANWELLA
Registered Canadian Immigration Consultant, CEO,
Former Visa Officer, Canadian High Commission,
Colombo, Sri Lanka

1585 Markham Road, Suite 405, Scarborough, ON M1B 2W1
www.novaim.ca


TB
TISSA BOYAGODA, LLM
KNOW YOUR RIGHTS
TISSA BOYAGODA, LLM
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka
Areas of Practice
| Criminal Law
| Family Law
| Real Estate
| Immigration Matters
| Civil Litigation
| Small Claim Court Matters
| Power of Attorneys
| Last Wills
| Notarizations
GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED
1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4
100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3
TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com
www.tissaboyagodalaw.com

EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca
We'll Target The Best Rates!
Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.
Mortgage Renewals and Refinancing
First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!
Investment Properties
Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!
Safe and Secure Application
Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.
Manzeel Patel
Mortgage Broker - M11002628
Direct: 647-272-8355
Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7
T 416 - 840 - 6368
F 416 - 850 - 5153
info@everythingmortgages.ca
www.everythingmortgages.ca

දිනකට ලීටර් පනස්දහසක් කුණු කාණුවලට හෙළන ලෝකේ විශිෂ්ටතම ශක්ති ජනක පානය

■ ගැමුණු සාලිය පෙරේරා

පොළව පළා ගලක් දුටින්
එගල පලා රිදී දුටින්
රිදී ළිඳේ දියත් දුටින්.....

එසේ කුඩා ළමුන්ගේ තේරවිලිවලටද පාදක වූ, පොල් වතුර, කුරුම්බා වතුර අනාදිමත් කලෙක සිට ලෝකයේ විවිධ රටවල රෝග සුව කිරීම සඳහාද භාවිතයට ගෙන තිබේ.

සමකාසන්නයේ රටවල වැවෙන පොල් පිළිබඳ බටහිර ජාතීන් නොදැන සිටි නිසාවෙන් මෙම ශාකයේ ඖෂධීය වටිනාකම පිළිබඳවද මේ මෑතක් වනතුරු සුදු ජාතීන්ගේ අවධානය යොමු වූයේ නැත. අනෙක් අතට ඔවුන්ගේ ඉරිඟු, සෝයා, එළඑළු තෙල් සහ මාගරින් වර්ග විකුණා ගැනීමේ අරමුණු වෙනුවෙන් පොල්තෙල්, පොල්මදයේ සහ පොල් වතුරෙහි ඇති විස්මිත ගුණය හිතාමතාම වසන් කළ නිසාවෙන්, ඔවුන් පොල් සැලකුවේ සෞඛ්‍යයට අහිතකර හදවත් රෝගවලට තුඩු දෙන ආහාරයක් ලෙසය.

ඔවුන්ගේ දැනුම හා හඬ ඔස්සේ තීන්දු තීරණ ගත් අප විසින්ද පොල් තෙල්, පොල් මදය මෙන්ම, පොල් වතුරද කිසිදු වැදගැන්මකට නැති ආහාරයක් ලෙස සලකා අවඥාවෙන් බැහැර කරනු ලැබිණ.

මෑතකදී ශ්‍රී ලංකාවේ පොල් සංවර්ධන මණ්ඩලය විසින් පුවත්පත්වල පළකර තිබූ වාර්තාවකින් කියවුණේ ශ්‍රී ලංකාවේ වැසියන් දිනකට පොල් වතුර ලීටර් 50,000 ක් සින්ක් එකට හළන බවයි. අප කොයිතරම් පොල් ගසට අකාරුණික වීද යන්න තේරුම් ගැනීමට එකී කාරණාව පමණක් වුව ප්‍රමාණවත් වනු ඇත.

එබැවින් එකී කාරණාවද මතකයේ තබාගෙනම පොල් තැඹිලි, කුරුම්බා වතුර පිළිබඳ පෙර අපරදිග විද්‍යාඥයින් විසින් කර ඇති පර්යේෂණවල තතු විත්තිවලින් හෙළිදරව් කෙරෙනා මාහැඟි ගුණය මෙන්ම සෞඛ්‍ය ප්‍රතිලාභද විමසා බලමු.

පෝෂණයෙන් අති විශිෂ්ට පොල් වතුර ජීවයේ පානයයි.

පොල් වතුර මේ ලොව ඇති සුපිරිසුදුම පානයයි. මාස 9 ක් පුරා පෙව පිරිසුදුවීමේ ක්‍රියාවලියට ලක්වී නිපදවන පොල් වතුර, ජීවානු හරිතය.

එහි සංයුතිය අපගේ සෛල ප්ලස්මාවේ, රුධිරයේ අයනික සංයුතියට බෙහෙවින්ම සමාන වන බව විද්‍යාඥයින් විසින් සොයා ගෙන තිබේ.

මෙහි සුලභව පවතින පොටෑසියම්, සෝඩියම් ක්ලොරයිඩ්, මැග්නීසියම් අයන මෙන්ම සුළු වශයෙන් ඇති ස්වභාවික සීනි නිසාවෙන් අයනිකතාවය අතින් විශිෂ්ට ගුණ දක්වයි. මෙකී විශිෂ්ට අයනික ගුණය නිසාවෙන්, යුද්ධවලදී බරපතල තුවාල ලබන සොල්දාදුවන් සඳහා සේලයින් ද්‍රාවණයක් ලෙස කෙලින්ම භාවිතයට ගෙන තිබෙන බවත්, දෙවන ලෝක යුද්ධයේදී පමණක් ජීවිත 50,000 ක් පමණ බේරා ගෙන තිබෙන බවත් ඉතිහාසය තතු විමසීමේදී දැනගත හැක.

එමෙන්ම පොල් වතුර ආහාරමය තන්තුවලින්ද පොහොසත්ය. මැංගනීස්, අයඩීන්, සලගර්, සින්ක්, සෙලේනියම්, කැල්සියම්, පොස්පරස්, යකඩ හා විටමින් සී, බී, හා ඊ ද ඇත. තවද මෙහි අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල, කාබනික අම්ල, එන්සයිම වර්ග, ප්‍රතිඔක්ෂිකාරක, පයිටොකෙමිල්ස් වර්ග, ශාක හෝමෝන වර්ග මෙන්ම

හදවත රැක දෙන පොල් වතුර

පොල් වතුරෙහි තිබෙන අධික බණිජ ලවන සංයුතිය නිසාවෙන්, හෘදයාබාධ හා අධික රුධිර පීඩනය වැළැක්වීමේ සුපිරි ආහාරයක් ලෙස විද්‍යාඥයන් විසින් පොල් වතුර හඳුන්වා දී ඇත.

මේ පිළිබඳව කර ඇති අධ්‍යයනයකදී හෙළිවී ඇත්තේ, අධික රුධිර පීඩනයෙන් පෙළුණු රෝගීන් සඳහා පොල් වතුර පානය කරන්නට දීමෙන්, ඔවුන්ගේ රෝග තත්ත්වය සියයට 71 කින් අඩු වූ බවයි.

පොල් වතුර මිලි ලීටර් 100 ක පොටෑසියම් මිලි ග්‍රෑම් 300 ක් පමණ තිබෙන අතර, එම ප්‍රමාණය කෙසෙල්වලටත් වඩා වැඩි අගයකි. එබැවින් මෙය හදවත රකින විශිෂ්ට ආහාරයක් ලෙස හඳුන්වන්නට විද්‍යාඥයන් පසුබට වන්නේ නැත.

පොල් වතුරෙහි අහිතකර කොලෙස්ටරෝල් නොමැති අතර, අධ්‍යයනවලදී හෙළි වී ඇත්තේ අපගේ සිරුරේ තිබෙන අහිතකර කොලෙස්ටරෝල් අඩු කිරීමට ඉවහල් වන හිතකර කොලෙස්ටරෝල් (HDL) මට්ටම පොල් වතුර බීම නිසාවෙන් ඉහළ යන බවයි.

අනෙක් අතට රුධිර කැට ඇති වීම වළක්වාලන ගුණයක් පොල් වතුරෙහි අඩංගු වන බැවින් දරුණු හෘදයාබාධ සහ ආඝාතනය වැනි රෝගවලින් ඇති වන අවධානම අඩුකර ගන්නටද පොල් වතුර පානය ඉවහල් වන බව සොයා ගෙන ඇත.

වකුගඩු රැකගන්නට සහ මූත්‍රාශයේ ගල් දිය කිරීමට.

වකුගඩු තුළ රැඳෙන විවිධ විෂ පදාර්ථයන් නිසාවෙන් වකුගඩුවලට සිදුවන හානි වැළැක්වීම පොල් වතුර සතු තවත් විශිෂ්ට ගුණයක් බව පර්යේෂකයන් පෙන්වා දෙයි. එබැවින් මත්පැන් හා වස විස නිසාවෙන් සිදු වන වකුගඩු නරක්වීම පාලනය කිරීමටද පොල් වතුර ප්‍රයෝජනවත් වනු ඇත.

පිලිපීනයේ චයිනීස් මහ රෝහල් මූත්‍රවාහිනී පද්ධතිය පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෛද්‍ය ඉයුජිනෝ මැකලැලෙන් මහතා පෙන්වා දෙන්නේ, සතියකට දෙවතාවක් හෝ තුන් වතාවක් පමණ පොල් වතුර හෝ කුරුම්බා පානය කර මූත්‍රාශයේ ගල් සෑදී ශල්‍යකර්මයකින් ඉවත් කිරීමට නියමිතව සිටි රෝගීන්ගේ එම ගල්වල විශාලත්වය අඩුවී හෝ කුඩා කොටස්වලට කැඩී තිබුණු බවත්, ඒ නිසාවෙන් ඒවා ශල්‍යකර්මයකින් නොව, සාමාන්‍ය ඖෂධ ප්‍රතිකාර මගින් සුව කිරීමට හැකි වූ බවත්ය.

අනෙක් අතට පොල් වතුර හොඳ මූත්‍ර කාරකයක්ද වෙයි. (Diuretic) මූත්‍ර හොඳින් පහවීමටත් මූත්‍ර මාර්ග යේ ඇතිවන අසාධාරන (UTI) සුව වීමටත් පොල් වතුර හොඳ ඖෂධයක් ලෙස සැලකේ.

වස විසවලින් හා දරුණු විස බීජවලින් ආරක්ෂා වීමට

අප්‍රිකානු හා ඉන්දියානු මෙන්ම ශ්‍රී ලංකාවේදීද දේශීය වෛද්‍ය කර්මයේදී විස ඖෂධවල විස ගතිය ඉවත් කිරීමට පොල් වතුර භාවිත කොට තිබේ.

එමෙන්ම බටහිර ඖෂධ අධි මාත්‍රාවලින් ශරීරගතවීමකදී ඒවායේ විෂ හරණය කිරීමටත්, මෙරට ජනයා ආහාරයට ගනු ලබන, ආහාර වර්ගවල ඇතැයි කියනු ලබන පළිබෝධ නාශක ශේෂ කොටස් මෙන්ම ආසනික් හා කැඩ්මියම් වැනි බැර ලෝහ නිසාවෙන් සිදුවන හානිය අවම කිරීමටත් පොල් වතුර ඉවහල් විය හැකි බවට විශ්වාස කළ හැකි විද්‍යාත්මක තොරතුරු බොහොමයක්ම ඇත.

පොල්,
කුරුම්බා සහ තැඹිලි වතුරෙහි අඩංගු වෙන මොනොලෝරින් (Monolaurine) සතුව ව්‍යාධිජනක බැක්ටීරියා, වෛරස් හා ප්‍රොටාසෝවා මෙන්ම, තද ලිපිඩ ආවරණයක් සහිත හර්පීස් සයිටොමෙගලෝ වෛරස් වර්ග මෙන්ම HINI වැනි දරුණු ප්‍රතිශ්‍යාකාරක වෛරස් වර්ගත් විනාශ කිරීමේ ප්‍රභල හැකියාවක් සතු වන බව පැවසෙනවා. එමෙන්ම මොනොලෝරින් සතු විශිෂ්ට ක්‍රියාකාරිත්වය අපගේ ප්‍රතිශක්තිකරණය පද්ධතිය දියුණු කෙරෙන නිසාවෙන් රෝගවලින් අපව ආරක්ෂා කෙරෙන බවත් සොයාගෙන ඇත.

හදවතට හිතකර මේදයද අන්තර්ගත වේ.

යෞවනත්වයේ, දීර්ඝායුෂ ලැබීමේ උල්පත සයිටොකයිනින්.

පොල් වතුරෙහි තිබෙන විටමින්, බනිජ ලවන හා අනිකුත් පෝෂණ ගුණයන්ටත් වඩා වැදගත් විශිෂ්ට ගුණය වන්නේ මෙහි තිබෙන ශාක සයිටොකයිනින් සංයෝගවලින් අපගේ සිරුරට ලැබෙන ගුණය බව නොඅනුමානය.

සයිටොකයිනින් යනු පයිටෝ හෝර්මෝන නොහොත් ශාක හෝර්මෝනයන් වෙයි. මෙම හෝර්මෝන වර්ග ශාකය වයසට යෑම, වර්ධනය, විකසනය හා සංවර්ධනය පාලනය කිරීමට ඉවහල් වේ.

නමුත් මෙම ශාක හෝර්මෝනවලින් මිනිසාට ඇති ඵළ ප්‍රයෝජනය කවරේදැයි විද්‍යාඥයෝ මෑතක් වන තුරුම සොයාගෙන නොසිටියහ.

කෙසේ වෙතත්, විද්‍යාඥයින් දැන් අවධාරණය කරන්නේ, මෙම සයිටොකයිනින්වලින් පොහොසත් ආහාර සුලභව ලබා ගැනීම, දීර්ඝායුෂ වීඳීම සහ වයසට යෑමේදී මතු වන සංකූලතා අවම වීමටත්, යෞවන පෙනුම වැඩි කාලයක් රැක ගැනීමටත් ඉවහල් වන බවයි.

පොල්වතුර වනාහී මෙම ශාක හෝර්මෝනයන්ගෙන් පරිපූර්ණ ආහාරයකි.

පිළිකා පාලනය කිරීමේ ගුණය

පෙර කී සයිටොකයිනින් මගින් වයසට යැම පාලනය කිරීමට අමතරව, නිරෝගී සෛල විභාජනය යහපත්ව පවත්වා ගෙන යමින් පිළිකාමය සෛල විනාශ කිරීමටත් හේතු වන බව විද්‍යාඥවරු අවධාරණය කරනවා. මීට අමතරව පොල් වතුර පිළිකා ඇතිවීමට හේතු වන නිදහස් මූක්ත කණ්ඩක විනාශ කරන ප්‍රතිඔක්සිකාරකවලින්ද පොහොසත් බව සොයා ගෙන ඇත.

බර අඩු කර ගැනීමට කදිම පානයකි

1999 වර්ෂයේ ඇමරිකාවේ යේලේ සරසවියේදී කර ඇති අධ්‍යයනයකදී හෙළිවී ඇත්තේ පොල් වතුර සීනි සහිත ආහාර ගැනීමට කෙනෙකු තුළ ඇති වන කෑදරකම පහ කරන බැවින් බර අඩුකර ගැනීමට කදිම පානයක් ලෙස යොදා ගැනීමට හැකි බවය.

අනෙක් අතට විටමින් සී සුලභ ආහාර ගන්නා උදවිය බර පාලනය කර ගැනීමේ සමතුන් බව, ඇරිසෝනා ප්‍රාන්ත සරසවියේ කර ඇති තවත් අධ්‍යයනයකදී හෙළි වී ඇත. පොල් වතුරවල විටමින් සී අනුනය.

පොල් වතුරෙහි තිබෙන වෙනත් ගුණයන්.....

දියවැඩියා රෝගය පාලනයෙහි ලාද පොල් වතුර වැදගත් වන බව සොයා ගෙන තිබෙනවා.

එමෙන්ම ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රධානී, මෝරින් සැටින් මහතා අවධාරණය කරන්නේ, මේ ලොව තිබෙන විශිෂ්ටතම ශක්ති ජනක පානය වන්නේ පොල්වතුර බවයි.

පොල් වතුරෙහි සින්ක් හා සෙලේනියම් වැනි බණිජ ලවන වර්ග තිබෙන බැවින් ලිංගික සරු භාවයටත්, මඳ සරුභාවය දුරු කිරීමටත් පොල් වතුර ගුණදායක බව පැවසෙනවා.

පොල් වතුරෙහි තිබෙන විශිෂ්ට අයනික ගුණය නිසාවෙන් ඔබ ලබා ගන්නා ඖෂධ වර්ග ලෙහෙසියෙන්ම සිරුරට උරා ගැනීමටත්

22 වන පිටුව බලන්න

■ සිරිසේන විතානගේ

ප්‍රබන්ධ වර්ග

ප්‍රබන්ධ වර්ග විවිධය. ඒ එක් එක් ප්‍රබන්ධයේ හැඩය වෙනස්ය. එබැවින් ඒ පිළිබඳවද කෙටියෙන් හෝ යමක් දැන සිටීම ප්‍රයෝජනවත්ය.

1. විවරණාත්මක හෙවත් විස්තරාත්මක ප්‍රබන්ධ
2. විමර්ශනාත්මක හෙවත් විචාරාත්මක ප්‍රබන්ධ
3. වර්ණනාත්මක ප්‍රබන්ධ
4. කාල්පනික හෙවත් නිර්මාණාත්මක ප්‍රබන්ධ යනු ඉන් සමහරකි.

1. විවරණාත්මක ප්‍රබන්ධ

'මගේ මවුබිම සැරසිය හැක්කේ මගේම ශ්‍රමයෙනි' යන මාතෘකාව යටතේ ඔබ ලිවීමට සැරසෙන්නේ යැයි සිතන්න. මෙහිදී ඔබට කරන්නට සිදුවන්නේ කුමක්ද? මගේ මවුබිම මගේම ශ්‍රමයෙන් සරසන්නේ කෙසේද යන ප්‍රශ්නය ඔබම නගා ගනිමින් එයට පිළිතුරු සැපයීමයි. එසේ නම් ඔබ ඒ සඳහා දීර්ඝ වූත් විවිධ කරුණු ඇතුළත් වූත් විස්තරයක් ලිවිය යුතුය. මෙහිදී ඔබට ඔබේ මුතුන් මිත්තන් ඔවුන්ගේ ශ්‍රමයෙන් මවුබිම සරසා ඇති සැටි මෙනෙහි කරන්නට සිදුවෙයි. වර්තමානයේ ඔබේ සොයුරු ජනයා මවුබිම සරසන්නට ශ්‍රමය යොදවන අයුරු මැදිහත්ව සිතන්නට සිදුවෙයි. අතීත, වර්තමාන අත්දැකීම් ඔස්සේ අනාගතය වෙත ඔබ හෙළන බැලුම් කෙබඳුදැයි සිතන්නට සිදුවෙයි. මේ සියල්ල පිළිබඳව කෙරෙන විවරණ, විස්තර නිසාම මෙවැනි මාතෘකා විවරණාත්මක ප්‍රබන්ධ ගණයට වැටෙයි. ඉතිහාසයෙන් ඔබ දැනගත් දුටුගැමුණු, මහපැරකුම්බා වැන්නවුන් රට නගන්නට ගත් වෑයම පිළිබඳ කරුණුත් ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත් වැනි මාධ්‍ය මඟින් ඔබ දැනගත් මෑත කාලීන කරුණුත් විවරණය කොට මවිබිම සරසන්නට ඔබේ ශ්‍රමය යොදන්නේ කෙසේද යන්නට පිළිතුරුත් මෙහිදී විස්තර කිරීම කළ හැකි වේ.

2. විමර්ශනාත්මක ප්‍රබන්ධ

විමර්ශනය, විචාරය, විවේචනය යන වචන ඔබට අමුතුවෙන් විස්තර කළ යුතු නුහුරු වීවා නොවේ. කිසියම් දෙයක් පිළිබඳව හේතු සහිතව, තර්කානුකූලව, සංසන්දනාත්මකව විමසා බැලීම ඉන් අදහස් කෙරේ. විමර්ශනාත්මක ලිපියක් ලිවීමේදී කෙරෙන්නේද මෙයමය. මෙවැනි මාතෘකාවක ඇති විශේෂ ලක්ෂණය නම් විවිධ පැතිවලට විහිදෙ යන එකකට එකක් පරස්පර වන අදහස් හෙවත් මත කිහිපයක් එය තුළ ගැබ්ව තිබීමයි. විස්තරාත්මක ලිවීමකදී නම් ඔබ විසින් ලියන මාතෘකාවට අනුව එක දිගට එකම රේඛාවක් ඔස්සේ කරුණු විස්තර කරගෙන යා හැකිය. එහි ඇත්තේ ස්ථිර වූත් මතභේදයෙන් තොරව කාටත් අනුමත කළ හැකි පොදු කරුණුය. එහෙත් විමර්ශනාත්මක ප්‍රබන්ධයක් ලිවීමේදී මාතෘකාවේ ඇතුළත් කරුණු සියල්ලන් විසින් එක සේ අනුමත නොකරන වීවා විය හැකිය. එසේම එකම කරුණ පිළිබඳව විවිධ දෘෂ්ටි කෝණවලින්, පැතිවලින් බලන්නට හැකි වීවා විය හැකිය.

'පරමාණු බලය හා අනාගත ලෝකය' යන මාතෘකාව ගනිමු. මෙතැනදී විශේෂයෙන්ම ඔබට මතක් කළ යුත්තක් ඇත. එනම් මාතෘකාව ඉතාම සියුම්ව ඔබ විසින් අර්ථකථනය කරගත යුතු බවය. මේ මාතෘකාවෙන් අදහස් කරන්නට ඇත්තේ කුමක්ද යන ප්‍රශ්නය ඔබම නගා ගෙන එය මැනවින් වටහා ගන්නට උත්සාහ කළ යුතුය.

පරමාණු බලය හා අනාගත ලෝකය යන මාතෘකාවට අනුව අවශ්‍ය කරුණු මනසින් සකස් කර ගැනීමෙන් එම ලිපිය යා යුතු මග තීරණය කිරීමට ඔබට පහසු වනු ඇත. 'පරමාණු බලයෙන් අනාගත ලෝකයට යහපතක් සිදුවිය හැකිද? අයහපතක් සිදුවනු ඇත්ද?' යන මාතෘකාව තුළ දෙපැත්තකට කරුණු තිබෙන බව ඔබට පැහැදිලි වනු ඇත. එක් පැත්තකට පමණක් බර කරුණු ලිපියකින් ඉදිරිපත් කළහොත් එය අසම්පූර්ණ වූවක් වේ. එබැවින් පරමාණු බලය ලෝකයේ යහපත සඳහාත් අයහපත සඳහාත් උපයෝගි කොට ගත හැකි අයුරුත් අතීතයේ එය යහපත සඳහා කෙසේ උපයෝගී වී ඇද්ද? අයහපත සඳහා කෙසේ උපයෝගී වී ඇද්ද? යන කරුණුත් වර්තමානයේ එය යහපත සඳහා යොදා ගන්නටත් අයහපත සඳහා යොදා ගන්නටත් උත්සාහ ගන්නා අයුරුත් ඔබේ නිගමනයන් සමග සංසන්දනාත්මකව අදාළ ලිපියේ ඇතුළත් විය යුතුය.

විමර්ශනාත්මක ප්‍රබන්ධකරණයට අයත් තවත් මාතෘකාවක් ගැන විමසා බලමු. 'රටේ දියුණුව පතන අපි වඩා බර විය යුත්තේ පොතටද? නැතහොත් කෙතටද?' මෙය පැහැදිලිවම දෙපැත්තක් ඇති මාතෘකාවක් බව පෙනෙයි. පොතට බර වීමෙන් සිදුවන්නේ කෙබඳු සංවර්ධනයක්ද? කෙතට බර වීමෙන් සිදුවන්නේ කෙබඳු සංවර්ධනයක්ද? මේ දෙක ගැනම සියුම්ව සිතීමට ඔබට සිදුවෙයි. දෙකටම අයත් කරුණු සහේතුකව ඉදිරිපත් කළ යුතු වෙයි. අවසානයේ මේ දෙක්හිම එක්තැන් වීම තුළින් නැතහොත් උගත්කමත්, ශ්‍රමාභිමානයත් එක්තැන් වීමෙන් ඇති වන දියුණුව වඩාත් අගය කළ යුතු බව ඔබේ ලිපියෙන් පළ කළ හැකි වුවහොත් ඔබ සාර්ථක ප්‍රබන්ධයක් ලිවී යයි සතුටු විය හැකිය.

3. වර්ණනාත්මක ප්‍රබන්ධ

යමක් පිළිබඳව ඔබ සතුව ඇති අත්දැකීම රසවත්ව, විසිතුරුව කියා පෑම වර්ණනයයි. අසන්නාගේ හෝ කියවන්නාගේ සිතෙහි ඔබේ අත්දැකීම් ඒ ආකාරයෙන්ම සිත්තම් කිරීමට ඔබ සමත් විය යුතුය. තවත් අයුරකින් කිවහොත් ඔබේ වර්ණනය ආසාවෙන් කියවීමේ හැකියාව ඔබ පාඨකයාට ලබා දිය යුතුය. 'ගංවතුර ගැලූ දා' යන මාතෘකාව ගනිමු. දැන් කළ යුත්තේ කුමක්ද? ගංවතුර ගැලූ දා ගැන ඔබ ඇසූ දුටු දෑ වර්ණනය කිරීමයි. නැතහොත් ඔබ දුටු ගංවතුර කියවන්නාගේ මනසේ ඇඳීමට සමත් රචනයක් ලිවීමයි. මෙහිදී ඔබේ මනසට ගංවතුර සම්බන්ධ දහසකුත් එකක් ලොකු කුඩා සිතුවිලි ඇදී එනු ඇත. එයින් වඩාත්ම වැදගත් දෑ තෝරා බේරා ගත යුතුය. බොහෝ දෙනෙක් දුර්වල ලිපි ලියන්නේ වර්ණනාත්මත මාතෘකා යටතේ යයි කිවහොත් ඒ නිවැරදිය. පහසුම ලිපි ලිවීමේ මග මෙය වුවත් එසේ වන්නේ අවශ්‍ය කරුණු තෝරා බේරාගෙන ලියන්නට උනන්දු නොවීම නිසාය.

'ගංවතුර ගැලූ දා' මාතෘකාව ගනිමු. අහසේ වැහි වලාකුළු නැගුණු සැටි, වැස්සට පෙර විදුලි කොටා ගෙරවූ සැටි, වැස්සට පෙර මිනිසුන් හැසිරුණු හැටි, මිනිසුන් කුඩ ඉහළාගෙන ගිය හැටි, වැස්ස පිළිබඳ විද්‍යාත්මක දත්ත ආදි අනවශ්‍ය දෑ රැසකින් ලිපිය සරසන්නට බොහෝ දෙනා උත්සාහ දරති. අවසානයේ ලිපිය ලියවී ඇත්තේ ගංවතුර ගැන නොව වැස්ස ගැන යයි හැඟෙන තරමට මාතෘකාවෙන් බැහැර ගොස් ඇත. ගඟ පිටාර ගොස් ක්‍රමයෙන් ජලය වැඩි වූ සැටි, ගෙවල් වහල පමණක් පෙනෙන සේ වතුරෙන් යට වූ සැටි, ප්‍රදේශයම එකම මුහුදක් බවට පත් වූ සැටි, අනතුරට පත් ජනයාගේ විලාප හඬ, ඔවුන් බේරා ගැනීමට ගත් විවිධ උත්සාහයන්, ජල රකුසා කළ විනාශයෙහි තරම ආදි දෑ වර්ණනාවට ලක් වී නම් කොතරම් හොඳ ලිපියක් බිහිවීමට ඉඩ තිබුණිද?

2. කාල්පනික හෙවත් නිර්මාණාත්මක ප්‍රබන්ධ

රචකයකුගේ ස්වාධීනත්වයට ඉඩකඩ සලසන එකම ප්‍රබන්ධ වර්ගය මෙයයි. වෙනත් ප්‍රබන්ධ රචනාවලින් බොහෝ දුරටම අනුන්ගේ අදහස් උපයෝගී කොටගත්තද මෙහිදී ඔබ තමන්ගේම අදහස් ඉදිරිපත් කළ යුතුමය. අනුන්ගේ අදහස් ඇසුරු කරගත්තද වීවාද තමන්ගේ බවට පත්කර ගත යුතු වෙයි. මේ ස්වාධීනත්වය නිසාම නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේදී ඔබ මත පැවරෙන වගකීමේ භාරදූරකමද වැඩි වෙයි.

නිර්මාණය යනු අලුතින්ම යමක් ඉදිරිපත් කිරීමයි. වෙනත් තැනක ඇති දෙයක් ඒ හැටියෙන්ම ඉදිරිපත් කිරීම නිර්මාණයක් නොවේ. එය කොපි කිරීමකි. එසේත් නැත්නම් පිටපත් කිරීමකි. මේ ප්‍රබන්ධ වර්ගයේදී බොහෝ දුරට ඔබේ කල්පනා ශක්තියෙන් ප්‍රයෝජන ගැනීමට සිදුවේ. 'මා දුටු සිහිනයක' යන මාතෘකාව ගනිමු. මෙහිදී ඔබට සිදුවන්නේ කල්පනා ලෝකයේ මවාගත් සිහිනයක් ගැන ලිවීමටයි. සිහිනය යනු කෙබඳු එකක්දැයි යන ඔබ සතු දැනුමෙන් ප්‍රයෝජන ගනිමින් ඔබේ කල්පනාමය දර්ශන රැසක් ඇතුළත් කොට මේ සිහිනය නිර්මාණය කරන්නට ඔබ සමත් විය යුතුය. මෙවැනි ලිපි ලිවීමේදී රසවත් බව අනිවාර්යයෙන්ම අන්තර්ගත විය යුතු බව කල්පනාවට ගත යුතුය.

විශේෂ කරුණු

ප්‍රබන්ධකරණයේදී භාෂාව ඉතා වැදගත්ය. මූලිකව එය ව්‍යාකරණයට අනුගත විය යුතුය. උක්තාඛ්‍යාත සම්බන්ධය ගැනත්, අක්ෂර වින්‍යාසය ගැනත්, සෙසු භාෂා රීතීන් ගැනත් දැඩි සැලකිල්ලක් දක්වා තිබීම අවශ්‍යය. මෙහි මූලදීම කීවාක් මෙන් ලිඛිත, කථිත රීති දෙක මිශ්‍ර නොකර ගත යුතුය. අප විස්තර කළ මුල් ප්‍රබන්ධකරණ ලිපි වර්ග තුනේදීම ලිඛිත ව්‍යවහාරය අනුගමනය කළ යුතුය. නිර්මාණාත්මක රචනයේදී සංවාද ඇතොත් පමණක් වීවා කථිත ව්‍යවහාරයෙන් ලිවිය යුතු අතර සෙසු කොටස් ලිඛිත ව්‍යවහාරය අනුගමනය කළ යුතුය. ලියූ ලිපිය නැවත කියවීමෙන් එහි වැරදි නිවැරදි කරගන්නට ඔබට ලැබෙන අවස්ථාව ඉතා වටිනා බව සලකන්න.

අභ්‍යාස

1. පුවත්පත්වල විවිධ මාතෘකා යටතේ පළවූ ලිපි හැකි පමණ සොයාගෙන කියවන්න. වීවායේ භාෂාමය වැරදි ඇතොත් ලකුණු කරන්න.
2. ඉහත වර්ග 4 ට අයත් ප්‍රබන්ධ ලිපි 10 බැගින් ලියන්න.
3. ඔබ ලියූ ලිපි නැවත නැවත කියවා වීවායේ අඩුලුහුඬු මග හරවන්න.

සිංහල භාෂාව හැදෑරීමට කැමැත්තක් දක්වන පිරිස වෙනුවෙන් ලියවුණු 'සිංහල උගනිමු' පාඩම් මාලාව මින් අවසන් වනවා.

නව වසරේ දිවත්...

6 වන පිටුවෙන්

පමණක් මුදල් වෙන් කරන සමාජ සේවා කටයුතුවලින් පමණක් දිළිඳු කම නැති කිරීම යනු කාන්තාරයේ දිය සෙවීම වැනි අසාර්ථක ප්‍රයත්නයක් වන්නේය.

මෙතෙක් ශ්‍රී ලංකාවේ නගරයෙන් බැහැරට විශේෂයෙන් බස්නාහිර පළාතෙන් බැහැරට දුගී බව පිළිබඳව ඇස යොමුව ඇත්තේ ඉතා අඩුවෙන් බව පිළිගත යුතුව ඇත. අධ්‍යාපනය, සෞඛ්‍යය, නිවාස, විදුලිය ආදි අත්‍යවශ්‍ය පහසුකම් දිවයිනේ ඈත ඇතැම් ප්‍රදේශ කරා තවමත් ළඟා නොමැති බව නිතර නිතර පුවත්පත්වල පළවන වාර්තාවලින් අනාවරණය වෙයි. මෙහි මූලදී සඳහන් කළ දේශපාලනඥයා 'නොකා මිය ගිය අයෙක් නැතැ' යි කීවද බඩ පිරෙන්නට නොකා ජීවත්වන, ඇඟට දිරා ගිය වැරහැල්ලක් ඇඳ සිටින, වැස්සට තෙමෙමින් නොනිදා රැය පහන් කරන, පැල්පත්වල ජීවත් වන මිනිසුන්ගෙන් ලක් දෙරණ තවමත් සම්පූර්ණයෙන් ඈත්ව නැති බව කිව යුතුය. දේශපාලනඥයන්ගේද සහභාගිත්වයෙන් සිදුවන මහා පරිමාණ වංචා දූෂණ රට තුළ සිදුවන්නේ මෙවැනි තත්ත්වයක් තිබියදීය. රටකට ඉසිලිය නොහැකි ණය බරක් තිබියදීය. එබඳු තත්ත්වයක් මත දුගී ජනගහනය දෙස විශේෂ අවධානයක් යොමු කිරීමට රජයට නොහැකි බවද අරුමයක් නොවේ. එහෙත් ඒ තත්ත්වයන් වළක්වා ගනිමින් ශ්‍රී ලංකාව තුළ පවත්නා සුවිශාල සමාජ ප්‍රශ්නයක්ව ඇති දිළිඳු කම පිටුදැකීමේ ගැටලුවට ස්ථිරසාර විසඳුම් සෙවීමට, නිදහසින් වසර 70 ක් ඉක්ම යමින් පවතින මේ මොහොතේ හෝ රජය උත්සුක විය යුතුමය.

ගත වූ 2017 වසර රජය හැඳින්වූයේ 'දුගී බවින් මිදීමේ වසර' හැටියටය. එහෙත් ඒ සඳහා ගත් මොනම පියවරක් වත් එම වසර තුළ දක්නට නොලැබුණි. ලැබුවා වූ නව වසර 2018, හඳුන්වා ඇත්තේ 'කුසගින නිවීමේ වසර' හැටියටය. මෙම නව වසරේදී වත් ඒ සඳහා නිසි වැඩපිළිවෙළක් යෙදී රටේ සෞභාග්‍යයේ ගමන ඇරඹේවායි 'දසත' ප්‍රාර්ථනා කරයි.

ගෝලීය උණුසුමෙන්...

8 වන පිටුවෙන්

පෘතුගාලයේ හා වයඹදිග ස්පාඤ්ඤයේ ඇති වූ සාමාන්‍ය ලැව් ගිනි හේතුවෙන් හෙක්ටයාර් 25000 ක භූමි ප්‍රමාණයක් විනාශ විය. ඉදිරි කාලය ඇතුළත මධ්‍යධරණී කලාපයේ ලැව් ගිනි අවදානම ඉහළ අගයක පවතින බව කාලගුණික අනාවැකි අවධාරණය කරයි. දේශගුණික වෙනස්වීම් මානව සෞඛ්‍යය කෙරෙහි බලපානු ලබයි. ගෝලීය උණුසුම හේතුකොටගෙන වර්ෂ පිළිකා වැළඳීමත්, ශ්වසන ආබාධ ඇති වීමත් වැඩිවී තිබේ. එමෙන්ම උෂ්ණත්වය, වර්ෂාපතනය, ආර්ද්‍රවතාව, වර්ධනය වීම හේතුවෙන් වායු ගෝලීය ජලවාෂ්ප ප්‍රමාණය වැඩිවීම සිදුවේ. වසංගත රෝග ව්‍යාප්ත වීමට සුදුසු පරිසර තත්ත්වයන් ඉන් ගොඩ නැගේ. මැලේරියා, ඩෙංගු, කොළරාව, බරවා, කුරුළු උණ ව්‍යාප්ත වීමටද දේශගුණික වෙනස්වීම් බලපා තිබේ. ජලයේ වායුවේ ගුණාත්මක භාවය අඩුවීම, ආහාරවල ප්‍රෝටීන් ප්‍රමාණය අඩුවීම, රෝග කාරකයන් වර්ධනය වීම සඳහා සුදුසු පරිසර තත්ත්ව ගොඩනැඟීම වැනි දේශගුණික විපර්යාසයන්ගෙන් ඇති වන බලපෑම් නිසා මිනිසාගේ සෞඛ්‍යය තත්ත්වය දිනෙන් දින පිරිහීමට ලක්වේ. මෙලෙස සමස්තයක් ලෙස බලන විට දේශගුණික විපර්යාස සිදු වීමට නියමිත කාලයක් වකවානුවක් හෝ සීමාවක් නොමැත. එය විවිධාකාරයෙන් විවිධ ප්‍රදේශවලට බලපෑම් වල්ල කරනු ලබයි. සමස්ත දේශගුණික රටාවම උඩු යටිකුරු කිරීමට දේශගුණික විචල්‍යයන්ගේ වන වෙනස්කම් බලපා ඇති අතර, ඒ අතරින් ගෝලීය උණුසුම් වීම ප්‍රධාන වන බව මේ අනුව හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයකි.

දේශගුණික විපර්යාස අවම කිරීම උදෙසා ලෝක ප්‍රජාව පෙළ ගැසිය යුතු කාලය එළඹ ඇත. ඒ අනුව දේශගුණික විපර්යාස නම් ගැටලුවට මුළු ලොවම එකතු වී විසඳුම් සෙවිය යුතුය. දේශගුණික සමතුලිතාව දිගටම පවත්වා ගෙන ගොස් අසිරිමත් සොබාදහමක් අනාගත පරපුර සඳහා උරුමකර දීම අප සතු වගකීමකි.

අද කොළඹ...

9 වන පිටුවෙන්

යේ කොළඹ හා ආශ්‍රිතව ඇත් ගාලක්ද පවත්වාගෙන ගොස්තිබෙන බවත් ඇතැම් පැරැණි සිතියම් පරීක්ෂා කර බැලීමේදී පෙනේ. කවාකාර වහලවලින් යුත් ගබඩා ගොඩනැඟිලි බොහොමයකින්ද කොළඹ සමන්විත වූයේ ලන්දේසි පාලන කාලයේදීයි. ඒවායින් වැඩි ප්‍රමාණයක් කොළඹ වරාය නවීකරණය කළ විට දහස් නවසිය පනහ දශකයෙහි පමණ සිඳ බිඳ දමා තිබේ.

මේ අතර පෘතුගීසී යුගයේ කොළඹ කොතැනත් පැවැති දේවස්ථාන හා පල්ලි සියල්ලම පාහේ ලන්දේසිහු විනාශ කළහ. එසේ වනසා දැමූ ඔවුහු ඒවා සමහරක් තම කම්හල් බවට පත් කොට ගත්හ. අදත් කොළඹ දක්නට ලැබෙන අතුරු මාර්ග හෙවත් වීටි ගොන්නෙහි වීටි බොහොමයක්ම එදාත් දක්නට ලැබුණේය. 'කැනල් රෝඩ්' යනු ඒ අනුව අද මෙන්ම එදාත් කොළඹ තිබූ පාරකි. එසේම මෙකල කා අතරත් පාහේ ප්‍රසිද්ධ යෝක් වීටියද එදාත් කොළඹ තිබුණු තවත් පාරකි. කොළඹ හරස් පාර එවක ලන්දේසි ආණ්ඩුකාරවරයාගේ නිල නිවහනට යාබදම පාර විය. කුමාර වීදිය පෘතුගීසීන් ඉදිකළේ තම විවිධ නිවහන්වලට පිවිස ගත හැකි ප්‍රවේශයක් හැටියටයි.

ලන්දේසි කාලයේම බියර් ස්ට්‍රාට් පාර ලෙස හැඳින් වූ වර්තමාන 'චැතම් වීදිය' එකල කොළඹ නගරයේ අග්‍රගණ්‍යතම වීදිය ලෙස කිරුළු දරා සිටියේය. මේ වීදි දෙපස නිවාසවල බොහෝ දෙනෙක් පදිංචි වී සිටියහ.

ලන්දේසින් ගෙනා පංකාව

පරංගි බලය අභිබවා ලන්දේසි බලය තහවුරු වීමත් සමගම කොළඹ ගොඩනැඟුණු ගොඩනැගිලිවලද, සුවිශේෂී ලක්ෂණ ගණනාවක්ම දැකගත හැකි විය. එම ගොඩනැඟිලිවල ජනෙල්වත් විදුරුවත් දක්නට ලැබුණේම නැති තරම්ය. එනම් ඒ දොර මෙන්ම ජනෙල් පියන්පත්ද නිමවා තිබුණේ දැව හා යකඩ පොලුවලිනි. මෙකල එක් මොහොතකින් අප ගත දාහය නිවාලන විදුලි පවන් පත නැත්නම් පංකාව කොතරම් නවීකරණයකට ලක්වී තිබේද?

මෙයද අප රටට මුලින්ම හඳුන්වා දුන්නේ කොළඹ නගරයෙනි. ඒත් ලන්දේසි කාලයේදීයි. ලන්දේසි ජාතිකයකු වූ මැක්ඩොවල් නම් ජනරාල්වරයා මේ පවන්පත මුලින්ම කොළඹට හඳුන්වා දුන්නේය. මෙසේ හඳුන්වා දුන් මෙය එදා ගොඩනැඟිලි වහලයේ වූ විශාල ලීයක සවිකළ පවන් පතක් විය. ලී පුවරුවකට සවි කළ කඹයක් ඇදීමෙන් එදවස මෙය ක්‍රියාත්මක කරවීමටද වෙනම සේවකයෙක් සිටියේය.

වුල්ෆන්ඩෝල්

පෘතුගීසි පාලන කාලයේ ඉදිවී ශාන්ත ෆ්‍රැන්සිස් පල්ලිය යන නමින් විරුදාවලිය ලබා ලන්දේසි යුගය තුළදී වුල්ෆන්ඩෝල් නමින් ඉතිරි වූ පල්ලියද අතීතයේ කොළඹ පවැති විශේෂ ඉදිකිරීම් අතර තවත් එක් ගොඩනැඟිල්ලකි. ආචාර්ය ආර්. එල්. බ්‍රෝහියර් සිය CHANGING FACE OF COLOMBO ග්‍රන්ථයෙහි ඒ පිළිබඳව තබා ඇති සංක්ෂිප්ත එහෙත් අර්ථ ව්‍යාඛ්‍යාවෙන් අතිශය පුළුල් වූ සටහනක් මෙසේය.

'අතීතයට සැපත් වීම ප්‍රශස්ත ක්‍රියාවලියකි. ඒ අතීතයට යට වූ වකවානුවේ නිමග්න වීම එහි ද්‍රව්‍ය අතපත ගෑම, එම යුගයට අයත් පුද්ගලයන් පිළිබඳව මනඃකල්පනය කිරීම, එකල දිවි පෙවෙත් ආවර්ජනය කිරීම යන මේවාද ආනන්දජනක ක්‍රියාවලි වේ. මේ පල්ලියට ඇතුළු වන්නෝ අනිවාර්යයෙන්ම ඒ යට ගිය ලොවටද ඇතුළු වෙති. ඇතුළු වී ඒ සියල්ල ආවර්ජනය කිරීමට පෙළැඹෙති. පල්ලිය සතු ඒ සුවිශේෂ පරිසරය එවැනි පෙළැඹවීමක් ඇති කරයි'

බ්‍රිතාන්‍ය යුගයේ කොළඹ

ඕලන්ද ආධිපත්‍යය මුළුමනින්ම පාහේ ශ්‍රී ලංකාවෙන් තුරන් වන විට මෙරට කොළඹ ප්‍රදේශය පුරාවෙහිම වැපිරුණේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ බීජයෝයි. මෙම බීජ ක්‍රමයෙන් වැපිරුණා. 1803 දී පමණ කොළඹ කොටුවේත් ඒ අවටත් බ්‍රිතාන්‍යයමය විලාසිතාවන්ගෙන් නොඇඹුව තිබිණ. කොළඹ සිට ගාල්ල තෙක් දිව ගිය බොරළු පාර තුළ මේ විලාසිතාවලින් සැරසුණු බොහෝ අය අසුන් පිට නැඟී ගියහ.

මෙකල නොයෙක් දුරාචාරයන්ගෙන් පාරාදීසයන් බවට පත් වී තිබෙන කොළඹ සමාජ ශාලාවන්ගේ ආරම්භයද අද රියේ සිදුවූවක් නොවේ. එහි ඓතිහාසික අක්මුල්ද බ්‍රිතාන්‍ය යටත් විජිත අධිරාජ්‍ය සමය තෙක් දිව ගිය එකකි. තවදුරටත් සඳහන් කළහොත් බ්‍රිතාන්‍යයෝ ශ්‍රී ලංකාව අල්ලාගෙන වසර හතරක් ගෙවී යන්නටත් පෙර මේ සමාජශාලා කොළඹ නගරය පුරා ව්‍යාප්ත කළහ. මෙම සමාජ ශාලා වූ කලී හුදෙක්ම එම බ්‍රිතාන්‍යයිනට ආගන්තුක බිමෙක පිහිටුවා ගත් කුඩා වංගලන්තයක් මෙන් වූ බව ආචාර්ය ආර්. එල්. බ්‍රෝහියර් සිය CHANGING FACE OF COLOMBO කෘතියෙහි වැඩිදුරටත් සඳහන් කර තිබේ.

රැකටි අංගනය

අතීත ප්‍රතිරාව විමසා බලන විට කොළඹට යුග යුග ගණන්වලදී අභිමානයක් එක් කළ තවත් පෙදෙසක් වූයේ 'රැකටි අංගන' ප්‍රදේශයයි. කොළඹ මුල්ම වරට එදා නිශ්ශබ්ද චිත්‍රපට පෙන්නුවේද මේ රැකටි අංගනයෙහිදීය. එපමණක්ද නොව රඟල් සිනමා ශාලාවේද ආදි ශාලාව මෙය වූ අතර කොළඹ මුල්ම නාට්‍ය ශාලාවත් වූ මෙය ප්‍රකට සිලෝන් තියටර් සමාගමටද මං පෙත් පෑදීය.

මීයන්ගෙන් ව්‍යාප්ත වන 'මහාමාරය' නම් වසංගතය කොළඹත්, ඒ අවටත් ශීඝ්‍රයෙන් පැතිරී ගියේත් මෙම අවධියේදීමය. එකල කොළඹ නිරන්තරයෙන් ආනයනය කෙරුණු සහල්ද මේ මීයන්ගෙන් බේරා ගැනීම මහත් වූ අසීරු කටයුත්තක් විය. එහෙයින් බ්‍රිතාන්‍යයන් මෙහිලා ඉදිරිපත් කොට ක්‍රියාත්මක කළ එකම පිළිවෙත වූයේ මීයන්ට රිංගා ගත නොහැකි සහල් ගබඩා ඉදිකිරීමයි. රැකටි අංගනය මෙවැනි ආරක්ෂිත සහල් ගබඩාවක් ලෙසද කාලයක් පැවතිණි.

කියුරිකල් රථය

'කියුරිකල්' යනුවෙන් බ්‍රිතාන්‍ය යුගයේ කොළඹ ආශ්‍රිතව නිතර දක්නට ලැබුණු වාහන විශේෂය පිළිබඳව තතු දන්නන් අද ඇතැම්විට ඉතා සුළු ගණනක් වන්නට පිළිවන. මෙනමින් හැඳින් වූයේ රෝද තුනක් සහිත තල්ලු කරගෙන යන කරත්ත විශේෂයකි. එකල උදේ කාලයේ බොහෝ විට මේවා මත නැඟ කොළඹ නගරය පුරා සැරි සැරුවෝ ධනවත් කාන්තාවෝය. මෙවැනි කරත්තවලට අමතර අශ්වයන් බඳින ලද කුඩා කරත්ත විශේෂයන්ද පුරාණ කොළඹ නගරය පුරා දිව ගියේය. මෙවක කොළඹ ගාලූ මුවදොර පිටිය ඉදි වී තිබුණේ නැත.

පැරැණි කොළඹ නගරයේ පුරාවත මෙලෙස විමසුමට ලක්කිරීමේදී ඒ ආශ්‍රිතව පැවැති බේරේ වැව ගැනද කතා නොකර බැරිය. සැබවින්ම එදා කොළඹ නගරයට සුන්දර ගම්බදක අසිරිය එක් කළේද මෙකී වැවමය. එය එදා අදට වඩා සුවිශාල බිම් පෙදෙසකද විහිදී තිබුණු අතර එහි වැඩි ජල ධාරිතාවක්ද අල්ලා ගත්තේය. පුංචි පුංචි රුවල් යාත්‍රා සේම බෝට්ටුද උපයෝගි කර ගනිමින් බ්‍රිතාන්‍යයෝ තරග පැවැත්වූහ.

අතීත කොළොම්පුරය වෙන් කෙරුණු තැන කැලණි ගඟයි. එම වෙන්වීම වළක්වනු වස් බ්‍රිතාන්‍යයෝ කදිම උපායක් යෙදූහ. එනම් ඔවුහු එහිලා ක්‍රිස්තු වර්ෂ 1865 දී පමණ කැලණි ගඟත් කොළඹත් යාවන සේ නව පාලමක් ඉදිකළහ. කොළඹ නුවර ප්‍රධාන දුම්රිය මාර්ගය එදා දිව ගියේත් මෙලෙස ඉංග්‍රීසීන් ඉදිකළ අලුත් පාලම හරහාය. කොළඹ සුප්‍රසිද්ධ පැරැණි වික්ටෝරියා පාලම ඉදිකෙරුණේත් මේ කාලයේදීමය.

විවිධ ජන කොටස්

පුරාතන යුගයෙහි කොළඹ ජීවත් වූ නානාප්‍රකාර මිනිසුන් අතර සිටි තවත් පිරිසක් වූයේ කාපිරි මිනිසුන්ය. ඔවුන් කොළඹට පැමිණ තිබුණේ, අප්‍රිකාවෙහි නැගෙනහිර වෙරළෙහි මොසම්බිකය නම් ප්‍රදේශයේ සිටයි. ඉන්දියාවේ මලබාර් වෙරළෙහි ගෝව ප්‍රදේශයේ සිට මොවුන් කොළඹට ගෙනාවේ පෘතුගීසීන්ය. කොළඹ කොටුව විධිමත් ලෙස සකස් කරන සෑම ප්‍රයත්නයකදීම ලන්දේසීහු මොවුන්ගේ සහාය ලබා ගත්හ. 18 වැනි සියවස මුල වන විට මොවුන්ගේ සංඛ්‍යාව 4000 ක් පමණ වූ අතර මොවුහු කොළඹ කැරැල්ලක්ද ඇති කළහ. කාපිරි ජාතිකයන්ට අමතරව පැරැණි කොළඹ නගරයේ වාසය කළ තවත් ජන කොට්ඨාසයක් වූයේ 'වෙට්ටියාර්වරුන්'ය. මොවුන් කොළඹට පැමිණ තිබුණේ ඉන්දියානු වෙරළ තීරයේ සිටයි. මොවුහු වැඩි වශයෙන් රෙදි පෙරෙදි වෙළෙඳාම් කළහ. මුදල් කටයුතු සම්බන්ධයෙන් විවිධ තනතුරු දැරූ සටකපට ව්‍යාපාරික පිරිසක්ද වූහ.

මීටත් අමතරව 'හෙට්ටීන්' යනුවෙන් හැඳින් වූ මිනිස් වර්ගයකටද පුරාණ කොළඹ නගරය ජීවන බිමක් බවට පත්වී තිබුණේය. 'නාට්ටුකුට්වරුන්' යනු මොවුන්ට ව්‍යවහාර කළ තවත් නමකි. මොවුන්ගේ ඇඳුම අත් නැති කබායකින් හා රෙද්දකින් සමන්විත විය. ඔළුවල අමුතු තලප්පා බැඳගෙන කන්වල විශාල තෝඩු දමාගෙනද සිටි මොවුන් නිතර ව්‍යවහාර කළේ ද්‍රවිඩ භාෂාවයි. ද්‍රවිඩ බසින් කණකපිල්ලේ යනුවෙන්ද හැඳින්වූවෝත් මොවුහුමය. මෙයටත් අමතර කොළඹ වීදි පුරා එදා ජීවත් වූවෝ අතර සිංහලයෝද වූහ.

මේ සෑම සියලු ජාතිකයකුවත් සෑම සියලු සංසිද්ධතාවකටත් කොළඹ කේන්ද්‍රස්ථානය වූයේ පිටකොටුවයි. කොළොම්පුරය පුළුල් වූයේත් මේ පිටකොටුව වටාය. යුරෝපීය ආක්‍රමණිකයන් එන්නටත් කලින් අනේකවිධ වූ ආසියාතිකයන්ගේ එකම ලැඟුම්හල බවටද පත්වූ පැරැණි කොළඹ විවිධ ජාති, ආගම් හා ජන විශ්වාස හා නුරු පුරුදුවලට එක නිවහනක් වූයේ පුදුම විදියකටය. මේ සියල්ලක්ම මෙබඳු සංක්ෂිප්ත සටහනක් තුළ සාකච්ඡාවට බඳුන් කිරීම කෙතරම් දුෂ්කර කාර්යයක්ද?

ආචාර්ය ආර්. එල්. බ්‍රෝහියර්ගේ CHANGING FACE OF COLOMBO කෘතියෙහි පද්මා එදිරිසිංහ විසින් පරිවර්තනය කරන ලද කොළොම්පුර පුරා වෘත්තය ග්‍රන්ථය ඇසුරින් සකස් කෙරිණි.

LESSON 7

Hope you had a very productive month learning French! With the help of all the vocabulary and the grammar lessons presented so far, you should be able to construct small sentences on your own. If you are a visual learner, you possibly can name tag the things around you. You can also use greetings and the words that you have studied so far in basic conversations. Practice and dedication is the most important factor in learning a foreign language.

This month's Dasatha issue consists of a vocabulary section and a grammar section. Vocabulary section brings to you some very important word lists that you should know in order to handle a basic conversation. Conversation section is taken out in this issue in order to present you with these essential word lists. The grammar lesson continues as usual in order to improve your grammar knowledge and help you converse and write correctly in French. Enjoy learning! Thank you!

Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary

The vocabulary section of this issue consists of the parts of the body, the days of the week and the months of the year. These words play a major role in French conversations. It is necessary to know these basic words when learning a new language. Study the words with their correct pronunciations and write them repeatedly in order to remember well.

Les parties du corps (ලෙ පර්ති දියු කෝර්) - Parts of the body

La tête (ලාතෙත්) -the head
Le visage (ලවිසාෂ්) -the face
Les cheveux (ලෙශෙව්) -the hair
Le front (ලෆ්රොං) -the forehead
Les yeux (ලෙස්ඉය) -the eyes
Un oeil (අන්අයි) -the eye
Le nez (ලනෙ) -the nose
Les joues (*f*) (ලෙජු) -the cheeks
Les oreilles (ලේස්ඔරෙයි) -the ears
Les lèvres (*f*) (ලෙලෙව්ර) -the lips
La bouche (ලාබුෂ්) -the mouth
Les dents (*f*) (ලෙදොං) -the teeth
La langue (ලාලොංග්) -the tongue
Le menton (ලමොන්තොං) -the chin
Le cou(ලකු) -the neck
La nuque (ලානියුක්) -the nape, back of the neck
La gorge (ලාගෝර්ෂ්) -the throat
Le dos (ලදො) -the back
Les épaules (*f*) (ලේස්එපොල්) -the shoulders
La poitrine (ලාපුවාත්ත්‍රින්) -the chest
Les seins (*m*) (ලෙසෑං) -the breasts
Les bras (ලෙබ්‍රා) - the arms
Les coudes (m) (ලෙකූද්) -the elbows
Le ventre (ලවොන්ත්‍ර) -the belly
Les mains (f) (ලෙමෑං) -the hands
Les doigts (m) (ලෙදුවා) -the fingers
Les ongles (m) (ලෙස්ඕංග්ල) -the fingernails
Le pouce (ලපුස්) - the thumb
Le poignet (ලපුඇංෂෙ) -the wrist
La hanche (ලාඕන්ෂ්) -the hip
L'abdomen (ලබ්දොමෙන්) -the abdomen
Les fesses (f) (ලෙෆෙස්)- the backside, buttocks
Les jambes (f) (ලෙජොම්බ්) -the legs
Les cuisses (f) (ලෙකුයිස්) -the thighs
Les genoux (m) (ලෙජනු) -the knees
Les chevilles (f) (ලෙෂෙව්) -the ankles
Les talons (m) (ලෙතලොං) -the heels
Les pieds (m) (ලෙපියෙ) -the feet
Les orteils (m) (ලෙස්ඔර්තෙයි) -the toes
Les jours de la semaine (ලෙ ජුර් ද ලා සමෙයින්) - Days of the week

Lundi (ලන්දි) - Monday
Mardi (මර්දි) - Tuesday
Mercredi (මැර්ක්‍රෙදි) - Wednesday
Jeudi (ඉදි) - Thursday
endredi (වෝන්ද්‍රදි) - Friday
Samedi (සම්දි) - Saturday
Dimanche (දිමොංෂ්) - Sunday

- *IT IS IMPORTANT TO NOTE :*

➢ - Days are not capitalized when used in a sentence.

➢ - Instead of Sunday, French people start the week from Monday.

➢ - When you talk about a specific event that does not happen frequently, you are not required to use the definite article le to the front.

➢ Ex: Je vais venir lundi (I am going to come on Monday).

➢ - When you talk about an action that happens repeatedly, you are required to use the definite article le to the front.

Ex: Je fais des courses le mercredi (I go shopping on Wednesdays).

Les mois de l'année (ලෙ මුවා ද ලනේ) - Months of the year

Janvier (ජොන්වියෙ) - January
Février (ෆෙව්රියෙ) - February
Mars (මර්ස්) - March
Avril (අව්රිල්) - April
Mai (මෙයි) - May
Juin (ජුඇං) - June
Juillet (ජුයියෙ) - July
Août (ඌත්) - August
Septembre (සෙප්තෝම්බ්‍ර) - September
Octobre (ඔක්තෝබ්‍ර) - October
Novembre (නොවෝම්බ්‍ර) - November
Décembre (දෙසෝම්බ්‍ර) - December

▪ *It is important to note that months are also not capitalized when used in a sentence.*

Grammaire (ග්‍රාමෑර්) Grammar

Hope you had gone through the last issue's grammar lesson! Now you know how to conjugate regular verbs ending in –er, -ir, -re. Now, as you know the formation of all regular verbs in French, you should be able to construct small sentences on your own. With regard to irregular verbs in French, we already learnt the most common irregular –er verbs in lesson 3. The rest of the irregular verbs of the –er verb group will continue in this month's issue. As you already know, there are hundreds of irregular verbs in each group of verbs and it is solely by studying that you have to remember all the conjugations of these verbs.

The first set of irregualr verbs :

Appeler (අපලෙ) - to call	
j'appelle (ජපෙල්)	nous appelons (අපෙලොං)
tu appelles (තියුඅපෙල්)	vous appelez (වුස්අපලෙ)
il/elle/on appelle (ඉල්රැවල්රැඔන් අපෙල්)	ils/elles appellent (ඉල්රැවල් අපෙල්)

For verbs like appeler - to call, rappeler (rmf,) - to call back, épeler (tfmf,) - to spell and jeter (cf;) - to throw, the consonant -l or -t in the stem doubles in all subject pronouns in the present tense, except in the first and second person plural (nous and vous).

The second set of irregular verbs:

Préférer (ප්‍රෙෆෙරෙ) - to prefer	
je préfère (ජප්‍රෙෆෑර්)	nous préférons (නු ප්‍රෙෆෙරොං)
tu préfères (;shq fm%*E¾)	vous préférez (වු ප්‍රෙෆෙරෙ)
il/elle/on préfère (ඉල්/වල්/ඔන් ප්‍රෙෆෑර්)	ils/elles préfèrent (ඉල්/වල් ප්‍රෙෆෑර්)

In verbs like préférer, the é in the last syllable of the stem changes to an è, except in the first and second person plural (nous and vous).

Verbs conjugated like préférer:
Considérer (කොන්සිදරෙ) - to consider
Espérer (එස්පෙරෙ) - to hope
Régler (රෙග්ලෙ) - to regulate, pay, settle, adjust
Répéter (රෙපෙතෙ) - to repeat
Sécher (සෙෂෙ) - to dry

The third set of irregular verbs:

Acheter (අෂතෙ) - to buy	
j'achète (ජෂෙත්)	nous achetons (නුස් අෂෙතොං)
tu achètes (තියු අෂෙත්)	vous achetez (වුස්අෂතෙ)
il/elle/on achète (ඉල්/වල්/ඔන් අෂෙත්)	ils/elles achètent (ඉල්/වල් අෂෙත්)

In verbs like acheter, the e in the last syllable of the stem also changes to an è, again with the exception of the first and second person plural forms (nous and vous).

Verbs conjugated like acheter include:
Amener (අමනෙ) - to bring somebody (along)
Emmener (ඔමනෙ) - to take somebody (along)
Lever (ලවෙ) - to lift, raise
Mener (මනෙ)- to take, lead
Peser (පෙසෙ)- to weigh

The fourth set of irregular verbs:

Essayer (එසෙයියෙ) - to try	
j'essaie (ජෙසෙයි)	nous essayons (නුස් එසෙයියොං)
tu essaies (තියු එසෙයි)	vous essayez (වුස් එසෙයියෙ)
il/elle/on essaie (ඉල්/වල්/ඔන් එසෙයි)	ils/elles essaient (ඉල්/වල් එසෙයි)

In verbs like essayer, the y changes to i in all subject pronouns except the first and second person plural (nous and vous).

Verbs conjugated like essayer include:
Payer (පෙයියෙ) – to pay
Essuyer (එසුයියෙ) – to wipe
Envoyer (ඔන්වොයියෙ) – to send
Nettoyer (නෙතුවයියෙ) – to clean
Balayer (බලයියෙ) – to sweep

Kumudu Abeywardena
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

නිශ්ශබ්දතාව...

10 වන පිටුවෙන්

සිතීම විසින් දෙනු ලබන නිත්‍ය ස්වභාවයක්ද ඇත්තේය. බිය, කාලය හා අනුක්‍රමිකව සිය අභිමතාර්ථය වෙත වළඹීම එනම්, අජරාමරවීම යන මේ සියල්ල සිතීමෙහිම ප්‍රතිඵලය.

"එසේ නම් සිතන්නා යනු කවරෙක්ද? මේ සියලුම සිතුවිලි පවතිනුයේ සිතන්නා තුළ නොවේද?"

සැබැවින්ම සිතන්නෙක් සිටියිද? එසේ නැතහොත් සිතන්නා යනු සිතීම එකතැන් කොට ගැනීමක්ද? සිතන්නකු සිටින බවට තහවුරු කොට ගැනීමෙන් අනතුරුව එහි නිත්‍ය ස්වභාවය නිර්මාණය කර ගනු ලබන්නේ 'ආත්මය' හෝ ප්‍රාණය' යනුවෙන් එය නම් කිරීමෙනි.

"ඔබ කියන්නට අදහස් කරන්නේ මා නොසිතා සිටින විට මගේ පැවැත්මක් නැති බවද?"

සිතුවිලි සහමුලින්ම නැතිව ගිය අවස්ථාවක කවරදා හෝ ඔබට ඔබම පසක් වන ලෙස හමු වී තිබේ ද? එවැනි විටෙක සිතන්නකු, විමසා බලන්නකු හා අත් දකින්නකු වශයෙන් ඔබ සිටින්නේ තමා පිළිබඳව දැනුම්වත් වෙමින්ද? සිතීම යනු මතකයෙහි ප්‍රතික්‍රියාවය.

එසේම සිතන්නා යනු මතක පොදියකි. ඉදින් කෙසේ හෝ සිතීමක් නොමැති කල මෙතරම් කලබැගෑනියක් හෝ ඝෝෂාවක් කරන "මම" යනුවෙන් කෙනකු සිටිය හැකිද? අප මෙහිදී කතා බහ කරන්නේ මතක ශක්තිය නැතිව ගිය පුද්ගලයකු හෝ දවල් හීන දකින්නකු හෝ සිතුවිලි නිහඬ කරනු වස් එය පාලනය කරන්නකු හෝ ගැන නොව, පරිපූර්ණ වූ අවදියෙන් හා සෝදිසියෙන් පවතින සිතක් පිළිබඳවය.

සිතීම හා වචන නැති නම් සිත පවතිනුයේ මුළුමනින්ම වෙනත් අවකාශයක නොවේද?

අප විසින් මමත්වය හෝ ආත්මය හෝ යනුවෙන් මතක පොදියක් ඇති බව වටහා ගනු ලබන්නේ කිසියම් අභියෝග යකට ප්‍රතික්‍රියාවක් දක්වන විට පමණි. එහෙත් ඇතැම් විට එය උදාසීනව හෝ අක්‍රියව හෝ එහි පවතිනුයේ ඊළඟ අවස්ථාව වෙනුවෙන් මඟ බලා සිට ප්‍රතික්‍රියා කරනු පිණිස විය හැකිය.

තණ්හාධික පුද්ගලයකු වැඩි කාලයක් මිඩංගු කරනුයේ සිය තණ්හාවෙහිම ඇලී ගැලී සිටිනු පිණිසය. එය අක්‍රියව පවතින අවස්ථාවන් ඔහුටද තිබිය හැකිය. එහෙත් එය නිරන්තරයෙන් පවතිනුයේ ඔහු වෙතමය.

"එසේ නම් තණ්හාව වශයෙන් ප්‍රකාශ වන ඒ දිවි පැවැත්ම කුමක්ද?"

ඒ වනාහි තවදුරටත් තණ්හාවමය. ඒ දෙකෙහි වෙන් කිරීමක් නොමැත.

"ඔබතුමා විසින් ආත්මය හා මමත්වයද, එහි මතකය, තණ්හාව හා ගර්විත බවද, තවත් නොයෙකුත් ආසාවන්ද යනාදි වශයෙන් හඳුන්වනු ලබන්නේ කුමක්දැයි මට හොඳින් වැටහෙනවා. නමුත් ආත්මය හැරුණු විට වෙන කිසිවක්ම නැති බවද ඔබ කියන්නේ? ආත්මයක් නැතැයි යනුවෙන් ඔබ අදහස් කරන්නේ මතකය නැතිව යෑමේ ස්වභාවයක්ද?"

අර කපුටන් ගේ කෑ කෝ ගැසීම් නැවතුණු විට එහි යම්කිසි ස්වභාවයක් පවතියි. ඒ වනාහි සිතෙහි පවතින මේ නන් දෙඩවිල්ලය. එනම් දුක් කරදර, ආරවුල්, මරණින් පසු ඉතිරි වනුයේ කුමක්දැයි යනුවෙන් කැරෙන මේ විමැසීම පවා එයට අයත් වන්නේය. මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයිය හැකි වනුයේ සිතෙහි තව දුරටත් ඊර්ෂ්‍යාවක් හෝ තණ්හාවක් හෝ නැති විට පමණි.

මෙහිදී අපේ සැලැකිල්ල යොමු වී තිබෙනුයේ ආත්මය නැතිව ගිය පසු පවතින යම් කිසිවක් ගැන නො ව, ආත්මය හා බැඳුණු ගති ලක්ෂණ සියල්ලෙහිම අවසන් වීමක් පිළිබඳ වය. සැබෑ ගැටලුව නම් එයයි.

නො එසේව යථාර්ථය කුමක්ද කියා හෝ සදාතනික වූ යම් කිසිවක් ඇතිදැයි කියා හෝ නොවේ. එසේම සංස්කෘතිය තුළ පවතින මේ සිත ඒ හේතුවෙන්ම බෙහෙවින් හැඩ ගැසී තිබේ. ඉදින් ඒ පිළිබඳවද සිතට වගකීමක් ඇති බැවින් එබඳු සිතකට මෙයින් නිදහස් වීමටත්, මෙය තේරුම් ගැනීමටත් හැකිදැයි යනුත් අප අභියස ඇති ගැටලුවකි.

"එසේ නම් මෙයින් මා නිදහස් කර ගැනීම ආරම්භ කළ යුත්තේ කෙසේද?"

ඔබට ඔබ නිදහස් කර ගත නොහැකිය. මේ දුක් කන්දරාවෙහි බීජය වූ කලී ඔබමය. ඉදින් ඔබ කෙසේදැයි ප්‍රශ්න කරන විටම ඔබ කරන්නේ 'ඔබ' විනාශ කර දමන ක්‍රමයක් විමසා සිටීමකි. 'ඔබ' විනාශ කර දමන ක්‍රියා මාර්ග යෙහිදී සිදු වනුයේ වෙනත් 'ඔබ' කෙනකු නිර්මාණය කර ගැනීමයි.

"හොඳයි. එසේ නම් අමරණීයත්වය යනු කුමක්දැයි ඔබතුමාගෙන් දැන ගන්නට පුළුවන්ද?"

අනිත්‍යය නම් මරණයයි. දුක් කරදවලින් පිරි මේ ජීවිතයෙහි ස්වභාවය වූ කලී අනිත්‍යතාවයි. මිනිසා හැමදාමත් සොයා තිබෙන්නේ අමරණීයත්වයක්. ජරාවක්, මරණයක් නැතිව සිටිය හැකි තත්ත්වයක්.

ඔබ නැවතත් පැමිණ සිටිනුයේ සිතීම ඉක්මවා පවතින අකාලික වූ ස්වභාවය පිළිබඳ ගැටලුවටයි. සිතීම අතික්‍රමණය වූ විට පවතිනුයේ හැමතින්ම නිදොස් වූ අහිංසක බවයි. එය කිසිසේත්ම සිතීමෙන් ස්පර්ශ කර ගත නොහැකිය.

සිතීම හැමවිටම අතීතයට අයත් වූවකි. අහිංසක බව කරුණාව හා මෛත්‍රිය බඳුය. එය නොනැසෙන සුලුදු වේ. එහෙත් එය සැබෑ දෙයක් වනු පිණිස දහසක් දින මතක බරින් සිත නිදහස් විය යුතුය.

එසේම නිදහස යනු වෛරය, සැහැසිකම හා ක්‍රෑරත්වය නැති ස්වභාවයකි. මේ සියල්ල බැහැර නොකොට අමරණීයත්වය, මෛත්‍රිය හා සත්‍යය යනු කුමක්දැයි ප්‍රශ්න කළ හැකි වනුයේ කෙසේද?

FLU SHOT...

14 වන පිටුවෙන්

එන්නත ලබාගැනීමට යොමුවීම සුදුසු වේ. එපමණක් නොව, ඉන්ෆ්ලුවන්සා රෝගයට ගොදුරු වන තරුණ සහ නිරෝගී පුද්ගලයින් අතරින් සියයට 20 ත් 30 ත් අතර ප්‍රතිශතයක් කිසිදු රෝග ලක්ෂණයක් නොපෙන්වන නමුත් ඔවුන් පහසුවෙන්ම දුර්වල පුද්ගලයින් වෙත රෝගය ගෙන යන වාහකයන් ලෙස ක්‍රියා කරන බව සොයාගෙන ඇත.

'ෆ්ලූ ෂොට් එක ගිය අවුරුද්දෙ ගත්තනෙ. මේ සැරේ ඕන නෑ' බොහෝ ප්‍රතිශක්තිකරණ වන්නත් ජීවිත කාලයටම එක වරක් හෝ වසර ගණනාවකට සැරයක් හෝ ගනු ලබන නිසා ෆ්ලූ වැක්සිනයත් එසේ ගත හැකි යැයි සිතීම වැරදි වැටහීමකි. ඉන්ෆ්ලුවන්සා වෛරසය ඒකාකාරී ලෙස පවතින්නක් නොවන අතර එහි ස්වභාවය කාලෙන් කාලයට වෙනස් වේ. ඒ අනුව එම කාල සීමාව තුළ වඩාත් බලපෑමක් ඇති කළ හැකි වෛරසයට අදාළ ලෙස වන්නත නිපදවීම සිදුකෙරේ. ඒ අනුව මෙම වන්නතද වසරින් වසර වෙනස් වේ. එම නිසා ඔබ පසුගිය වසරේ ලබාගත් වන්නත මගින් මේ වසරේ සෑදෙන වෛරස ආසාදනවලින් ආරක්ෂාවක් සලසා ගැනීමට ඔබට හැකියාවක් නොමැත. එම නිසා සෑම වසරකදීම නියමිත කාලයේදී ෆ්ලූ වන්නත ගැනීම කළ යුතු වේ.

'ෆ්ලූ ෂොට් මොනාටද? උණ හැදුණොත් ප්‍රතිජීවක ඖෂධයක් (antibiotics) ගන්නවා.' මේ ඇතැම් අය සිතන විදියයි. මෙහිදී අප මතක තබාගත යුතු ප්‍රධාන කරුණ වන්නේ ප්‍රතිජීවක ඖෂධ සටන් වදින්නේ බැක්ටීරියා ආසාදන සමග පමණක් බවයි. වෛරස හේතුවෙන් හටගන්නා උණ රෝගවලට කිසිදු බලපෑමක් කිරීමේ හයියක් ප්‍රතිජීවකවලට නොමැත. රෝගයේ ස්වභාවය වරදවා තේරුම් ගෙන ප්‍රතිජීවක ගැනීමෙන් භයානක අවධානමකට වුවත් ඔබ ගොදුරු විය හැක. එම නිසා උණ සමයෙහි හටගන්නා ඉන්ෆ්ලූවන්සා රෝගය සඳහා ප්‍රබලම සටන් කරුවා වන්නේ ෆ්ලූ වන්නතයි.

'හෙම්බිරිස්සාව නිසා ෆ්ලූ ෂොට් ගත්තෙ නෑ' වෛද්‍යවරුන් පවසන ආකාරයට සෙම්ප්‍රතිශ්‍යාව වැළඳී ඇති විට ෆ්ලූ ෂොට් එක ගැනීමෙන් ඔබට කිසිදු හානියක් සිදු නොවේ. එහෙත් යම් ආකාරයකින් ඔබට උණ රෝගය වැළඳී ඇත්නම් එනම් ශරීර උෂ්ණත්වය 99.5°F වැඩි අගයක් පෙන්නුම් කරයි නම් එම තත්ත්වය සුව වන තුරු ෆ්ලූ වන්නත ගැනීමෙන් වැළකී සිටීම සුදුසු වේ. ෆ්ලූ වන්නත ලබාගැනීමට සූදානම් වන අවස්ථාව වන විට ඔබ කුමන හෝ ආකාරයක රෝගී තත්ත්වයකින් පෙළේ නම් වෛද්‍යවරයා සමග සාකච්ඡා කොට එහි යෝග්‍යතාව අනුව කටයුතු කරන්න.

ෆ්ලූ වන්නත ගැනීමේදී ඇතැම් පුද්ගලයන්ට එය අසාත්මික වන අවස්ථා පවතින නිසා ප්‍රථම වරට ෆ්ලූ වන්නත ලබාගන්නා අය ඒ පිළිබඳව වෛද්‍යවරයකු සමග සාකච්ඡා කිරීම සුදුසු වේ. විශේෂයෙන්ම බිත්තර සඳහා අසාත්මිකතා පෙන්වන පිරිස ෆ්ලූ වන්නත ගැනීමේදී විශේෂ වෛද්‍ය අධීක්ෂණයක් යටතේ එය ලබාගැනීම සුදුසු වේ. ෆ්ලූ වන්නත නිපදවීම සඳහා බිත්තර ප්‍රෝටීන මඳ වශයෙන් යොදාගැනීම නිසා ඇතැම් විට බිත්තර අසාත්මිකතා ඇති අය තුළ එම තත්ත්වයන් මතුවිය හැක. එසේම මේ වන විට බිත්තර ප්‍රෝටීන නොමැතිව නිපදවන ෆ්ලූ වන්නත් විශේෂයන් පවතින නිසා එබඳු අසාත්මිකතා ඇති අයට වෛද්‍යවරයා හා සාකච්ඡා කොට එවැනි වන්නතක් ලබාගත හැකිය. නමුත් මෙම බිත්තර ප්‍රෝටීන නොමැති වන්නත ළමුන් සඳහා භාවිත නොකරන අතර ආහාර හා ඖෂධ පාලන ආයතනය (FDA) විසින් එය අනුමත කර ඇත්තේ වයස අවුරුදු 18 න් ඉහළ පිරිස සඳහා පමණි.

සෑම වසරකම අදාළ කාල සීමාවේදී Flu Shot ලබා ගැනීම මඟින් කැනඩාවේ ප්‍රධාන බෝවන රෝග 10 අතර ඉහළින්ම පවතින ඉන්ෆ්ලුවන්සා ආසාදනයෙන් ඔබත් ආරක්ෂා වී ඔබේ නිවසිනුත් අවට සමාජයෙනුත් එම දරුණු රෝගය තුරන් කිරීමේ අවස්ථාවට ඔබට දායක විය හැක.

අන්තර්ජාලට ඇසුරිනි

දිනකට ලීටර්...

18 වන පිටුවෙන්

පොල් වතුර සහය දක්වන බව සොයා ගෙන ඇත.

මහලු උදවියට හා ඉන ආහාර දිරවීමට අපහසු රෝගීන්ට ලබා දිය හැකි විශිෂ්ට පෝෂණීය පානයකි.

පොල් වතුර එළ කිරිවලට වඩා පෝෂණ තත්ත්වයෙන් විශිෂ්ට වන අතර, විටමින් සංයුතියෙන් දොඩම් යුෂයටත් වඩා විශිෂ්ට වෙයි.

මවු කිරිවල තිබෙන ලෝරික් අම්ලය පොල් වතුරෙහිද තිබෙන නිසා සකස් කළ ළදරු කිරි පිටි වර්ගවලට වඩා පොල් වතුර විටමින් සංයුතියෙන් ගුණදායක බව පැවසෙනවා.

වමනය යෑම නතර කිරීමේ ගුණයක් සහ ආමාශයේ දැවිල්ල, ගැස්ට්‍රයිටිස් රෝගය, ආහාර ජීර්ණ පද්ධතියේ ආබාධ, බඩ පුරවා දැමීම්, අජීර්ණය මළ බද්ධය සුව කිරීමේ ගුණයක් පොල් වතුරෙහි තිබෙන බව සොයා ගෙන ඇත.

ඇසට හිතකරය. ඇසේ සුද වීම සහ ග්ලූකෝමා රෝග තත්ත්වයන් ඇතිවීම වළක්වයි.

ළමයින්ගේ පණු රෝග සහ උදරාබාධ සුව කිරීමටත් පොල් වතුර හොඳ ඔසුවක් ලෙස භාවිත කළ හැකිය.

ශරීරය අධිකව වෙහෙසෙන අවස්ථාවලදී සහ විජලන තත්ත්වයන්හිදී පොල් වතුර හෝ කුරුම්බා වතුර ලබා දීමෙන් විශිෂ්ට ගුණ ලැබෙන බව පැවසෙනවා.

පැපොල, සරම්ප, සහ ශරීරයේ පලු දැමීම සහ ඌෂ්ණ බිබිලිවලින් සුවයක් ලැබීම සඳහා පොල් වතුර බාහිරව ගැල්වීමෙන් සහනයක් ලැබෙන බව පර්යේෂකයන් සොයා ගෙන ඇත.

සම රැලි වැටීම පාලනය කරන අතර, තුවාල සුව වීමටද දායක වෙයි.

පොල් වතුරෙහි තිබෙන විශිෂ්ට ගුණයන් නිසාවෙන් ලොව පුරා වෛද්‍යවරු ගර්භණී මවුවරුන්ට පොල් වතුර, තැඹිලි වතුර පානය කරන්නට උපදෙස් දේ.

හෙළ වෙදකමට නැතුවම බැරි පොල් වතුර

මෙරට හෙළ වෙදකමෙහි ලාද පොල්, කුරුම්බා සහ තැඹිලි වතුර භාවිත කෙරෙන අවස්ථා රාශියක් තිබෙන බව පැහැදිලිව දැකගත හැකිය.

ශරීරයේ උෂ්ණය, දාහය, සහ දොස් සමනය කිරීම සඳහා භාවිත කරන 'රාජ විරේකය' මුත්‍ර ගල් දිය කිරීමට භාවිතා කරන 'වැලි හැළියේ කෂාය' 'බලා විෂ්ණු තෙලය' වැනි ඖෂධ සංයෝග රාශියක් සකස් කිරීමට තැඹිලි සහ පොල් වතුර භාවිත කරයි. සුලභව යෙදෙන ඖෂධයක් සංස්කෘතිය තුළ පවතින මේ සිත ඒ හේතුවෙන්ම බෙහෙවින් හැඩ ගැසී තිබේ. ඉදින් ඒ පිළිබඳවද සිතට වගකීමක් ඇති බැවින් එබඳු සිතකට මෙයින් නිදහස් වීමටත්, මෙය තේරුම් ගැනීමටත් හැකිදැයි යනුත් අප අභියස ඇති ගැටලුවකි.

"එසේ නම් මෙයින් මා නිදහස් කර ගැනීම ආරම්භ කළ යුත්තේ කෙසේද?"

ඔබට ඔබ නිදහස් කර ගත නොහැකිය. මේ දුක් කන්දරාවෙහි බීජය වූ කලී ඔබමය. ඉදින් ඔබ කෙසේදැයි ප්‍රශ්න කරන විටම ඔබ කරන්නේ 'ඔබ' විනාශ කර දමන ක්‍රමයක් විමසා සිටීමකි. 'ඔබ' විනාශ කර දමන ක්‍රියා මාර්ග යෙහිදී සිදු වනුයේ වෙනත් 'ඔබ' කෙනකු නිර්මාණය කර ගැනීමයි.

"හොඳයි. එසේ නම් අමරණීයත්වය යනු කුමක්දැයි ඔබතුමාගෙන් දැන ගන්නට පුළුවන්ද?"

අනිත්‍යය නම් මරණයයි. දුක් කරදවලින් පිරි මේ ජීවිතයෙහි ස්වභාවය වූ කලී අනිත්‍යතාවයි. මිනිසා හැමදාමත් සොයා තිබෙන්නේ අමරණීයත්වයක්. ජරාවක්, මරණයක් නැතිව සිටිය හැකි තත්ත්වයක්.

ඔබ නැවතත් පැමිණ සිටිනුයේ සිතීම ඉක්මවා පවතින අකාලික වූ ස්වභාවය පිළිබඳ ගැටලුවටයි. සිතීම අතික්‍රමණය වූ විට පවතිනුයේ හැමතින්ම නිදොස් වූ අහිංසක බවයි. එය කිසිසේත්ම සිතීමෙන් ස්පර්ශ කර ගත නොහැකිය.

සිතීම හැමවිටම අතීතයට අයත් වූවකි. අහිංසක බව කරුණාව හා මෛත්‍රිය බඳුය. එය නොනැසෙන සුලුදු වේ. එහෙත් එය සැබෑ දෙයක් වනු පිණිස දහසක් දින මතක බරින් සිත නිදහස් විය යුතුය.

එසේම නිදහස යනු වෛරය, සැහැසිකම හා ක්‍රෑරත්වය නැති ස්වභාවයකි. මේ සියල්ල බැහැර නොකොට අමරණීයත්වය, මෛත්‍රිය හා සත්‍යය යනු කුමක්දැයි ප්‍රශ්න කළ හැකි වනුයේ කෙසේද?

MONEY PROBLEMS?™

ඔබගේ සියලුම ණය
එක් කුඩා මාසික වාරිකයකින්
ගෙවන්න

ඔබගෙන්ම විමසන්න....

- ඔබගේ බැංකු අයිරාව **(overdraft)** සෑම විටම භාවිත කරන්නේද?
- ඔබ රැකියාවේ නිරතව සිටින විටත් නිවසේ පසුවන විටත් නිරතුරුව ණය හිමියන්ගේ තර්ජන හිරිහැරවලට ලක්වන්නේද?
- ඔබ නිවාස කුලිය, නිවාස උගස් වාරිකය හෝ වාහන සඳහා වන ගෙවීම් වෙනුවෙන් බලවත් පරිශ්‍රමයක් දරන්නේද?
- ඔබගේ විවාහය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය ගැටලු නිසා මූල්‍යමය ගැටලුවලට මුහුණ පා සිටීද?
- ඔබගේ ණය තක්සේරුව **(credit rating)** සෑම විටම අන්තරාකාරී මට්ටමක තිබේ යැයි ඔබ සිතනවාද?
- ඔබගේ වාහනය, නිවස, **RRSP**, ව්‍යාපාර කොටස් හා වෙනත් වත්කම් කොයි මොහොතක හෝ අහිමි වේ යැයි බියෙන් පසුවෙත්ද?
- ඔබට විරුද්ධව උසාවි නියෝග පනවා ඇත්ද?
- ඔබ කැනඩා රජය හා සම්බන්ධිත ආදායම් බදු ගැටලුවලින් පීඩාවට පත්වී සිටීද?

gta™ credit

ඉහත ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුර 'ඔව්' යන්න නම් ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට වහාම අප හමුවන්න

Scarborough / Downtown Toronto: 416-489-2000
Mississauga / Brampton: 416-650-5400

Scarborough	Toronto/Downtown	North York	Mississauga	Brampton
201-4433 Sheppard Ave. E Scarborough, ON, M1S 1V3	800-120 Eglinton Ave. E Toronto, ON, M4P 1E2	306-1280 Finch Ave. W North York, ON, M3J 3K6	110-93 Dundas Street E. Mississauga, ON, L5A 1W7	201-7990 Kennedy Rd. South, Brampton, Ontario, L6W 0B3

Mark Shamly
Sinhalese Consultant

Proudly Served over 10,000 clients since 2004
Visit : GtaCredit.Com

Ajay Oberoi
Government Certified Counsellor

Whether you'll be travelling, planning your retirement, or creating that extra bit of security for you and your loved ones, the one thing you will need above all else is peace of mind.

Trust a dedicated person for all your Insurance and Investment needs. Here is what I cover

INSURANCE
- > TRAVEL INSURANCE
- > SUPER VISA - HEALTH INSURANCE
- > VISITOR VISA - HEALTH INSURANCE
- > LIVING BENEFITS: CRITICAL ILLNESS, CANCER GUARD, LONG TERM CARE, DISABILITY INSURANCE
- > PERMANENT LIFE INSURANCE: UNIVERSAL LIFE, WHOLE LIFE, TERM 100
- > TERM LIFE INSURANCE

INVESTMENTS
- > RRSP INVESTMENTS
- > TFSA
- > RESP

Insurance Sales Representative for all your health and life insurance needs and investments.

CALL **VICTOR GAMAGE**
304 MILNER AVENUE SUITE 904
SCARBOROUGH ON M1B 3V4
OFFICE :416 298 3448
MOBILE:64 780 2853
EMAIL: vgamage030azc@wfgmail.ca

WFG™

ඔස්ටියෝපොරෝසිස් Osteoporosis



■ කේ. එන්. ඕ. අමරදාස

ඔස්ටියෝපොරෝසිස් රෝගය හටගන්නේ අස්ථි පටක (Bone tissue) ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොතිබීම හේතු කොටගෙනය. අස්ථි ව්‍යුහයෙහි පරතරයන් හටගෙන අස්ථිවල ශක්තිය හීන වීම නිසා ඒවා බිඳීමේ ප්‍රවණතාව වැඩිවේ.

ඔස්ටියෝපොරෝසිස් හටගන්නේ කුමක් නිසාද?

ළමා අවධියේදී හා යෞවන සමයේදී අපේ අස්ථි වැඩෙන අතර ඒවා ශක්තිමත්ම තත්ත්වයේ පවතින්නේ විසිවැනි වයස්වල අග භාගයේදීය. මැදි විය එළඹෙත්ම ශක්තිමත්ව පවත්නා අස්ථිවල ඝනත්වය ක්‍රමයෙන් අඩු වීමට පටන් ගනී. අප වයසට යත්ම අස්ථි තුනී වීම දිගටම සිදුවේ. ආර්ථවහාවයට (menopause) පසු එළඹෙන වසර දහය තුළදී කාන්තාවන් සම්බන්ධයෙන් මේ ක්‍රියාවලිය ඉක්මනින් සිදුවේ. මේ අවධියේදී අස්ථි ශක්තිමත්ව තැබීමට උපකාර වන ඊස්ට්‍රජන් නම් හෝමෝනය නිපදවීම ඩිම්බකෝෂ මගින් නතර කරයි.

පිරිමින් ඔස්ටියෝපොරෝසිස් රෝගයට වැඩි වශයෙන් ගොදුරු නොවන්නේ ඔවුන්ගේ අස්ථි කාන්තාවන්ට වඩා ශක්තිමත් හෙයින් හා ඔවුන් ආර්ථවහාව තත්ත්වයට පත් නොවන හෙයිනි.

අවදානම් තත්ත්වයේ පසුවන්නේ කවුරුන්ද?

අප වයසට යත්ම ඔස්ටියෝපොරෝසිස් රෝගයට ගොදුරු වීමේ අවදානම වැඩිවේ. වියපත් තැනැත්තන් ඇද වැටුණු විට ඔවුන්ගේ අස්ථි බිඳෙන්නේ මේ නිසාය. එහෙත් සමහරුන් අන් අයට වඩා මේ අවදානමට ගොදුරු වීමේ අවකාශය වැඩිය. මේ වෙනස ඇති කිරීමට තුඩු දෙන හේතු කිහිපයක් පහත දක්වා ඇත.

ඊස්ට්‍රජන් ඌනතාව

ආර්ථවහාවය කලින් සිදුවූ අය (වයස අවුරුදු 45 ට පෙර) හෝ ඩිම්බ කෝෂ ඉවත් කර ඇති කාන්තාවන්

ව්‍යායාම මඳ බව

ව්‍යායාම මගින් අස්ථි ශක්තිමත්ව තබයි. එබැවින් ව්‍යායාම නොකරන තැනැත්තන් හෝ ව්‍යායාම කිරීම අපහසු රෝගාබාධවලින් පෙළෙන තැනැත්තන් අස්ථිවලින් කැල්සියම් අහිමි වීමේ වැඩි නැඹුරුතාවකින් යුක්ත වීම නිසා ඔස්ටියෝපොරෝසිස් වැළඳීමේ වැඩි අවදානම් තත්ත්වයක පසුවෙති. ප්‍රමාණවත් කැල්සියම් ප්‍රමාණයක් අඩංගු නැති ආහාර ගන්නන්ට මේ අවදානම වැඩිය.

අධික දුම්පානය

දුම්කොළ කාන්තාවන්ගේ ඊස්ට්‍රජන් මට්ටම් අඩුකර ආර්ථවහාවය ඉක්මන් කරයි.

අධික මත්පැන් පානය

අධික මත්පැන් පානය මගින් සිරුරේ සෛලවල අස්ථි සෑදීමේ හැකියාව අඩු කරයි.

පවුල් ඉතිහාසය

අස්ථි වර්ධනය වීමට බලපාන පරම්පරාගත හේතු නිසා සමහර පවුල්වල අයට මේ රෝගය ආවේණික වේ. කලින් අස්ථි බිඳීම් තත්ත්වයන්ට භාජන වී ඇති තැනැත්තන්ට එම බිඳීම් හටගැනීමේ අවදානම වැඩිය. කොඳු ඇටයේ අස්ථිවල මැඩීම නිසා බිඳීම් හටගැනීම හේතු කොටගෙන උසින් අඩු පිරිමි හා ගැහැනුදැ වැඩි අවදානම් තත්ත්වයක පසුවෙති.

ඔස්ටියෝපොරෝසිස් රෝගයේ ලක්ෂණ මොනවාද?

මෙය දිගු කලක් වේදනා රහිතව පවතින රෝගයක් හෙයින් හා පැහැදිලි බාහිර ශාරීරික ලක්ෂණ නොමැති රෝගයක් නිසා ඔබ ඔස්ටියෝපොරෝසිස් රෝගයෙන් පෙළෙන්නේදැයි දැනගැනීම දුෂ්කර කාර්යයකි. මෙය පළමුවෙන් හඳුනා ගන්නේ වැඩි වශයෙන් කොඳු ඇටයේ මැණික්කටුවේ හෝ උකුලේ ඇතිවන බිඳීමකින් පසුවය. මෙම බිඳීම් වැඩි වශයෙන් ඇතිවන්නේ බරක් ඔසවාගෙන යෑම, ඇද වැටීම වැනි තත්ත්වයකින් අනතුරුවය. ව්‍යායාම කිරීමේදීද කොඳුඇටයේ තදබල වේදනාවක් හට ගැනීම, කොඳු ඇට පේළියේ බිඳීමක් හඟවන ලක්ෂණයක් වන අතර බොහෝ අවස්ථාවලදී වේදනාව රහිතවද මෙය හට ගනී.

මෙය වළක්වා ගත හැකිද?

මේ තත්ත්වය ඇතිවීම වළක්වා ගැනීම සඳහා ඔබේ ජීවිතයේ විවිධ අවස්ථාවල ගත හැකි පියවර රාශියක් තිබේ.

සෞඛ්‍යයට හිතකර ආහාර ගැනීම

ළමයින් මෙන්ම වැඩිහිටියන්ද කැල්සියම් නිවැරදි ප්‍රමාණය අඩංගු ආහාර ගත යුතුය. මෙය ලබාගත හැකි හොඳම මාර්ගය නම් කිරි, චීස්, යෝගට් හා ටින් කළ සාඩින් ආදිය ආහාරයට ගැනීමය. යොදුය රහිත කිරිපිටිවල යොදුය සහිත කිරිපිටිවලට වඩා කැල්සියම් වැඩි ප්‍රමාණයක් අඩංගු වේ. ඔබ වයස 60 ඉක්මවූ අයෙක් නම් දිනපතා කැල්සියම් මිලිග්‍රෑම් 1000 සිට 1500 දක්වා වන ප්‍රමාණයක් ගැනීම නිර්දේශ කෙරේ. කැල්සියම් අඩංගු සාමාන්‍ය ආහාර වේලක් සමග කිරි පයින්ට් එකක් ගැනීමෙන් මේ අවශ්‍යතාව සපුරාගත හැකිය. කැල්සියම් අඩංගු කොළ පැහැති එළවළු රාශියක් ඇත. කතුරුමුරුංගා කොළවලට මෙහි ප්‍රමුඛස්ථානය හිමි වේ.

ළමුන් හා ව්‍යායාම

ළමුන්ගේ අස්ථි ශක්තිමත් කරගැනීම සඳහා ක්‍රීඩා හා වෙනත් ව්‍යයාමවල නිරත විය යුතුයි.

වැඩිහිටියන් හා ව්‍යායාම

වැඩිහිටියන්ද ඇවිදීම, දිවීම වැනි සිරුර වෙහෙසෙන කාර්යයන්හි නිරත විය යුතුය.

දුම්පානය හා මත්පැන් පානය

දුම්පානයෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටිය යුතුය. පමණ ඉක්මවා මත්පැන් නොගත යුතුය.

ඔස්ටියෝපොරෝසිස් රෝගයෙන් පෙළෙන බව හඳුනාගන්නේ කෙසේද?

අස්ථිවල ශක්තිය හෝ ඝනත්වය මැන බලන ස්කෑන් පරීක්ෂණයක් කරගත හැකිය. අස්ථි බිඳීමේ කොතරම් අවදානම් තත්ත්වයක පසුවන්නේදැයි මෙමගින් දැනගත හැක. මෙහිදී ඔබගේ අස්ථි එක්ස්කිරණ ග්‍රහණයට හසුකර ගන්නා තෙක් ඔබ විනාඩි 15 ක් පමණ ඇඳුම් ඉවත් නොකර ඇඳක දිගා වී සිටිය යුතුය. දිනක් අව්වේ සිටින විට ලැබෙන රශ්මියට සමාන සුළු රශ්මි ප්‍රමාණයක් මෙමගින් නිකුත් කෙරේ.

ඔස්ටියෝපොරෝසිස් රෝගයේ ප්‍රතිවිපාක මොනවාද?

මේ ආබාධයෙන් පෙළෙන තැනැත්තන් සුළු ඇද වැටීමකදී පවා අස්ථි බිඳීමක් ඇතිවීමට ඉඩ තිබේ. බිඳීම් වැඩි වශයෙන් හටගන්නේ උකුලේ, පිටකොන්දේ හෝ මැණික්කටුවේය. කොඳුඇටයේ අස්ථි දුර්වල වී එකට මැඩීම නිසා කඡේරුකාවේ ගැටලු ඇතිවේ. මෙහි අස්ථි කිහිපයක් මැඩීම හේතුකොට ගෙන කොඳුඇටය වක ගැසේ. මෙමගින් කොන්දේ වේදනාව, උස අඩුවීම හා ඉලඇටය අතර අඩු ඉඩක් තිබීම නිසා හුස්ම ගැනීමේ අපහසුතා ආදිය සමහරුන්ට හටගත හැකිය.

ඔස්ටියෝපොරෝසිස් රෝගයට ප්‍රතිකාර තිබේද?

අස්ථි බිඳීමේ කාර්යයේ නිරත සෛලවල ක්‍රියාකාරිත්වය අවහිර කරන ඖෂධ මගින් මේ ආබාධයට ප්‍රතිකාර කළ හැකිය. අස්ථි ස්කන්ධය වැඩි කර සැකිල්ල ශක්තිමත් කර බිඳීම් හටගැනීමේ අවදානම අඩු කිරීමට ඒවා උපකාර වේ. ප්‍රතිකාර කිරීම ආරම්භ කර ප්‍රථම වසර තුළදී දරුණු ඔස්ටියෝපොරෝසිස් තත්ත්වයෙන් යුත් රෝගීන් තුළ අලුතෙන් කඡේරුකා බිඳීම් 60 සිට 70 දක්වා වන ප්‍රමාණයකින් අඩුකර ගත හැකි බව මෑතකදී කර ඇති අධ්‍යයනයකින් පෙන්වා දී තිබේ. අවශ්‍ය නම් විටමින් 'ඩී' සහ කැල්සියම් ප්‍රමාණවත් ප්‍රමාණයක් ගැනීමද නිර්දේශ කෙරේ.

ඔබ ඔස්ටියෝපොරෝසිස් රෝගියෙක් ලෙස හඳුනාගතහොත් කළ යුත්තේ කුමක්ද?

වෛද්‍යවරයා නියම කරන පරිදි ප්‍රතිකාර ගන්න. සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා ප්‍රතිකාරය වසර කිහිපයක් දිගටම ගත යුතුය.

ආහාර ගැන සැලකිලිමත් වන්න. අස්ථි ස්කන්ධය පවත්වා ගැනීම සඳහා හිතකර ආහාර ගැනීම හා කැල්සියම් ගැනීම ඉතා වැදගත්ය. ඔබ දිගටම කැල්සියම් මිලිග්‍රෑම් 1500 ක් පමණ ගත යුතුය. ගොවිපොළ නිෂ්පාදන කැල්සියම්වලින් පොහොසත්ය. වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි කැල්සියම් අතිරේකයක් ගැනීම යෙහෙකි.

හිරු එළියෙන් ප්‍රයෝජන ගන්න. එමගින් කැල්සියම් උකහා ගැනීම වැඩිකරන හෙයින් හා අස්ථි වර්ධනයට අනුබල දෙන හෙයින් විටමින් 'ඩී' මෙහිලා ඉතා වැදගත්ය. දිනපතා හිරු එළියට නිරාවරණය වන්න. ඔබට මෙය කළ නොහැකි නම් ඔබේ ආහාරයට විටමින් 'ඩී' ඇතුළත් කරගන්නා ලෙස ඔබට උපදෙස් දෙනු ඇත. තෙල් අඩංගු මාලුවල විටමින් 'ඩී' අන්තර්ගතය. නොඑසේ නම් විටමින් 'ඩී' අතිරේකයක් ගන්නා ලෙස ඔබට උපදෙස් දෙනු ඇත.

දිනපතා ශාරීරික ව්‍යායාමවල නිරත වන්න. බිඳීම් ඇතිවීමට ඉඩ ඇති හෙයින් සුෂුම්නා ස්ථම්භය මත තද බරක් නොවැටෙන පරිදි කටයුතු කරන්න.

යමක් ඔසවන විට දණහිස් නැමීමෙන් කොන්ද කෙළින් සිටින සේ තබාගන්න. අධික බර සහිත සූට්කේස්, බෑග් ආදිය ඔසවාගෙන නොයන්න.

හදිසි එහා මෙහා වීම්වලින් වළකින්න.

අප වයසට යෑමත් සමග ඇද වැටීමේ අවදානම වැඩිවේ. ඔබ ගැටී ඇද වැටීමට ඉඩ ඇති ද්‍රව්‍ය නිසි තැන්වල තබන්න.

ලිස්සා වැටීමට ඉඩ ඇති හෙයින් බුමුතුරුණු, පාපිස්නා ආදිය ගැන සැලකිලිමත් වන්න.

ගන්නා මත්පැන් ප්‍රමාණය සීමා කරන්න.

දුම්පානය මගින් ඔස්ටියෝපොරෝසිස් හටගැනීමේ අවදානම වැඩි කරන හෙයින් එය නතර කරන්න.

ඔස්ටියෝපොරෝසිස් හටගැනීම වළක්වා ගැනීමේ හොඳම මග ක්‍රියාශීලී ජීවිතයක් ගත කිරීම හා කැල්සියම් අඩංගු ආහාර ගැනීමය. මේ ආබාධයෙන් පෙළෙන රෝගියෙකුට සුදුසුකම් ලත් වෛද්‍යවරයකු ලවා අප්‍රමාදව ප්‍රතිකාර කිරීමෙන් බිඳීම් හට ගැනීමේ අවදානම අඩුකර ගත හැකිය.

කැනඩා සිංහල සංගමය

■ සාකච්ඡා කොට සටහන් කළේ චමරි අබේසිංහ

ටොරොන්ටෝ ප්‍රධාන අවට නගරවල සිටින සිංහල පිරිසට එකට එකතුවීම සඳහා ආයතන, සමිති, සමාගම් බහුලව නොතිබුණු යුගයක එම අවශ්‍යතාව සපුරමින් බිහි වූ 'කැනඩා සිංහල සංගමය' එහි දෙවන දශකයට පා තබමින් සිටී. 1998 නොවැම්බර් 05 වන දින නිල වශයෙන් ආරම්භ කරනු ලැබූ කැනඩා සිංහල සංගමය මෙතෙක් දුර රැගෙන ඒමට දායක වූ පිරිස බොහෝය. ඒ සියලුම දෙනාව ස්තුති පූර්වක ගෞරවයෙන් මතක් කරන අතර කැනඩා සිංහල සංගමය පිළිබඳව කෙටි පිළිසඳරක් ඔබ වෙත ගෙන ඒමට අප අදහස් කළා.

ඒ සඳහා අප වක් කර ගත්තේ කැනඩා සිංහල සංගමයේ ගරු ලේකම් යසන්ත නවරත්න මහතාවයි.

Q ලැබුවා වූ 2018 නව වසර වෙනුවෙන් සුභ ප්‍රාර්ථනා කරන ගමන් කැනඩාවේ සිංහල ප්‍රජාව වෙනුවෙන් අපි ඔබව ආයුබෝවන් කියා පිළිගන්නවා.

ආයුබෝවන්....!

දසත පාඨක ඔබ සැමටත් සුභ නව වසරක් වේවා ! යි කැනඩා සිංහල සංගමය වෙනුවෙන් මම සුභ පතනවා.

Q යසන්ත, අපි කැමතියි කැනඩා සිංහල සංගමය මෙතෙක් ආ ගමන් මග පිළිබඳව දැනගැනීමට.....

ඔව්.... අපේ සිංහල ප්‍රජාව වෙනුවෙන් කැනඩාවේ බිහි වූ පැරණිම සංගමයක් විදියට මෙය හඳුන්වන්න පුළුවන්. කැනඩාවේ සෙසු ප්‍රාන්තවල තියෙන සිංහල සංගම් සමග සසඳා බැලුවොත් සමහරවිට මෙය සිංහලයන් වෙනුවෙන්ම සෑදුණු ප්‍රථම සිංහල සංගමය වීමටත් ඉඩ තියෙනවා. වර්තමානයේදී ඔන්ටාරියෝ ප්‍රාන්තයේ වගේම ඉන් පිටතත් ශ්‍රී ලාංකිකයන් ජීවත් වන සෑම ප්‍රදේශයකම පාසල්, විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන මට්ටමින් ලංකාවේ අය සඳහා නොයෙකුත් සමිති සමාගම් තියෙනවා. ඒත් එවැනි පාසල්, විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතන ලෙස නොබැඳී පොදුවේ සිංහලයන් සඳහාම තිබෙන සංගමයත් මෙය විය හැකියි කියා මට සිතෙනවා. එයින්ම මෙම සංගමය අප සිංහල ප්‍රජාවට කෙතරම් වටිනවාදැයි යන්න ඔබට සිතාගත හැකි වේවි.

කැනඩා සිංහල සංගමය පැමිණි ගමන් මග පිළිබඳව කීමේදී අමතක කළ නොහැකි පිරිසක් සිටිනවා. ඒ මෙහි ආරම්භකයින්. කැනඩාවේ සිටින ජ්‍යෙෂ්ඨතම සම්භාවනීය සිංහල පිරිසක් මූලික වී තමයි මේ සංගමය පිහිටුවා ගනු ලැබුවේ. මම ඔවුන්ව නම් වශයෙන් හඳුන්වන්නම්.... දොන් පතිරාජ, වන්නි ධනවර්ධන, මෙල්වින් බොරලැස්ස, සෙනරත් විජේසේකර සහ තිස්ස මල්ලවආරච්චි යන මහත්වරුන් තමයි මෙහි ආරම්භකයින්. මෙහි පළමු සභාපති ලෙස පත් වී තිබෙන්නේ දොන් පතිරාජ මහතායි. ඉන්පසුව මෙල්වින් බොරලැස්ස මහතාත්, වන්නි ධනවර්ධන මහතාත් සභාපතිවරුන් ලෙස කටයුතු කළා. ඒ අය මෙම සංගමය වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදුකර තියෙනවා. ඒ වගේම ඒ ඒ කාලවලදී සංගමයට සම්බන්ධ වී කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩල

කැනඩා සිංහල සංගමය නිලධාරී මණ්ඩලය

ගාමිණී අබේසිංහ - සභාපති - 416 822 2789

යසන්ත නවරත්න - ලේකම් - 416 522 5325

වර්ණ ඉලංගසිංහ - භාණ්ඩාගාරික / සැලසුම් කමිටු සම්බන්ධීකරණය - 647 783 1334

ආචාර්ය දුමින්ද රන්දෙණිය - උප ලේකම් / සැලසුම් ක මිටු සම්බන්ධීකරණය 647 995 8337

දර්ශන ඈපාසිංහ - සාමාජිකත්ව හා සන්නිවේදන කටයුතු සම්බන්ධීකරණය - 416 500 9968

සුමිත් දහනායක - සැලසුම් කමිටු සම්බන්ධීකරණය - 416 894 7352

අනුර රණවීර - සාමාජිකත්ව හා සන්නිවේදන කටයුතු සම්බන්ධීකරණය - 416 720 2386

මහේන්ද්‍ර රන්ජිත් පෙරේරා - අධ්‍යක්ෂ - 416 438 1401

චමින්ද මාරසිංහ - අධ්‍යක්ෂ - 416 312 7262

තිස්ස බෝයගොඩ - අධ්‍යක්ෂ - 416 627 6090

ඇන්ඩෘ සමරසිංහ - අධ්‍යක්ෂ - 416 873 8372

විසිනුත් විශාල සේවාවක් ඉටු කර තියෙනවා. එමෙන්ම එදා සිට අද දක්වාම කැනඩා සිංහල සංගමය ඉතාමත් සක්‍රියව තබා ගැනීමට වෙහෙස මහන්සි වී කටයුතු කරන බොහෝ පිරිසක් මේ ටොරොන්ටෝව ඇතුළු අවට නගරවල සිටිනවා. ඒ සෑම දෙනාවම සංගමය වෙනුවෙන් ඉතාමත් ආදරයෙන් ගෞරවයෙන් මේ වෙලාවෙ සිහිපත් කරනවා.

මෙතෙක් ආ ගමන් මග පිළිබඳ සඳහන් කිරීමේදී එය ආරම්භ කළ අවධිය දක්වා යාමට මා කැමතියි.

වර්තමානයේ පවතින දියුණු තාක්ෂණ ක්‍රමවේදයන් නිසා අපට මුළු ලොවම එක මිටකට ගත හැකියි. නිවසේ සිටම අපේ මවුරටේ තිබෙන ගීත, නාටක, සංස්කෘති උරුමයන් ආදි මේ සියල්ලම රස විඳීමට හැකියි. ඒ නිසාම ලෝකයේ කොහේ සිටියත් අපට එතරම්ම හුදෙකලා බවක් වර්තමානයේදී දැනෙන්නෙ නෑ. ඒත් මීට දශක දෙකකට පමණ පෙර මේ රටවල් වෙත පැමිණි අය මීට හාත්පසින්ම වෙනස් තත්ත්වයකට මුහුණ දුන් බව අපට පැහැදිලියි. මුහුදු 7 කින් මෙපිටට පැමිණි ඔවුන් මේ හිම මිදෙන මිටියාවතේ තනි වෙන්න ඇති. හුදෙකලා වෙන්න ඇති. එවැනි යුගයකදී අපේම අය වෙනුවෙන් මූලිකත්වය ගෙන කටයුතු කිරීමට, එකට එක් වී අදහස් උදහස් හුවමාරු කර ගැනීමට, අපේ සංස්කෘති උරුමයන් සමග ජීවත් වීමට හැකි සංගමයක් පිහිටුවා ගැනීමට මීට මුල් වූ පුරෝගාමීන් අදහස් කිරීම කොපමණ වටිනවාද? එහි ප්‍රතිඵලය තමයි කැනඩා සිංහල සංගමය. එතැන් පටන් දශක දෙකක් පුරා මහත් වූ සේවාවන් රැසකට දායක වෙමින් කැනඩා සිංහල සංගමය එහි වගකීම ඉටුකරමින් සිටිනවා.

Q සිංහල සංගමය විසින් සිංහල ප්‍රජාව වෙනුවෙන් පවත්වන විශේෂ උත්සව සහ සේවාවන් මොනවාද?

අප සංගමය සෑම වසරකම ග්‍රීෂ්ම ඍතුවේදී එළිමහන් සංස්කෘතික සංදර්ශනයක් 'සත්සර රාවය' නමින් පවත්වනවා. ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සාහිත්‍යය දැනුම පුළුල් කිරීම සඳහා 'බසක වරුණ' නමින් සිංහල භාෂා හා සංස්කෘතික උළෙලක් පවත්වනවා. ඒ වගේම අපි ප්‍රථම වතාවට 2017 වසරේදී වෙසක් උළෙල සමරමින් 'බුද්ධ පූර්ණිමා' නමින් වෙසක් උත්සවයක් පැවැත්වුවා. මේ සියල්ලම ඉතාමත්ම උත්කර්ශවත් ආකාරයට පවත්වන උත්සව. සිංහල සංගමය විසින් සිංහල අවුරුද්ද සමරමින් 'බක්මහ උළෙල' නමින් අවුරුදු උත්සවයකුත් පැවැත්වුවත් වර්තමානයේදී ටොරොන්ටෝව තුළ සිංහල අවුරුදු උත්සව රැසක් පවතින නිසා අපේ 'බක්මහ උළෙල' පැවැත්වීම මඳකට නවතා සහෝදර ප්‍රජාව විසින් පවත්වන අනෙකුත් අවුරුදු උත්සවවලට සහයෝගය ලබා දීමට සිංහල සංගමය තීරණය කර තියෙනවා.

මේ සියල්ලටම අමතරව අපේ මවු රටේ, ශ්‍රී ලංකාවේ ජීවත් වන සහෝදර ජනතාවටත් විශේෂ අවස්ථා රැසකදී උදව් උපකාර කිරීමට අප සංගමය ඉදිරිපත් වී තියෙනවා. ගංවතුර, නාය යාම් වැනි විපත් වසසන පැමිණි අවස්ථාවලදී අප සංගමය ඉදිරිපත් වී පිහිටක් ඇවැසි පිරිස වෙත ඒ පිහිට ලබාදීමට කටයුතු කර තියෙනවා. ඒ වගේම නොයෙක් වර රෝදු පුටු, ඇස් කණ්ණාඩි ආදිදේ බෙදා දීමද සිදුකර තිබෙනවා. ඉදිරියේදීත් අප එවැනි කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා.

Q 'බසක වරුණ' සිංහල භාෂා හා සංස්කෘතික වැඩ සටහන මේ වසරේදී පැවැත්වෙනවද?

ඔව්... අපි එය මේ වසරේදී පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පසුවනවා. ඒ පිළිබඳව සියලුම තොරතුරු නුදුරේදීම ඔබ වෙත ගෙන ඒමට අප බලාපොරොත්තු වෙනවා.

Q මෙම කාර්යයන් සිදුකිරීමේදී ඔබ සංගමයේ සෙසු පිරිසගෙන් ලැබෙන සහයෝගය කෙබඳුද?

මා එය අනිවාර්යෙන්ම පැවසිය යුතුයි. මෙහිදී මා විශේෂයෙන්ම අප සංගමයේ සභාපති තුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම දෙනාව ආදරයෙන් මතක් කරනවා. ඔවුන්ගේ කැපවීම මහන්සිය නොමැති නම් මෙතරම් කාර්යයන් රැසක් සිදුකිරීම සිහිනයක් පමණක්ම විය හැකියි. ඇත්තෙන්ම ඒවා තනිව කළ හැකි දේවල් නොවෙයි. එක් සංවිධානයක් මගින් වසරක් තුළදී මෙතරම් උත්සව, වැඩකටයුතු රැසක් පැවැත්වීමම මොනතරම් භාරදූර වුවක්ද කියා ඔබට වැටහෙනවා ඇති. අපි හැමෝම මේ කාර්යයන් කරන්නෙ ස්වේච්ඡාවෙන්. ඒ වගේම අපි හැමෝම කැනඩාවේ තියෙන කාර්යබහුල ජීවන රටාව තුළ සිටිමිනුයි මෙවැනි පොදු කාර්යයන් සඳහා කැප වී සිටින්නේ. ඇත්තෙන්ම එය විශාල අභියෝගයක්. අපිට මේ දේවල් අවසානයේදී ලැබෙන එකම දේ අපේ හැකියාවෙන් යමක් අපේ ප්‍රජාව වෙත ලබා දුන්නාය කියන ආත්ම තෘප්තිය පමණයි. පොදු වැඩකටයුතු කරල හොඳ පළපුරුද්දක් ඇති පිරිසක් අප සමග එකතු වී සිටීම අප හැමෝටම ලොකු ශක්තියක්.

ඒ වගේම අප සමග එක්වී කටයුතු කරන තරුණ ප්‍රජාව ගැනත් මම විශේෂයෙන්ම මතක් කරන්න ඕන. මේ මොහොතේදී ඔවුන් විසින් සංගමය වෙනුවෙන් ඉටු කරන කාර්යභාරය විශිෂ්ටයි. ඔවුන් තමයි මේ සංගමයේ අනාගත බලාපොරොත්තුව. ඒ පිරිස ඉතාමත් උනන්දුයි. අපේ සෑම උත්සව අවස්ථාවකදීම ඔවුන් ඉතාමත් වෙහෙස මහන්සි වී කටයුතු කරනවා.

තවත් මා විශේෂයෙන්ම මතක් කළ යුතු පිරිසක් සිටිනවා. ඒ අපේ සංගමයේ සාමාජික මහත්ම මහත්මීන්. ඔවුන් බොහෝ දෙනෙකු නොයෙකුත් අන්දමින් අප වෙත සක්‍රීයව දායකත්වය සැපයීම අපට විශාල සවියක් වී තියෙනවා.

ඇත්තටම මේ සියලුම කටයුතු සාර්ථක කර ගැනීමට නන් අයුරින් උදව් උපකාර වන හැමෝටම අප සංගමය වෙනුවෙන් ස්තූති වන්ත වීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

Q කැනඩා සිංහල සංගමය මගින් සුවිශාල කාර්යභාරයක් සිදුකරන බව අපට දැන් පැහැදිලියි. මේ සියලුම කාර්යයන් සිදුකිරීමේදී විශාල මුදලකුත් වැය වෙන බව අප දන්නවා. මෙහිදී සංගමය මගින් එම අවැසි මුදල් සොයාගන්නේ කොහොමද?

ඇත්තෙන්ම එය ගැටලුවක් තමයි. සංගමය මගින් කරන කටයුතු මීටත් වඩා පුළුල්ව සිදුකිරීමට අපි හැමෝම කැමතියි. ඊට ශ්‍රමයෙන් දායකත්වය සැපයීමට කැමති බොහෝ

34 වන පිටුව බලන්න

ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT

ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

IMPERIAL MORTGAGES INC.

**Residential Mortgages, Commercial Mortgage,
Refinancing, Second Mortgage,
First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

Abby Sri Haran

Senior Mortgage Specialist

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

SRI LANKA'S NO.1

TRICO

TRICO MARITIME

(Sole Authorized Agent of
Trico Meritime (Pvt) Ltd. Sri Lanka)

The first Customs Bonded Warehouse for Personal Effects and gift items clearance in Sri Lanka

Serving People Worldwide Reliably for 35 Years

SRI LANKA'S BEST AND LARGEST CLEARING FACILITIES IN THREE MAJOR CITIES SINCE 1980

COLOMBO
GALLE
KURUNEGALLA

DOOR TO DOOR SERVICE to any part of Sri Lanka

special service to
Colombo, Jaffna, Kilinochchi, Batticaloa, Trincomalee, Vavuniya & Mannar

TORONTO: DERRICK ANTON
647.833.3020 | 416.335.8800

Our Canadian Agents

Thank you for your business with Trico

OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL) • VANCOUVER: 604 219 6232 (VIJE)

CALGARY: 403 971 6721 **(SAMAN) • WINNIPEG:** 204 800 2364 **(MANGALIKA) • EDMONTON :** 403 971 6721 **(SAMAN)**

Trico Maritime Customer Services & Warehouses in Sri Lanka

HEAD OFFICE
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000

COLOMBO WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000

KURUNEGALA WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967

GALLE WAREHOUSE
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841

Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Intersection: Markham Road/Nashdene Road
Tel: 413 335 8800
Fax: 416 335 8848
email: info@tricomaritime.ca
www.tricomaritime.ca

LAL LAW OFFICE

- Real Estate
- Mortgages
- Immigration Law
- Family Law
- Tax Law

Lal Handapangoda

Barrister & Solicitor

90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com

AJITH BERAGAMA LL.B, LL.M

BARRISTER, SOLICITOR AND NOTARY PUBLIC

experienced, quality, knowledgeable and affordable service

AB Ajith Law Office

Real Estate Law
Landlord and Tenent Law
Personal Injury Law

Wills & Estates Law
Immigration Law
Family Law

24/7 Hotline - 647 328 6623

10 MILNER BUSINESS COURT,
3 RD FLOOR SCARBOROUGH M1B 3C6

OFFICE - 647 777 8347
FAX - 647 777 8348
EMAIL - AJITH@AJITHLAWOFFICE.COM

Century 21 Leading Edge Realty Inc. Brokerage

invis Canada's Mortgage Experts™

THUSITH WEERASURIYA

REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT

416 616 2402
THUSITH.WEE@ GMAIL.COM
WWW.THUSITH.COM

"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"

Bus: 905-405-8484 Fax : 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3

*Independently owned and operated.

Markham	Scarborough	Ajax	Toronto North
165 Main St N.	1825 Markham Rd.	527 Kingston Rd. W	1053 McNicoll Ave.
Yorkville	**Stouffville**	**Whitby**	**Don Mills**
1300 Bay St.	6393 Main St.	408 Dundas St. W	801 York Mills Rd.

Designed@nijukraids.ca

seasons GREETINGS

TO MY CLIENTS, FRIENDS, FAMILIES & EVERYONE...

INSURANCE ~ LIVING BENEFITS ~ INVESTMENTS

TR

BUILD WEALTH

with Life Insurance

INCREASE CASH FLOW
MINIMIZE TAXES
BUSINESS LOAN PROTECTION
ESTATE PLANNING
FUNDING CAPITAL GAINS TAX
EMPLOYEE INSURANCE & BENEFITS

CRITICAL ILLNESS COVERAGE
INCOME PROTECTION
SUPER VISA/TRAVEL INSURANCE
HEALTH & DENTAL BENEFITS
INVESTMENTS (RESP/RRSP)

Life100 INSURANCE & INVESTMENTS INC.

TERRANCE RAJAH
FINANCIAL SECURITY ADVISOR
647.528.4111

7393 Markham Road, Suite 91, Markham, ON L3S 0B5

10 Milner Business Court, Suite 208, Toronto, ON M1B 3C6 www.terrancerajah.ca

දිසත Dasatha

උඩරට සිටි සුද්දන්ගේ ඉගතුන

මහනුවර ඉපිද ධර්මරාජ විද්‍යාලයෙන් සිප්සතර හදාරා පේරාදෙණිය සරසවියෙන් උපාධිය ලැබූ මෙම ලිපියේ කතුවරයා ශ්‍රී ලංකා විදේශ සේවයට බැඳී වසර 32 ක් සේවය කළේය. ඔහු පෙර අපර දෙදිග විවිධ රටවල් ගණනාවකම ශ්‍රී ලංකා දූත මණ්ඩලයන්හි විවිධ තනතුරු හෙබවූයේය. ලන්ඩනයේ ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා ලෙසද, ඕලන්දයේ හේග් නුවර ප්‍රථම ශ්‍රී ලංකා නේවාසික තානාපති ලෙසද පසුව පිලිපීනයේ ශ්‍රී ලංකා තානාපති ලෙසද කටයුතු කළ ඒ මහතා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු ලෙසද සේවය කොට විශ්‍රාම ලැබීය. 'දිවයින' බදාදා අතිරේකය වෙනුවෙන් කරුණාසිරි මහතා විශේෂයෙන් සකස් කළ ලිපියකි මේ. මෙම ලිපිය සඳහා ඔහු විසින් ඕලන්දයේ පුස්කාලයන්හි සුරක්ෂිතව පවතින ඕලන්ද බසින් රචිත ලේඛන රැසක් මූලාශ්‍ර කරගනු ලැබ ඇත.

■ **ඕලන්දගේ සහ පිලිපීනයේ හිටපු ශ්‍රී ලංකා තානාපති**

පිටිදූව ගමගේ කරුණාසිරි

ලන්දේසීන්ගේ පාලනය යටතේ 17 වැනි සියවසේ අගභාගය වන විට (1680 - 1690) කොළඹ නගරය සුන්දර පුරවරයක් විය. දෙපස ගස් සිටුවා සකසන ලද වීථි සහ මංමාවත් මෙන්ම ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පය අනුව තැනූ මන්දිර සහ උද්‍යාන නගරය අලංකාරවත් කළේය.

ඒ සමයෙහි එක් උදෑසනක කොළඹ වැසියෝ අපූරු දර්ශනයක් දැක විමතියට මෙන්ම අමන්දානන්දයට පත් වූහ. උඩරට සිංහල ගැමි ආරට අනුව චාම් කපු රෙදි කඩක් ඉන වටා ඔතා පාවහන් නොමැති වුවද පැකිලීමක් නැතුව හිරු රැසින් රත්වූ පොළවේ පය ගසමින් මුවේ තිබූ බුලත් විට සපා වරින් වර තැනින් තැන වීථි රතු පැහැ ගන්වමින් ගමන් කළ මැදි වියේ සිටි සුද්දන් දෙදෙනකු දැකීම මෙම අපූර්ව දර්ශනය විය.

මේ දෙදෙනාගේ එක් අයෙකු කොණ්ඩය බැඳි සුද්දෙකු වූ අතර අනෙකා දිගට වැඩුණු රන්වන් කෙස් කළඹ උරහිස පිටුපසට වැටෙන සේ සකස් කර සිටියේය. දෙදෙනා කතා කළේ ඉංග්‍රීසි බසිනි. එහෙත් ඒ සමඟ සිංහල ඉතා ව්‍යක්ත අන්දමින් වරින් වර කතා බහ කළ බව පෙනුණි.

ඕලන්ද පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ (VOC) බලධාරීන් කිහිපදෙනෙක්ද ආණ්ඩුකාරතුමාගේ කාර්ය මණ්ඩලයේ අතොළොස්සක් පමණ වූ නිලධාරීන් හැරුණු විට අන් කිසිවෙක් මේ අරුම පුදුම සුද්දන් දෙදෙනා කවුරුන්දැයි නොදැන සිටියහ.

කොළොම්පුරේ වීදි සැරි සැරූ මේ දෙදෙනා යන යන තැන පසුපසින් ගමන් කළ විපිලිසර පුරවැසියන්ගේද අඩුවක් නොවීය. සමහරු මේ දෙදෙනා සමග සිංහලෙන් කථා බහ කිරීමට වෑයම් කළහ. නම මොකක්දැයි ඇසූ ප්‍රශ්නයට "මගේ නම රොබට් නොක්ස්" යැයි පැහැදිලි සිංහලෙන් එක් අයෙකු පිළිතුරු දුන්නේය. "මගේ නම ස්ටීවන් රට්ලන්ඩ්" යනුවෙන් පවසමින් අනෙකාද බුලත් කෙළ පහරක් ගසා ඔවුන්ගේ කතා බහට එක් විය.

"අපි කන්ද උඩරට අවුරුදු 19 ක් විතර ජීවත් වුණා. උඩරටින් පැන යන්නට අපි නොයෙක් විට වෑයම් කළා. කීප වතාවක්ම වැරදුනා. මේ වතාවේ වෙළෙඳාමේ යනවා වගේ කන්ද උඩරටින් ගොහින් මහරූස්ස වනාන්තර මැදින් අනුරාධපුරයට සේන්දු වුණා. එතන ඉඳලා මල්වතු ඔය දිගේ ඉහළට ගමන් ගත්තා. එතනින් අලි, කොටි, වලස්සු ගහණ මහ වනාන්තර මැදින් දවස් කීපයක්ම ගමන් කළා. අන්තිමේදී ලංදේසි සමාගමේ වැයික්කියට අයිති අරිපො නැමැති ගමට ආවා. ගමේ මිනිස්සු අපිව එක්කරගෙන මන්නාරමට ගිහින් ඕලන්ද කපිතාන්වරයාට භාර දුන්නා"

" 'මේ වැයික්කිය කන්ද උඩරටට අයිති නෑ. දැන් නුඹලා දෙන්නා සම්පූර්ණයෙන්ම නිදහස්' යැයි කපිතාන්වරයා කියූ විට අපි දණින් වැටී දෙවියන් වහන්සේට ස්තුති කළා. දින කිහිපයක් ගියාට පස්සේ ලංදේසි නැවක මන්නාරමේ ඉඳලා කොළොම්පුරයට සේන්දු වුණා. ඔන්න ඕකයි අපේ කතන්දරේ" රට්ලන්ඩ් පැවසුවේය.

දින දෙකකට පසු කොළඹ කොටුවේ ඕලන්ද ආණ්ඩුකාර මන්දිරයට පැමිණෙන ලෙස දෙදෙනාටම ඇරයුම් ලැබිණිඩ් ඉතා සාදරයෙන් මෙම ඉංග්‍රීසි ජාතිකයන් දෙදෙනා පිළිගත් ඕලන්ද ආණ්ඩුකාර ෆන් ලෝටේන් ප්‍රමුඛ නිලධාරි පිරිස දිගින් දිගටම කන්ද උඩරට තොරතුරු විචාලහ. ඔවුන් වඩාත් විමසිලිමත් වූයේ කන්ද උඩරට රජුගේ යුද උපක්‍රම ගැනත් යුද ශක්තිය ගැනත් රජුගේ ආධිපත්‍ය කොතෙක් දුරට පැතිරී ඇත්ද යන කරුණු පිළිබඳවය.

සුහද සාකච්ඡාවෙන් පසු ඉංග්‍රීසි ජාතිකයන් දෙදෙනා ඇමතූ ඕලන්ද ආණ්ඩුකාරවරයා ඔවුනට සුදුසු ඇඳුම් පැළඳුම් සැපයීමට තමා නියෝග කර ඇති බව පැවසීය. මෙහිදී නොක්ස් සහ රට්ලන්ඩ් යන දෙදෙනා කියා සිටියේ දැනට තමන් ඉනෙන් පහළට ඇඳගෙන සිටින සැහැල්ලු කපු රෙද්ද, මේ රටේ දේශගුණයට ඉතාම සුදුසු බවත්, පාවහන් පැළඳීම අනවශ්‍ය කරදරයක් බවය. කෙසේ වුවද යුරෝපීයයන්ගේ නම්බුව රැකිය යුතු යැයි පැවසූ ඕලන්ද ආණ්ඩුකාර ෆන් තුමා තමාගේ ඇඳුම් මසන්නා ලවා ඉතා ඉක්මනින් එදා පැවති යුරෝපීය ක්‍රමයට අනුව සේද කලිසම් සහ තද නිල් පාට කබායක්ද පාවහන් යුගලයක් සහිත ඇඳුම් පැළඳුම් සපයා දුන්නේය. ආණ්ඩුකාරවරයාගේ බලපෑම අනුව මෙසේ යුරෝපීය ඇඳුම් ඇන්දත් බුලත් විට කෑම නම් දෙදෙනාම අත් හැරියේ නැත.

කන්ද උඩරටින් පැන විත් කොළඹට පැමිණ දින 22 කට පසුව රොබට් නොක්ස් සහ ඔහුගේ සගයා වූ ස්ටීවන් රට්ලන්ඩ් ඕලන්ද නැවක නංවා ඉන්දුනීසියාවේ බතාවියා නුවරට යවන ලදී. කොළඹින් පිටත් වූ එම නෞකාව 1681 ජනවාරි 15 වැනිදා, එනම් මාසයකුත් දින 21 කට පසුව ඉන්දුනීසියාවට පැමිණියේය.

බතාවියේ මාස කිහිපයක් ගත කළ මේ දෙදෙනා ඉන්දුනීසියාවේ බැන්ටම් නුවර සිට එංගලන්තය බලා යාත්‍රා කොට 1680 සැප්තැම්බර් මාසයේදී එංගලන්තයට ගොඩ බැස්සෝය. එනම් සිය රටෙන් පිටව අවුරුදු 20 කට පසුවය. බැන්ටම් සිට ලන්ඩන් බලා ගිය නැවේ ගත කළ කාලය තුළදී තමාගේ මතකයන් අත්දැකීම් සහ කන්ද උඩරට පිළිබඳව සටහන් ලිවීමට නොක්ස් පටන් ගත්තේය. එංගලන්තයට ළඟා වන විට එම සටහන් ලියා නිම කළ බව නොක්ස් පවසයි.

විස්මිත අන්දමේ මතක ශක්තියක් ඇතිව ලියූ එම කරුණු බොහෝ දුරට ඔහුගේ අත්දැකීමෙන් පෝෂණය වූ සටහන් බව පැහැදිලිය.

යුරෝපීය දෘෂ්ටි කෝණයකින් යුතුව බැලූ එම ලංකා විස්තරය දේශීය ඇසකින් බලා විශ්ලේෂණය කරන විට රසවත් සිද්ධි සමූහයක් මතු වෙයි මෙම ලිපියේ පරමාර්ථය එවැනි සිද්ධීන් සහ චරිතයන් කිහිපයක් කියවන ඔබේ රස වින්දනය සඳහා ඉදිරිපත් කිරීමයි.

ඇත්ත වශයෙන්ම ඔහු සිරකරුවකු ලෙස ජීවිතය ගත කළේද? නැත්නම් නිදහස් රැඳවුම්කරුවකුගේ ජීවිතයක් ගත කළේද යන ප්‍රශ්නය මෙහිදී පැන නඟී. ඔහු ලියා ඇති Historical Relation of The Island of Ceylon නමැති ග්‍රන්ථයේ කිහිප තැනකම තමන් හඳුන්වා දී ඇත්තේ සිරකරුවකු ලෙසය. තවත් කිහිප තැනකම රැඳවුම්කරු යන යෙදුම භාවිත කොට ඇත. එහෙත් ඔහු ලංකාවේ ගත කළ කාලයේ ජීවන විස්තරය අනුව කිසි දිනෙක සිරකරුවකු මෙන් විලංගු දමා කුටියක සිරකර තැබීමට භාජන වූයේ නැත. උඩරට සිටි නොක්ස් ඇතුළු පිරිස නිදහස් රැඳවුම්කරුවන්ගේ ජීවිතයක් ගත කළෝය. ඉඩ කඩම් මිල දී ගැනීම, උඩරට තරුණියන් සමග විවාහ ජීවිතයට එළඹීම, නිවෙස් තනා ගැනීම ආදිය සඳහා ඔවුන්ට සම්පූර්ණ නිදහස තිබුණි. එසේම වෙළහෙළඳාම උදෙසා උඩරට රාජධානිය තුළ නිදහසේ ගමන් බිමන් කිරීමට වරම් ලැබී තිබුණි. ඔවුන් ගත කළ නිදහස් ජීවිතයට එකම බාධාව වූයේ උඩරට දේශ සීමාවෙන් පිට ලන්දේසීන්ගේ පාලනයට නතු ප්‍රදේශවලට යෑමට ඉඩ නොදීමයි. එහෙත් එය වුවද පොදුවේ ආරක්ෂක හේතූන් උඩරට අනෙකුත් ජනතාවටද එක සේ බලපාන ලෙස පනවා තිබූ නීතියකි.

නොක්ස්ගේ පියා ඇතුළු නාවිකයන් පිරිස ලංකාවට ගොඩ බැස්සේ කුණාටුවකට අසු වී කැඩී ගිය නැවේ කුඹ ගසට සුදුසු ගසක් සොයාගැනීම පිණිස බව සඳහන් වෙයි. වෙළෙඳාම සඳහා කැලිකෝ රෙදිපිළි තොගයක්ද නැවේ ගෙනවිත් තිබුණි. එය විකුණා ලංකාවෙන් පුවක් මිල දී ගෙන දකුණු ඉන්දීය වෙළඳ මධ්‍යස්ථානවලට අලෙවි කිරීමද එම ගමනේ එක් අරමුණක් විය. මෙම අවස්ථාවේදී නැවේ කපිතාන් වූ රොබට් නොක්ස්ගේ පියා කළ විශාල වරදක් වූයේ තමන් පැමිණි කාරණය පිළිබඳ උඩරට රජුට දන්වා නොයැවීමයි. ඒ අතර උඩරට රාජධානිය සතුව පැවැති එම ප්‍රදේශවල අවසර නැතිව වෙළහෙළඳාම් කිරීමට තැත් කිරීම බරපතල වරදක් විය.

එසේ වුවද මුල් අවස්ථාවේදී කපිතාන් නොක්ස් ඇතුළු අනෙකුත් ඉංග්‍රීසි නාවිකයන්ට සිංහල වැසියන්ගේ ආගන්තුක සත්කාරය නොමදව ලැබුණි. ඒ අතර කපිතාන්වරයාට උඩරට ප්‍රභූවරයකුට හිමි අන්දමේ සැලකිලි වතාවත් පිරිනමනු ලැබීය. ඔහුගේ වාසය සඳහා වෙනම ලැගුම් හලක් තනවා උඩු වියන්ද සුදු වට රෙදිද දමා තිබූ බවද, අනෙකුත් සියලුම නාවිකයන්ට අවශ්‍ය ආහාර පානාදිය නොඅඩුව සැපයුණු බව නොක්ස් සඳහන් කර තිබේ.

රජුගේ හේවායන් තමන් සතු සියලු දේ පැහැර ගනීවි යැයි අස්ථාන බියක් ඔවුන් තුළ තිබුණත් ඔවුන් සතු කිසි දෙයක් සිංහල හේවායන් විසින් පැහැර නොගත් බව නොක්ස් සඳහන් කරයි. එසේම තමන්ට ඉතා කාරුණිකව සැලකූ බවත් සඳහන් වෙයි. "We were only detained and kindly entertained" යනුවෙන් සඳහන් කර තිබේ.

උඩරට මහා වාසල අණ දුන් ලෙස මෙම පිරිසට සහ කපිතාන් නොක්ස්ට ගෞරවනීය අමුත්තකුට දක්වන සැලකිල්ල ලැබුණි. එසේම මාසයකින් හෝ දෙකකින් පසුව ඔවුන් නිදහස් කිරීමට රජුගෙන් අණ ලැබෙන තුරු සිටින බව එම ප්‍රදේශය භාරව සිටි තෙන්නකෝන් දිසාවේ පැවසීය. කෙසේ වුවත් තමන්ට දීර්ඝ කාලයක් කොට්ටියාර්හි සිටීමටද සිදු වෙතැයිද එසේම රජුගේ අණින් නැව පැහැර ගනීදැයි යන බියක් කපිතාන් තුළ හට ගති. ඒ අනුව රහසින් නැව රැගෙන මදුරාසිය අසල පෝර්තනෝවා වරායට යන ලෙසත් ඉන්පසු ඉංග්‍රීසි ඒජන්තවරයාගේ අණසක අනුව ක්‍රියා කළ යුතු

34 වන පිටුව බලන්න

4 වන කොමස

ප්‍රාර්ථනා වල් පිපුණා

පද්මිණී ජයතිලක

"කරලැයින්ගෙ ඇස් නම් දැන් පේන්නෙම නැහැ. අද බෝංචි කරල් ඇතුළෙ පනුවො"

"අනේ මැණිකේ මම හොඳට බලල බෝංචි කැඩුවෙ. හොඳට හේදුව"

"කරලැයින්ට පේන්නෙ නැති හින්දනේ. මෙහෙම බැහැ කරලැයින් මම දැන් කෑම උයන වැඩේ මුළුමනින්ම පුෂ්පට පවරනවා. පුංචි හාමුට එහෙම ඔය ඉසකෙස් ගහක් හෙම හම්බ වුනොත් ආයෙ වලව්වෙන් කෑම එපා කියල කියයි. පිටින්ම කන්න ගනී. පුෂ්පා මීට පස්සෙ කෑම උයන එක කරයි. කරලැයින් අත් උදව්වක් දීල හරි වැරදි කියල දෙන්නකො"

"හොඳයි හාමු. හොඳයි. මම දැන් ඉතින් වයසයිනෙ"

ලොකු මැණිකේ එතැනින් ඉවත්ව ගිය පසු කරලැයින් පුෂ්පා දෙසට හැරී,

"මම ඉතින් වලව්වට නාකි වුණා. මගෙ උන්දැ මැරුණට පස්සෙ මම වලව්වට ආවෙ මගෙ කොලු පැටියව අම්මට බාර දීල. දැන් ඌත් ලොකු මහත්වෙලා. උගෙ දරුවොත් දීග තලහ අරන්. මම තාම වලව්වට බත් තම්බනවා. මොනව කරන්නද පුෂ්පො අපි කරපු කරුමනේ මේ. අපි පිං කරපු උදවිය නෙමෙයිනෙ" කියමින් සුසුමක් උඩට ඇද්දාය.

"ඉතින් කරලැයින් නැන්දට මෙහෙ දුකක් තිබුණැයැ"

"ඔව් දුකක් තිබුණෙ නැහැ. තුන්වේල හම්බ වුණා. ඒත් ඉතින් තිබුණ සැපකුත් නෑ බං. වැඩ.. වැඩ වැඩම තමා"

"ඉස්සර මීට වැඩිද වැඩ?"

"ඔව් ඔය මේනකා බේබි ජානකී බේබි රට ඉන්න දේවිකා බේබි හෙම ඉන්න කොට හරියට වැඩ තිබුණ"

"ඒගොල්ලො හොඳයිද කරලැයින් නැන්දෙ"

"රට ඉන්න දේවිකා බේබි නම් හොඳයි. මේනකා බේබිත් හොඳයි. ජානකී බේබි නම් යක්ෂණියක් වාගෙ බං. ඉන්නකල් අක්කල දෙන්නත් එක්ක රණ්ඩු කළා. අන්තිමට ඔය දිවුලපිටිය වලව්වෙ රංජන් හාමුත් එක්ක පැනලා ගියා"

"ඒ ඇයි පැනලා ගියෙ. ලොකු මැණිකෙ අකමැති වුණාද?"

"අපේ ලොකු මැණිකෙ රංජන් මහත්තයාට කියන්නේ බෙබේ හාමු කියලා. බීලා පාරෙත් වැටිල ඉන්නවලු. ඒ හාමුගෙ ලොකු හාමුත් එහෙමලු. ඉතින් කොහොමද මඟුලට කැමති වෙන්නේ. ඒ වුණාට රංජන් මහත්තයාගේ ලස්සනට ජානකී බේබි වශී වුණා. මිනිහ හරිම හැඩකාරයානෙ"

"ඔව් රංජන් හාමු තවමත් හරිම ලස්සනයි"

"දැන් මොන ලස්සනක්ද? තවමත් නහුතෙට බොනවලු බං. සමහරදාට ඔය ජානකී බේබි අඬාගෙන එන්නෙ වලව්වට"

"ලොකු මැණිකේ කියන්නෙ පැනල ගිය දූරු විස්වාස කරන්න බැහැ කියල. අම්ම අප්පට ද්‍රෝහි වුණා නම් එයාගෙන් ඇති වැඩක් නැහැ කියලයි"

"ඒක වෙන්න ඇති පුංචි හාමු රට ඉඳල ආපු දවසෙදි රංජන් හාමු ආවෙ නැත්තේ"

"ලොකු මැණිකෙ රංජන් හාමුට කැමති නැහැ. ඇවැස්ස මස්සිනා හින්ද පොඩි කාලෙ ඉඳලම යාළු වෙලා හිටියලු. දැන් වුණත් ජානකී බේබි වලව්වට ආවොත් ලොකු මැණිකෙත් එක්ක රණ්ඩු වෙලාම තමයි ආපහු යන්නෙ"

"ඒ මොකද?"

"එයාට දේපල දුන්නා මදි කියල"

"ඇයි එහෙම කළේ. මදිවෙන්න දුන්නේ"

"ලොකු මැණිකේ ඉඩම් ලියන වෙලාවෙදි මොකුත්ම නොදී ඉන්නයි හැදුවෙ. ඒත් පුංචි හාමු එහෙම කරනවට කැමති වුණේම නැහැ. මම්ම එහෙම කළොත් මම මට දීපු දේවල් පොඩි අක්කට දෙනවා කියල කිව්ව"

පුංචි හාමු හරි ආදරෙයිනෙ එහෙනම් ජානකී බේබිට"

"ඒ දෙන්න කොහොමත් පොඩි කාලේ ඉඳලම හරි එකතුයි. බාල දෙන්නනෙ"

"ඉතින් රංජන් හාමුට නැද්ද දේපල තිබිල"

"තියෙනවා, තාත්තයි, පුතයි දෙන්න එකතු වෙලා විකුණ විකුණ බීල"

"අනේ පව් ජානකී බේබි"

"මොන පව්ද බං, ඒකි යක්ෂණියක්. පැන ගිය දූවරුන්ට මොන දෑවැද්දද? දැනුත් ආව වෙලේ ඉඳල මැණිකෙත් එක්ක රණ්ඩුවෙවී රත්තරන් බඩු ඉල්ලනවා. ඉඩම් ඉල්ලනවා. වලව්වෙ තියෙන අර ලොකු පියානෝ එක ඉල්ලනවා. ඒක එයාට පප්පා අරන් දුන්නු එකක්ලු"

"ඉතින්"

"ලොකු මැණිකෙ කියන්නේ ඒවා අයිති පුංචි හාමුට කියල. පුංචි හාමුගෙ දරුවන්ට දෙන්නලු මැණිකේ ඒවා තියාගෙන ඉන්නේ"

"මේනකා බේබි එහෙම නැද්ද?"

"ඒකිත් හරි වසයි. ඒක ඉතින් කථා කරල කරපු මඟුලනෙ. හොඳ වලව්වකට ගියෙ. දවසක් දෙකක් මමත් එහෙ, රත්නපුරේ ගිහින් තියෙනවා"

"ඒ මොකටද?"

"එක දවසක් නම් ගියෙ එහෙ තිබිච්ච පිරිත් ගෙදරකට. ආයෙ ගියා මේනකා බේබිගෙ ලොකු බබා හම්බු වෙච්ච වෙලාවෙ සාත්තුවට. සුමාන තුනක්ම හිටිය"

"එතකොට මේ වලව්වෙ වැඩ කවුද කෙරුවෙ"

"ඉස්සර මෙහෙ හිටපු ඇලිස් ආවා. දැන් ඒ ගෑනි මැරිලා"

"ඉතින් එහෙ ගියාම කරලැයින් නැන්දට හොඳට සැලකුවද?"

"ඔව්ත... ඒ දවස් ටිකේ හොඳට කථා බහ කරල සැලකුව. මට එනකොට සල්ලි ටිකකුත් යහමින් දුන්නා. ඇඳුම් දෙක තුනකුත් දුන්නා"

"ඇත්තටම කරලැයින් නැන්දෙ දැන් අවුරුදු හතලිහක් විතර මේ වලව්වෙ වැඩ කරල මොනවද නැන්ද හම්බු කරගෙන තියෙන්නෙ"

"මොනව හම්බු කළාද? හම්බු කරපු දේ ඔක්කොම කොලුවට දුන්නා. ඌ පොඩි කාලෙ මගෙ අම්ම ඇවිත් ලොකු මැණිකෙගෙන් මගෙ පඩි සල්ලි අරගෙන ගිහින් ඌට කන්න දුන්නා. ඊට පස්සෙ ඌගෙ දරුවන්ට මායියට අඩු පාඩු හැදුව"

"දැන් ඉතින් නැන්දට බැරි වුණහම පුතා ළඟට යනවද?"

"අනේ නැහැ. පුෂ්පො, ඌ කොහොම මට සලකන්නද? ඌ මට වැඩිය ලෙඩා දුකා. ඌට දැන් දියවැඩියාව හැදිල. අනේ අපේ පරම්පරාවකවත් අහපු නැති ලෙඩ ඌට හැදිල. උගෙ දරුවොත් දැන් දීග තලහෙ ගිහින්. ලොකු මැණිකෙ කියන්නෙ මාව සල්ලි ගෙවල හොඳ මඩමකට දානව කියලනෙ. ඒවායෙ තුන්වේල හොඳට කන්න දීල බලාගන්නවලුනෙ. වැඩක් පලක් කිසිම දෙයක් කරන්න ඕනි නැහැලු. පිටරට ඉන්න සුද්දො තමයි ඒ මඩමට විය හියදම් කරනව කියන්නෙ. එතැන සැප හොඳයිලු. ගෙදර ගියොත් මට නහින දෙහින කාලේ හරියට දුක් විඳින්න වෙයි කියල තමයි මැණිකෙ කියන්නෙ"

"අන්තිමට බැලුවම නැන්දට ඉතුරුවෙලා තියෙන්නේ ඇඳිවතයි, බඩට කාපු දේකුයි විතරයි නේද?"

"ඒ මදෑ බං අපිට ඒකවත් නැති හින්දනෙ මේවයැ වැඩට ආවේ"

"නැන්දට තිබුණෙ මනුස්සය මැරුණට පස්සේ තව මනුස්සයෙක් එක්ක යන්න"

"කොහෙ යන්නද බං. ගියා නම් ඉතින් දරුවොත් වදන්න වෙයි. දුකම තමයි. එක අතකින් මෙහෙම වෙච්ච එක හොඳයි. වැඩි දුකක් වින්දෙ නැහැ. උන්දැ ඉන්න කාලෙ මට හරියට තඩිබෑව. මම කෑවත් වැරදියි. නිදිය ගත්තත් වැරදියි. දීග කෑවට වඩා කළේ ගුටි කාපු එක. ඒකෙන්ම මට මිනිස්සු එපා වුණා බං"

"අනේ ඇත්තද?"

"ඒ වුණාට මම මෙහෙම කිව්වට උඹ නම් මඟුලක් කරගන්නෙ නැතුව ඉන්න එපා. මේවාට මෙහෙවර කරයි අතපය හයිය තියන කල්. උඹට හොඳ දීගෙක යන්න පුළුවන්. උඹ හොඳ හැඩ ගෑනියෙක් වෙලානෙ දැන්. මෙහාට එනකොට තිබිච්ච කුරු ගතිය හොඳට දිග ඇදිල මස් පිරිල තියෙන්නෙ ඔය. මොනව වුණත් මේ වලව්වෙ කෑමෙන් හිඟයක් නැහැනෙ. ගෑනිගෙ පින කුණු මුල්ලෙ කියල තියෙනවනෙ. උඹවත් මොකෙක් හරි හොඳ එකෙක් ගෙනියන්න බැරි නැහැ"

"අනේ අපිව ගෙනියන්නෙත් අපි වාගෙම හිඟන්නොනෙ නැන්දෙ. කුණු මුල්ලෙවත් පිනක් තියෙයිද? එහෙම වෙයිද නැන්දෙ"

"උඹ හැබෑට අකුරු ලියන්න කියන්නත් දන්නවනෙ"

"ඔව් මම පහේ පංතියෙ ඉද්දැද්දි අපේ තාත්තා මැරුණෙ"

"ඊට පස්සෙ"

"ඊට පස්සෙ මම ඉස්කෝලෙ ගියෙ නැහැ. අම්ම ගෙවල්වල වැඩට ගියහම මල්ලිව බලාගන්න මම ගෙදර නතර වුණා. මට ඉගෙන ගන්න හොඳට ආශාව තිබුණා"

"දැන් උඹේ මල්ලිත් ලොකු නැතෑ"

"ඔව් එයා මේසන් බාස් කෙනෙක් එක්ක අත් වැඩට යනවා"

"දැන් උඹේ වයස"

"මම මෙහෙ එනකොට වයස දොළහයි. මම ඇවිත් දැන් හරියටම අවුරුදු පහයි. මට දැන් දාහතයි"

"ඔව් ඔව් මට මතකයි උඹේ අම්ම ඇවිත් උඹ ගැන කියනකොට ලොකු මැණිකෙ උඹ එනවට කැමති වුණා.

32 වන පිටුව බලන්න

පුාර්ථනා මල්...

31 වන පිටුවෙන්

පුංචි හාමු රට ගිය අලුත නිසා මැණිකෙ පාළුවෙන් හිටියෙ. ඔන්න ඔහෙ කෙල්ලව ගෙන්න ගනින් කියල මට කිව්වා"

"උඹේ තාත්ත මැරුණෙ මොනව වෙලාද?"

"අම්ම කියන්නෙ උණ සන්නිපාතෙ හැදිල කියල. වැහි කාලෙක ගොයම් කපන්න ගිහිල්ල. මඩේ බැහැගෙන ඉඳලම උණක් හැදුනලු. ඉස්පිරිතාලෙ ගෙනිච්චම මැරිල. මට මතකයි තාත්තගෙ මළගම"

"උඹල ඉන්න ගේ දොරත් හැම වතුරකටම යටවෙනව කියලනෙ උඹේ අම්ම උඹව මා ගාවට අරගෙන ආවෙ"

"ඔව් නැන්දෙ පොඩි වැස්සටත් අපේ ගේ තියෙන දෙණිය යටවෙනවා. යට වෙනවනම් බැරියැයි බිත්තිත් කඩාගෙන වැටෙනවා. ඉතින් පන්සලට යනවා. වතුර බැහැල ගියහම ආයෙත් ඇවිල්ල



පොල්අතුවලින් වටකරගෙන පදිංචි වෙනවා. අම්මා හරි බයෙන් හිටියේ පන්සලේ සෙනඟ පොදිය මැද්දෙ මාව තියාගෙන ඉන්න"

"ඔව් ඉතින් උඹ ඇහැට කනට පේන කෙල්ලනෙ. ඔය සෙනඟ මැද්දේ උඹව කොහොම පරිස්සම් කරන්නද?"

"අම්ම මාවත් අරගෙන කරලැයින් නැන්දව හොයාගෙන ආවෙ ඒකනෙ"

"ඔව් මටත් ඔය කථාව අහල උඹ ගැන හරියට දුක හිතුණා. ඒ කාලෙ මේ වලව්වෙ පිරිමි පුළුටක් හිටියෙ නැහැ. මමත් බය නැතුව උඹව ගෙන්න ගත්තා"

"ලොකු මැණිකෙ නම් කියනවා මට හොඳ පඩියක් දෙනවා කියල. ඒත් ඉතින් අම්මත් ඇවිත් සැරින් සැරේ මගේ පඩි අරන් යනවනෙ. කවද හරි මටත් කරලැයින් නැන්දට වෙච්ච දේ වෙයිද දන්නෙ නැහැ"

"හැබැයි පුෂ්පො. අපේ මේ මැණිකෙ හොඳ යහපත් හාමු. කවදාවත් මේ වලව්වෙ සේවෙ කොරපු කෙනෙක් හිස් අතින් නම් යවන්නෙ නැහැ. මැණිකෙට හිතවත්ව කීකරුව හිටියොත් උඹටත් වරදින්නෙ නැහැ. හැබැයි මොන විදියකටවත් මැණිකෙට අකීකරු වෙන්න එපා. කිසි අනුකම්පාවක් නැහැ. පේන්නෙ නැතෑ එයාගෙ දුවට කරන දේම. හිතුවක්කාර වුණා කියල කිසිම දයාවක් පෙන්නන්නෙම නැහැනෙ"

"ආ පුෂ්පො මෙන්න පොල් ටික ගාලා අහවරයි. උඹ දැන් උයන්න පටන් ගනිං. කියහන්කො තව මොනවද උඹට කරල දෙන්න ඕනි. මම අර වනලා තියෙන මිරිස් වට්ටිය අතගාල එන්නම්"

"කරලැයින් නැන්දෙ මේ වලව්වෙ අවතාර නැද්ද"

"ඇයි උඹ එහෙම ඇහැව්වෙ. උඹත් දැන් ඇවිත් අවුරුදු පහක් නම් අවතාර උඹත් දැකල ඇති තියනවනම්"

"නැහැ ඉතින් මේවා හරි ලොකු ගෙවල්නෙ. අපේ පැල් කොට වාගෙද. මේ වලව්වෙ කිහිප දෙනෙක්ම මැරිලත් තියෙනවලුනෙ. මම අහල තියෙන්නෙ මේ පරණ ලොකු වලව්වල අවතාර තියෙනවා කියල අපේ පංතියෙ ළමයෙකුගෙන්"

"අනේ නිකං හිටහං. මෙහෙ අවතාර නැහැ"

"ඇයි මැරුණ ලොකු හාමු අවතාරයක් වෙලා ආවෙ නැද්ද?"

"ලොකු හාමු ඉන්න කාලෙ නම් අවතාරෙ වගේ රෑට රෑට ආව කාලයක්. මැරුණට පස්සෙ නම් අවතාර වෙලා ආවෙ නැහැ"

"ඒ මොකක්ද නැන්දෙ ඒ කතාව"

"ඕව ඉතින් මේ වලව්වල තියෙන දේවල්. මේවයැ ඉන්නවනම් ඕවටත් හැඩ ගැහෙන්න ඕනි"

"මට තේරෙන්නෙ නැහැ. නැන්ද කියන ඔය කථාවල්"

"අපි මේවායෙ වැඩකාරයො බං, වැඩකාරයො. අපි හාමුලගෙ ඕන එපා කම්වලට ඉන්න වැඩකාරයො. ඒව තේරුම් ගනිං"

"අනේ මන්ද නැන්ද මොනවා කියනවද කියල"

"ආ දවල් වෙලා. අන්න දහයමාර වදිනවා පුංචි හාමුගෙ වැඩ පොළේ. ගනිං ඔය කොස් මදුළු ටික මම කපල දෙන්නම්. ඉක්මන් කොරල උයපං පුංචි හාමුට කෑම ටික යවන්න එපායැ දොළහ වෙනකොට"

"පුෂ්පා....."

"අන්න. ලොකු මැණිකෙ එනවා"

දෙදෙනාම හනි හනිකට වැඩ කටයුතුවල නිරත වූහ.

ලබන කලාපයෙන් හමුවෙමු

BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers
Any Document Shipping worldwide
DHL EXPRESS
AIR-SEA-LAND
Household Goods & Commercial Cargo
Packing / Relocation / Transport / Express delivery
DELIVERY SERVICE ALL PART OF SRI LANKA (GIFT PACK)

Warehouse In Colombo
LAKSIRI SEVA (PVT) Lid
66 New Nuge Road,Peliyagoda
Kelaniya
Tel: 11-257-4180

Kurunegala Warehouse
Laksiri Seva (PVT)Lid
118/96 Negombo Road
Malkaduwawa
Kurunegala
Tel : 037-2052-810

Warehouse In Batticaloa
LAKSIRI SEVA (PVT)Lid
26,Hmyl Lane
Main Street,Addapalam
Ninthavur
Tel : 0672051050

Toronto: - 416-321-0400
Proud member of
IAM International Association Of Movers
CIMC Canadian International Movers Club
Ajax / Whitby - Mr.Prasad,1-289-200-4288
Ottawa : Kannan -1-613-828-2221 Montreal: Uthayan -1-514-736-2525
Web:www.briskcargo.com Email: info@briskcargo.com
919 Ellesmere Road Suite # 306 M1P2W7

ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳුනන

2018 ජනවාරි 01 දින සිට ජනවාරි 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)

මීන ලග්නය

කුම්භ ලග්නය

ලග්නාධිපති ගුරු 8 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. උසස් අධ්‍යාපනය ලැබීමට භාග්‍ය ඇති අතර ඊට ශුභ කාලයකි. විභාග ජය ලැබේ. රැකියා ව්‍යාපාර කටයුතුවලට ශුභයි. තාන්න මාන්න ලැබිය හැක. සමාජ සේවා කටයුතුවලට යොමු වේ. පිරිස් බලය සහිත කාලයකි. පිනට දහමට යොමු වේ. ආදායම් මාර්ග සරු වේ.

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. රැකියා ව්‍යාපාර ආදි කටයුතු දියුණු වේ. තනතුරු උසස්වීම් ලබාග ැනීමේ අවස්ථාව සැලසේ. අලුතෙන් ආරම්භ කරන වැඩකටයුතු සාර්ථක වේ. මිතුරු ඇසුර ලැබේ. රැකියාවේ, පදිංචියේ වෙනසක් ඇති විය හැක. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ආදායම් මාර්ග සරු වේ.

මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 7 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභ කාලයකි. විභාග ජය ලැබේ. ව්‍යාපාර කටයුතු සහ රැකියා කටයුතු දියුණු වේ. තනතුරු ලැබීමේ භාග්‍යය ඇත. පදිංචියේ වෙනසක් ඇතිවිය හැක. නිදහස් මතධාරී වේ. ආදායම් මාර්ග සරු වේ.

වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 8 වැන්නේ ගමන් කරයි. සතුරු කරදර අඩු වේ. වෙළඳ ව්‍යාපාරවලින් ලාභ ලැබිය හැක. රැකියා දියුණු වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. බාධක අපහසුතා බිඳ ඉදිරියට යාමේ හැකියාව ඇත. ආදායම් මාර්ග සරු වේ. සඳු 8 වැන්නේ නම් ජන්ම අෂ්ටම ඒරාෂ්ටකයක් ඇති හෙයින් අනතුරු පීඩා ඇති විය හැක.

මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 6 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. චිත්‍ර, ගැයුම්, වැයුම් වැනි කලා අංශයන්ට සිත් දේ. රැකියා දියුණුව ඇති වේ. හවුල් ව්‍යාපාරවලින් වාසි සැලසේ. ආදායම - වියදම සම තත්ත්වයේ ඇත.

මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. ව්‍යාපාර කටයුතු රැකියා කටයුතු දියුණු වේ. රැකියා අපේක්ෂිත අයට ඊට අවස්ථාව සැලසේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. ගේ දොර මිල දී ගැනීමේ හැකියාව ඇත. අය-වැය සම තත්ත්වයේ පවතී.

කටක ලග්නය

ලග්නාධිපති සඳු 12 වැන්නේ ගමන් කරයි. සතුරු කරදර අඩුය. ආදායම් මාර්ග යහපත් වේ. ඉඩකඩම්, යානවාහන ගැනීමේ අවස්ථාව සැලසේ. රැකියාවේ දියුණුවක් ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. ගමන් බිමන් අධික වේ. සඳු 6 වැන්නේ නම් ජන්ම ඒරාෂ්ටකය ලබා ඇත.

ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 11 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. රැකියා සහ ව්‍යාපාර කටයුතුවලටද ශුභ කාලයකි. තනතුරු ලැබීමට පුළුවන. අලුතෙන් ආරම්භ කරන වැඩ කටයුතු දියුණු වේ. ආදායම් මාර්ග සරු වේ. භූමි ලාභ ඇත. සඳු ලග්නයේ නම් අනතුරු පීඩා ඇතිවිය හැකි හෙයින් ප්‍රවේසම් වන්න.

සිංහ ලග්නය

ලග්නාධිපති රවි 5 වැන්නේ ගමන් කරයි. සතුරු කරදර අඩුය. රැකියා කටයුතුවලට ශුභයි. වැඩ රාජකාරී අධික කාලයකි. පදිංචිය, රැකියාව වෙනස් විය හැක. මිතුරු මිතුරියන්ගේ ඇසුර ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. තනතුරු, උසස්වීම් ලැබීමට පුළුවන. ආදායම් මාර්ග සරු වේ.

වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 12 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු හොඳින් සිදුවන ශුභ කාලයකි. අලුත් දේ නිර්මාණය කිරීමට, ලිවීමට අවස්ථාව ඇත. රැකියා කටයුතු ශුභ වේ. නිදහස් මතධාරී වේ. මෙම කාලයේදී හදිසි තීරණ ගැනීම සුදුසු නැත. සමාජ සේවා කටයුතුවල යෙදේ. උසස් පුද්ගලයන් ඇසුරට ලැබේ. ආදායම් වියදම් සම තත්ත්වයේ පවතී.

තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු 3 වැන්නේ ගමන් කරයි. සතුරු කරදර අඩුය. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. සංගීත කලාවට ප්‍රිය වේ. රැකියා ව්‍යාපාර කටයුතුවලට ශුභයි. වචනය බලවත් වන කාලයකි. බාධක මැඩ ඉදිරියට යාමේ හැකියාව ඇත. ආදායම් මාර්ග සරු වේ.

කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ 3 වැන්නේ ගමන් කරයි. උසස් අධ්‍යාපනය ලැබීමට හැකි කාලයකි. ගේ දොර ගැනීමට භාග්‍යය ඇත. රැකියා දියුණුව ඇති කෙරේ. රැකියා අපේක්ෂිත අයට ලබා ගැනීමේ අවස්ථාව ඇත. පදිංචියේ වෙනසක් ඇතිවිය හැක. කථිකත්වයට හොඳයි. පිරිස් බලය ලැබේ. ධන ලාභ ඇත.



එම්. වයි. ධර්මවිජය
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණි(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca

උඩරට සිටී...

30 වන පිටුවෙන්

බවටත් ගොඩබිමේ සිට නැවට නාවිකයන් දෙදෙනකු යවන ව්‍යාපයෙන් නැවේ සිටි නාවිකයන් දෙදෙනාට රහසිගත පණිවිඩයක් යවන ලදී. මෙසේ තමන් පැමිණි නැව හැංගි හොරා ඉන්දියාවට පිටත් කර හැරීම නැවේ කපිතාන්වරයා කළ බලවත්ම වරදක් විය. එම ක්‍රියාව නිසා කපිතාන් සහ දිසාවේ අතර තිබූ හොඳ හිත පළුදු වී යම් යම් සැකයන් මතු වන්නට පටන් ගති. අනෙක් අතට තමන්ට ආපසු යෑමට තිබූ එකම ප්‍රවාහන යාත්‍රාව මෙසේ ආපසු යැවීමෙන් තමන් අතරමං වන බවද ඉන්පසු උඩරට රජුගේ අණසක අනුව ක්‍රියා කිරීම හැර වෙන කරන්නට දෙයක් නැති බවද ඉංග්‍රීසීන්ට වැටහිණි. මාස කිහිපයකට පසු මේ සියලු දෙනාම කන්ද උඩරට රාජධානියට රැගෙන යා යුතු බවට විධානයක් මහනුවර රජ වාසලින් ලැබුණි. මෙහිදී ඉංග්‍රීසි නාවිකයන්ගේ බලවත් භීතිය වූයේ තමන් වහල් භාවයට පත්වීම අනිවාර්ය බවයි. එහෙත් එසේ බියපත් වූවාට වඩා ඉතාම නිදහස් ජීවිතයක් ඉදිරියේදී උඩරටදී ගත කළ හැකි බව ඔවුන් සිහිනයකින්වත් නොසිතූහ.

කොට්ටියාරම් වරායේ සිට කන්ද උඩරට දක්වා රැගෙන ගිය අතරමඟ කොයි මොහොතේදී හෝ මංකොල්ලකරුවන් කඩා පැන තම රෙදි පිළි සහ රැගෙන ගිය අනෙකුත් භාණ්ඩ කිහිපය උදුරා ගනීවි දැයි මොවුනට තවත් බයක් තිබුණි. එසේ වුවද රජතුමා අණ දී තිබුණේ ඔවුන් සතු එක නුල් පොටක දෙයක්වත් නොගත යුතු බවයි. මහනුවර බලා ගිය මෙම ගමනේදී තමන් ගිය රැකවලුන්ගේ ආගන්තුක සත්කාරය මහත් අස්වැසිල්ලක් ගෙන දුන්නේ යැයි නොක්ස් පවසයි. වන දුර්ග හරහා යන විට දඩමස්, නොයෙක් පළතුරු එම තේවායන් සපයා දුන් බවද ගම්මාන මැදින් යන විට ගැමියන් නොයෙකුත් මාදිලියේ කෑම බීම සැපයූ බවද සඳහන්ය. ඉංග්‍රීසි ජාතිකයන්ට මෙසේ සිංහල ගැමියන්ගෙන් ආගන්තුක සත්කාරය ලැබුණේ දෙපාර්ශ්වයටම ප්‍රීතියක් ගෙන දෙමිණි. බීම පැදුරු එළා අතින් ආහාර ගැනීමට තැත් කරන සුද්දන් දෙස බලා ගැමියෝ විනෝදාස්වාදයක් ලැබූහ. සමහර සුද්දන්ගේ හැඳි ගෑරුප්පු හරඹය බලා සිටි අයට අරුමයක් විය. සුද්දන් කන බොන විට විශේෂයෙන්ම අතින් කන විට එය බලා විනෝදයක් ලැබීමේ නොමනා පුරුද්ද අද මෙන්ම එදත් තිබූ බව පෙනී යයි.

කන්ද උඩරටට ගෙන ගිය මෙම පිරිස හත් කෝරළයේදී එකිනෙකාගෙන් වෙන් කොට විවිධ ගම්මානවලට යවන ලදී. මේ අය බලා ගැනීම සහ ආහාර සැපයීම ගම්වාසීන්ට නිල වශයෙන් පැවරී තිබුණු රාජකාරියක් විය. කෙසේ වෙතත් ආහාර පාන සහ වාසස්ථානයන්ට අමතරව වෙනත් කිසිම අන්දමේ මුදල් දීමනාවක් රජවාසලින් ලැබුණේ නැත. ටික කලක් ඇවෑමෙන් මුදල් හිඟය තමන්ට වැඩි වැඩියෙන් දැනෙන්නට පටන් ගත් බව නොක්ස් පවසයි. අමතර ආදායමක් උපයා ගැනීම සඳහා නොක්ස් මෙන්ම අනිකුත් සුද්දෝද මුදල් ඉපයීමට නොයෙකුත් උපක්‍රම යෙදූ බැව් වාර්තා වේ.

සිය ආදායම් මාර්ගය වැඩි කර ගැනීමට මුලදී ඔහු එක්තරා උපායක් යෙදීය. තමන් ඇඳ සිටි කලිසමේ මහා පරිමාණ සාක්කු දෙකක් මස්සා ගත් නොක්ස් ගමේ කුඹුරු දිගේ ඇවිදිමින් වී කරල් එකතු කොට සාක්කු පුරවා ගෙන ගෙදර ගෙනවිත් ගොඩ ගැසීමට පටන් ගත්තේය. එසේ කළේ පසුව එම වී ගැමියන්ට විකිණීම සඳහාය. කෙසේ වුවද හිමිදිරි පාන්දර ලියැදි දිගේ සක්මන් කරන මේ සුද්දා ගැන ගැමියන් විමසිලිමත් වූ බවට සැකයක් නැත. හදිසියේම මෙම සාක්කු වී ව්‍යාපාරය නතර කළ නොක්ස් කපු නූල්වලින් හිස්වැසුම් ගොතා විකිණීම ගැන සිත යොමු කළේය. මුලදී මෙම ජාවාරම යම්කිසි ආදායමක් ලැබුණු නමුදු අනෙක් හැම සුද්දාම පාහේ මෙම තොප්පි කර්මාන්තය පටන්ගත් හෙයින් නිපයූ භාණ්ඩවල අතිරික්තයක් ඇතිවී හිස් වැසුම් විකුණා ගත නොහැකි වූ තත්ත්වයක් ඇති විය.

නව ආදායම් මාර්ග සොයා ගැනීමට උත්සුක වූ සමහර සුද්දෝ ඉන්පසු කුඹුරු ගොවිතැනටද බැස්සාහ. අමුඩය ගසා ගෙන වෙලට බැස කුඹුරු කොටා සිය සිංහල බිරිඳ විසින් ගෙනෙන ලද ඇඹුලෙන් සප්පායම් වී සවස වැඩ හමාර කළ පසු ඇළට බැස සිසිල් ජලය නා උදැල්ල කර ගසා ගෙන ගෙදර යන සුද්දන් දැකීම එදා සිංහල ගැමියන්ට අරුමයක් නොවීය.

උඩරට සරළ ජීවිතයට ඔවුහු ඉක්මනින් පුරුදු වූහ. තමන් ඇඳ ගෙන සහ ගෙන ආ ඇඳුම් කිහිපය ක්‍රම ක්‍රමයෙන් ඉර යත්ම වෙනත් ඇඳුම් මසා ගැනීමට අවස්ථාවක් හෝ මිල මුදල් නොතිබූ නිසා හැකිතාක් දුරට පරණ ඇඳුම් කපා භාවිතයට ගැනීමට පුරුදු වූහ. තමා සන්තකයේ තිබුණේ ඇඳ ගෙන සිටි කලිසම පමණක් හෙයින් එය ඉතා පරිස්සමින් භාවිත කළ බැව් නොක්ස් කියයි. එම රෙදි පිළි සෝදා ගැනීමට අවශ්‍ය වූ විට අසල තිබූ දිය ඇළකට ගොස් ඇඳුම් සෝදා වේලෙන තුරු නිර්වස්ත්‍රව පළුරක් අසල සැඟවී සිටීම සිරිතක් වූ බව ඔහු ලියා ඇත. දිගටම භාවිත කිරීමේදී ඉර යාමට පටන් ගත් තම එකම කලිසමේ පහළ කොටස සඳහා තම කමිසයේ අත් දෙක කපා මූට්ටු කොට එක්තරා විකාර ඇඳුමක් පසුව ඔහු සාදා ගත්තේය. එයද ඉර ගිය පසු එවකට උඩරට ගැමියන් ඇඳි චාම් කපු රෙදි කඩ ඉන වටා ඔතා ගැනීමට අනෙකුත් බොහෝ සුද්දන් මෙන් ඔහු පුරුදු වීය. නොබෝ කලකින්ම පරිසරයට සහ වැඩ කිරීමට ඉතාම පහසු වන්නේ මෙම ඇඳුම් බව ඔවුනට වැටහිණි. පුරා අවුරුදු දහ නවයකට පසු උඩරටින් පැන ගිය නොක්ස් සහ ඔහුගේ සගයාට කොළඹදී වෙනත් ඇඳුමක් ඇඳීම ඉතා අපහසු වූ බව ඉහතින් කියා ඇත.

රටේ ඈත ප්‍රදේශවලට ගොස් තොරොම්බල් බඩු විකිණීම සුද්දන් පටන් ගත් තවත් ජාවාරමක් විය. මෙයින් කරුණු දෙකක් ඉටු විය. පළමුවැන්න යම්කිසි අමතර ආදායම් මාර්ගයක් ලැබීමය. ඒ සමඟම රටේ තොටේ සෑම අස්සක් මුල්ලක් පාහේම වෙළඳාමේ ගිය බැවින් එම ප්‍රදේශ ගැන මනා අවබෝධයක් ලබා ගත හැකි විය. උඩරට රාජධානියේදු සිට මුහුදුබඩ ලන්දේසි පාලන ප්‍රදේශවලට පැන යෑම සඳහා පසු කලෙක පිඹුරු පත් සකස් කරන ලද්දේද මෙසේ ඈත එපිට වෙළෙඳාමේ යන ව්‍යාපයෙන් බොහෝ දිනක් තමන් පදිංචි වී සිටි ගමෙන් ඈත් වී සිටීමට ඉඩ ලැබීමයි.

හැළි අරක්කු පෙරීමද සුද්දන්ට ආදායම් ගෙන දුන් තවත් කර්මාන්තයක් විය. එදා උඩරට රාජධානියේ ජීවත් වූ සුද්දන් අතර සුරා පානය තදින්ම පැතිරී පැවතිණි. මේ පුරුද්ද විශේෂයෙන්ම ලන්දේසි ජාතිකයන් අතර පැවැති දුරාචාරයක් විය. එදා සාමාන්‍ය සිංහලයන් අතර කියමනක් වූයේ 'කුඩා ළමුන්ට කිරි මෙන් සුද්දාට අරක්කු ස්වාභාවික දෙයක් වූ බව' ය. උඩරට ගම්මානවල විසූ සුද්දන් වරින් වර එකිනෙකාගේ නිවෙස් කරා ගොස් සුරා මතින් පදම්ව දොඩමලු වන්නට වූ බව නොක්ස් සඳහන් කරයි. එසේ සුද්දන් සමඟ එකතු වී සාදයන් තමාගේ පැල්පතේ පැවැත්වීම නොක්ස්ගේ සිරිතක් විය. එම දිනවල නොයෙක් විට අනෙකුත් සුද්දන් සිය සිංහල භාර්යාවන් සහ දරු මල්ලන්ද කැටිව පැමිණ එකතු වූහ. සිංහල භාර්යාවෝ එකතු වී ඉවුම් පිහුම් කටයුතු කළ අතර ඉංග්‍රීසි ස්වාමිපුරුෂයන් සහ අනෙකුත් අය එකතු වී සුරා පානය කිරීම එක්තරා චර්යාවක් බවට පත් විය. එසේ වුවද වරින්වර මෙසේ ළමා ළපටි අඹු දරුවන් කැටිව එක්රැස්වී සාදයන් පැවැත්වීමෙන් ඔවුන් ඉමහත් ආශ්වාදයක් ලැබූහ.

ගැමි ජීවිතයක් ගත කළ මෙම සුද්දෝ ගස් නැගීම, පොල් ගස් බඩගෑම, හරක් බැඳීම, දර දිය ඇදීම ආදි වදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය කාර්යයන් තම තමන්ම කර ගැනීමට හුරුපුරුදු වූහ. එවැනි අවස්ථාවලදී යම් යම් හදිසි අනතුරුවලට භාජන වූ බවද සඳහන් වේ. 'කොස් ගෙඩියක් හිස මත කඩා වැදී සුද්දෙකු මිය යයි' යනුවෙන් අද පුවත්පත්වල පළවුවහොත් එය අපූරු සිද්ධියක් වනු ඇත. එහෙත් එදා හියු ස්මාර්ට් නමැති සුද්දා කෙක්කක් ගෙන දිවා ආහාරයට කොස් ගෙඩියක් කඩා ගැනීමට ගොස් එය හිස මත කඩා වැටීමෙන් මිය ගියේය. ඔහුගේ දරු පවුලද එම අවස්ථාවේ එතැන සිටි බව වාර්තා වේ.

එදා ජීවත් වූ සුද්දන්ගෙන් වැඩි කොටසක් සාමකාමීව ජීවත් වූ නමුත් කිහිප දෙනෙකු බීමත්ව නීතිය කඩ කරමින් හැසුරුණු බවට වාර්තා වේ. එක් අවස්ථාවක බීමත්ව වළං කඩයකට ගොඩ වැදුණු සුද්දන් කණ්ඩායමක් වළං පොළවේ ගසමින් කෝලාහල කරන්නට වූ බවද එයින් කෝප වූ අහල පහළ සිටි සිංහලයන්ගෙන් බඩ කට පුරා ඔවුනට ගුටි වැදුණු බවද වාර්තා වේ.

රාජ නීති කඩ කිරීම සහ උඩරටින් පැන යාමට තැත් කිරීම වැනි වැරදිවලට කිහිප දෙනෙකු සිර දඬුවම් වින්දෝය. ඒ අතුරින් තෝමස් මෑන් නමැති සුද්දා රාජද්‍රෝහී වීමේ වරදට ඇතු ලවා පාගා මරවන ලදී.

සිංහලයන් විසින් ආගන්තුක සත්කාරයේදී කරන ලද යම් යම් චාරිත්‍ර වාරිත්‍ර විදි මුලදී වරදවා තේරුම් ගත් සුද්දෝ තමන් ඉතාමත් ඉහළ ජාතියක් බවද පෙරදිග මිනිසුන් යටහත් පහත් භාවයෙන් තමන්ට සැලකූ බවටද උද්දාම වූහ. රොබට් නොක්ස් ඇතුළු නාවිකයන් කණ්ඩායම කොට්ටියාරමේ සිට මහනුවරට ගෙන ගිය අවස්ථාවේදී එවැනි අදහසක් විශේෂයෙන්ම ආහාර ගැනීමේදී ඔවුන්ගේ සිත් තුළ ගැබී විණිඩි ආහාර ගැනීම නිමවා පැන් බීමේදී අයා ගත් මුවට පැන් වැක්කිරීම සිරිත විය. කිසිවිටෙක පැන් කොතලය අතින් ඇල්ලීමට සිංහලයන් ඔවුනට ඉඩ නුදුන්හ මෙසේ පැන් වැක්කිරීම තමන්ගේ උසස් තත්ත්වය නිසා කරන ලද ගෞරවයක් ලෙස මුලදී සිතා ගත් නමුදු නියම තත්ත්වය එය නොවීය. ශරීර කෘත්‍ය කර අතපය නොසෝදන්නවුන් (ඇම්බැට්ටයන්) දැඩි සේ පිළිකුල් කළ සිංහලයන් සිය මුළුතැන් ගෙයි භාණ්ඩ එවැනි අය පරිහරණය කිරීම වළැක්වූහ. නොක්ස් ඇතුළු සුද්දන්ට මේ තත්ත්වය අවබෝධ වූයේ සෑහෙන කලකට පසුවය.

1664 දී මහනුවරට පැමිණි ඕලන්ද තානාපතිතුමාගේ ඉල්ලීම අනුව කන්ද උඩරට ජීවත් වූ සියලුම යුරෝපීය ජාතිකයන් නිදහස් කිරීමට රජතුමා එකඟ විය. ඒ අනුව උඩරට රාජධානියේ විවිධ තැන්වල විසූ යුරෝපීයන් නුවර රාජවාසලට කැඳවන ලදී. ඉංග්‍රීසි නාවිකයන් ඇතුළු එකසිය හැට දෙනෙකු පමණ එසේ එක් රැස් වූ බව සඳහන් වෙයි.

මෙහිදී අපට ඉතාමත් වැදගත් නිගමනයකට බැසිය හැකි වේ. එනම් 1659 දී 'පර්සියා මර්චන්ට්' නැවෙන් පැමිණි අයත් 1660 දී 'ඈන්' නැවෙන් පැමිණි අයත් අවුරුදු පහක් පමණ වූ සුළු කාලයක් තුළදී මුදා හැරීමට රජතුමා අනුමැතිය දීමයි. එයින් පැහැදිලි වන්නේ යුරෝපීයන් දිගු කාලයක් රඳවා තබා ගැනීමට රජතුමාට අවශ්‍යතාවක් නොවූ බවයි. නොක්ස්ගේ ග්‍රන්ථය ඇසුරෙන් අද බොහෝ දෙනා නගන තර්කය එනම් රාජසිංහ රජතුමා වුවමනාවෙන්ම තරුණ සූදු නාවිකයන් රඳවා ගත් බවට නගන අභූත චෝදනාව එයින් බිඳ වැටේ. මෙසේ නිදහස් කළ අය ඕලන්ද තානාපතිතුමා හාරයේ කොළඹට යැවීමට රජවාසල නිලධාරීන් සියලු කටයුතු යොදා තිබුණු අතරතුරේ යුරෝපීයන්ගේ කරුමයට මෙන් සිදුවූ රාජවාසල පෙරළියක් නිසා සියලු බලාපොරොත්තු සුන් විය. සුද්දන් පිටත් කර ඇරීමට කටයුතු යොදා තිබූ දිනට පෙර දින රාත්‍රියේ අඹන්වෙල රාළ ප්‍රමුඛ කණ්ඩායමක් රජුට විරුද්ධව කැරැල්ලක් ගැසූහ. රජතුමා හඟුරන්කෙතට පලා ගියේය. කැරලිකරුවෝ නුවර මාළිගයට කඩා වැදුණහ. කොල්ලයට හවුල් වූ සුද්දන් ඉවත වීසි වෙන රන් රිදී කාසි වස්ත්‍රාභරණ ආදිය අහුලා ගැනීමට බලු කපුටන් මෙන් පොර කන්නට වූ බව සඳහන් වෙයි. කැරලිකරුවන්ගේ ඉල්ලීම පරිදි යුරෝපීයයෝ වැඩි දෙනෙක් කැරැල්ලට එකතු වූහ.

එහෙත් රාජසිංහ රජතුමා ප්‍රතිප්‍රහාරයක් දෙමින් දින පහක් ඇතුළත කැරැල්ල මැඩ පැවැත්වීය. කෙසේ වුවද අසාර්ථක රාජ්‍ය පෙරළියට එක්වූ යුරෝපීයයන්ට දැඩි ශාරීරික දඬුවම් පැන වූයේ නැත. ඒ වෙනුවට ඔවුනට එක්තරා උපරිම දඬුවමක් ලැබිණි. එනම් ඔවුන් නිදහස් කරලීමට ඕලන්ද තානාපතිතුමා සමඟ යෙදූ වැඩ පිළිවෙළ අත්හැර දැමීමයි.

අසාර්ථක වූ කැරැල්ලට එක් වූ විදේශිකයන්ට බරපතල දඬුවම් දීමෙන් රජතුමා වැළකී සිටියත් එතෙක් රජවාසල නියමයෙන් සැපයුණු ආහාරපාන, ඉඳුම් හිටුම් වැනි වරප්‍රසාද දීම නතර කරන ලදී. මෙම ක්‍රියාවෙන් ඉමහත් ආර්ථික අසහනයට පත්ව කරකියා ගන්නට දෙයක් නොමැති වූ සමහර සුද්දෝ මහනුවර වීථි දිගේ සිඟා කමින් යන යාචකයන් බවට පත් වූහ. මහනුවර මහමළුවට පිවිසෙන ස්ථානයේ පිහිටි වාසල දොරටුව අභියස එදා දණින් වැටී සුද්දෝ සිංහලයන් ගෙන් සිඟමන් ඉල්ලුවෝය. වර්තමානයේ සුප්‍රසිද්ධ සංචාරක හෝටලයක් පිහිටි එම ස්ථානය අඩියස අද සිංහලයෝ සුද්දන් ගෙන් සිඟමන් ඉල්ලති.

(මෙම ලිපියේ ඉතුරු කොටස ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න)

කැනඩා සිංහල...

25 වන පිටුවෙන්

දෙනෙකුත් අප සමග සිටිනවා. ඒත් එහිදී ලොකුම බාධකය වන්නේ අපගේ මූල්‍ය තත්ත්වයයි. නමුත් අප අධෛර්යය වන්නේ නෑ. ඒ ඒ අවස්ථාවලදී අවශ්‍ය මුදල් සපයා ගැනීම සඳහා කළ යුතු දේවල් කරමින් අප සංගමයේ කටයුතු ඉදිරියට කරගෙන යනවා. මෙහිදී මම කැනඩාවේ වෙසෙන ශ්‍රී ලාංකික වෙළඳ ප්‍රජාව ගැනත් විශේෂයෙන්ම සඳහන් කරන්න කැමතියි. අප සිදුකරන සෑම කාර්යකදීම ඔවුන්ගේ නොමසුරු දායකත්වය අප වෙත දක්වමින් උපරිම සහයෝගය දැක්වීමට ඔවුන් කටයුතු කර තිබෙනවා. එය අපට ඉතාමත් විශාල ශක්තියක්.

ඒ වගේම මම අපේ සිංහල ප්‍රජාවට යමක් පැවසීමට කැමතියි. කැනඩා සිංහල සංගමයේ ප්‍රගතිය බලාපොරොත්තු වන ඔබට ඒ සඳහා කළ හැකි යුතුකමක් තිබෙනවා. ඒ ඔබත් කැනඩා සිංහල සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමයි. මේ සඳහා අවශ්‍ය තොරතුරු අප සංගමයේ නිලධාරී මණ්ඩලයේ නිලධාරී මහත්වරුන් වෙතින් ඔබට ලබාගත හැකියි. ඇත්තෙන්ම මේ සඳහා ඔබගේ දායකත්වය අපට ඉතාමත් වටිනවා.

බෙහෝවැඩ රාජකාරී රැසක් මැද ඔබගේ වටිනා කාලය මිඩංගු කරමින් අප වෙත මේ අදහස් දැක්වීම පිළිබඳව කැනඩා සිංහල සංගමයේ ගරු ලේකම් යසන්ත නවරත්න මහතාට අප නැවතත් ස්තූති කරනවා. කැනඩා සිංහල සංගමය විසින් සිදුකිරීමට බලාපොරොත්තු වන සියලුම වැඩ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා කියා අප ප්‍රාර්ථනා කරනවා.

Cakes To Dream On
මංගල කේක්
ලාංකේය මංගල කේක්
මංගල හා ප්‍රිය සම්මාෂණ සඳහා තනි තනි අනුභූපය (Individual Desserts)
ඉල්ලීම අනුව නිර්මිත කේක් වර්ග (Custom Cakes)
කප් කේක් / කේක් පොප් / මැකරෝන්
ප්‍රණීත ආහාර මේස (Sweet Tables)
ඩබල් චොක්ලට් ෆවුන්ටන්
චොක්ලට් වර්ග
සැපීවී ද්‍රාව්‍ය නයිට්‍රජන් අයිස් ක්‍රීම් (Liquid nitrogen Icecream (Live)
සැපීවී උදෑසන ආහාර මේස
ලාංකේය කුමයට ඔන් සහ විපංජන
සැන්විච් වර්ග
ලාංකේය බේකරි කෑම වර්ග (Pastries)
පලතුරු, චොක්ලට්, සීනිමය හා මාසිප්‍යැන් වලින් නිර්මිත ප්‍රධාන කෑම සැරසිල්ල
(Edible Carvings for centre pieces)
සඳහා විශිෂ්ඨයන්.
25ස් වසරක අත්දැකීම් හා සහජ කුසලතාවෙන් සපිරි, ඔලිම්පික් රන් පදක්කම් ලාබී, සූපන ආචාර්ය ශිල්පී
දිලූනු ෆෙර්ර.
අතින් හැඩගැන්වෙන සම්මානනීය ආහාර සැරසිලි, අප කේක්ස් ටු ඩ්‍රීම් ඔන් ආයතනයෙන් එළි දැක්වේ.
අප හා සම්බන්ධ වීමෙන් ඔබගේ ඊළඟ විශේෂ උත්සවය සඳහා අපගේ විශ්වාසනීය
උපදෙස් නොමිලේ ලබා ගත හැක.
Cakes To Dream On
www.cakestodreamon.ca
https://www.facebook.com/cakestodreamon
TP: 416-857-4566
order@cakestodreamon.ca
ටොරොන්ටෝ හා තදාසන්න ප්‍රදේශ (GTA), ඇජැක්ස්, බර්ලිංටන්, ඔක්විල් හා මුස්කොකා දක්වා සේවා සැපයේ.
අවම ඇනවුම් දස දෙනෙකු සඳහා.
තම නිවසටම ප්‍රවාහනය කෙරේ.

SYLVESTER STUDIO'S
CUSTOM PORTRAIT &
FINE ART PHOTOGRAPHY IN AJAX,
TORONTO & SURROUNDING AREAS
Professional Wedding and E-Shoots
416-300-1121
sylvesterstudios404@gmail.com
404
sylvester studios copyright

නව වසරට නැවුම් පැතුම්

කොළ ටික ඉවර වී පෙරළී දින දසුනේ
ගෙවිලා මාස දොළහක් ඇති බව කියුණේ
සුන්දර දුරුත්තේ ඇති සිසිලස දැනුණේ
නව අවුරුද්දකට සැරසෙන බව හැඟුනේ

වසරක් ගෙවී නව වසරක් වළඹීම
දියදම අනුව සිදුවෙයි ලොව සැමදාම
සලකා ජීවයේ කාලය අඩුවීම
කළ යුතු සුචරිතෙහි කවුරුත් නියැලීම

මිනිසුන් ලෙස වෙසෙන ලොව නම් ගම්මානේ
කාටත් උදාවෙයි දුක දෙන හිම්හානේ
ගුණදම් දියුණු කර තම තම සන්තානේ
සොයුරන් ලෙස වෙසෙමු ලැබගෙන සම්මානේ

බී. විජයතුංග

තාත්තේ කෝ ඔය

ඉදිමුණ අත දෙන්න

කැණියුලාවේ ඵලක් නොමැති බැල්මත්
බෙහෙත් විද දෙන
නිමා නැති රුදුරු රිදුමත් නවතා
මට පුළුවනි ලොවම අතැර
රෝගී ඔබ අත පිරි මැද මැද
ඔබ ළඟම ගැවසී
ඔබ සිතට සේලයින් දෙන්න

ඉදින් අපට පුළුවනි
අප දෙදෙන සතු ඒ එකම වස්තුව
අම්මාගෙ සෙනෙහස ගැන
අතීතය ගැන
දොඩමින්

දෙවියන් මැවූ ඇගෙ විස්මිත ආලය
මේ ජීවිත දෙව්ලොව
මිහිර මැවී වග
අප නිවාගූ වග
සහනයෙන් සිහිකරලන්න
නුඹ මට කුඩා කල කියා දුන් නිබ්බුත පද
අප විශාදය නසා ශාන්තිය
පැතිරෙන තෙක් කොඳුරන්න

දෝරෙ ගැලූ ඔබ සෙනෙහෙ වෙනුවෙන්
මට පුළුවනි
උනුන් පරයන තරඟයට
මෙතැන් සිට සමු දී

ආදරය යළි පණ ගැහෙන
සන්නාලියක හිමිදිරියෙ මැහූ
නිල්පැහැ ළදරු ඇඳුමේ හැඩය ගැන
ඔබ නිතර කියනා අතීතය
යළි යළිද

අහන්නට කැමති වග
ආදරෙන් සෙනෙහෙන්
ඔබ හිස පිරිමැද පියෙකු සේ
හඟවන්න

තාවකාලික විසුළු ලොව කඳුළු මැද
සඳ බැසයන මේ අලුයමෙද
නුඹ ගත වේදනා කෙඳිරිය
නොමඩිනා අසරණ පුතෙකු ලෙස
මට හැකිය
සිත පහුරු ගානා වේදනා අතරෙදී

අතහැරුමක අමිල බව ගැන
විසඳුම් රහිත මිටට ගත් ජීවිත
අනියත ගැන
අවකාශයට
අප අපට
ඇහෙන ලෙස හිමි හිමින් මුමුණන්න

ඉතා ඈත පෙරඹරක
ඔය දෑස'ඟ හුස්මෙ දිස්නෙන්
ළදරු අඩියෙන් අඩියට මඟ කී
වදන් නැති ඒ
දිරියට ප්‍රේමයට
සුදුසු නව වදනක්
මහදට කොඳුරන ලෙස
සියල් සියොතුනට පවසා

ලෝකයට රැව්දෙන සේ
තාත්තා ගැන
එවිටවත් මහ පොලව'ත අහස'ත
නින්නාද වන සේ පවසා
මට හැකිය බිඳක් සිත සනසගන්න
රහසේ නොසෑහෙන සිතින්
වැලපෙන්න

තුෂාරිකා ඇන්තනී

ආදරය කියන්නෙමි

ආදරය කියන්නෙම
වචන නැති කවියකට
නෙතඟ බැල්මෙන්
හිතක් නවතන
සුසුම් ස්වරයෙන්
තනුත් උපදින
ආදරය කියන්නෙම
වචන නැති කවියකට

අගුළු ලෑ දුරකථන
අහේතුකවම හැර පියාලන
කෙටි පණිවිඩෙක මග හැරුණු
ඉස්පිල්ලමක් හෝ තිබේදැයි බල බල

පුරා රැයකුත්
දොඩමලුව ගෙවූවද
නොපැවසූ තව යමක්
ශේෂ වී පවතින
රැහැන් ඇතුළෙත්
නාඩි හඬ දෙන
ගල් බොරළු පවා
හඬවන

ආදරේ කියන්නෙම
වචන නැති කවියකට
කටු අකුල් තුළින් වුව
සීරුවට ගලා යන
නෙතඟ බැල්මෙන් පවා
හදවතම තිගැස්සෙන

ආදරේ කියන්නෙම
වචන නැති කවියකට

පූර්ණිමා කුලතුංග

මතක

ඉතින් අප අපෙන් සමුගන්න පෙර
එකම එක මොහොතකුදු මග නොහැර
අස්කරමු ඒ සොඳුරු අතීතය
මුලක සිට එකක් හෝ අත නොහැර

ඔබෙ මතක ඔබ වෙනම අරගන්න
සීරුවට එකින් එක අසුරන්න
මගෙ මතක මට හැකිය හඳුනන්න
කොයිතරම් බර වුණත් ගෙනියන්න

ඔබෙ නොවන මගෙ නොවන අපෙ මතක
බෙදාගමු සම සමව හැකි විලස
ඔබ කැමති මතක අරගෙන හනික
සෙස්ස මට දෙන්න ගෙන යනු පිණිස

ඔබ යනෙන තැන තබා ගනු නොහැකි
මතක ඇතිනම් තබා යනු යෙහෙකි
මගෙ හිතේ බොහෝ ඉඩ ඇති සෙයකි
නබාගන්නම් සදාකල් සුරැක

ඉතින් අප අපෙන් සමුගන්න පෙර
එකම එක මොහොතකුදු මග නොහැර
අස්කරමු ඒ සොඳුරු අතීතය
මුලක සිට එකක් හෝ අත නොහැර....

පසුගියදා සදහටම සමුගෙන ගිය
ඉන්දික ගුණවර්ධන
සොයුරා විසින් ලියූවකි.

වඳවෙන්න ඉඩ දෙන්න

වඳවෙන්න ඉඩ දෙන්න
ඔන්නොහේ අපිට

එතකොට පුළුවනි
දිරා යන සැකිලි
පරිස්සම් කරගන්න
විදුලි වැටවල් ගලවා වීසි කරන්න
හව හෝග රැකගන්න

පන්සලේ පෙරහැරට
රොබෝ අලියෙක් හදාගන්න
මඳ කිපෙනවා කියලද
කෑම දෙන්නැයි කියලද

ඔන්නොහෙ අපිට
වඳවෙන්න ඉඩ දෙන්න
පස්සෙ කාලෙක බැරුවැයි
නෑ කිය අඬා වැළපෙන්න

උපේක්ෂා ඉමාලි ප්‍රේමතිලක

බණ දෙබස

අපිත් යමුද බණ ගෙදරට
හාමුදුරුවො වඩින්ඩ ඇති

දැන්ම ගිහිල්ලා කූමකට...?
තවමත් බණ කියනව ඇති

සනත් පියසේන


The Alumni Association of
the University of Peradeniya
– GTA and Suburbs
Proudly presents
BACK TO HANTANA – 2018
(An exciting musical drama evening)
In collaboration with Two leading Sri Lankan Artists
Madani Malwattage
And
Dr. Jayalath Manorathna
As a part of the 75th Anniversary Celebration of the University
On Saturday April 7th, 2018
Await details

SFL
SILVY FERNANDO LAW
✓ Personal Injury
✓ Real Estate Purchase/Sale/Refinance
✓ Family Law
✓ Wills
✓ Powers of Attorney
✓ Affidavits
✓ Immigration
✓ Commercial Property Sale/Purchase
✓ Landlord-Tenant
✓ Notarizing & Commissioning
✓ Incorporations
Silvy Fernando LL.B.
Barrister, Solicitor & Notary Public
350 Highway 7 East, Suite 213
Richmond Hill, ON L4B 3N2
Tel: 416-272-6587/ 905-597-1716
Email: Silvy@sfdolaw.com

ALPC
AHANGAMA LAW
PROFESSIONAL CORPORATION
Real Estate Law
Immigration Law
Corporate Law
Wills and Estates
Family Law
Simple Divorce/ Separation and Marriage Agreements
4465 Sheppard Avenue East
Unit 21, Toronto, ON
M1S 5H9
Canada
Tel: 647-977-2263
Cell: 647-215-7642
Fax: 647-977-2264
E-mail: info@ahangamalaw.com
Anoshan Ahangama
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

RUPAN PEST CONTROL
Complete Elimination of Roaches,
Mice,Bees,Wasps,Bedbugs
Houses.Industriel,Commercial,Apartments & Etc
Tel: 416-291-3997
Cell: 416-895-4283
Professional Services
Fully Licenced
Unmarked Vehicles
Over 10 years of experience
No Extra Charges on Weekends
Day and Night Services
100% Guaranteed Result
No Spraying, No Moving
and
No Smelling
10% Off with this flyer
CALL:KANTHAN
Keep this Number Safe
Tel: 416-291-3997
Cell: 416-895-4283

ශ්‍රී ලංකාවේ දේශපාලන කාටූන් චිත්‍ර ශිල්පියෝ



■ **වජිර ලියනගේ**

ශ්‍රී ලංකාවේ දේශපාලනඥයන් සේම වඩාත් ජනප්‍රිය කොටසක් වෙත්නම් ඒ ගොඩට 'කාටූන්' චිත්‍ර ශිල්පීන්ද අයත්ය. ඔවුන් එපමණටම ජනප්‍රියත්වයක් හිමිකර ගන්නට සමත් වන්නේ දේශපාලනඥයන් තදින් උපහාසයට ලක් කිරීම තුළින්ම පමණක් නොවේ. දේශපාලනය තුළ ඇති අමිහිරි යමක් ඉතා රසවත්ව ජනතාවට ඉදිරිපත් කරන්නට තරම් ඔවුන් දක්වන්නා වූ දක්ෂතාව හේතු කොටය.

'කාටූන්' තරම්ම බොහෝ කාටූන් ශිල්පීන්ගේ ජීවිත රසවත් නැත. බොහෝ දේශපාලන ගැහැට මැද ඔවුන් රාජකාරිය ඉටු කරති. ප්‍රකට කාටූන් ශිල්පියකු වූ 'යුනුස්' වරක් තමාගේ 'අත' නොව කට කපාගන්නට ගොස් ඉතා දැඩිමයකින් බේරී ගත් ශිල්පියෙකි.

ඕවර් කොල්

ලංකාවේ දේශපාලන කාටූන් කලාවේ ප්‍රමුඛයා වශයෙන් සැලකෙන්නේ ඕවීර කොලටිය. එකල පොදු ජනතාවගේ සංකේතය වූයේ කොලට්ගේ 'සිට්සන් පෙරේරා' ය. තැන් තැන්වල අණ්ඩ දමන ලද කම්සය සහ ඉරුණු කලිසම 'පුරවැසි පේරාගේ' නිල ඇඳුම විය. කොලට්ගේ චිත්‍ර තුළ විශේෂ ලක්ෂණයක් වූයේ සිත්තරාට, රසිකයාට මෙන්ම උපහාසයට ලක් වූ පුද්ගලයාටද ඒවායින් රසාස්වාදයක් ලැබිය හැකි වීමය. ඔහුගේ කාටූන් කලා දිවිය තුළ ආයාසයෙන් රැකගත් ප්‍රතිපත්තියක් ලෙස එය සැලකිය හැක. මේ නිසාම ඕස්ට්‍රේලියානු කාටූන් චිත්‍ර ශිල්පීන් කොලට් දුටුවේ වධකයන් මෙනි. කෙනෙකුගේ හොඳ නම කෙළෙසමින් කෲර ලෙස අඳින ඕස්ට්‍රේලියානු කාටූන් ගැන කොලට් කතා කළේ පිළිකුලිනි.

කොලට්ගේ චිත්‍රවලින් මතුවන උපහාසය සමගම, හුදෙක් චිත්‍ර වශයෙන් වුවද ඒවායේ කලාත්මක වටිනාකමක් තිබූ බව විචාරක මතයයි. රාජකීය විදුහලේ ජ්‍යෙෂ්ඨ චිත්‍ර කලා ගුරුවරයකු ලෙස කලාත්මක චිත්‍ර අධ්‍යයනයෙන් ඔහු ලත් පරිචය මීට හේතු වන්නට ඇත.

කොලට් පළමු වරට සේවය කළේ 'ටයිම්ස් ඔෆ් සිලෝන්' පුවත්පතේය. ඉන්පසු ඔබ්සර්වර් පත්තරයට බැඳුනු කොලට් නිසාම පත්තරයේ අලෙවිය දහස් ගණනින් ඉහළ යන්නට විය. ඔහුගේ කාටූන් බැලීමට පත්තරය ගන්නා පිරිසක්ද එකල බිහිවිය. ශෛලීන් දෙකකින් චිත්‍ර ඇඳීමේ හැකියාවක්ද කොලට් සතුවිය. 'ඔබ්සර්වර්' පත්තරයේ ඔහුගේ සාම්ප්‍රදායික චිත්‍ර පළවූ අතර 'ලංකා ලාෆ්ස්' නමින් ඊට හාත්පසින්ම වෙනස් ශෛලියකින් ඩේලි නිවුස් පත්තරයට කොලට් කාටූන් ඇන්දේය. මේ අතර උඩඟුකමින් හිස උදුම්මා ගත් ඉහළ තැන්වලට අතුල් පහර වල්ල කරන 'බංකම්සිංහ' නම් චරිතය කොලට්ගේ සියලු නිර්මාණවලට වඩා වෙනස් මගක් ගත්තේය.

තමා කාටූනයෙන් හුවා දක්වන පුද්ගලයා උපහාසයට පත්කොට යහ මගට ගැනීම කාටූන් ශිල්පියාගේ අරමුණයි. ශරීර අංග ලක්ෂණ වෙනස් කොට එසේත් නැත්නම් විකෘති කොට වැඩි අවධානයක් ලබා ගැනීමට කාටූන් ශිල්පියා සමත්ය. කෙනෙකුගෙ කැපී පෙනෙන අංග ලක්ෂණ මෙන්ම චරිත ලක්ෂණද ඊට උපකාරී වේ. කොලට් විසින් මුල් කාලයේ ජේ. ආර්. ගැන අඳින ලද කාටූන්වල ජේ. ආර්. ට 'මහ විශාල' බඩක් ඇඳීම ප්‍රශ්නාර්ථයකි.

කොලට්ගේ කාටූන්වලට මහත් ලැදියාවක් දැක්වූ ජේ. ආර්. වරක් ඔහු තම නිවසට කැඳවුයේය. තේ පැනින් සංග්‍රහ කරන අතරේ ජේ. ආර්. කොලට් ඇමතුවේය.

"කොලට්, තමුසෙ ඩඩ්ලිව අඳින කොට ගිරා හොට නහයයි පයිප්පෙයි දානවා. බණ්ඩව අඳින කොට ජාතික ඇඳුමයි, පයිප්පෙයි, කන්නාඩි කුට්ටමයි දානවා. මාව අඳින කොට මහ විශාල නහයක් දානවා. මේ ඔක්කොටම මම එකඟ වෙනවා. ඒ වුණාට මොන එහෙකටද මට තඩි බඩක් දාන්නේ?" යි පැවැසූ ජේ. ආර්. තමන්ට කොහෙත්ම බඩක් නැති බව බැනියම අතගා කොලට්ට පෙන්වූයේය.

කොලට් නිරුත්තර විය. ඉන්පසු ඔහු කිසි දිනක කාටූන්වල ජේ. ආර්. ට බඩක් අඳින්නට ගියේ නැත. ජේ. ආර්. එක වචනයකින් තමන්ගේ බඩද අයින් කර ගැනීමට සමත් විය.

ඩී. ඇස්, ඩඩ්ලි, බණ්ඩාරනායක, සර්. ජෝන්, ජේ. ආර්, දහනායක සහ හමීඩ් ආදි කවුරුත් එකල තමන් ගැන පුවත්පත්වල පළවූ කාටූන් බලා මහත් ආස්වාදයක් ලැබූ දේශපාලකයන්ය. එම කාටූන්වල වූ සියුම් උපහාසය රසවිඳින්නට තරම් සංවේදී මනසක් ඔවුන් සතු විය. නමුත් බණ්ඩාරනායක මැතිණිය සහ රෝහණ විජේවීර තමන් ගැන දේශපාලන කාටූන් නොරස්සූ බවට ඇත්තේ ප්‍රකට මතයකි. වෙනකක් තබා කොලට් රට හැර ගියේද බණ්ඩාරනායක මැතිණියගේ පාලන යුගයේදීය. ඒ 1960 දීය. ඕස්ට්‍රේලියාව බලා ගිය කොලට් 'මෙල්බර්න් හෙරල්ඩ්' පුවත්පතකට එක්විය. එතැනින් සිංගප්පූරුවට සංක්‍රමණය වූ ඔහු 'නිව් නේෂන්' පුවත්පතට කාටූන් චිත්‍ර ඇන්දේය. ඉන්පසු කොලට්, 'ස්ට්‍රේට් ටයිම්ස්', 'ඒෂියා මැගසින්', 'සන්ඩේ ටයිම්ස්' වැනි පුවත්පත් ගණනාවක සේවය කළේය.

කොලට් නිසා මෙරට දේශපාලන කාටූන් කලාවේ ඇතිවූ පුනර්ජීවය අති මහත්ය. ඔහු නිසා කාටූන් කලාවට පිවිසි පිරිස බොහෝය. නිසඟ කුසලතාව මෙන්ම සාමාන්‍ය ජන ජීවිතය නිසි ලෙස අවබෝධ කර ගත් කොලට් ලංකා පත්‍ර කලා ඉතිහාසයේ නොමැකෙන චරිතයකි.

ජී. ඇස්. ප්‍රනාන්දු

ටයිම්ස් මන්දිරයේ කැන්ටීම පත්‍ර කාලාවේදීගෙන් පිරී ගොසිනි. එක් පසෙක කෙස් පැලෙන දේශපාලන තර්කය. තව තැනෙක ඕපාදූප ඉහවහා යයි. තවත් තැනෙක එකම ගාලගෝට්ටියකි. මේ කිසිත් නොඇසුනාක් මෙන් කෝටි එකක් හා සුදු සරමක් ඇඳි පුද්ගලයකු විත් මේසයක වාඩිවූයේ ෂෝකී මුහුණකිනි. ඔහු ගල් ගෙඩියක් මෙන් තද වී තිබූ බත් ගෙඩියෙන් කෑල්ලක් කඩා කන්නට පටන් ගත්තේ වට පිට සිටි අය දෙසවත් බැලීමට සිතක් නැති ලෙසිනි.

"ජී. ඇස්. මහත්තයාට සර් ජෝන් එන්න කියලා" යි අසල මේසයේ පත්‍ර කලාවේදීන් පිරිස ඔහු දෙස බලන්නට වූයේ 'මරණයට කැප වූ ගවයකු දෙස' බලන්නාක් මෙනි.

කතාව ඇත්තකි. සවසට සර් ජෝන් හමුවන ලෙස කඳවල වලව්වෙන් ජී. ඇස්. ට පණිවිඩයක් ලැබුණේ උදෑසන ලංකාදීපය නිකුත් වී පැයක් යෑමටත් පෙරය. එදා ලංකාදීප කාටූන් එකේ. ජී. ඇස්. ඇන්දේ සර් ජෝන්වය. එක්තරා ගොවිපොළක් නැරඹීමට ගිය සර් ජෝන්, එහි සිටි පට්ටි ගොනුනට ගොවිපොළේ සුරූපී තරුණ සේවිකාවන් කරන සත්කාර දැක "මමත් ගොනකු වෙලා උපන්නා නම්" යැයි පැවැසූ බවක් පෙර දිනයෙක පුවත් පත් වාර්තාවක සඳහන් වී තිබිණ. සර් ජෝන්ගේ එම කියමන ජී. ඇස්. කාටූනයකට නැගුවේය. සර් ජෝන්ගේ මුහුණ යොදන ලද ගොනකු සුරූපී තරුණියක් විසින් නාවන අයුරු කාටූනයේ විය. උදේ පාන්දර ලංකාදීපය අතට ගත් කඳවල වලව්වේ සේවකයන් එය සඟවා තැබුවේ ලොක්කා එය දුටුහොත් වන කලබැගෑනිය ගැන දන්නා නිසාය. නමුත් ලංකාදීපයේ කාටූනය ගැන ඉව වැටී තිබුණු සර් ජෝන්ට එය සොයා දීමට අකමැත්තෙන් වුවද සේවකයාට සිදුවිය. ලංකාදීපයේ කාටූනය බැලූ සර් ජෝන් කොක් හඬලා සිනාසුනේ කඳවල වලව්ව දෙදරවමිනි.

කෙසේ නමුත් හැන්දෑ යාමයේ සර් ජෝන් බැහැදැකීමට ජී. ඇස්. ගියේ තමන් මෙතෙක් කල් කළ පින් දහම් ගැන සිතමිනි. සර් ජෝන් එනතුරු ජී. ඇස්. බලා සිටියේ මරණයට නියම වූවෙකු පෝරකයේ විදුලි බොත්තම ඔබන තුරු බලා සිටින්නකු පරිදිය. වලව්ව දෙවනත් කර ගෙන එන බූට් හඬත් සමගම සර් ජෝන් පැමිණියේය. "උඹද මේක ඇන්දේ?" යි ලංකාදීපය පෙන්වමින් සර් ජෝන් ඇසුවේය.

"ඔව් සර්" යැයි ජී. ඇස්. පවසනවාත් සමගම සර් ජෝන්, ජී. ඇස්. ගේ දෑතින් අල්ලා ගත්තේය. තමාගේ දෑත දඬු අඬුවක දමා තද කළාක් මෙන් ජී. ඇස්. ට දැනෙන්නට විය.

"මට ඕන මිනිහ උඹ තමයි" කියූ සර්. ජෝන්, ජී. ඇස්. තම කෑම කාමරයට ගෙන ගොස් "කාපන් බිත්තර ආප්ප" යි පැවසුවේය.

ජී. ඇස්. ගේ කාටූන් ගැන මහත් ප්‍රසාදයෙන් කතා කළ සර් ජෝන් "තවත් ඇඳපන්" යැයි ජී. ඇස්. දිර ගන්වන්දද අමතක නොකළේය. "හැබැයි ඒ හැම කාටූන් එකකම ඔරිජනල් මට ඕනෑ" යි සර් ජෝන් නියෝගයක් කළේය. කඳවල වලව්වේ බිත්ති පුරා ජී. ඇස්. ගේ රාමු කරන ලද කාටූන් එදා සුලබ දර්ශනයක් විය.

ගම්වාසී සෙනරත් ප්‍රනාන්දු නොහොත් ජී. ඇස්. ප්‍රනාන්දුගේ උපන් ගම බෙන්තරය. සිංහල අටවැනි ප්‍රමාණය සමත් වන තුරු බෙන්තර ගාම්ණි විද්‍යාලයේ උගත් ජී. ඇස්. ට සහෝදර සහෝදරියන් හත් දෙනෙකි. දෙමාපියන්ගේ අරමුණ වූයේ ජී. ඇස්. හොඳ වෙද මහත්මයකු කිරීමටය. ඒ සඳහා ඔහු බෙන්තරින් කොළඹ මිහිඳු මාවතේ රාජසුන්දර වෙදමහතාගේ නිවසට එවන ලදී. ගෙදරදීම වෙදකම ඉගෙන ගත් ජී. ඇස්. ආනන්දයේ රෑ ඉස්කෝලයට ගොස් ඉංගිරිසි ඉගෙන ගත් අතර මාලිග ාකන්ද විද්‍යෝදය පිරිවෙනට ගොස් සංස්කෘත භාෂාවද උගත්තේය.

විද්‍යෝදය පිරිවෙනේ ඉගෙනීමට ජී. ඇස්. ගියේ ටවර්හෝල් එක හරහාය. ටවර්හෝල් ඉදිරිපිට දිනපතා සවි කරන දැැවැන්ත චිත්‍රවලට ජී. ඇස්. ගේ සිත තදින් ඇදී ගියේය. දිනපතාම එම චිත්‍ර අසල ටිකක් රැඳී සිටීම ජී. ඇස්. ගේ සිරිත විය.

එය ටවර් හෝල් ස්වර්ණමය යුගය විය. හෙන්රිකන් එහි චිත්‍ර කටයුතු භාර සුප්‍රකට චිත්‍ර ශිල්පියා විය. චිත්‍ර අඳිනවා බලන්නට එන කොලු කුරුට්ටන් හෙන්රිකන්ට මහා හිසරදයක් විය. කොයිතරම් පන්නා දැමුවත් ජී. ඇස්. නම් නැවතුණේ නැත. ඔහු ටිකින් ටික හෙන්රිකන්ට කිට්ටු කළේය. කෙසේ හෝ හෙන්රිකන්ට සමීප වීමට ජී. ඇස්. ට හැකි විය. හෙන්රිකන්ට සිගරැට් එකක් අවශ්‍ය වූ විට එය ගෙන ඒමට ජී. ඇස්. යුහුසුළු විය. ජී. ඇස්. හෙන්රිකන් වෙනුවෙන් කඩේ ගියේය. ගෝලයා ගැන පැහැදුනු හෙන්රිකන් මුලින්ම ජී. ඇස්. ට දුන්නේ තීන්ත ටික දිය කරන්නටය. ලොකු පදාසවල තීන්ත තැවරීම ඊළඟ කාර්යය වූ අතර හෙන්රිකන් ටිකෙන් ටික ජී. ඇස්. ට වගකීම් භාර දෙන්නට විය.

ජී. ඇස්. ගේ සහජ කුසලතා අවබෝධ කරගත් හෙන්රිකන් ඔහුට චිත්‍ර ශිල්පය ඉගැන්වීමට ගෙන ගොස් භාර දුන්නේ සාර්ලිස් මාස්ටර්ය. නවකයන් පුහුණු කරන්නට තරම් හෙන්රිකන්ට වෙලාවක් නැති වීම ඊට හේතුවයි. සාර්ලිස් මාස්ටර්ගේ චිත්‍ර කර්ම ආයතනය පිහිටියේ පිටකොටුවේ නොරිස් පාරේය. පිරිවෙන් අධ්‍යාපනයට ආයුබෝවන් කියූ ජී. ඇස්. චිත්‍ර ශිල්පය හැදෑරීමට පටන් ගත්තේය.

සාර්ලිස් මාස්ටර් ළඟ චිත්‍ර අඳින එක්තරා තරුණියක් ජී. ඇස්. ගේ හදවතේ ජීවන චිත්‍රය අඳිමින් සිටියාය. සාර්ලිස් මාස්ටර් ජී. ඇස්. ගේ මෙම 'ප්‍රේම රෝගය' ආරංචි වූ විට මහත් කලබලයට පත්විය. ඔහු සිතා සිටියේ තමාගේම දක්ෂ ගෝලයාට නැද්ද තරුණියක් විවාහ කර දීමටය.

"මා ළඟ රස්සාව කරනවා නම් ඔය විකාරවලට ඉඩ දෙන්න බෑ. තමුසෙගේ ඔය මඟුලට මම කැමැති නෑ" යි මාස්ටර් ගෝලයාට කෙළින්ම කියා සිටියේය. රස්සාවද පරස්තාවදැයි දෙළොවක් අතර තනි වී සිටි ජී. ඇස්. 1930 දී රස්සාවෙන් අස් වී පරස්තාව කර ගත්තේය. ඒ අතරම ජී. ඇස්. මුදලිඳු අමරසේකර සහ සී. ඇම්. වින්සර් යටතේ තම කුසලතා ඔප් නඟා ගැනීමට පසුබට නොවූයේය. ලන්ඩනයේ චිත්‍ර ශිල්ප විද්‍යාලයකද අධ්‍යාපනය ලබන්නට තරම් ජී. ඇස්. භාග්‍යවන්ත විය.

විවාහයෙන් පසු සූරියමල් ව්‍යාපාරය හරහා දේශපාලනයට ගිය ජී. ඇස්.

42 වන පිටුව බලන්න

The Power Tools To Sell Your Property

Renovation Cost upto $4000.00 Free

Advertising Signage & Photos Free

Lawyer's Fee Free

Market Evaluation & Home Inspection Free

Home Staging Free

Open Houses Showing Free

**Some conditions apply.This promotion can bi discontinued without prior notice.Not intended to solicit buyers or sellers currently under contract.

Save money when selling your home!

Selling real estate is what I do. I can help you save thousands when listing your property. You will pay less and get a full service listing with no hidden fees. My home marketing strategy will attract the greatest number of potential buyers and help you sell quickly and hassle-free for the best value.

Nishantha Donsiyambalapitiyage
Real Estate Sales Representative

Mobile: 416 417 0763
Email: nishan.don@gmail.com

Mississauga Office: 350 Burnhamthrope Dr. W. Unit 127
Scarborough Office:2250 Markham Road Unit #3 Scarbotough ON M1B2W4

Century 21 INNOVATIVE REALTY INC

AKG WEB DESIGN

TAKE YOUR BUSINESS ONLINE!

- Professional Quality
- E-Commerce Features
- Fully Responsive
- Reliable Service
- 24/7 Support

FLEXIBLE PRICING MONTHLY OR ONE TIME FEES

647-995-3391

LEARN MORE AT: http://webstore.danakg.ca

සත්සර

ප්‍රවීණ සංගීතවේදී සරත් කුමාරසිංහයන් විසින් පවත්වන ලද 'සත්සර 2017' ප්‍රසංගය පසුගිය දෙසැම්බර් 08 වන දින මිසසාගාහිදී පවත්වනු ලැබුණි. එස්රාජ් වාදනය පිළිබඳව ඉතාමත් ප්‍රවීණත්වයක් දක්වන සරත් කුමාරසිංහයන් එහිදී එස්රාජය වාදනය කරමින් පැමිණ සිටි පිරිස වෙත ඉමහත් රසාස්වාදයක් ගෙන දුණි. පරම්පරා කීපයක් රස විඳි පැරණි ගීත කීපයක්ම එහිදී එස්රාජයෙන් හැඬුවුණි. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 'ඒ' ශ්‍රේණියේ ගායකයකුද වන සරත් කුමාරසිංහ මෙම ප්‍රසංගයේදී මියුරු ගී රැසක්ම ගායනා කරනු ලැබුණි. මෙම ප්‍රසංගය රසවත් කිරීම සඳහා ටොරොන්ටෝවේ සිටින දක්ෂ ගායක ගායිකාවන් රැසක්ද සරත් වෙත සහාය ලබා දී තිබුණි. 'සත්සර 2017' ප්‍රසංගය සරත් කුමාරසිංහ සංගීතවේදියා විසින් ඉදිරිපත් කරන ලද සය වෙනි ඒක පුද්ගල ප්‍රසංගය වේ.

සත්සර 17 ප්‍රසංගයේ ඇස ගිය සොඳුරු තැන් කීපයක් මෙසේ පළ කරමු.



ෆිල්ම් ෆෙයාර් කවරයේ හිටි ඩේසි රාසම්මා



ජනවාරි 15 වැනි දිනට යෙදෙන රුක්මණී දේවියගේ ජන්ම දිනය නිමිත්තෙන් ඇයට උපහාර පිණිස පළවන්නකි.

■ කැලුම් වැලිගම

මේක කළු සුදු කාලේ කතාවක්. එහෙත් එම කළු සුදු කතාව තුළ ඔබට හමුවන්නේ යුග ගණනක් වර්ණවත් කළ දිළිසෙන චරිතයක්. මෙහි කතා නායිකාව 1923 ජනවාරි මස 15 වැනිදා නුවරඑළියේ රම්බොඩ උපත ලද ඩේසි රාසම්මා ඩැනියෙල්. එහෙමත් නැත්නම් ශ්‍රී ලාංකේය සිනමාවේ පුරෝගාමී රැජනයි. එහෙත් ඇය සිංහල රිදී තිරයේ ජනප්‍රිය වුණේ රුක්මණී දේවී යන නමින්.

රුක්මණී දේවිය රඟපාපු කළු සුදු සිනමා පටවලට වඩා වත්මන් පරපුර නරඹන චිත්‍රපට තාක්ෂණයෙන්, ආකෘතියෙන්, තිර රචනයෙන් සහ වර්ණයෙන් සමහර අවස්ථාවල උසස් වුණත්, රුක්මණී දේවිය වැනි සිනමාවේ පුරෝගාමී චරිත අමතක කර අපට ඉදිරියට යා නොහැකියි. මා චිත්‍රපට විචාරකයකු නොවන නිසා ඇයගේ සිනමා දිවිය ගැන කතා කරන්නේ නැහැ. එසේම මෙම ලිපිය ඇය පිළිබඳ මුල මැද අග සම්බන්ධ කරන ලිපියක්ද නොවෙයි. අද මෙම ලිපිය තුළ මා අවධානයට ලක් කරන්නේ ඩේසි රාසම්මා නම් කළඹ මල රුක්මණී දේවිය ලෙස කිරුළු පැලඳීම දක්වා වූ ගමනේ සියුම් තැන් කිහිපයක් පමණයි. එම සියුම් තැන් කිහිපය කෙනකුගේ ජීවිතය සංවර්ධනය කරගන්න මහඟු රුකුලක් වෙයි. මෙම ලිපිය ලිවීමට ඒ. ඩී. රංජිත් පෙරේරා මහතා ලියූ රුක්මණී දේවී - යුගයක ස්වර්ණ ගීතය නම් කෘතිය උපකාර වුණු බවත් කිව යුතුමයි.

පළමුවැනි වතුර බාල්දිය ඇඟට වත්කර ගැනීමේ අභියෝගය

සීතල පැත්තකට ගිහිල්ලා ළිඳකින් වතුර ඇදලා නාන්න හදන කෙනෙක් පළමු වතුර බාල්දිය ඇඟට වත්කර ගන්න ගොඩක් කාලයක් සාමාන්‍යයෙන් ගන්නවා. මොකද පළමු වතුර බාල්දිය අපේ ඇඟ සීතල කරනවා. එම නිසා නානවද? නැද්ද? කියලා මනසින් දෝලනය වෙමින් කාලයක් ඉන්නවා. අන්න ඒ වගේ ඕනෑම ක්ෂේත්‍රයක පළමුවැනියා වීම අභියෝගාත්මකයි. නමුත් සදා අමරණීයයි. හඳට ගිය සිවුවැනි මිනිසා කවුද? මම ඔබගෙන් එහෙම ප්‍රශ්නයක් අහනවා. සැබැවින්ම හඳට ගිය පළමුවැනි මිනිසා කවුද? කියලා ඇහුවා නම් ඔබ ගත් කටටම නීල් ආම්ස්ට්‍රොන් කියලා කියයි. එහෙත් හඳට ගිය සිවුවැන්නා ගැන අපට ඇත්තටම මතක නැහැ. කිසියම් දෙයක් පළමුවෙන්ම කිරීමේ වැදගත්කම ඒකයි. සමහර වෙලාවට හඳට ගිය සිවුවැන්නා නීල්ටත් වඩා දක්ෂයෙක් වෙන්න පුළුවන්. නමුත් අදටත් හඳ ගැන කියන විට අමරණීයව පවතින්නේ නීල් ආම්ස්ට්‍රොන්ගේ නමයි. ඉන්දියාව කෙතරම් සුරූපිනියන් බිහිකළත් සුෂ්මිතා සෙන් ඉහළින්ම අදත් සිටින්නේ ඇය ඉන්දියාව බිහිකළ ප්‍රථම විශ්ව රූ රැජන නිසයි. ඒ 1994 වසරේදීයි.රුක්මණී දේවියගේ ජන්ම මාසය තුළ ඇය පිළිබඳ සටහනක් තබන්නත් සිතුවේ ඇය ශ්‍රී ලංකාවේ ප්‍රථම සිනමා නිළිය ලෙස ජන හද තුළ තවත් අමරණීය නිසයි. අල් රයිස් සහ ජැකි ට්‍රොවුට් නම් අලෙවි විශ්ලේෂකයන් දෙදෙනා මෙය නායකත්වයේ නීතිය ලෙස සලකනවා.

නුවරඑළියේ ඈත එපිට ගමක උපන් කැළෑ මලකට ශ්‍රී ලංකාවේ ප්‍රථම සිනමා නිළිය වීමේ අවස්ථාව උදාකර ගැනීම පහසු දෙයක් නෙවෙයි. එසේම එය සැබෑ අභියෝගයක්. ස්ත්‍රියගේ සීමා මායිම් පිරිමින් ලකුණු කරමින් තිබුණු සමාජ සංස්කෘතික පසුතලයක සිනමා නිළියක් ලෙස සමාජගත වෙන්න තරුණියක් තීරණය කිරීමම නාද්දී පළමු වතුර බාල්දිය ඇඟට වත්කර ගන්නවා වගේ සීතල වැඩක්. එදා රුක්මණී පළමු සිනමා නිළිය වෙමින් සිනමාව අපවිත්‍ර කරන දේවල් කළා නම් සිනමා නිළියකට ගෞරව කරන සමාජයක් බිහි නොවෙන්න තිබුණා. නමුත් රුක්මණීගේ නිරහංකාර සහ විනීත මෙන්ම වෘත්තීය හැසිරීම මතු හෙළ සිනමාවේ වැදගත්කම තීරණය කළා.

'කලාකාරයෙක්, කලාකාරියක් දෙවැනි වන්නේ දෙවියන් වහන්සේට පමණයි. රුක්මණී දේවී මැරිලා ඉවරයි. ඇය ඉතාම දක්ෂ කලාකාරියක් හැටියට ජීවත් වුණා. ඇය ලංකාවේ ජනප්‍රියත්වයේ අන්තිම මුදුන් පෙත්තටම නැඟලා සිටියා. මැරුණයින් පස්සේ මම ආඩම්බරයෙන් කියනවා අද එකම ගායිකාවක් නැහැ රුක්මණී තරම් ජනප්‍රිය. එකම නිළියක් නැහැ ඇය තරම් ජනප්‍රිය. මුළු රටක ජීවත්වන ජනතාවකගේ අවංක හද පතුලින් ආදරය කළ ඇය වැනි නිළියක් අදත් නැහැ.' 1980 ජනවාරි 15 දින රුක්මණී දේවියගේ පිළිරුවක් විවෘත කරන විට විජය කුමාරතුංග ඉතා ආවේගයෙන් පැවැසුවා යැයි කියන ඉහත කතාව අදත් වලෙසම අදාළයි කියලා ඔබටත් මට මෙන්ම හිතෙයි.

කළ හැකි දේ හරියන තුරු දිගටම කරන්න යොමු කිරීමේ වැදගත්කම

"මගේ පියාද සංගීතය ප්‍රිය කළේය. මට මිහිරි හඬින් ගී කීමට පුළුවන් බව මුලින්ම දුටු තැනැත්තාත් මා ගායිකාවක වශයෙන් රටට හඳුන්වාදීමට මුලදීම අදහස් කළ තැනැත්තාත් අන් කිසිවෙක් නොව මගේ දයාබර පියාණන්ය. මා ගායිකාවක් කිරීමට ආධාරය, ධෛර්යය දීම ගැන පියාට මා සදාකාලික ණයගැති විය යුතුය"

මගේ ජීවිත චිත්ති නම් කෘතිය තුළ රුක්මණී දේවිය තම පියා ගැන වලෙස පවසනවා. රුක්මණී සම්බන්ධව කියවපු සියලු දේවලින් පසුව මට පැහැදිලිව වැටහුණේ රුක්මණී මැණිකක් බව වටහාගත්තේ ඇයගේ පියා බවයි. රඟපෑමට තබා නැටීමටවත් ආශා නොකළ ඇය ඒ වෙත යොමු කළේ ඇගේ පියා. ඇය පියා පිළිබඳ තවදුරටත් මෙසේ පවසයි.

"ජීවිතය පිළිබඳ පළල් අවබෝධයක් සහ අත්දැකීමක් තාත්තා තුළ තිබුණා. වේදිකාව ගැහැනු ළමයින්ට නුසුදුසු තැනක් කියලා තාත්තා හිතුවේ නැහැ. මගේ කටහඬ ලොවට අසන්න දෙන්න ඕන කියලා තාත්තා විශ්වාස කළා. ඔහු මට නිතරම දිරි දුන්නා."

වේදිකාවට නිළියක් ගොඩවන විට "ථියේටර්කාරයෝ" ලෙස එකල අපහාස වෙන සමයක තම දියණියට වේදිකාව සුදුසු බව රුක්මණීගේ සාමාන්‍ය පියා කල්පනා කළේ දිගු දැක්මක් සහිතවයි. ලෝකයට යමක් දුන්න බොහෝ දෙනෙක් කුඩා කලම තමන්ට කළ හැකි දේ දැනුවත්ව හෝ නොදැනුවත්ව වටහා ගන්නවා. එහෙමත් නැත්නම් කවුරුන් හෝ ඔවුන්ට වටහා දෙනවා. එහෙත් ඉතා වැදගත් වෙන්නේ තමාට කළ හැකි දේ දිගටම හරියන තුරු කිරීමයි. බොහෝ දෙනෙක් තමන්ට කළ හැකි දේ දිගටම නොකර, ඉතා ඉක්මනින් කීයක් හරි ලැබෙන දෙයක් කරන්න පෙලඹෙනවා. මෙයින් සිදුවන්නේ තමාගේ උපරිම ශක්තියෙන් නිසි ප්‍රයෝජනයක් ගන්න බැරිවීමයි.

දරුවන් ඔවුන් කරන්න කැමැති දේ වෙතට යොමු නොකර, බොහෝ මවුපියන් තමන් කරන්න උත්සාහ කළ නමුත් තමන්ටද කළ නොහැකි වුණු දේවල් හෝ සිහින වෙත දරුවන් බලෙන් යොමු කිරීමේ තත්ත්වය වත්මන්දී බහුලයි. මෙම තත්ත්වය සහ තරඟය තුළ කීයක් හරි හොයා ගන්න මිනිසෙක් බිහිවෙනවා මිසක සමාජයට තම මිනිස් ශක්තියෙන් යමක් දෙන අයෙක් බිහිවන්නේ නැහැ. රුක්මණීවත් නොදැන සිටි ඇයගේ ගායන සහ රංගන කුසලතාව දැක්ක ජෝන් ඩී. ඩැනියල්ස් මහතා නම් ඇයගේ පියා ඇය ඒ වෙත ආශාවෙන් යොමු කළා.

"මම කියන දේ කරන්න. එහෙත් මම කරන දේ නොකරන්න"

මේ තත්ත්වය වත්මන් බේදවාචකයයි. දරුවන්ට පොත් කියවන්න කියලා කියන මවුපියන් වසරකට එක පොතකවත් කියවනවා දරුවා දකින්නේ නැහැ. දරුවන්ට රූපවාහිනියේ විකාශය වන තේරුමක් නැති වැඩසටහන් නරඹන්න එපා කියන මවුපියන් නරඹන්නේම එහෙම දේවල් බව දරුවට පෙනෙනවා. ඉතින් දරුවා මවුපියන්ගේ වචනවලට වෙනස් වෙන්නේ නැහැ. රුක්මණී තුළ කලාකාරිනියක් වීමේ ආශාව ඇයගේ පියා ඇති කළේ ආදර්ශයෙන්.

ඔහු රුක්මණී කුඩා කල ඇයට ග්‍රැමෆෝන් තැටියෙන් ගීත අසන්න අවස්ථාව උදාකර ඇය තුළ ගීත ගායනා කිරීමේ ආශාව ඇති කළ බව ඇය පසු කලෙක පවසා තිබෙනවා. රුක්මණීගේ පියාගේ දැඩි උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස රුක්මණීට වයස අවුරුදු 13 දී ග්‍රැමෆෝන් තැටියකට ගීතයක් ගායනා කරන්න ලැබෙනවා. ඒ ශ්‍රී බුද්ධ ගයා විහාරේ නම් ගීතයයි. ඇයගේ ජීවිතය සහමුලින්ම වෙනස් කරන එම ගීතය ගැයීමට පෙර දිනයේ ඇයට තදබල ලෙස උණ හැදී ඇති අතර එය සිතට ධෛර්ය ලබාගැනීමට තමාට සුවය ලබාදෙන ලෙස දෙවියන්ට යාඥා කළ බව ඇය පවසනවා. ඒ ඇයගේ සිහින අත් නොහැරීමේ ස්වභාවයයි.

"කිසි දවසක නුදුටු නුපුරුදු අමුත්තන්ගෙන් පිරි ශාලාව දෙස බලා වේදිකාවට නැඟ ගීතයක් ගයන විට දැඩි ලෙස නිශ්චලව තිබුණු ශාලා ගැබ මැදින් විහිදී ගිය මගේ කටහඬ මටම ඇසෙන විට මා තුළ උපන් ආඩම්බරය සහ ආස්වාදය විස්තර කිරීමට මට වචන නැත."
රුක්මණී දේවිය තම කලාව අස්වාද කරන්නේ එලෙසයි. මුදල්වලින් ලබාගත නොහැක්කේද එම ප්‍රීතියයි. එවැනි ප්‍රීතියක් ලබාගත හැක්කේ තමා කරන දේ කැමැත්තෙන්ම කිරීමෙන්ය. රුක්මණී දේවියට එතෙක් මෙතෙක් ශ්‍රී ලාංකික නිළියකට නොලැබුණු වරමක් වන ඉන්දියානු ප්‍රකට සිනමා සඟරාව වන ෆිල්ම් ෆෙයාර් සඟරාවේ පිටකවරය සරසන්නටද අවස්ථාව ලැබුණා. සැබැවින්ම ලොව කුමන තරඟකාරිත්වයකදී වුණත් රුවෙන් සහ දක්ෂතාවයෙන් මෙන්ම තරු ගුණයෙන් වැජඹෙන්න හැකියාව තිබුණු අතිශය ජනප්‍රිය ශ්‍රී ලාංකේය සිනමා චරිත අතර ඇය පෙරමුණේම සිටියි.

කිසියම් චරිතයකදී ඇඳන්න සිදුවන අවස්ථාවක රුක්මණී දේවියගේ නෙතට කඳුළු ගැනීමට ග්ලිසරීන් යොදන්න අවශ්‍ය වුණේ නැහැ. මන්දයත් ඇයට එම චරිතයට ආරූඪ වෙලා ඇත්තටම අඬන්න හැකියාව තිබුණා. එබැවින් ඇය සිංහල සිනමාවේ කඳුළු බින්දුව ලෙස සලකනවා.

බුදු වගා පැළිගේ

■ සී. ඩබ්ලිව්. සහබන්දු

එදිනෙදා ජීවිතයේ තමා ජීවත්වන පරිසරයේදී ලැබෙන අත්දැකීම් නිසා සිතට චමත්කාර වූ අපූර්වත්වයෙන් යුතු අමුතු හැඟීම් මතුවේ. මේවා අපේ සිත තුළ අනුභූතීන් වශයෙන් තැන්පත් වෙයි. ගීතයක් නිර්මාණය කරන්නෙකුට එවැනි අනුභූතීන් වැදගත් වෙයි.

රචකයා විසින් ගීතයක් රචනය කළ පසු සංගීතවේදියාත් ගායකයාත් යන ත්‍රිමූර්තිය එක්වීමෙන් සාර්ථක ගීතයක් එළිදැක්විය හැක. ඇතැම්විට රචකයාගේ ගීත රචනයේ අදහස්වලට බාධාවක් නොවන පරිදි ගායන සුමටතාවය සඳහා සංගීතවේදියා අතින් එහි වෙනස්කම්ද සිදුවේ. ගායකයා රචකයා කියන දේ හොඳට තේරුම් ගෙන ගීතය ගායනා කළොත් එතැන සාර්ථක නිර්මාණයක් එළි දකී. ඒ අනුව ගීතය, රචකයාගේ පෞද්ගලික වූවක් නොව සංගීතඥයා, ගායකයා, තිදෙනාම එක්වීමෙන් එළිදකින පොදු නිර්මාණයකි. මේ ලක්ෂණ සියල්ල ඇතුළත් එක්තරා ගීතයක් කෙරේ මගේ සිත නැඹුරු විය. ඒ 'රන්සළු' චිත්‍රපටයේ එන තේමා ගීතයයි.

ගීතයේ රචක මහගමසේකර ඇමරිකාව බලා ගුවන්යානයේ ගමන් කරද්දී ලද අත්දැකීමක් සහ බදුල්ල බලා දුම්රියෙන් ගිය ගමනක සවස් කාලයේ ලද අත්දැකීමක් මේ සඳහා පාදක කොටගත්තද ගීතයෙන් ධ්වනිතවන හැඟුම් සමුදාය රචකයාගේ ප්‍රතිභා ශක්තියට අපූර්ව උදාහරණයක් වේ.

සිරිපා පියුමේ
රොන් සුණු තැවරී
ගිමන් නිවන පවන් හමායේ
නිවී පහන් වී ළය සැනැහේ

නිවන් දොරට මග පානා
සමනොල රන් කොත මුදුනේ
බැන්ද වියන් සේ
අරණු වලා රන්සළු පැටලේ
හද කිමිදී ලොව් තුරු සුවඳේ

කෙලෙස්වලින් මිදි
සිත සුවපත් වී
පාවි යයි නිසංසලේ
මහ රහතුන් වැඩි මග ඔස්සේ
වලා අතුළ කඳුවැටි අතරේ

ගීතයේ ආරම්භක පද හතර තුළින් බුදු සිරිපතුල ළඟ ශ්‍රද්ධාවෙන් වැඳ වැටෙන්නෙකුට ගත සිත නිවී සැනැහෙන ශාන්ත සුවයක් මොහොතකට හෝ ලැබේ යැයි දළ වශයෙන් අදහස් කළ හැකි අතර, ඒ පිළිබඳ අපූරු චිත්තරූපයක්ද මැවේ. එහෙත් මෙයට වඩා ගැඹුරට දිවෙන අදහසක් මේ තුළ අන්තර්ගත වී ඇතැයි මට සිතේ.

මෙහිලා මට සිහිපත් වන්නේ බුදුරජාණන් වහන්සේගේ අන්තිම ශ්‍රාවකයා වීමට වරම් ලත් සුභද්ද පරිබ්‍රාජකයාය. ඔහු පිළිබඳව අපට ධර්මයේ බොහෝ තැන්වල එළැඹෙන්නේ සාමාන්‍ය විස්තරයකි. බෞද්ධ සාහිත්‍යය මැනැවින් විමසන කල ඔහු වේද වේදන්තයෙහි පරප්‍රාප්ත බුද්ධිමතෙකි. බුදුවරයෙකුගේ ගති ලක්ෂණ මැනවින් හඳුනාගත් උගත්, ඔහු බුදුන් කෙරෙහි එක්තරා ප්‍රමාණයක (අමූලික) ශ්‍රද්ධාවක් දැක්වුණි. උපතින් බ්‍රාහ්මණයෙකු වූ ඔහු තම ගර්වය නිමිති කොට ගෙන බුදුරදුන් හමුවීමට නොපැමිණියේය. එහෙත් උන්වහන්සේ පිරිනිවීමට යන බව දැනගත් ඔහු යුහුසුළු විය. තවත් ප්‍රමාද වුවොත් තවත් බුද්ධාන්තරයක් දක්වා භයානක සසරෙහි සැරිසැරීමට සිදුවන බව දැනගත් ඔහු වහා බුදුරජුන් හමුවීමට පැමිණියේය. ලද අවසරයෙන් බුදුහිමි අභියසට පැමිණි ඔහුට අවශ්‍ය වූයේ බුදුවරයෙකු පිළිබඳ තම සන්තානයෙහි ලැගුම්ගත් සිතුවිලි නිවැරදිදැයි මුලින්ම දැනගැනීමයි. ඒ නිසා බුදුහිමි අභියස ඔහු මුලින්ම විමසා සිටියේ "ආකාශයෙහි පාද සටහන් තැබිය හැකිද යන්නයි" මෙයින් අදහස් වන්නේ කුමක්ද සාමාන්‍යයෙන් කෙලෙස් බහුල සමාජය තුළින් මිදුන බුදුරජාණන් වහන්සේ නික්ලේෂි පුද්ගලයෙකු විය යුතු බව නොවේද? එසේ නම් මෙතැන ඔහු අසා ඇත්තේ බුදුහිමියන්ම දේශනා කළ ධර්මතාවයකි. "මහණෙනි යම්සේ පියුමක් මඩෙහි ඉපදී මඩෙහිම වැඩී මඩෙහි නොගෑවී නොකිලිටිව ඉන් ඉහලට සුපිරිශුද්ධව නැගී සිටීද? එපරිද්දෙන් මමද කෙලෙස් සහිත ලෝකයෙහිම ඉපදී ඒ තුළම වැඩී එයින් මිදුන පාරිශුද්ධ ලෝකයක නැගී සිටින්නෙමි" යන්නයි. එසේ නම් මුණි සිරිපා පියුම සාමාන්‍ය කෙලෙස් ලෝකයෙන් මිදුණු නික්ලේෂි උත්තමයෙකුගේ පා සලකුණකි.

ශ්‍රද්ධාවන්තයා අවබෝධයෙන් යුතුව උන්වහන්සේගේ පා පියුම වඳින විට ඔහුගේ සිත සසර බියගෙන දෙන කෙලෙස් ගිම් නිවා මොහොතකට හෝ හදවත නිවී සැනැහේ.

නිවන් දොරට මඟ පානා
සමනොල රන් කොතමුදුනේ
බැන්ද වියන් සේ
අරණු වලා රන් සළු පැටලේ
හද කිමිදී ලොව්තුරු සුව දේ

ගීතයේ මෙකී අන්තරා කොටසට පිවසෙන විට මා සිත එක්වරටම පිවිසෙන්නේ ධම්ම පදයේ අප්‍රමාද වග්ගයේ එන මේ ගාථාවටය.

පමාදං අප්පමාදෙන - යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාද මාරුයිහ - අසොකං සොකිනි පපං
පබබතට්ඨෝච භුම්මට්ඨෙ - ධීරො බාලේ අවෙක්ඛති

මෙහි අරුත කුමක්ද? 'ප්‍රමාදයෙන් තොර අප්‍රමාදී වූ ලෝකය පිළිබඳ දැනගත් පණ්ඩිතයා දුෂ්කර වූ ප්‍රවේශයක් සහිත වූ උස් කඳු මුදුනක පිහිටි ප්‍රඥාව නැමැති ප්‍රාසාදයට නැග ගන්නා බව' යි. එසේ පිවිසි ඔහු බාලයන්ගෙන් පිරි ලෝකයක සිට අතිතයේ පැමිණි දුෂ්කර ගමන්මග සැහැල්ලු සිතින් අවලෝකනය කෙරේ. දැන් ඔහු අතීතයෙන් මිදී ඇත.

ශ්‍රද්ධාවෙන් හදවත නිවාගත් පහන් සිතින් ප්‍රමුදිත පුඟුලා ඊළඟට ගමන් කරන්නේ සමනොල රන්කොත මුදුන කරාය. ඒ සඳහා බුදුහිමි දේශනාකළ අනුපූර්ව සික්ඛා, අනුපූර්ව චර්යා, අනුපූර්ව ප්‍රතිපදායන චරණ මාර්ග යන් ක්‍රමක්‍රමයෙන් සිත තුළ වඩනු ලබයි. අවසානයේ ඔහු සමනොල කොත මුදුනට ළඟා වෙයි. ඒ නිවනේ අග්‍රඵලය වන ප්‍රඥාවෙන් විකසිත වීමයි. බුදු හිමිගේ චරණ මාර්ග යෙහි ශීලය වඩාගෙන සමාධිය උදාකරගත යුතු අතර, සමාධියෙන් ප්‍රඥාව කරා යා යුතුය. එසේනම් ඔහුගේ ගමන් මාර්ගයේ ශීලපූර්ණං සමථ - විදර්ශනා භාවනාව ප්‍රගුණ කිරීම ප්‍රඥාව කුළුගැන්වීම සඳහා සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් වඩා අවසානයේ සම්‍යක් ප්‍රධාන සම්මා විමුක්තිය දිනා සැනහේ.

මෙකී අන්තරා කොටසේ සමනොල රන්කොත මුදුනට බැන්ද වියනක් සේ අරුණු වලා රන්සළු පැටලේ යැයි රචකයා සංකේතවත් කරන්නේ අරහත් ධජය හෙවත් සිවුරයි. මෙතෙක් ආ ගමන්මගට වියනක් (පිහිටක්) සෙවනක් වූයේ අරහත් ධජයයි.

අවසාන අන්තරා බණ්ඩය විමසන විට දැන් ඔහු පත්වී සිටින අවස්ථාව මැනැවින් නිරූපිතය. ඔහුගේ සිත සියලු කෙලෙස්වලින් මිදී ඇත. පුළුන් වලාවන් මෙන් සිත සැහැල්ලුය. එය පාවී පාවී යන්නා සේය. වලා අතුල කඳුවැටිද ඉක්මවා පාවී යන්නේ මහ රහතුන් නිවී සැනසුන ලෝක උත්තර වූ නිදහස් ලෝකයටයි. දැන් ඔහු අකුප්පා චේතෝ විමුක්තියට පත්ව ඇත. අතීතය නිමාවිය. අනාගතයක් නො එළඹේ. වර්තමානය තුළ පමණක් වෙසෙන ඔහු නිර්මල මනසක් දිනා ඇත.

ශ්‍රී ලංකාවේ...

38 වන පිටුවෙන්

ලංකා සමසමාජ පක්ෂයේ මුල් යුගයේ සාමාජිකයෙකි.

ජී. ඇස්. සිය ප්‍රථම දේශපාලන කාටූනය ඇන්දේ 1931 දී 'ස්වදේශ මිත්‍රයා' පත්තරයටය. 'ඩොනමෝර් කොමිෂන් වාර්තාව' එයින් විවේචනයට ලක්කොට තිබිණි. ජී. ඇස්. ගේ ජනප්‍රියම කාලය ඔහු ලංකාදීපයේ සේවයේ කළ යුගයයි. ලංකාදීපයට ඔහු ගෙන ආ. ඩී. බී. ධනපාලගේ වියෝවෙන් පසුද වයස 90 වන තෙක්ම ඔහු ලංකාදීපයට දේශපාලන විකට චිත්‍ර ඇන්දේය.

අමිත අබේසේකර

අමිත අබේසේකර කියන පරිදි 1970 දී පිහිටුවනු ලැබූ බණ්ඩාරනායක මැතිණියගේ මුල් ආණ්ඩුව ගෙදර යැව්වේ කාටුන්කරුවන්ය. කොටින්ම කියතොත් 1977 දී එක්සත් ජාතික පක්ෂය විසින් පළකරන ලද 'හත් වසරක සාපය' නම් පොත බණ්ඩාරනායක ආණ්ඩුව පෙරළා දැමීමට මූලික වශයෙන් හේතු වූ බව අමිත තදින්ම විශ්වාස කළේය. එම යුගයේ හතු පිපෙන්නාක් මෙන් දේශපාලන පුවත්පත් බිහිවීම නිසා දේශපාලනය කාටුන් ශිල්පීන්ටද තිබුණේ දැඩි ඉල්ලුමකි. දේශපාලන සංග්‍රාමයේ බලවත්ම ආයුධය ලෙස අමිත සැලකුවේ කාටුනයයි.

අමිතගේ පියා මුදළිඳු ඊ. ඒ. අබේසේකරයි. කාටුන් ඇඳීම නිසා කුඩා කල අමිත වේවැල් පහර කෑ වාර අනන්තයි. නමුත් ගුරුවරුන්ගේ විකට රූප කළු ලෑල්ලේ ඇඳීමේ පුරුද්ද අමිතගෙන් තුරන් කිරීමට එම වේවැල් පහරට පුළුවන් වුණේ නැත. වේවැල් පහර ඔහු දිරි ගැන්වීයයි කිවහොත් වඩාත් නිවැරදිය. පාසල නිම වී ගෙදර ගිය අමිත ගෙදර බිත්ති පුරා අඟුරු කැබලි ගෙන චිත්‍ර අඳින්නට පටන් ගනී. වේවැල් කසාය නොලැබුණද පියාගෙන් බැනුම්වල නම් නිමක් නොවීය.

පාසල් වියේ සඟරාවලට චිත්‍ර අඳිමින් ප්‍රසිද්ධියක් ඉසිලූ අමිතගේ දක්ෂතා දුටු පියා ඔහු චිත්‍ර කර්මාන්තය උගෙනීමට ගෙන ගොස් භාර දුන්නේ මුදළිඳු ඒ. සී. ජී. ඇස්. අමරසේකර මහතාටය. කුඩා අමිතගේ දක්ෂතා දුටු ගුරුතුමා වැල යන පැත්ත බලා මැස්ස ගැසුවේය. කාටුන් ශිල්පියෙකු ලෙස අමිත සතු දස්කම් චිත්‍ර ශිල්පය ඉගැන්වුවහොත් මොට වන බව ගුරුතුමා වටහා ගත්තේය. එතැන් සිට අමිත තනිවම කාටුන් කලාව හදාරන්නට විය. තමාගේම ආරක කාටුන් කලාවක් ඔහු ගොඩනගා ගත්තේය.

මේ අතර එදා පළ වූ පුවත්පත්වලට අමිත කෙතරම් කාටුන් තැපැල් කර ඇරියත් පළ වුයේ නැත. උත්සාහය අත්හළේ අමිත නොවේ. අමිතගේ උත්සාහය මල්ඵල ගන්වමින් ටයිම්ස් පත්තරයේ අමිතගේ කාටුනයක් මුල් වරට පලවිය. එවිට අමිතට යන්තම් වයස 16 පිරුණා පමණි. දැලි රැවුල අතගාමින් අමිත ටයිම්ස් පත්තරය අතට ගත්තේ රටක් රාජ්‍යයක් දිනා ගත්තාක් මෙනි.

ප්‍රථම 'ඉරිදා ලංකාදීපයට' සිය පියා වන මුදලිඳු ඊ. ඒ. අබේසේකර ලියූ ලිපියට කාටුනයක් ඇඳ තාත්තාගේ පහනිත් එළිය ලබා ගන්නටද අමිත සටකපට විය. කාටුන් ශිල්පියකු ලෙස මතුවීමට තිබූ තොතින් ආශාව ඊට හේතු විය. අබේසේකර මුදළිතුමාගේ ලිපිය කියැවූ ලංකාදීප ප්‍රධාන කර්තෘ ඩී. බී. ධනපාල මහතාගේ සිත වඩාත් ඇදී ගියේ ලිපියට වඩා එහි වූ කාටූනටය. ධනපාල මහතාගේ ආරාධනයෙන් අමිත දිනපතා ලංකාදීප පත්‍රයේ කාටුන් අඳින්නට පටන් ගත්තේය. ඔහු 'රාළහාමි' විකට චිත්‍රය තුළින් මහජන ප්‍රශ්න කතා කළ අතර 'මොට්ටපාල' අමිත මැවූ අමතක නොවන චරිතයකි. දේශපාලන කාටුන් චිත්‍ර ශිල්පියකු අනිවාර්යයෙන්ම රටේ පවත්නා නීතිය ගැන අවබෝධයක් ලැබිය යුතු බව අමිත තදින්ම විශ්වාස කළේය. කාටුන් චිත්‍රවලින් යමක් දැක්වීමේ ක්‍රමය බටහිරින් පැමිණි වගක් විශ්වාස නොකළ අමිත පැරණි පන්සල් චිත්‍ර, බිතු සිතුවම්වලින්ද ඒවා දැක්වෙන බව සනාථ කරන්නට ගත්තේ දැඩි උත්සාහයකි.

ලංකාදීප ආයතනයේ විසි පස් වසරක් සේවය කළ අමිතගේ විශ්වාසය වූයේ ලිපිවලට, විවේචනවලට වඩා කාටුන් චිත්‍රවලට දේශපාලනඥයන් බිය බවය. ලංකාදීපයෙන් පසු 'දවස' ආයතනයේ පස් වසක් සේවය කළ අමිත අවසන් වරට දැකගතහැකි වූයේ උපාලි පුවත්පත් ප්‍රකාශන තුළිනි.

(මෙම ලිපියේ ඉතිරි කොටස ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න)

සර්ණාගත බල්ලා

කෙටි කතාව

ඉංග්‍රීසි පරිවර්තනය ඇසුරින් සිංහලට නැගුවේ

■ **ආචාර්ය ජගත් රූපසිංහ විසිනි**

සාදත් හසන් මොන්ටෝ විසින් උර්දු භාෂාවෙන් ලියන ලද කෙටිකතාව කාලිඩ් හසන් විසින් The Dog of Titwal **ලෙස ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලදී.**

සති ගණනාවක සිට සෙබළුන් බංකර තුළට වී සූදානම්ව සිටියද කිසිදු සටනක් සිදුනොවීය. සිදුවූ එකම දෙය නම් දෙපැත්තේම සෙබළුන් දිනපතාම වාගේ පුරුද්දකට මෙන් එකිනෙකාගේ දිසාවට වෙඩි ප්‍රහාර කිහිපයක් එල්ල කිරීම පමණි. කාලගුණය ඉතාමත් ප්‍රියජනකය. ප්‍රසන්නය. කැළෑමල්වල සුවඳින් පරිසරය පිරී ඇත. කඳුවල වැවුණු පඳුරුවලට සහ ගල්කුළුවලට මුවාවී සැඟවී සිටින සෙබළුන් ගැන කිසිදු වගක් සෙවිල්ලක් නැතිවා සේ සොබාදහම සුපුරුදු ලෙස තමාගේ ක්‍රියාවලිවල නිරතව සිටියි. මල් විකසිත වේ. කුරුල්ලන් සුපුරුදු ලෙස නාද නගයි. මී මැස්සන්ගේ ගුමුගුමුව දසත විහිදේ.

වෙඩිහඬක් පිට වූ විගස බියට පත් වී එක්වරම ඉගිළෙන කුරුල්ලන් ඒ මේ අත පියාඹමින් තටු ගසන හඬ ඇසෙනුයේ වාදකයෙක් තමාගේ සංගීත භාණ්ඩය එක්වරම වාදනය කළා සේය. සැප්තැම්බර මස අගට ළං වෙමින් ඇත. තද රශ්නයක් හෝ ශීතලක් නොදැනේ. ගිම්හානය සහ හේමන්තය සමගි වූවා සේය. නිල් අහස පුරා සුළඟට ගසාගෙන යන පුලුන් වැනි සුදු වලාකුළු පෙනෙනුයේ ජලාශයක සුදු රැළි නැගෙන්නා සේය.

කිසිදු වැදගත් දෙයක් තවමත් සිදු නොවූ නිමක් නොමැති යුද්ධය නිසා සෙබළුන් හෙම්බත් වී ඇත. දෙපැත්තේ සෙබළුන් රැඳී සිටිනුයේ එකිනෙකට මුහුණ ලා ඇති එකම උසින් යුතු කඳු දෙකක නිසා සිටින තැන අනුව කිසිදු පැත්තකට විශේෂ වාසියක් නැත. කඳු පාමුල නිම්නය මැදින් ගලා බසිනා දිය පහර මිටියාවතේ ගල්තලාවන් අතරින් ඇදී යන්නේ සර්පයකු මෙනි.

ගුවන් හමුදාව සටනට එකතු වී නොමැති අතර දෙපැත්තේම සෙබළුන් ළඟ බර ආයුධ හෝ මෝටාර් නැත. රාත්‍රිය එළඹෙන විටම විශාල ගිනි මැලයන් ගසා ගන්නා දෙපැත්තේම සෙබළුන්ගේ කථාබහ කඳුවළල්ලේ වැදී දෝංකාර දී එකිනෙකාට ඇසේ.

නින්දට පෙර අවසාන තේ පානයද නිමා විය. ගිනිමැලය නිවී යාමට ආසන්නය. වලාකුළු නොමැති අහස පැහැදිලිය. පරිසරය ටිකෙන් ටික ශීතල වේගෙන එයි. එතරම්ම අප්‍රසන්න ගඳක් නොවුණත් සදාහරිත ගස්වල ගෙඩිවල සැර සුවඳ දසත පැතිරෙයි. බොහෝ සෙබළුන් නින්දට වැටී ඇත. ලුතිනන් හර්නාම් සිං අවදියෙන්ය. ඔහු රාත්‍රී රාජකාරියේ නිරතය. රාත්‍රී දෙකට ගන්ඩා සිං ව ඇහරවූ ඔහු ගන්ඩා සිං ට මුරකිරීමේ රාජකාරිය පැවරීය. නිදාගන්නට උත්සාහ කළද නින්ද අහලකවත් නොවීය. ඔහු පන්ජාබි ජන ගීයක් මුමුණන්නට විය.

"මගේ ප්‍රියාදරය, මට මිරිවැඩි සඟලක් අරගෙන දෙන්න... තරු සහිත මිරිවැඩි සඟලක්... මුදල් නොමැතිනම් ඔබගේ මිහරකා විකුණන්න.... මට තරු සහිත මිරිවැඩි සඟලක් අරගෙන දෙන්න...."

මෙලෙස මුමුණන විට සිතට මිහිරක් ගෙනදුන්නා සේම මඳ හැඟුම්බර ශෝකී බවක්ද ඔහුගේ සිතට දැනුණි. සෙබළු එකිනෙකා අවදි වන්නට විය. ලාබාලම සෙබළා වූ බන්ටා සිං මියුරු හඬින් ගයන්නට වූයේ හීර් රන්ජා ප්‍රේම පුරාවෘත්තයේ විරහ පද කිහිපයකි. ආදරයේ විරහව ශෝකාන්තය දැනවූ පන්ජාබි ආදර අන්දරයක් වූ හීර් රන්ජා හි ගී ඇසූ හැම සෙබළා තුළම ඇති වූයේ මහා දුකකි. කම්පනයකි. කඳු වළල්ල පවා ගීතයේ දුක්බර භාවය නිසා මුසපත් වූවා සේය.

සිත්වල ඇතිවූ විරහ ශෝකී හැඟීම් එක්වරම බිඳී ගියේ බල්ලෙකුගේ බිරිමක් නිසාය.

"මේ වල්බල්ලා කොතනින් පාත් වුණාද?" ලුතිනන් හර්නාම් සිං ට කියවුණි.

බල්ලා නැවතත් බුරන්නට විය. බුරන හඬ තවතවත් ළඟින් ඇසෙන්නට විය. ළඟ තිබූ පඳුරක් තුළින් සරසර හඬක් ඇසෙන්නට විය.

බන්ටා සිං ඒ ගැන සොයා බැලීමට පඳුර අසලට ගියේය. ඔහු ආපසු ආවේ බල්ලෙකුවත් ඇදගෙනය. බල්ලා වලිගය වනමින් ඇදී ඇදී ආවේය.

"පඳුර පිටිපස්සේ ඉඳල මූව හම්බ වුණේ. ඌ මට කිව්ව උගේ නම ජුන් ජුන් කියල" බන්ටා සිං පැවසුවේය. හැම දෙනාටම සිනාගියේය.

බල්ලා ලුතිනන් හර්නාම් සිං දෙසට ගියේය. තමාගේ බෑගයෙන් ක්‍රැකර් බිස්කට් එකක් ගත් ලුතිනන් වරයා එය බිමට දැමීය. බිස්කට් එක ඉව කළ බල්ලා එය කන්න සැරසෙන විටම ලුතිනන්වරයා බිස්කට් එක උදුරා ගත්තේය.

"නැවතියන්.... උඹ පකිස්ථාන් බල්ලෙක් වෙන්න පුළුවන්" සැමදෙනාම සිනාසුනහ.

"ලුතිනන් සර් ජුන් ජුන් ඉන්දියන් බල්ලෙක්" බන්ටා සිං බල්ලාව අතගාමින් කීවේය.

"ඉන්දියන් කියල ඔප්පු කරපන්" ලුතිනන් වරයා අණ කළේය. බල්ලා වලිගය වනන්නට විය.

"වලිගය වැනුවට උඹ ඉන්දියන් බල්ලෙක් කියල කියන්න බෑ. හැම බල්ලෙකුටම වලිගය වනන්න පුළුවන්" ලුතිනන් හර්නාම් සිං නැවතත් පැවසීය.

"ඌ අතරමන් වෙච්ච අසරණ සරණාගතයෙක්" බල්ලාගේ වලිගය අතගාමින් බන්ටා සිං පැවසීය.

ලුතිනන් වරයා ක්‍රැකර් බිස්කට් එකක් බල්ලා දෙසට විසි කළේය. බිස්කට් එක බිමට වැටීමට පෙරම බල්ලා එය ඩැහැ ගත්තේය.

"බල්ලන්ට වුණත් දැන් පකිස්ථානුවන්ද ඉන්දියානුවන්ද කියල තීරණයක් ගන්න වෙනවා" සෙබළෙක් පැවසීය.

ලුතිනන් වරයා තවත් බිස්කට් එකක් බල්ලාට විසි කළේය.

"සියලුම පකිස්ථානුවන් බල්ලන්ද ඇතුළුව වෙඩි තියල දානවා"

"ඉන්දියාව දිනේවා" සෙබළුන් කෑගැසීය.

බිස්කට් එක කෑමට ගිය බල්ලා එක්වරම හිටිතැනම නැවති වලිගය කකුල් අතර ගසාගෙන බියෙන් වටපිට බැලීය. ලුතිනන් හර්නාම් සිං මහ හඬින් සිනාසුනි.

"ඇයි උඹ උඹේ රටට බයවෙන්නෙ ජුන් ජුන් කාපන් තව බිස්කට් එකක්"

ඉක්මනින්ම එළි විය. හරියටම කළුවර කාමරයක එක්වරම විදුලි බල්බයක් පත්තු කළා වාගේය. තිට්වාල් ලෙස හැඳින්වූ මෙම ප්‍රදේශයේ කඳු වලා සහ මිටියාවත් පුරා ඉර එළිය පැතිරුණි.

යුද්ධය මාස ගණන් ඇදී ගියේය. දිනන්නේ කවුද කියා කිසිවෙකුටවත් ස්ථිර විශ්වාසයක් නැත.

ලුතිනන් හර්නාම් සිං දුරදක්නය ගෙන ප්‍රදේශය සිසාරා බලන්නට විය. පකිස්ථානුවන් රැඳී සිටින කඳු මුදුනින් දුම් පිටවනු ඔහු දුටුවේය. එහි අදහස නම් තමන් මෙන්ම සතුරු සෙබළුන්ද තම උදෑසන ආහාරය පිළියෙල කරමින් සිටින බවයි.

පකිස්ථාන් හමුදාවේ කපිතාන් හිමත් බාන් තම ගොරෝසු උඩුරැවුල වේගයෙන් කරකැවීය. ඔහු තිට්වාල් ප්‍රදේශයේ සිතියම අධ්‍යයනය කරන්නට විය. ඔහු ළඟින්ම සිටියේ රේඩියෝ රසීවරය කනේ තබාගෙන සිටින සංඥා සෙබළාය. ඔහු පාබල හමුදා බණ්ඩයේ අණ දෙන නිළධාරියා සමග සම්බන්ධ වීමට උත්සාහ කරමින් සිටියි. ඔවුන් දෙදෙනාට අඩි කිහිපයක් ඉදිරියෙන් වාඩි වී සිටිනුයේ සෙබළ බසීර්ය. ඔහු ගලකට හේත්තු වී තම රයිෆලය ඉදිරියට මානාගෙන සිටියි.

ඔහු සෙමින් මුමුණන්නට විය.

"මගෙ සොඳුර මගේ සඳ ඔබ රැය පහන් කළේ කොතනද... ඔබ රැය පහන්කළේ කොතනද...."

ඔහු ගීතයේ මිහිර තමන්ම විඳිමින් ප්‍රීතියෙන් ඉපිලෙමින් තවතවත් හයියෙන් ශබ්ද නගා ගයන්නට විය.

"උඹ කොහේද රෑ හිටියේ" කපිතාන් බාන්ගේ කෑගැසීම එක්වරම බසීර්ට ඇසුණි. එහෙත් එය බසීර්ට කළ විධානයක් නොවන බව පෙනුණි.

ඔහු කෑගැසුවේ බල්ලෙකුටය.

දිනකිහිපයකට පෙර බල්ලා ඉබාගාතේ පැමිණ කඳවුරේ හොඳින් කාලය ගත කළ අතර හදිසියේම වාගේ රෑයේ රාත්‍රියේ අතුරුදහන් විය. ඌ නැවතත් පැමිණ ඇත. ඌව පෙනුණේ කිසි වටිනාකමක් නැති අවලංගු කාසියක් මෙනි.

"උඹ ඊයේ නැවතුනේ කොහෙද... උඹ ඊයේ නැවතුනේ කොහේද..."

සිනාසුණු බසීර් බල්ලාට සෙමින් තට්ටු කරන ගමන් ගැයුවේය.

බල්ලා කළේ සුපුරුදු ලෙස වලිගය වැනීම පමණි. කපිතාන් බාන් බල්ලා දෙසට ගල් කැටයක් විසි කළේය.

"ඌට පුළුවන් වලිගෙ වනන්න විතරයි.... මෝඩයා..."

"මොකක්ද බල්ලගෙ බෙල්ලෙ එල්ලලා තියෙන්නෙ ?" බසීර් විමසීය.

බල්ලාව අල්ලාගත් සෙබළෙක් බෙල්ලේ තිබූ පටිය ගැලවීය. කුඩා කාඩ්බෝඩ් කැබැල්ලක් එයට අමුණා තිබුණි.

"මොකක්ද ලියල තියෙන්නෙ ?" කියවීමට නොදත් සෙබළා ඇසීය.

ඉදිරියට ගිය බසීර් ඉතා අමාරුවෙන් එය කියවන්නට විය.

"ජුන් ජුන් කියලයි ලියල තියෙන්නෙ"

කපිතාන් බාන් නැවතත් තම ගොරෝසු උඩු රැවුල කරකැවීය.

"ඕක රහස් පණිවිඩයක් වෙන්න පුළුවන්. තව මොනවහරි ලියල තියෙනවද බසීර් ?" කපිතාන්වරයා ඇසීය.

"ඔව් සර් ඒකෙ ලියල තියෙනවා ඉන්දියන් බල්ලෙක් කියල"

"මොකක්ද ඒකේ තේරුම ?" කපිතාන් බාන් නැවතත් ඇසීය.

"සමහරවිට රහස් දෙයක් වෙන්නැති" බසීර් ටිකක් බරපතල ලෙස පැවසීය.

"රහස් දෙයක් නම් ඒ රහස තියෙන්නෙ අර ජුන් ජුන් වචන දෙකේ" වෙනත් සෙබළෙක් ටිකක් වැඩිපුර හිතා පැවසීය.

"මේකෙ මොනවහරි දෙයක් තියෙන්න පුළුවන්" කපිතාන්වරයා එය හොඳින් නිරීක්ෂණය කළේය.

"ජුන් ජුන්. මේ ඉන්දියන් බල්ලෙක්" බසීර් මුල සිට අගට නැවතත් යටහත් පහත්ව කියවීය.

කපිතාන්වරයා සංඥා රේඩියෝව මගින් තම අනුබණ්ඩ අණදෙන නිලධාරියා සම්බන්ධ කරගත්තේය. ඔහු සියලු දේ තම උසස් නිළධාරියාට පවසන්නට විය. දින කිහිපයකට පෙර බල්ලා කඳවුරට පැමිණීමත් දින කිහිපයක් එහි ගත කිරීමත් ඊයේ රාත්‍රියේ අතුරුදහන් වීමත් නැවත අද උදේ පැමිණීමත් ඔහු වාර්තා කළේය.

"මොකක් ගැනද කැප්ටන් කියන්නෙ ?" අණදෙන නිළධාරියා ඇසීය.

කපිතාන් බාන් නැවතත් සිතියම හොඳින් පරීක්ෂා කළේය.

සිගරැට් පැකට් එකක් ගත් ඔහු එහි කවරයෙන් කුඩා කෑල්ලක් ඉරා බසීර් අතට දුන්නේය.

"දැන් ලියපන් ගුර්මුකි භාෂාවෙන්, ඒ කියන්නෙ සික්වරුන්ගේ භාෂාවෙන්"

"මොකක්ද මම ලියන්නෙ ?"

"හොඳයි..."

බසීර්ට හොඳ ඉවක් ඇත.

"සුන් සුන්... ඔව් ඒ නම හොඳයි අපි ජුන් ජුන් නමට එකට එක කරන්න සුන් සුන් කියල නම දාමු"

"හරියටම හරි" කපිතන්වරයා එය අනුමත කළේය.

"තව ලියන්න 'මේ පකිස්ථාන් බල්ලෙක්' කියල"

කපිතාන්වරයාම එම කොළ කැබැල්ල බල්ලාගේ කරපටියේ ගැටගැසීය.

"දැන් ගිහින් උඹේ පවුලට එකතු වෙයන් "

"මේ බලපන් යාළුවා පාවාදීම් කරන්න බෑ. පාවාදීම්වලට දඬුවම මරණයයි" බල්ලාට කෑමට යමක් දුන් කපිතාන්වරයා පැවසීය.

48 වන පිටුව බලන්න

ගමේ ඉගැන්නූම් විත්තිය

■ මාමිනියාවේ ඒ. පී. බී. ඉලංගසිංහ

අපේ ගංකුඩුවල ඇත්තන් නුගතුන් කොට සැලකීමේ පුරුද්දක් නාගරික සමාජයේ පවතී. නමුත් ගමේ පැවති අධ්‍යාපන පිළිවෙත් පරීක්ෂාවෙන් වී මතය යටපත් වන බව පෙනේ. එම අතීත උරුමය කෙබඳුදැයි පොත්පත්, ශිලාලේඛන හා ශේෂව පවතින පුරාවිද්‍යා නටබුන් තුළින් පැහැදිලි වේ. වැව් බැඳි අඩවියට බුදුදහම පැමිණීමත් සමග ඇතිවූ දැනුම ලබා ගැනීමේ බුද්ධි ප්‍රබෝධයන් මෑතක් වන තුරුම අපේ ගම්දනව්වල නොනැසී පැවතිණි.

ඒ අනුව ගම්මණ්ඩියක් හෝ ගම්මණ්ඩි කීපයකට ප්‍රධාන වූ විහාරස්ථානයක, නැත්නම් පාරම්පරික ශිල්ප කලා ශාස්ත්‍ර බෙදා දුන් වර්ග පරපුරක් මුල් කරගෙන ශිල්ප ශාලා පැවතිණි. මේවා ඉදිකර නඩත්තු කරගත්තේද ගම්මු විසින්මය.

මේ හැම තැනකම 'පදනම් ශාස්තර' ඉගැන්වීමක් කෙරිණි. සෑම සිප්හලකම මේ මූලික ඉගැන්වීම් එකලෙසින්ම කෙරිණි. ලොව පවතින ආලෝකය හා ඊට විරුද්ධ වූ අඳුර පිළිබඳ බොහෝ දේ පළමුව පහදා දුන්නේය. සෑම සත්-අසත් කාරණාවක් ගැනම නිවැරදිව තේරුම් ගැනීමේ හැකියාව මෙයින් ප්‍රගුණ කෙරිණි. මේ ශාස්තරය ජෝති (ආලෝක) විද්‍යාව නැත්නම් ජ්‍යොතිෂ්‍ය නම් විය. දෙවැන්න වූයේ සතර භූත සම්භන්ධ කිරීමයි. ලොව ජීවී-අජීවී වස්තූන් සතර භූත ආස්සර කොට ඇත. ඒ නිසාම මේ ජීවී-අජීවී දෙපාර්ශ්වයම, ක්ෂය වීමකට හා වෙනස්වීමකට ලක් වේ. ජීවයන්ගේ එම වෙනස් වීම අප ලෙඩදුක් රෝග පීඩා ලෙස හඳුනාගෙන තිබේ.

ගැබ් ගැනීමේ සිට මරණය දක්වා කාලය තුළදී ළදරුවකු, ළමයකු, තරුණ තරුණියක ලෙස මැදිවයසේ කෙනකු ලෙස මහල්ලකු ලෙසින් සැපවත් ජීවිතයක් ගත කරවූ වෛද්‍ය ශාස්ත්‍රය කීවේද මෙයටයි. තෙවැනි ඉගෙනුම නම් ආගම ධර්ම, සිරිත් විරිත් අනුව මෙලොව එලොව සැපවත් කර ගැනීමයි. මෙයින් තම තමන් හා එක්වන පරිසරය සම්බන්ධ සියලු දේට හානියක් නොවන සේ ජීවත්වන හැටි සුබාව කියා දුන්නේය. පදනම් ඉගැනුමෙන් පසු තමුන්ට අවශ්‍ය ලෙස හෝ තමාගේ දක්ෂකම් අනුව ශිල්ප, ශාස්තර, කරුමාන්තයක් ප්‍රගුණ කළේය. වෛද්‍යවරයකු, වඩු කාර්මිකයකු, රන්කරුවකු, චිත්තර මූර්ති කැටයම් කරුවකු වැනි ඕනෑම තරාතිරමක අයකු වුවත් මනුස්සකම දන්නා යහපත් පුද්ගලයකු වූයේ මේ පදනම් ශාස්තර ක්‍රමය පළමුවෙන්ම එදා අපේ ගම්වල අධ්‍යාපනයට ඇතුළු වූ නිසාය.

අපේ ගම්වල දරු උපත සමග හදාගන්නා වේලාපත්කඩය මෙම උගැන්වීම්වලට බෙහෙවින්ම බලපෑවේය. නක්ෂත්‍රානුකූලව ඒ ඒ පුද්ගලයාගේ දක්ෂකම් හැටි පාට එයින් කියවුන නිසා ඊට සුදුසු වූ අධ්‍යාපනයක් ඔහුට ලබාදීමට දෙමාපියන් වෙහෙසිණි. 'හතර කේන්දරය පාලු එකා මහන දමට' කියමන ආවේද ඔය නිසාමය. වෙළහෙළඳුම්, වෙදකම් වැනිදේ පමණක් නොව නාට්‍ය කලා ශිල්පාදිය උගැන්වීම පරපුර පිළිවෙත් අනුව තීරණය වුවද ඊට සුදුසු වූ ග්‍රහ පිහිටීම් ඇත්දැයි බැලීමටද සිදුවිය. "උඹට මට මොන අකුරු ශාස්තර්ද. බෙහෙත් තුන්ඩුවක් කියවා ගන්ට දැනගත්තාම ඇති" කියා ඵලනැති දරුවන් තමන් කරගෙන ආ ජීවන වෘත්තියට ඇදගෙන ගියේය. එසේම කේන්ද්‍රයේ ග්‍රහ පිහිටීම් අනුව ඉතා දියුණු තත්ත්වයක් පෙනුන විට, ගුරු ගෙදර රඳවා තැබීම, ශිල්ප ශාලා ඇති තැන ඥාතීන් ළඟ නතර කරවීම, තමන්ගේ පවුලේ දැනඋගත් අයකුට දරුවා බාරදීම පමණක් නොව දඬුවම් කර යොමුකර ශිල්ප දීමට පවා පෙළඹිණි.

වේ වැල් කෝටු නාරං සියඹලා අතු
කිතුල් පොල් ඉරටු වැල් කසඹිලිය අතු
මෙවැනි ඉපල් මගෙ දෑතට නොපෑ යුතු
පමා නොවී එම් අකුරට මෙයින් මතු

ගුරු ගෙදරින්ද මුරණ්ඩුකම් පාලනයට මෙවැනි දඬුවම් දක්ෂකම් පාන ගෝලයකු හදා ගැනීමට ලැබිණි. බටහිර ජාතීන් ඉංගිරිසි ඌරුවේ අධ්‍යාපනය අපේ ගම්වලටද ගෙන ඒමට පෙර මෙම ශිල්ප ශාලා, විහාරස්ථාන මුල් කරගත් පිරිවෙන් අධ්‍යාපනය නොඅඩුවම ගමට ලැබිණි.

'මූලික පදනම් ශාස්තර' ඉගැනීම අණ තහංචි වූවෙක් නොමැත. නමුත් ගොවිතැන ඉගැනීම නීච කුල යයි සම්මත වූ ගාර්ඩිවරුන්ට එකල ගම්වල තහංචි විය. ඒ ඔවුන් සදාකාලිකව ඉල්ලා කන්නන් විය යුතු හෙයිනි. අපේ ගම්වලද වර්ග සම්මුතින් කැඩූ අයවලුන් නීච කුලවලට පලවා හැරියේද ඔය දඬුවම පැමිණවීමට විය හැක.

ගමේ ඇත්තෝ තමාගේ දරුවන්ට පූර්වාචාරීන් බවට ප්‍රායෝගිකවම පත් විය. දරුවාට බහ තෝරා ගමන් බිමන්

යන්නට හැකිවූ විගසම, හේනට, කුඹුරට, හැලිවලං හඳන තැනට, වඩු, මේසන් වැඩ කරන තැනට, බේත් කරන තැනට, කපු පන්නන් කරන තැනට, බලිතොවිල් ශාන්ති කර්ම කරන තැනට ගෙන ගියේය. එවිට දරුවා ඇහැදැක බැලීමෙන් දැනුමක් ලැබුවේය. ගමේ ඇත්තන් සියදරුවන් ගුරු හාමුදුරුවන්ට, ගුරු මහතැන්ට, ගරුසැලකිලි බිය පක්ෂ පාතිත්වයෙන් හදා වැඩුවේය. මේ බව තමුන්ද ආදර්ශයෙන්ම පෙන්වීය. නාන තොටක, මහමගකදී ගුරුමහතුන් හමු වූ විට ගරු සැලකුම් දක්වා එකත් පස් වූවේය. දරුවන් තුළද ගෞරව සම්ප්‍රයුක්ත බියක් ඇති කළ මේ සිරිත් ආදර්ශයක් වූවේය. දරුවන් සමග වැඩපල කරන විටෙක පවා උපදේශන කවි, වැකි කතා කියා දුන්නේය.

ගුරු සිත නොරිදවා
වේලාව නොවරදවා
බැතිපෙම් උපදවා
අකුරු උගනීවි කුමරු සොඳවා

වැනි කවි අපේ සිත්තුළ අදත් පැළපදියම්ව පවතී. නුවර කලාවියේ අපේ කටවහරේ අධ්‍යාපනයට මුල්තැනක් ලැබිණි. යුද්ධ අංගම්කෙළි, වාදන ශිල්ප, කැඩුම් බිඳුම්, සර්ප වෙදකම් ක්‍රම, මන්ත්‍ර ගුරුහරුකම් ආදිය කටබසේ බානක පරම්පරාවෙන් වැඩිපුර පෝෂණය විය. මේවායේ ගුරුමුෂ්ටි තබා ගත්තේ ඒවා හොඳ නරක දෙකටම භාවිත කළ බැවිනි. හික්මීම, විනය ප්‍රකාශ වූ පසුව ඊළඟ පරපුරේ විශ්වාසවන්තයාට මේ දේවල් කියා දුන්නේය.

වැලි පිල්ලේ ස්වස්ථි සිද්ධම් අයනු ආයනු කියා ආරම්භ කළ ලේඛන ශිල්ප තමන් දන්නා දේ හා අලුතින් උපදවා ගත් දේ පුස්කොළවල ලියා තැබීමෙන් කෙළවර කළේය. ගුරු ශිෂ්‍ය සහ සම්බන්ධතාව ශිල්ප ශාලාවේදී මෙන්ම ඉන් පිටදීද ඉහළින්ම පැවතිණි. මවුපියවරුන් (දෙගුරුන්ව) ගුරුවර උතුමන් සමග කතාබහකරමින් දරුවන්ගේ උගත්කම් හදා වැඩීය. දරුවා ගුරුවරයා හා දෙමාපියන් ඔවුනොවුන්ට ආදර්ශවත්ව හැසුරුණිඩි ඒ බව 'හරි මවුපියෝ දරුවන්ට පාරේ බැස යන්ට ඉඩ තියන්ඩ ඕනෑ', 'හරි දරුවා මවුපියන්ට අපහාසයක් වෙන්ට ජීවත් වෙන්නෑ', 'ගුරුන් මවුන් නාඳුනන එකා අමනුස්සයෙක්' වැනි වගන්ති ගමේ ඇත්තන් අතර නිතර භාවිතයෙන්ම පැහැදිලි වේ.

පදනම් ශාස්තරයෙන් පසු තම තමුන්ට රිසි වූ ශිල්ප, ශාස්තර, කරුමාන්ත විශේෂ කොට ඉගැන්වීම්ද තිබිණි. ඒ සෑම දෙයක්ම කියා දුන් අය ගුරු පදවියෙන් පිදුම් ලැබීය. ඒ උතුමන් තුළ විශේෂිත වූ ලක්ෂණද තිබිණි. මේ අයවලුන් ඉතා යහපත් චරිත ශක්තියෙන්ද ප්‍රිය මනාප පෙනුමින්ද යුතුවිය. දෙමාපියන්ගෙන් ගරුබුහුමන් ලබාගැනීමේ ශක්තියක්ද මේ ගුරුවරුන් තුළ පැවතිණි. දරුවන්ට පමණක් නොව ගමටද අවවාද අනුශාසනා දිය හැකි තත්ත්වයක් එතුමන්ලා සතුව පැවතිණිඩි ගමම මෙහෙයවීමේ හැකියාවක්ද තිබිණිඩි ඉවසීමේ ගුණය, ඕනෑම ගැඹුරු දෙයක් සරලව කියා දීමේ හැකියාවක්ද මේ ගුරු උතුමන්ලා සතුවිය.

නවසිය තිස්ගණන්වලදී අපේ අධ්‍යාපන ක්‍රමය සුදු පාලකයන් වෙනසකට පත් කළද එදා ගමේ පාසලේ සිටි ගුරුතුමන්ලාද පැරණි ගති ලක්ෂණ රැකගති. කෝට්බෑය, රෙද්ද ඇඳි ඒ ගුරු උතුමන්ලාද දරුවන්ගේ ගෙවල් දොරවල්වලට ගොස් මා පියන් සමග කතාබහ කර පසුබිම දැන හැඳින දරුවන්ට සුදුසු වූ අධ්‍යාපනයක් ලබා දුන්නේය. පිහිට වූවේය. අද මෙන් එකල දරුවන්ට ඉතා කුරිරු දඬුවම්වලට මුහුණ දීමට සිදු නොවිය. එහෙත් පාසල් දරුවන්ට දඬුවම් පැමිණවීමක්ද සිදුවිය. දරුවන්ගේ දෙමාපියන් ඊට එරෙහිව මානව හිමිකම් කඩ කළේ යයි ගුරුවරුන්ට චෝදනා කර නඩු පවරා ආණ්ඩු මට්ටු කරන්ටද ගියේ නැත. මේ තත්ත්වය ආරක්ෂා වූයේ ගුරුතුමන් ගම්මුන්ට අවශ්‍යම පුද්ගලයෙකුව සිටි බැවිනි. එසේම නව සොයා ගැනීම් ගැන ඒ ගුරු උතුමන් දැනුම යාවත්කාලීන කරගෙන බහුශ්‍රැත භාවයක් දැරීමද ගෞරව විශ්වාසයට හේතුවිය. ඒ ගුරුඋතුමෝ සිය සිසුවන්ට සහජාත දූපුතුන්ට මෙන් ආදර පෑමද තවත් හේතුවකි.

එකල අකුරු කියවීම උදාහරණයක්ව ගතහොත් අකුරු හඳුනා ගැනීම, උපදින ස්ථාන දැන ගැනුම, ඇලපිලි පිල්ලම් එකතුවී අකුරු හැදෙන හැටි සුබාව ගැඹුරටම තේරුම් කරමින් ඉගැන්වූහ. ඊට සකස්කඩ, වදන් කවිපොත, සිරිත්මල්දම, නාමාෂ්ඨ ශතකය, නම්පොත ආදිය අැසුරු කොට ගත්හ. ගුරු උතුමන්ට නවවැඳුම් පිදුම් කිරීමද, දර දිය ඇද දෙමින් පුද්ගල අවශ්‍යතා සපුරන්ට එකල සිසුන්ද පෙළඹිණි.

අපේ ගංකුඩුවල පුරාණ පංසල් භූමියේම ශිල්ප ශාලාව තිබීමෙන් ගුරු, සිසු, මාපියන් හික්මවීම නිරායාසයෙන්ම සිදුවිය. වරිච්චි මැටි ගසා පොල්අතු පිදුරු හොයා සකසාගත් ශිල්ප පොළ ඉදිකර, ආරක්ෂාකර, නඩත්තු කිරීම ගමේ අය විසින් පොදු වස්තුවක්ව මහත් ඕනෑ කමින්ම කළේය. දරුවන්ට දිවා ආහාර පිළියෙල කරදීමක් එකලද සිදුවිය. දෙවෙනි ලෝක යුද්ධ කාලෙන් පසු අපේ ගම්වලට සහන සේවා සැපයුම් මධ්‍යස්ථානයක් වූවේද ගමේ පාසලයි. පොදු රැස්වීම් ශාලාව වූයේද එයයි.

අපේ ගම්වල තිබූ නාට්‍ය ශිල්ප, හරඹ, අංගම්, මල්ලව පොර වැනි විද්‍යාවන් උගැන්වූවන්ද ගුරුඋතුමන්ව සැලකූහ. වෙද ගුරු උතුමන්ද ගෝලබාලයන්ට සිය දරුවන්ට මෙන් තමන් දත් දේ කියා දුන්නේය. සිසු සිසුවියෝ ගුරුවරුන්ට මවකට පියකුට සේ සැලකුම් ලැබුම් කළෝය.

සමස්තව බලන විට එදා අපේ ගමේ අධ්‍යාපන ක්‍රියා පිළිවෙත පොත පත මුල් කොටගත් සිද්ධාන්ත පමණකට සීමා නොවිය. හැම ඉගැන්වීමක්ම අවසන් වූවේ ප්‍රායෝගික අත්විඳීමකින්ය. ක්‍රියාකාරිත්වයකින්ය. එදා ගමේ පැවති ඉගැනුම් පිළිවෙතේ යහගුණ යටපත් කිරීම නිසා වර්තමානයේ සිසු, ගුරු, මවුපිය සහ සම්බන්ධතා බිඳ වැටී ඇත. මිනිස්කම්වලින් ඈත් වූ යකඩ යන්තර සමාජයක් මේ වන විට බිහිවෙමින් පැවතීමට මෙයද ප්‍රබලම හේතුවක් වී ඇතැයි හැඟේ.

සෞන්දර්යය පිළිබඳ බෞද්ධ මතය



■ පී. ඩී. සුමිත් ද සිල්වා

බුදුදහම සිය දර්ශනයේ පදනම කරගනු ලබන්නේ ත්‍රිලක්ෂණය, චතුරාර්ය සත්‍ය වැනි ගැඹුරු ලෞකිකත්වය ඉක්මවා ගිය යථාර්ථවාදී ස්ථාවරයන්ය. එබැවින් එබඳු ස්ථාවරයන් තුළ සිට කලාත්මක සෞන්දර්ය ආශ්වාදයක් බෞද්ධයන්ට අත්විඳින්නට හැකිදැයි බොහෝ විචාරකයෝ විමසති. එපමණක් නොව පිළිකුල් භාවනාව වඩමින් ගීතයක් රස විඳින්නේ කෙසේදැයි ඔවුහු උපහාසයෙන් අසති. මෙම කේන්ද්‍රීය දර්ශනයේ වරදවා ගැනීම හේතුවෙන් හා බුදුදහම සර්ව අශුභවාදයක් ලෙස සැලකීම හේතුවෙන් අප ආරම්භක පියවරම වරදවා ගෙන ඇති බව දක්නට ලැබේ. එබැවින් බුදුදහම සෞන්දර්යය පිළිබඳ දක්වන ආකල්පය කෙබඳුදැයි වටහා ගැනීම වැදගත් වනු ඇත.

සෑම දෙයක් පිළිබඳවම දක්වන බුදුදහමේ යථාර්ථවාදී රීතිය සෞන්දර්ය කෙරෙහි වෙනසකින් තොරව දක්වයි. සතිපට්ඨාන සූත්‍රයේ දක්නට ඇති 'සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති - සරාගී සිතක් ඇති වූ කල්හී එය සරාගී සිතක් බව යථාර්ථවාදීව අප අවබෝධ කරගත යුතුය'. එබඳු සිතුවිලි ඇතිවීම මානුෂික ස්වභාවය මිස අපරාධයක් සේ බුදුදහම නොදකී.

බුදු දහම 'ලස්සන' ලස්සන ලෙස අත්විඳී. අත්දකී. එක් පැත්තකින් ඇති දේ ඇති සැටියෙන් (යථාභූතවාදී) පිළිගැනීම, දැකීම බුදුසමයේ ප්‍රමුඛ ලක්ෂණයක් වන අතර යථාර්ථවාදී අර්ථපූර්ණ ආනන්දනීය ප්‍රඥාව බුදුසමය බැහැර නොකරයි. සරාගී ලොවක් තුළ විරාගී සෞන්දර්යාත්මක චින්දනය අනුමත කිරීමම බුදුදහමේ ඇති අපූර්වත්වයයි.

සෑම කලාත්මක රසවින්දනයකින්ම රසවිඳින්නාගේ ඥානය අවදිකොට, ප්‍රඥාව කරා රැගෙන යෑම කලාවේ පරමාර්ථය විය යුතුය. 'කලාව කලාව සඳහා නොව කලාව මිනිසා සඳහාය' යන ඉදිරි පියවරට දැන් ලෝකය යොමුව ඇත. 'කලාව යනු ආනන්දයෙන් ප්‍රඥාවට යන්නක්' ය ලෙස ආනන්දවර්ධනගේ කියමන සදාකාලයට ගැලපෙන්නකි.

ත්‍රිලක්ෂණය වැනි දර්ශනයක් උගන්වන බුදුදහම සෞන්දර්ය අත්විඳින්නේ කෙලෙසින්ද යන්න අප විමසා බැලිය යුතුය. සංයුක්ත නිකායේ සඳහන් වන මෙම ගාථාව බෞද්ධ සෞන්දර්යයේ පදනම ලෙස සැලකිය හැක.

නතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සංකප්පරාගො පුරිසස්ස කාමො
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ
අථෙථ ධීරා විනයන්ති ඡන්දන්ති

ලොව විසිතුරු දේ කාම වස්තු නොවේ. පුද්ගලයාගේ රාග සංකල්පයම කාමය වේ. ලෝකයේ විසිතුරු දෑ එසේම පවතින අතර ප්‍රභූවන්තයෝ එහි ඇලීම දුරු කරයි. එබැවින් ලෝකයේ ඇති සෞන්දර්යය හෙවත් විසිතුරු දෑ සරාගී නොවේ. අපගේ හෙවත් මනුෂ්‍යයාගේ හැඟීම්හි ඇති දුර්වලතාවය හේතුවෙන් ඒවා සරාගී බවට අප පෙරළා ගනී.

ලෝකය අපූර්ව වස්තු නිර්මාණය කොට ලොවට දායාද කරති. මනුෂ්‍යයෝ ඒවා සිය රුචිකත්වයට අනුව රස විඳිති. ඒවා සරාග ික හෝ විරාගික බවට පත්වන්නේ පුද්ගලයා වින්දනය කරනු ලබන ආකාරයටය. කෘතියක් මනසින් ග්‍රහණය කොට තෘෂ්ණාවෙන් පීඩිතව රස වින්දනය කරනවාට වඩා එම ග්‍රහණයෙන් තොරව නොඇලී නොගැටී විඳීම සැබෑ රසාස්වාදය වේ. සඳකඩපහනේ ඇති සෞන්දර්යය අත්විඳින්නට එය මගේ යන මමත්වයෙන් අත්පත් කරගත යුතු නැත. මලක සොඳුරු බව අත්විඳින්නට මල තලා පෙළා නෙළා ගත යුතු නැත. එසේ කරන්නේ නම් අප විඳින්නේ සෞන්දර්යාත්මක රසාස්වාදයක්දැයි අප සිතා බැලිය යුතුය.

බුදුදහම මෙහිදී අවධාරණය කරනුයේ තණ්හා, දිට්ඨි, මාන යන මමත්වයෙන් තොරවූ නිදහස් මනසකින් යුතු රසාස්වාදයයි.

බුදුදහමට අනුව 'රූණ්ණමිදං භික්ඛවේ අරියස්ස විනයේ යදිදං ගීතං' ආර්ය විනයේ ගීතය වැලපිල්ලක් හා සමානය. 'උම්මත්තකවිදං භික්ඛවේ අරියස්ස විහයේ යදිදං නච්චං' ආර්ය විනයේ නර්ථනය උමතුවක් වැනිය. මේ විග්‍රහයන් කිසිදු වරදක් නොවන්නේ මෙහි ඇති අරියස්ස විනයේ ආර්යයන්ගේ විනය වදන හේතුවෙනි. විමුක්තිය සඳහා වෙහෙසෙන පුද්ගලයා මෙබඳු ලෞකික ක්‍රියාවන් සමග සම්බන්ධ නොවීම සාධාරණය. එසේ වූ පමණින් සෞන්දර්ය බැහැර කිරීමට තරම් බුදුදහම අන්තගාමී නොවේ. නිවන් මග එකක් බවත් ලාභ ලබන මග අනෙකක් බවත් බුදුදහම අවධාරණය කරයි. (අඤ්ඤාහි ලාභූ පනිස. අඤ්ඤා නිබ්බාන ගාමිණී). එහෙත් නොඇලීම, උපාදානයෙන් තොර සෞන්දර්යය හෙවත් සොඳුරු බව රහතන්වහන්සේට වුවද විඳිය හැකි බව ථේර ථේරී ගාථා තුළින් අපට පැහැදිලි වේ. වින්දනයේ අවස්ථා දෙකක් ඇත. එනම් ආමිස හා නිරාමිස යනුවෙනි. මෙහිදී සෞන්දර්ය රසාස්වාදයේදීද නිරාමිස වූ ප්‍රීතිය බුදුසමයේ පැසසුම් ලබා ඇත.

බර්ට්‍රෝල් බ්‍රෙෂ්ට් නම් ජර්මන් නාට්‍ය රචකයා පවසනුයේ 'ප්‍රේක්ෂකයා නාට්‍යයක් නරඹන විටදී තමන් නාට්‍යයක් නරඹනවා යන හැඟීමක් නරඹන්නා තුළ තිබිය යුතු අතර අප චරිතවලට ආරෝපණය නොවිය යුතුය' යන්නය. එය ප්‍රායෝගික රසවින්දනය වේ. වරක් පේරාදෙණිය සරසවියේදී මනමේ නාට්‍ය රඟදැක්වූ විටදී ප්‍රේක්ෂකයන් මනමේ කුමරයට නින්දා අපහාස කළ බව සරච්චන්ද්‍රයන් සඳහන් කොට ඇත. ඒ ප්‍රේක්ෂකයා අන්තගාමීව චරිත කෙරෙහි ඇලී හැඟුම්බර වීම හේතුවෙනි. යථාර්ථය වසන් වූ බැවිනි. අදද ඉන්දීය බොලිවුඩ් සිනමාවේ ප්‍රේක්ෂක ප්‍රතිචාරය යථාර්ථවාදී නොවේ. ඔවුන් චිත්‍රපටයේ වීරයාගේ අනිවාර්ය ජයග්‍රහණය බලාපොරොත්තු වේ.

සක්ක පඤ්හ සූත්‍රය බෞද්ධ සෞන්දර්ය අධ්‍යයනයේදී ඉතා වැදගත් අවස්ථාවකි. පඤ්චසිඛ නම් ශක්‍ර දේවේන්ද්‍රයාගේ ප්‍රධාන වීණා ශිල්පියා සිය පෙම්වතිය වන සූරියවච්ඡසාව අභිමිවීමේ විරහ වේදනාවෙන් වීණාව වයමින් ගීයක් ගැයුවේය. එහි පද කිහිපයක් මෙසේය.

යම් වරයක් දෙන්නේ නම් සක් දෙවිඳුන් මට
පතන්නේ ඔබමය සොඳුරිය
මල්පෙති ඇතිරූ රොන් සුනු අතුල
සිහිල් පැන් පොකුණක
ග්‍රීෂ්මයෙන් යුත් ඇතෙකු ගිලෙන්නාක් මෙන්
මමද ඔබගේ පියයුරු අතරේ ගිලෙමි

මෙම සරාගී ගීත ගායනය බුදුරදුන් අසා සිට එය අසිඤ්කිත ගායනයක් යැයි බැහැර නොකළේය. ප්‍රශංසා කරමින් සඳහන් කළේ ගීත ස්වරය සහ ශබ්ද ස්වරය එකිනෙකට මැනවින් ගැලපෙන බවය. එබැවින් මෙම සුමියුරු වූ වීණා නාදය හා විරහ ගීතය බුදුරදුන් පිළිකෙව් නොකරනු ලැබුවේ පෘථග්ජන ලෝකය තුළ මනුෂ්‍ය ස්වභාවය බුදුරදුන් දත් බැවිනි.

වරක් කුටිකණ්ණ සොණ තෙරුන් මිහිරි සරින් අට්ඨක වග්ගයේ ගාථා ගායනා කළ කල්හී එය අතිශයින්ම මිහිරි හඬින් දේශනා කළ බව දක්වමින් ප්‍රශංසා කළේය. ලකුණ්ඨක භද්දිය තෙරුන්ට ප්‍රදානය කළ තනතුර වූයේ මිහිරි හඬින් දම් දෙසන්නවුන් අතර ප්‍රමුඛ යනුවෙනි. එබැවින් මිහිරි බව සොඳුරු බව බුදුදහම ප්‍රතික්ෂේප නොකරයි.

මහා පරිනිබ්බාන සූත්‍රයේ

රමණීයං ආනන්ද වේසාලිං, රමණීයං උදේන චේතියං, රමණීයං ගෝතමක චේතියං, රමණීයං සන්තම්බ චේතියං... යනුවෙන් එම ස්ථාන රමණීය බව නොවලහා ප්‍රකාශ කළේය. එබැවින් රම්‍ය වූ දේ රම්‍ය ලෙසත්, එසේ නොවන දේ එසේ නොවන බවත් බුදුසමය යථාර්ථවාදීව ප්‍රකාශ කළේය. මිනිසුන් ආශ්වාදනීය වූ දෙයක් ආශ්වාද කරනුයේ එහි ආශ්වාදයක් ඇති බැවින් යැයි බුදුරදුන් පිළිගනී. එහි ඇති ආදීනවය හා නිස්සරණය දක්වා යන යථාර්ථවාදී සෞන්දර්ය චාරිකාවකට එක් නොවීම හේතුවෙන් මිනිසා දුකට පත්වේ. එබැවින් ප්‍රේක්ෂකයා යථාර්ථවාදී කලාකෘතීන්ට වඩා සුබාන්ත කලා කෘතිම බලාපොරොත්තු වේ.

රමණියානි අරඤ්ඤාණි - යත්ථ න රමතී ජනො
විතරාගා රමෙස්සන්ති - නතෙ කාම ගවෙසිනො

'ජනයා නොඇලෙන්නා වූ රමණීය වූ වන ලැහැබේ විතරාගීන් රමණය කරන බව' මෙයින් දක්වයි. විහඟ තුඩකින් ගිලිහෙන විහඟ ගීතයක, ලපළු සෙලවී ඇසෙන සිහින් ස්වරයක, ගලා බසින සිහිල් දිය කඳුරක, අතු අග සිනාසී නටන මලෙක මෙලෙක සහ ගසකින් පරවී ගිලිහෙන මලෙකත් ඇති අරුමය දක්නට හැකියාව ඇත්තේ සන්සුන් වූ සමාධිගත අර්ථවත් රසවින්දනයක් ඇති නිහඬ සෞන්දර්යාත්මක හදවතකට පමණි. බෞද්ධ සෞන්දර්යවාදය අප කැඳවාගෙන යනු ලබන්නේ එබඳු නිරාමිස වූ හදවතින් වැලඳ ගන්නා වූ අවස්ථාවන් කරාය.

'කළු වලාකුලෙන් තැති ගෙන සුදු පියාපත් විදා කොකුන් පියා සලා සැඟවෙන්නට යන විට අප්කරණී නදිය මගේ සිත ගනී'. විරාගී භික්ෂුණියකගේ මුවින් ගිලිහුණු මෙම උදාන ගීයෙන් ඇය විඳි අපූර්ව නිරාමිස සෞන්දර්ය කෙබඳුදැයි අපට හඳුනාගත හැකිය. රුවින් දුටුවන් මන්මත් කළ අම්බපාලි තෙරණිය යථාර්ථය අවබෝධ කරගනු ලැබීමෙන් පසු සරාගී ලොව තුළ ඇති යථාර්ථය දෙස සෞන්දර්යාත්මකව දක්වන ආකල්පය බෞද්ධ සෞන්දර්යවාදය පිළිබඳ ඉඟියක් ලබා දෙන්නකි. වෙනදා පැන් පිරුණු පෙරහන්කඩ සේ වූ වාගේ පියයුරු දැන් පැන් සිඳීගිය පෙරහන්කඩ සේය. මෙයින් රහත් මෙහෙණියකගේ සෞන්දර්යාත්මක ප්‍රතිභාව හඳුනාගත හැකිය. සැබැවින්ම ථේර-ථේරී ගාථා යනු විමුක්තිය පසක් කළ තරුණ තරුණියන්ගේ අව්‍යාජ වූ සෞන්දර්යාත්මක භාව ගීතාවලියකි. ආනන්දයෙන් ප්‍රඥාවට පිය මනින මග එහි මැනවින්ම විචිත්‍ර ලෙස චිත්‍රණය කොට ඇත.

පරමක්ඨ ජෝතිකා අටුවාව පවසන්නේ කෙතක් රැකි කතක් ගැයූ දහම් ගීයක් අසා සැට නමක් රහත් වූ බවය. එහිදී ගයන්නා කවුද නොව ගයන්නේ කුමක්ද යන්න පමණක් එම භික්ෂූන් අවධානය යොමු කොට ඇත. කලා කරුවා නොව කලා කෘතිය කුමක්දැයි යන්නය වැදගත් වනුයේ. ධම්මපදය උපමා උපමේය, පද බන්ධනය, යථාර්ථවාදී බව යන අංශ අතින් වෙනත් කිසිදු කාව්‍යයකට නොදෙවෙනි යථාර්ථය පසක් කරවන මනහර මහා කාව්‍යයකි. චුද්දක නිකායේ සුන්න නිපාතයේ රතන සූත්‍රයේ ස්වභාව සෞන්දර්ය වර්ණනාව, කාළදායි තෙරුන් කිඹුල්වත් පුරය දක්වා මග දෙපස පිළිබඳ කෙරෙන වැනුම අතිශය මනෝහර ස්වභාව සෞන්දර්ය වර්ණනාවකි.

මීට අමතරව බුදුදහම ව්‍යාප්ත වූ සෑම රටකම පාහේ බෞද්ධ දර්ශනයෙන් හික්මවනු ලැබූ කලාකෘති බෞද්ධ සෞන්දර්යවාදයේ හාස්කම් පිළිබඳ කියාපායි. ලංකාවේ අවුකන, සමාධි බුදුපිළිම ඇෆ්ගනිස්ථානයේ බාමියන් බුදුපිළිම, මථුරා, සාරානාත් බුදුපිළිම, සාගර පරයන මහවැව්, නිර්මාණශීලී වාපී ගල්තලා මත පිපුණු මල් කැටයම්, සඳකඩපහණ නිහඬව කියාපාන්නේ බෞද්ධ සෞන්දර්යයේ නිරාමිස අපූර්වත්වය නොවේද. බෞද්ධ සාහිත්‍යයේ උපන් ගීත, නවකතා, කාව්‍ය, චිත්‍රපට, නාට්‍ය මේ සියල්ල යථාර්ථවාදී සෞන්දර්යයේ බෞද්ධ ලකුණුය. මහා කළුගල් පර්වතයන්ට කරුණාව, දයාව, මෛත්‍රිය, ආදරය මුසු කරනු ලැබුවේ

48 වන පිටුව බලන්න

Saliroo Creations

All Your Publishing Needs under one roof

Graphics
Illustrations, Logos,
Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා

Tel : 416 201 0628

French Tutoring
Individual and small group classes for French learners'French reading, writing, and conversing'Any grade from grade 1-12, university minors and French Immersion

Kumudu Abeywardena, B.A
(Modern Languages), Dip (AFC)

T.P - 647 824 1897

MARRIAGE PROPOSALS

G/B Respectable parents residing Colombo suburbs, seek educated partner for their daughter (1982) and looks much younger to her age. She obtained MSc from UK university, and inherits substantial assets. Father held very senior position in banking sector. Flexible to settle down SL or abroad. Please reply with family details preferably with a recent photograph.

Please email:wish8e@gmail.com

කැනඩා පුරවැසිභාවය හිමි, ටොරොන්ටෝ පදිංචි, සිංහල, බෞද්ධ (ගොවිගම) පවුලක, 24 වියැති දියණියට සුදුසු සහකරුවෙක් සොයයි. උස 5' 4" සිහින්, පැහැපත්, රූමත්. කැනඩාවේදී B.Sc **සමත්ව රැකියාවක් කරයි.** Canada/ USA / Sri Lanka **පදිංචි පුතෙක් විශේෂයි.**

sldasatha18@gmail.com

පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි

ටිකට් නැතිව යන හැටි

විදේශික මිතුරන් දෙදෙනෙක් කොළඹ සිට මහනුවර යෑමට දුම්රිය ස්ථානයෙන් ටිකට් පත් දෙකක් මිලට ගනු ලැබීය. ඒ සමගම ලාංකික මිතුරන් දෙදෙනෙක්ද පෝලිමේ සිට එක් ටිකට් පතක් පමණක් මුදල් ගෙවා ගනු ලැබූ බව විදේශීය මිතුරන් දිටීය. එක් ටිකට් පතකින් දෙදෙනෙකු ගමන් කරනුයේ කෙසේදැයි විදේශිකයන් දෙදෙනාට මහත් ගැටලුවක් විය. එබැවින් ඔවුන් දෙදෙනාද පෙර කී ලාංකීය මිතුරන් දෙදෙනා අසල හිඳ ගත්හ. දුම්රිය ගමන ආරම්භ කොට ටික දුරක් ගිය පසු අතරමග ස්ථේෂමකදී ඊට ගොඩ වූ ප්‍රවේශ පත්‍ර පරීක්ෂා කරන නිලධාරීන් ප්‍රවේශ පත්‍ර පරීක්ෂා කරමින් ඉහත මිතුරන්ගේ මැදිරියට පැමිණුනු දුටු ලාංකීය මිතුරන් දෙදෙනාම අසල වූ වැසිකිළියට රිංගා දොර වසා ගනු ලැබීය. පරීක්ෂකවරුන් දෙදෙනෙකු විදේශීය මිතුරන්ගේ ටිකට් පරීක්ෂා කොට යන ගමන වැසිකිළියේ දොර වසා ඇති බැවින් ඊට තට්ටු කරන ලදුව යම්තමින් එහි දොර විවෘත කළ එක් අයෙක් ටිකට් පත දිගු කළ අතර එය බලා ඔවුන් පිටත්ව ඊළඟ මැදිරියට ගියහ.

එක් ටිකට් පතකින් ගමන් කරන අයුරු අධ්‍යයනය කළ විදේශිකයන් නුවර සිට ආපසු එන ගමනේ එම ක්‍රමය අනුගමනය කිරීමට ඉටාගෙන නුවරින් පිටත්වීමට කොළඹට එක් ටිකට් පතක් ගත් අතර ලාංකීය මිතුරන් දෙදෙනා ටිකට් නොගෙනම එනු දැකීම විදේශික මිතුරන්ට ඊටත් වඩා ගැටලුවක් විය. එම ක්‍රමයද ඉගෙන ගැනීමට ආපසු ගමනේදීද ඔවුන් අසල අසුනේ හිඳ ඉතා විමසිල්ලෙන් ගමන ඇරැඹීය. සුපුරුදු පරිදි ටික දුරක් එන විට පරීක්ෂකවරුන් ටිකට් පරීක්ෂාවට එම මැදිරියට පැමිණියහ. වහා ක්‍රියාත්මක වූ විදේශිකයන් දෙදෙනාම අසළ වූ වැසිකිළියට රිංගා දොර වසා ගෙන සිටි අතර ලාංකීය මිතුරකු ද වහාම එම දොරට තට්ටු කළ අතර එක් විදේශික මිතුරකු ටිකට්පත දිගු කර දුනි. එය ගත් අපේ මිත්‍රයා විරුද්ධ පැත්තේ වූ වැසිකිළියට අනෙක් මිතුරා සමඟ රිංගා ගත්හ.

ටිකට් පරීක්ෂාව අවසන් යැයි සිතූ විදේශික මිතුරන් දෙදෙනා වැසිකිළියෙන් එළියට ආ අතර ඔවුන් දෙදෙනා නියම ටිකට් පරීක්ෂකවරුන් ටිකට් නොමැතිව ගමන් කරන අය ලෙස අල්ලාගත් අතර අපේ මිතුරන් දෙදෙනා පෙර පරිදිම දොර අස්සෙන් විදේශියාගෙන් ගත් ටිකට් පත දී බේරුණි. අවසානයේ විදේශිකයන් දෙදෙනා අත්අඩංගුවට ගත් අතර ලංකාවෙ මිතුරන් දෙදෙනා කොළඹ කොටුවෙන් බැස සිනාසෙමින් පිටව ගියහ.

ඔට්ටුව

එක්තරා පුද්ගලයෙකු දිනපතාම පාහේ එම බැංකුවට පැමිණ තම ගිණුමේ විශාල මුදලක් තැන්පත් කර යනු බැංකු කළමනාකරු විසින් නිරීක්ෂණය කරන ලදී. බැලූ බැල්මට ඔහුට එතරම් වත්කමක් ඇතැයි හැඟී නොගිය බැවින් දිනක් කළමනාකරු එම ගනුදෙනුකරු සමඟ කතා කිරීමට සිතා මුදල් තැන්පත් කර යනු දුටු විට ඔහු අමතා ඔහුගේ තොරතුරු විමසීය.

ඔහුගේ නම ගම විමසා රැකියාවක් හෝ ව්‍යාපාරිකයෙක්දැයි විමසූ විට තමා කිසිත් රැකියාවක් නොකරන බව පැවසීය. තවද තමා ව්‍යාපාරිකයකු නොවන වගද හෙළි කළේය.

"ඉතින් ඔබට එතරම් මුදල් කොහින්ද?" කියා විමසූ විට තමා ඔට්ටු අල්ලා දිනූ පසු එම මුදල් බැංකු ගත කරන බව පැවසීය.

"ඉතින් ඔයා හැමදාම දිනනවද? පරදින්නෙම නැත්ද?" යනුවෙන් කළමනාකරු විමසූ විට හූඟාක් වෙලාවට දිනනවා යනුවෙන් පැවැසීය. "මොන විදියේ ඔට්ටුද අල්ලන්නේ?" ආදි නොයෙක් තොරතුරු විමසීමට කළමනාකරු පෙළඹී අවසානයේ බැංකු කළමනාකාර මහතා සමඟද ඔට්ටුවක් ඇල්ලීමට දෙදෙනාම එකඟ විය.

"හොඳයි මැනේජර් මහත්තය ඔට්ටුවක් අල්ලමු" කී ගනුදෙනුකරු "ඔබතුමාගේ පිටේ ලබන සතියේ අද වගේ දවසක ඒ කියන්නේ දින හතකින් සැරව ගෙඩියක් එන බවට ඔට්ටුයි" කළමනාකරු තිගැස්සී "ඒ කොහොමද?" කියා පිටද අතගා "ඔව් ඔට්ටුයි නැතුවට. කීයක්ද?"

"රු. 10,000 ක් ඔට්ටුයි ගෙඩියක් එනවාමයි. බලමු එහෙනම් මම ලබන සතියේ මේ වෙලාවටම මෙතනට ඇවිත් බලනවා" කියා ගිවිස ගෙන පිටත්ව ගියේය.

කෙසේ වුවද බැංකු කළමනාකාර මහතා දිනපතා පිට අතගා ගෙඩියක් ඒදැයි මහත් බියෙන් පසුවී නියමිත දින එන තෙක්ම සිටි නමුත් ගෙඩියක් නම් ආවේ නැහැ. නියමිත දින නියමිත වේලාව එන තෙක් මහත් නොඉවසිල්ලෙන් සිට හරියටම වේලාවට පෙරකී ඔට්ටුකරු නැත්නම් ගනුදෙනුකරු කළමනාකාර මහතාගේ කාමරයේ පෙනී සිටි විට කළමනාකාර මහතා මහත් උපාරුවෙන් ගෙඩියක් නැති බව පැවසීය.

එවිට ගනුදෙනුකරු "වෙන්න බෑ. ෂර්ට් එකයි බැනියමයි ගලවලා හොඳට බලමු" යැයි යෝජනා කළ සැනින් කළමනාකරු ඒවා ගලවා නියමිත ස්ථානය පෙන්වීය. ගෙඩියක කිසිදු සලකුණක් නැති බව කී ගනුදෙනුකරු රු. 10000 ක් දී එළියට ගොස් ඒ සැණින් රු. 50000 ක් තැන්පත් කිරීමට පැමිණි බව කළමනාකරුට දැන්වීය. එවිට එම මුදල් ලැබුණු ආකාරය විමසූ විට ගනුදෙනුකරු කීවේ මේ දැන් තමා අල්ලූ ඔට්ටුවක් දිනූ බවය. ඔට්ටු ගැන මහත් උනන්දුවකින් පසු වූ කළමනාකාර මහතා ඒ පිළිබඳ විමසන ලදුව ගනුදෙනුකරු කියා සිටියේ තමා අද දින මේ වෙලාවට බැංකුවේ කළමනාකාර මහතාගේ ෂර්ට් එක සහ බැනියම ක්ෂණිකව ගලවන බවට අල්ලූ ඔට්ටුව තමා දිනූ බැවින් එළියේ බලා සිටි මහතා පරාද වී තමා දිනූ රු. 50000 දුන් බවය. බැංකු කළමනාකාර මහතාගේ ඇස් උඩ සිට වී හීන්දාඩිය දමන්නට විය.

අශ්වයාගේ වලිගය උස්සා වේලාව පැවසීම

අශ්වයකු පිට නැගී දීර්ඝ ගමනක යෙදී සිටි මිනිසෙක් රාත්‍රිය ගතකිරීම සඳහා අම්බලමක් වෙත පැමිණියා. එදින සවස ඔහු මිදුලේ තිබූ ගසක අශ්වයා බැඳ තබා වී අසල වැතිර සිටියා. ඔහුට තරමක් එහායින් තවත් මිනිසෙක්ද තම අශ්වයා ගසක බැඳ තබා වී අසල වැතිර සිටියා. ටික වේලාවකට පසු පළමු මිනිසා දෙවැන්නාගෙන් වේලාව කීයදැයි ඇසීය. එවිට ඔහු තම අශ්වයාගේ වලිගය උස්සා හතරහමාරයි යැයි පැවසීය.

පසුදා අවදි වූ දෙදෙනා අම්බලමෙන් පිටවී ගොස් එදින සවසද ආපසු එම අම්බලමටම පැමිණ කලින් දවසේ මෙන් අශ්වයන් දෙදෙනා ගස් දෙකේ බැඳ වී අසල වැතිර සිටියා. වී දිනත් පළමුවන මිනිසා දෙවැන්නාගෙන් වේලාව කීයදැයි ඇසීය. එවිට ඔහු තම අශ්වයාගේ වලිගය උස්සා පහමාරයි පැවසීය. මෙයින් පුදුමයට පත් පළමුවන මිනිසා මේ අශ්වයා පුදුම අශ්වයෙක් විය යුතු යැයි කල්පනා කළා. මෙහි අබිරහස කුමක්දැයි දැන ගැනීම සඳහා ඔහු මෙසේ ඇසීය.

"මං රෑයෙත් වෙලාව ඇහැව්වහම ඔහේ අශ්වයාගෙ වලිගය උස්සල වේලාව කිව්ව. අදත් ඌගෙ වලිගය උස්සල වෙලාව කිව්ව. මූ පුදුම අශ්වයෙක් වෙන්න ඕනෑ"

"මුගෙ ඇති පුදුමයක් නෑ. පේනව නේද අර එපිට තියෙන ඔරලෝසු කණුව. මුගෙ වලිගෙන් වැහිල හින්ද මං ඉන්න තැනට ඒ ඔරලෝසුව පේන්නෙ නෑ. වලිගෙ ඉස්සුවහම තමයි ඒක පේන්නෙ" දෙවන මිනිසා පිළිතුරු දුනි.

48 වන පිටුව බලන්න

පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි

රහතන් බඳ පිරික්සීම !

කලින් කලට විවිධ වූ මාතෘකා ඔස්සේ දිගින් දිගට දිව යන කතාබහ අපේ රටට නුහුරු නොවෙයි. අතීතයේදී කටින් කට පමණක් පැතිරුණු මේ කතා බහ අපේ රට තුළ සිටින අයටම පමණක් සීමා විය. නමුත් අද වන විට තාක්ෂණයේ දියුණුවත් සමග එම කතාබහ ලෝකයටද පැතිර ගොස් ඇත. සමාජ ජාල වෙබ් අඩවිවල සිටින්නන් ඒවා තව තවත් වර්ණවත් කොට, රසවත් කොට බෙදා හරියි. මෙවැනි කතාබස්වලදී ආගම ධර්මයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මෑතකදී එසේ පැතිර ගිය කතාබහ අතර මාර්ගඵල ලබාගත්තා යැයි පවසන ගිහියන් මෙන්ම පැවිද්දන් පිළිබඳවද නිතර නිතර අපට අසන්නට දකින්නට ලැබුණි. මේ ලිපිය එසේ වන්මනේ රහත් වූවා යැයි පවසන අය පිළිබඳව නොවෙයි. බුදුන් දවස සිටි හිමිනමකගේ රහත් බව පිරික්සූ අයුරක් පිළිබඳවයි.

■ **අනුෂි තිසාරා කාරියවසම්**

බුදු දහමට අනුව කෙනෙකුට පත්විය හැකි ඉහළම තත්ත්වයන් තුන වන්නේ බුදු, පසේ බුදු හා මහරහත් යන අවස්ථාවන්ය. රහත් බව හා රහතුන් වහන්සේලා පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ නිතරම සඳහන් වී ඇති අතර මෙරට වංශකතා හා අටුවා ග්‍රන්ථයන්හිද මෙරට වැඩ සිටි රහතන් වහන්සේලා පිළිබඳ තොරතුරු විශාල ප්‍රමාණයක් සඳහන් වේ. එහෙත් වංශකතා හා අටුවාවල උන්වහන්සේලා පිළිබඳව සඳහන් වන සමහර තොරතුරු සියුම් ලෙස පරීක්ෂා කර බැලීමේදී උන්වහන්සේලා සැබෑවටම රහත්ද නැතහොත් තත් ග්‍රන්ථ කර්තෘන් විසින් අතිශයෝක්තියට නගා රචනා කරන ලද්දක්ද යන ප්‍රශ්නය මතුවේ.

අනුරාධපුරයේ එකල වැඩ සිටි රහතන් වහන්සේලා ගැන සඳහන් කිරීමේදී එම සංඛ්‍යාව කොතෙක්දැයි දැක්වීමට සමහර ග්‍රන්ථ කතුවරුන් උත්සාහ ඇත්තේ එම ප්‍රදේශයේ කාන්තාවකට වී පැදුරක් එලා වේළා ගැනීමට නොහැකි තරමට සෘද්ධියෙන් අහසින් වඩින රහතන් වහන්සේලාගේ සෙවණැලි නිරන්තරයෙන්ම මිහිතලය මතට වැටෙන බවයි.

පුරාණයේ භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා ධූතාංග ධාරී භික්ෂූන් වශයෙන්ද හඳුන්වනු ලැබීය. ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා බොහෝ සෙයින්ම ගිහියන් ඇසුරු කරමින් ඔවුන්ගේ ලෞකික අවශ්‍යතාවන්ට ආගමික අංශයෙන් ලබාදිය හැකි උපදෙස් යනාදිය ලබාදීමෙන් ඔවුන් හා සම්බන්ධව කටයුතු කරනු ලැබීය. එහෙත් ධූතාංග ධාරී භික්ෂූන් වහන්සේලා ලෞකික සම්බන්ධතා හැකි උපරිම මට්ටමින් ප්‍රතික්ෂේප කොට උතුම් නිවනම අරමුණු කොටගෙන වීර්යය කළ කණ්ඩායමක් විය. විශුද්ධිමාර්ගයේ එවැනි භික්ෂූන් වහන්සේලා විසින් පිළිපැදිය යුතු ධූතාංග ගණනාවක් සඳහන් වුවත්, ලංකාවේ ඉන් ජනප්‍රිය වී ඇත්තේ ආරඤ්ඤික හා පාංශුකූලික යන ධූතාංගයන්ය. ආරඤ්ඤිකයෝ ආරණ්‍යවාසී වූහ. එහෙත් පාංශුකූලිකයෝ නගරයට ආසන්න මහාවිහාරය, අභයගිරිය ආදි ආරාමවලද විසූහ.

රහතුන් වහන්සේලාගේ භාවනාවට සුදුසු ආරණ්‍ය සේනාසන වශයෙන් විශුද්ධි මාර්ගයේ ස්ථාන කිහිපයක් සඳහණි. දක්ෂිණගිරි විහාරය, හත්ථිකුච්චිය, මිහින්තල, සිතුල්පව්ව මේ අතරට වැටේ. පැරණියේ පැවති මෙවැනි භාවනා කරන ස්ථාන පියන්ගල් වෙහෙවර, පධානඝර හෝ පතනගල යනුවෙන් පොතපතෙහිත් ශිලාලේඛනවලත් හැඳින්වී ඇත. එවැනි පධානඝර පැවති ස්ථාන රාශියක් ලංකාවේ විවිධ ප්‍රදේශවලින් සොයාගෙන ඇති අතර එයින් වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ රිටිගල, අනුරාධපුරයේ බටහිරාරාමය, මානාකන්ද, හත්ථිකුච්ඡි, අරංකැළේ, වෙහෙරබැඳිගල ඇතුළු ස්ථානයන්ය. අද වුවද රිටිගල, අරංකැළේ ආදි ස්ථානයන්හි පිහිටි පධානඝරවලට පිවිසෙන්ම එහි ඇති පරිසරය අප භාවනානුයෝගී ලොවකට මොහොතකින් ගෙනයයි. එබඳු පරිසරයක් තුළ ක්ෂිණ ශ්‍රාවකයන් වහන්සේලා හෙවත් රහතුන් වහන්සේලා බිහිවීම බොහෝ සෙයින් සිදුවිය හැක්කකි.

අටුවාවල මෙන්ම පසුකාලීන ග්‍රන්ථවලද මෙරට වැඩ සිටි රහතන් වහන්සේලා සංඛ්‍යාත්මක වශයෙන් දැක්වීම දක්නට පුළුවන. ඒ අනුව සිතුල්පව්වේ රහතන් වහන්සේලා විසිහතර දහසක් වැඩ සිටි බව සඳහනය. එසේම එක් අවස්ථාවක අනුරාධපුරයේ මහා විහාරයේ දකුණු දොරටුවේ සිට රුවන්වැලිසෑය දෙස බලාගෙන එකම අවස්ථාවේ භික්ෂූන් වහන්සේලා තිස්දහසක් රහත්ඵලයට පත්වූ බව සඳහන් වේ. නමුත් ධර්ම විනයානුකූලව මේ කරුණු ඒ ආකාරයෙන්ම පිළිගැනීමේ අපහසුතාවක්ද ඇත.

රහතුන් වහන්සේලා පිළිබඳ විස්තර දැක්වීමට උදාහරණයක් වශයෙන් මනෝරථපූරණියේ හා සහලවත්ථුවේ විස්තර වන කුප්ජතිස්ස කතාව දැක්විය හැකියි. සීලහවත්ථුවේ එම නම සඳහන් වන්නේ කුණ්ඩලතිස්ස යනුවෙනි. මේ රහතන් වහන්සේ පිරිණිවන් පානා අවස්ථාවේ අධිෂ්ඨානයක් කළ බව පැවසේ. එනම් සද්ධාතිස්ස රජතුමා තමන්ගේ රහත් බව පිළිබඳව සැකයෙන් සිටින හෙයින් දේහය රැගෙන යන අවස්ථාවේ ප්‍රාතිහාර්යයක් පානා සේය. ඒ අනුව ථූපාරමයත්, ලෝවාමහාපායත් අතර ශිලාවේතිය තිබූ ස්ථානයෙන් දේහය ගෙන යන කල්හී ඊට ඉඩ ලබාදීම සඳහා ශිලාථූපය අහසට නැගී අනතුරුව පෙරහර එම ස්ථානය පසුකළ කල්හි බිමට බැස්ස බවය. එසේම දේහය රැගත් කුළුගෙය ලෝවාමහාපාය අසලදී අහසින් ගමන් කරන කල්හි මහාව්‍යාඝ්‍ර නම් රහතන් වහන්සේ ඒ හිමියන් සමඟ තමාත් පිරිනිවන් පෑම යෙහෙකැයි සිතා එම කුළුගෙයටම වැඩම කොට පිරිනිවන් පෑ සේක.

මෙවැනි කතා රාශියක් පොතපතෙහි සඳහන් වෙතත් ආචාර්ය වල්පොල රාහුල හිමියන් සඳහන් කරන්නේ බොහෝ අවස්ථාවලදී ශිලාවෘද්ධ, තපෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා හැඳින්වීම සඳහා රහතන් වහන්සේ යන නාමය පැරණි ලේඛකයන් විසින් යොදා ගන්නට ඇති බවය. එසේම අනුරාධපුර යුගයේදී මිස පොළොන්නරු, දඹදෙණි යුගවලදී එසේ රහතන් වහන්සේලා පිළිබඳ සඳහන් නොවීමත්, විමතියට හේතුවක් වේ. එයට හේතුව වශයෙන් අටුවාවල දැක්වෙන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් යම් කාලයකට පසු බුදුදහමේ ඇතිවන කිසියම් පසුබෑමක් හේතුවෙන් යළි රහතුන් වහන්සේලා බිහි නොවන බවය. එම අර්ථකතා පිළිගත් පොළොන්නරු හා දඹදෙණි යුගවල සාහිත්‍යකරුවන් අධි ශීලවත්ත භික්ෂූන් වහන්සේලාට රහතුන් යන වදන නොයොදා සිල්වත් බව හැඳින්වීම සඳහා රහතුන් සේ සිල්වත් යන වදන යෙදූ බව පෙනේ. නමුත් මූලික බුදුදහමට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුව ඕනෑම පුද්ගලයකුට වීර්ය හා උත්සාහය තුළින් රහත් ඵලයට පත්විය හැකිය. ඒ සඳහා කාල විරෝධයක් පැන නගින්නේ නැත.

එසේම ලංකාවේ වැඩ විසූ අන්තිම රහතන් වහන්සේ ලෙස සැළකෙන්නේ මලියදේව මහ රහතන් වහන්සේයි. එසේම මලියදේව රහත් නාමය අනුරාධපුරයට මෙන්ම රුහුණාටද සම්බන්ධ බව සඳහන් වී තිබේ. එසේම සියවස් කිහිපයක් තුළදීම උන්වහන්සේගේ නම සඳහන් වීම අනුව පෙනී යන්නේ මලියදේව රහත් නාමය භික්ෂූන් වහන්සේලා කිහිප නමකම හැඳින්වීම සඳහා යොදාගෙන ඇති බවයි.

මෙකී සමහර කතා පුවත්වල දැක්වෙන විශේෂතාවක් නම් සමහර භික්ෂූන් වහන්සේලා තමන් රහත් නොවී රහත් යැයි සිතා සිටි බවය.

උන්වහන්සේලා රහත් නොවන බව දැක්වීම සඳහා අනෙකුත් භික්ෂූන් වහන්සේලා විවිධ උපක්‍රම යොදා ඇත. එසේම එක් අවස්ථාවක එසේ රහත් යැයි සිතා සිටි සිල්වත් භික්ෂූන් වහන්සේ නමක් සත්‍ය වශයෙන්ම රහත්දැයි පිරික්සීම සඳහා උපක්‍රමයක් යෙදූ බව මජ්ඣිම නිකායේ සඳහනය. ඉහත කී ලෙස තමන් රහත් යැයි සිතා සිටි භික්ෂුවක් ඉදිරිපිට හිඳගෙන වසඟ රජතුමා විසින් වරෙක අච්චාරුවක් අනන්නට පටන්ගෙන ඇත. මෙය දුටු එම භික්ෂුවට නොදැනුවත්වම කෙළ උනන්නට පටන්ගෙන තිබේ. රහතන් වහන්සේ නමකට එලෙස රස තෘෂ්ණාව ඇති නොවන නිසා තමන් රහත් ඵලයට පැමිණ නැති බව දැන ගැනීමට එයින් එම භික්ෂුවට හැකි වී ඇත.

එසේම තමා රහත් යැයි සිතා සිටි එක් භික්ෂූන් වහන්සේ නමක් කැලණි ගඟේ ජලස්නානය කරමින් සිටියදී දීඝභාණක අභය නම් භික්ෂූන් වහන්සේ නමක් විසින් රහත් බව පරීක්ෂා කර ඇති බවද සඳහන්ය. ඒ සඳහා උපායක් යෙදූ උන්වහන්සේ එක් තරුණ භික්ෂු නමකට දිය යටින් පීනා ගොස් පාදයකින් අදින ලෙස උපදෙස් දුණි. එසේ කරත්ම කිඹුලෙකු තම පාදයෙන් අදිනවා යැයි සිතූ භික්ෂුව බියපත්ව මහ හඬින් කෑ ගැසීය. රහතන් වහන්සේලා තුළ බිය, දුක, කණගාටුව, සතුට ආදි වූ කිසිදු ආකාරයක හැඟීමක් ඇති නොවන නිසා තමා රහත් නොවන බව අවබෝධ කර ගන්නට ඒ හිමියන්ට හැකි වීය.

එසේම තවත් රහතන් වහන්සේලා තමන් රහත් බව බාහිර පුද්ගලයන්ට නොදැනෙන සේ සඟවා ගැනීමට උත්සාහ කිරීම ගැනද සඳහන්ය. උදාහරණ ලෙස ඉහතදී සඳහන් කළ කුප්ජතිස්ස රහතන් වහන්සේ හමු වී රාජ්‍ය පාලන උපදෙස් ලබාගැනීමට සද්ධාතිස්ස රජතුමාට උවමනාවී එම රහතන් වහන්සේ බැහැදැකීමට රජතුමා ගියත් තම රහත් බව සඟවා පෘථග්ජන භික්ෂුවක ලෙස හැසිරීම් කළ බව තත් ග්‍රන්ථයන්හි විස්තර වේ. එමගින් කුප්ජතිස්ස තෙරුන් උත්සාහගෙන ඇත්තේ ගිහියන්ට අයත් රාජ්‍ය පාලන කටයුතුවලින් ඉවත් වී සිටීමයි.

එක් එක් රෝගවලදී උණ යැගෙන විදිය වෙනස්

■ කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය පරාක්‍රම දිසානායක

අප අතර බෙහෙවින් දකින්නට ලැබෙන රෝග ලක්ෂණයක් තමයි උණ. එසේම එය රෝග ගණනාවකදීම මතුවන ප්‍රධාන රෝග ලක්ෂණයක්ද වෙනවා. එහෙත් ඒ විවිධ රෝග අවස්ථාවලදී උණ ඇති වන්නේ එකිනෙකට වෙනස් රෝග ලක්ෂණ රැසකුත් සමගයි. එබැවින් උණෙහි විවිධ මුහුණුවර පිළිබඳ දැනුවත් වී සිටීම වැදගත් වෙනවා.

පැය කීපයකට වරක් වක්වරම උණ ඇති වේ නම් ඒ සමඟ හිසරදය, කෑම අරුචිය, වමනය, මස් පිඬුවල හෝ සන්ධිවල වේදනාව, වියළි කැස්ස, නාසයෙන් සොටු දියර ගැලීම, අතීසාරය, උගුරේ වේදනාව, ඇඟපත රුදාව ආදිය ඇති වේ නම් ඊට හේතුව වෛරස ආසාදනයක් විය හැකියි. බොහොමයක් වෛරස ආසාදන නියමිත දින ගණන සම්පූර්ණ වූ විට සුව වෙනවා. මනා විවේකයත් සමඟ පැය කීපයකට වරක් (වෛද්‍ය නිර්දේශය මත) පැරසිටමෝල් වැනි වේදනා නාශකයක් භාවිත කිරීම ඊට ප්‍රමාණවත්. කෙසේ වෙතත් ඇතැම් වෛරස් ආසාදන වඩාත් ප්‍රබලව ඇති වීම සිදු වන නිසා ඒවාට නම් අතිරේක ඖෂධ මෙන්ම විශේෂ සත්කාරද අවශ්‍ය වෙනවා.

ප්‍රථම වරට උණ ඇති වන විට ඉහත සඳහන් කළ වෛරස් ආසාදනයකදී සාමාන්‍යයෙන් ඇති වන රෝග ලකෂණ ඇති වී ඉන් අනතුරුව දෙවන වර උණත් සමඟ විවිධ සංකූලතාද ඇති වේ නම් ඊට හේතුව ඩෙංගු උණ රක්තපාතයයි. (රක්තපාතය ඇති වූ විට නාසය, දත් මුල්, සම ආදී ප්‍රදේශවලින් ලේ ගැලීම සිදු වෙනවා) මෙසේ ඩෙංගු රෝග ලක්ෂණ පහළ වූ වහාම පමා නොවී වෛද්‍ය ප්‍රතිකාර කරා යොමු වීම අනිවාර්යයි. නැතහොත් මරණීය තත්ත්ව පවා උද්ගත විය හැකි වීම මීට හේතුවයි.

තදබල හිසරදය සමඟ බෙල්ලේ මස් පිඬුවල තද ගතිය ආලෝකය දෙස බැලීම අපහසු වීම, නිදිමත, වමනය. ක්ලාන්තය ආදී රෝග ලක්ෂණ පෙන්වයි නම් එයට හේතුව මෙනින්ජී ප්‍රදාහය විය හැකියි. මෙයද වහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත යුතු තත්ත්වයක්.

වෙව්ලීමක් සහිතව සෑම පැය 48 කට පමණ වරක් තද උණ ඇතිවීම මැලේරියා උණෙහි ප්‍රධාන රෝග ලක්ෂණයයි.

උදර වේදනාව, මළ ද්‍රව්‍ය සමඟ රුධිරය පිටවීම සමඟ උණද ඇති වුවහොත් ඊට හේතුව ඇමීබා අතීසාරයේ පසු අවස්ථාවක් වන අදාළ පරපෝෂිතයා අක්මාව වැනි වෙනත් ස්ථානවලටත් පැතිර යාම විය හැකියි.

උණත් සමඟ කොන්දේ පහළ කොටසේ වේදනාව, මුත්‍රා කිරීමේදී වේදනාව ඇති වීම, වමනය, ආදි ලක්ෂණවලට හේතු විය හැක්කේ වකුගඩු ආසාදනයයි.

උණත් සමඟ හුස්ම ගන්නා විට පපුවේ ඇති වන දරුණු වේදනාව, කැස්ස මෙන්ම හුස්ම ගැනීමේ අපහසුතා ඇති වේ නම් ඊට හේතුව නියුමෝනියාවයි.

සාපේක්ෂව දීර්ඝකාලීනව උණ ඇතිවීම (සාමාන්‍යයෙන් සති 3 ක් ඉක්මවා) උණසන්නිපාතය හෙවත් ටයිපොයිඩ් උණෙහි විශේෂ ලක්ෂණයක්. පළමු සතියේදී ක්‍රමයෙන් වැඩි වී දෙවන සතියේදී අඩු හෝ වැඩි නොවී ස්ථාවරම පවතින උණ තෙවන සතිය පමණ වන විට ක්‍රමයෙන් අඩු වී යාම එහිදී දැකිය හැකියි.

තද උණ සමඟ අධික ලෙස ඇති වන පේශී වේදනාව, ඇස් රතු වීම ආදිය මී උණ හෙවත් ලෙප්ටොස්පිරෝසිස් රෝගයේ ප්‍රධාන රෝග ලක්ෂණයි.

උණත් සමඟ සමේ බිබිලි ඇති වීම, සොටු දියර ගැලීම, වියළි කැස්ස, ඇඟපත රුදා ආදිය ඇති වුවහොත් ඒ ජර්මන් සරම්ප හෝ පැපොල ආදි රෝග තත්ත්වයන් නිසා විය හැකියි. කුඩා ළමුන් සම්බන්ධයෙන් නම් මෙහිදී විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත්.

තදබල ලෙස ගැහි උණ ගැනීමට හේතු වන්නේ උණ වලිප්පුවයි. විශේෂයෙන් මාස 6 ත් අවුරුදු 6 ත් අතර වයසැති දරුවන්ට මෙය වැළඳීමේ වැඩි ප්‍රවණතාවයක් තිබෙනවා.

මීට අමතරව ක්ෂය රෝගය, කණේ ආසාදන, කම්මුල්ගාය, මොළේ උණ (ජැපනීස් එන්සෙපලයිටීස්) ආදි ආසාදන රෝග තත්ත්වයන්වලදීත් උණ ගැනීම සිදු වෙනවා.

කිසියම් ඖෂධයක් ගැනීමෙන් අනතුරුව උණ ඇති වුවහොත් එය එම ඖෂධයට ශරීරය දක්වන ප්‍රතික්‍රියාව නිසා හට ගන්නක්.

දත් ආශ්‍රිතව මුඛයේ ඇති වන අධික වේදනාවත් සමඟ උණ ඇති වේ නම් ඒ මුඛයේ ඇති වන සැරව ගෙඩි නිසා විය හැකියි.

HIV ආසාදනයේදී උණ ප්‍රධාන රෝග ලක්ෂණයක් වෙනවා.

පූළුල් පරාසයකට අයත් රෝගවලදී වික් සුලබ රෝග ලක්ෂණයක් ලෙසට උණ ඇතිවන බව මෙහිදී අපට පැහැදිලි වනවා. ඒ නිසාම උණ නොසලකා හැරීම කිසිසේත් නොකළ යුත්තක්. එහෙයින් ඉහත සඳහන් කළ සෑම අවස්ථාවකදීම වෛද්‍ය උපදෙස් පැතීම ඔබේ මනා සෞඛ්‍යයට හිතකර වනු ඇත.

සරණාගත බල්ලා...

43 වන පිටුවෙන්

බල්ලා වලිගය වනමින් කෑම කන්නට විය.

"මේ පණිවිඩය අරගෙන සතුරු හමුදා පැත්තට පලයන්. ගිහින් ආපහු වරෙන් මේක උඹේ අණදෙන නිළධාරියාගේ නියෝගය"

බල්ලාව ඉන්දියන් කඳවුර සිටින දිසාවට හැරවූ කපිතාන් බාන් අණ දුන්නේය.

වලිගය වැනූ බල්ලා කඳු අතරින් වැටී ඇති වංගු ගැසුණු පාර දිගේ කඳු අතර වූ පහත මිටියාවත දෙසට පල්ලම් බසින්නට විය.

තම රයිෆලය අතට ගත් කපිතාන් බාන් අහසට වෙඩි තැබීය.

උදෑසන ඇසුණු වෙඩි හඬින් ඉන්දීය පිලේ සෙබළුන් විමතියට පත් විය. සාමාන්‍යයෙන් උදේ පාන්දරම එවැනි දෙයක් වෙන්නේ නැත.

"අපිත් උත්තර දෙමු"

මෙතෙක් උදාසීන හැඟීමෙන් සිටි ලුතිනන් හර්නාම් සිං කෑගැසීය.

දෙපසින්ම පැය භාගයක් පමණ වෙලාවක් වෙඩි හුවමාරු කරගත්තේය. එය සැබැවින්ම කාලය කා දැමීමක් සහ තේරුමක් නැති වැඩක් විය.

"දැන් ඇති... හොඳටම ඇති..." ලුතිනන් සිං අණ කළේය.

"අර බල්ලා ජුන් ජුන් කොහේ ගියාද ?" තම කොණ්ඩය පීරා අහවර කර කණ්ණාඩිය ඉදිරියට ගොස් තමාගේ රුව දෙස බලමින් ලුතිනන් හර්නාම් සිං තමා අසල සිටි බන්ටා සිං ගෙන් ඇසීය.

"කියමනක් තියෙනවනෙ බල්ලන්ට බටර් දිරවන්නෙ නෑ කියල" බන්ටා සිං දාර්ශනිකයෙකු මෙන් පැවසීය.

"මෙන්න ඌ එනවා" ඉදිරිපස මුරවළල්ලේ සිටි සෙබළෙක් කෑගැසීය.

"කවුද ?" ලුතිනන් සිං ඇසීය.

"මොකක්ද උගේ නම.... ජුන් ජුන්" සෙබළා උත්තර දුන්නේය.

"මොකද ඌ කරන්නෙ" ලුතිතන්වරයා නැවතත් ඇසීය.

"අපේ පැත්තට එනවා" තමාගේ දුරදක්නයෙන් බලමින් සෙබළා පැවසීය.

ලුතිනන්වරයා සෙබළාගේ දුරදක්නය උදුරාගත්තේය.

"හරි ඒ ඌ තමයි උගේ බෙල්ලෙ මොකක්ද එල්ලලා තියෙනවා"

"පොඩ්ඩක් ඉන්න ඌ එන්නෙ පකිස්ථාන් කඳවුර තියෙන කන්ද පැත්තෙ ඉඳල.... වල්බල්ලා...."

රයිෆලය අතටගත් ලුතිනන් හර්නාම් සිං ඉලක්කය ගෙන වෙඩි තැබීය. වෙඩි උණ්ඩය බල්ලා ආසන්නයේම වූ කලුගල් පර්වතයක වැදුණි. බල්ලා නැවතුණි.

වෙඩි හඬ ඇසුණු කපිතාන් හිමත් බාන් තම දුරදක්නයෙන් එදෙස බැලීය.

බල්ලා ආපසු හැරී පකිස්ථාන කඳවුර දෙසට දුවන්නට විය.

"නිර්භීත රණවිරුවන් සටනෙදි පළායන්නෙ නෑ. ඉන්දියන් කඳවුරට පලයන් උඹේ රාජකාරිය ඉවර කරපන්" කපිතාන්වරයා බල්ලාට කෑගැසීය.

බල්ලාව බියගැන්වීම සඳහා ඔහු බල්ලා සිටි දෙසට වෙඩි තැබීය.

එවිටම වාගේ ලුතිනන් සිංද වෙඩිතැබීය. බල්ලාගේ ඇඟ අසලින්ම උණ්ඩ හඹා ගියේය. බල්ලා කන් ගසමින් උඩපැන්නේය. කපිතාන් බාන් නැවතත් වෙඩි තැබීය. ඒවා බල්ලා අසල වූ ගල්වල වැදුනි.

එය කපිතාන් වරයා සහ ලුතිනන් වරයා අතර තරගයක් බවට පත් විය.

හොඳටම බය වූ බල්ලා කරකැවෙමින් ඒ මේ අත දුවන්නට විය කපිතාන්වරයා සහ ලුතිනන්වරයා යන දෙදෙනාම උපාරුවෙන් සිනහවෙන්නට විය. බල්ලා ලුතිනන් සිං සිටි පැත්තට දුවගෙන එන්නට විය. බල්ලාට බැන වැදුණු ඔහු තැබූ වෙඩිල්ල බල්ලාගේ කකුලකට වැදුනි. කෑ ගැසූ බල්ලා ආපසු හැරී කපිතාන් බාන් සිටි දෙසට දුවන්නට උත්සාහ ගත්තේය. එහෙත් බල්ලාව බය කිරීමේ අදහසින් ඒ පැත්තෙන් එන වෙඩිවලටත් මුහුණ දීමට ඌට සිදු විය.

"නිර්භීත එකෙක් වෙයන්. තුවාල වුණත් ඒක උඹේ රාජකාරියට බාධාවක් කරගන්න එපා. පලයන්. උඹේ රාජකාරිය ඉවර කරපන්" කපිතාන් බාන් කෑගැසීය.

බල්ලා නැවතත් ලුතිනන් සිං දෙසට හැරුණි. උගේ කකුල කැඩී ඇත. ඌ බිම දිගේ ඇදී ඇදී ඒ දෙසට බඩගාන්නට විය. ලුතිනන්වරයා මෙවර ඉලක්කය හරියටම ගෙන වෙඩි තැබීය. බල්ලා මැරී වැටුණි.

"අසරණයා.... උඹ රාජකාරිය හරියටම කරන්න ගිහින් දිවි දුන්නා උඹ රණවිරුවෙක්" කපිතාන් බාන් සුසුමක් හෙළීය.

"ඌ බල්ලෙක් වගේ මැරුණා" තවමත් උණුසුම් වූ රයිෆලය පිසදමමින් ලුතිනන් සිං හීන් හඬින් පැවසීය.

සෞන්දර්යය...

45 වන පිටුවෙන්

බෞද්ධ සෞන්දර්යයි.

හැඟීම් හා ප්‍රතිභාව අතින් බෞද්ධ කලාව හින්දු කලාවට වඩා වෙනස් බව අපේ සිත්තරුන්ගේ විහාර සිත්තම්වලින් ප්‍රකට වන බව මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් පවසන අතර බෞද්ධ කලාකෘතීන් මගින් යථාර්ථවාදී හැඟීම් මතු කරන අතර එම යථාර්ථවාදී හැඟීම් තුළින් හට ගන්නේ විරාගී කලා රසයකැයි මහාචාර්ය පරණවිතානයෝ පවසති. අනුන්ට හා තමන්ට යන දෙපක්ෂයටම හිංසාවක් නොවන්නා වූ සෞන්දර්ය බෞද්ධ සෞන්දර්යවාදය ලෙස මහාචාර්ය ජෝතිය ධීරසේකර (ධම්මවිහාරී හිමි) ප්‍රකාශ කරයි.

මේ අයුරින් සලකා බලන කල්හී බුදුදහම තුළ සෞන්දර්ය වනාහී අර්ථවත්, ප්‍රතිභාපූර්ණ, ප්‍රඥාව විකසිත කරන්නා වූ ක්‍රියාදාමයක් බව පැහැදිලිය. සෞන්දර්යයෙන් තොර ලෝකය තුළ දුක් විඳින්නා වූ අනුගාමික පිරිසක් බුදුදහම බලාපොරොත්තු නොවන අතර 'ජීවිතය යනු විඳවීමට නොව අර්ථවත්ව විඳින්නක් බව' ප්‍රකට කිරීමට බුදුදහම ක්‍රියා කරයි. 'කරුණාව' මගින් 'හදවත් ඇති', 'ප්‍රඥාව' මගින් 'හිස් ඇති' මිනිසුන් බිහි කිරීමට බුදුදහමට අවශ්‍යය. සෞන්දර්ය යනු හදවතින් අත්විඳි ප්‍රඥාවෙන් දහසක් අරුත් ජනනය කරන්නා වූ අපූර්ව අමූර්ත (abstract) සංකල්පයකි.

පුංචි කතා...

46 වන පිටුවෙන්

එකම වියදමින් උමං දෙකක්

පෝක් සමුද්‍ර සන්ධිය හරහා උමං දුම්රිය මාර්ගයක් තැනීමට උමගක් කැපීමේ අවශ්‍යතාව මතුවිය. එම කාර්යය ඉටුකිරීමේ හැකියාව ඇති සමාගමක් ගැන ලක් රජය සෙවිල්ලෙන් පසුවිය.

දිනක් රජයේ බලධාරියා හමුවට ඉස්කෝප්පයක් කර තබාගත් මිනිසෙක් පැමිණ උමග තනා දිය හැකි බව පැවසීය. පුදුමයට පත් බලධාරියා ඔහුගෙන් ප්‍රශ්න ඇසීමට පටන් ගති.

"මොන සමාගමද තමා නියෝජනය කරන්නෙ?"

"මගෙයි මල්ලිගෙයි සමාගම"

"කොහොමද කාරිය පටන් ගන්න අදහස් කරන්නෙ?"

"මල්ලි එහෙන් හාරා ගෙන එනවා, මං මෙහෙන් හාරාගෙන යනවා. සමුද්‍ර සන්ධිය මැද්දෙදි අපි දෙන්නම හමුවෙනවා."

"හොඳයි, බැරි වෙලාවත් දෙන්නට දෙන්න හමුවුණේ නැත්නම් මොකද කරන්නෙ?"

"එහෙම වුණොත් ඔයාලට වාසියි. එකම මුදලට උමං දෙකක්ම හැදෙනවනෙ"

ජන කවිය හා ගැමි ආහාර සංස්කෘතිය

■ සමන් චන්දන කුමාරසිංහ

ජන කවියා සමාජානුයෝජනයෙහි ලා සිය යුතුකම් කොටස මැනවින් ඉටුකළ නිර්මාණ කරුවෙකි. ඔහු සිය ප්‍රතිභාවෙන් උපරිම ඵල නෙළා ගැනුමට සමාජයේ හැම අනුමුල්ලකටම රිංගා විමර්ශනය කළා පමණක් නොව බහුවිධ අත්දැකීම් මතින්ද පෝෂණය වූ බව පෙනේ.

ජනකවියා ජන සමාජය සමඟ අවියෝජනීය බැඳීමෙන් යුතු පුද්ගල චරිතයක් බැවින් සමාජයේ සකල විධ මානුෂීය තල ස්පර්ශ කිරීමේ මඟහසර උදාකර ගත් බව දැනේ. අපේ රටේ බහු සංස්කෘතික සමාජය තවත් අතකින් ජන කවිය පෝෂණය වීමෙහිලා බලපාන්නට ඇත.

ජන ජීවිතය තුළ ඔහු ලබන සංජානනයන් ප්‍රතිපෝෂණය කිරීමේ භාග්‍යය උදාවන්නට ඇත්තේ බොහෝ විට මේ නන්වැදෑරුම් ගති සිරිත් ජීවිතය හා සංඝට්ටනය වීමෙන් විය හැකිය.

ඇතැම් විට ජීවිතයේ නන් විධ අනුභූතීන් සිය කාව්‍යලංකාරය පිණිස යොදා ගත් ජන කවියා ජන ජීවිතය හා සම්බන්ධ සකල විධ උපභෝග පරිභෝග වස්තූන්ද සිය මාධ්‍ය ඔස්සේ වර්ණිත අපූරුව සිත් පැහැර ගන්නා සුලුය.

ජන ජීවිතය හා බැඳි ආහාර පාන ඇසුරින් ඔහු මතු කළ අදහස් උදහස් භාව ප්‍රහේදනයට පමණක් නොව ඥාන මණ්ඩලයේ නිම් වළලු පුළුල් කිරීමෙහිලා විශාල කාර්යභාරයක් කරන බව දැක්වීම වරදක් නොවේ. ජනකවියේ ආහාර, කෑම බීම, පාන වර්ග වර්ණනා කර ඇති ආකාරය සැබැවින්ම සිංහල ජනී ජනයාගේ ගැමි ආහාර තරමටම ප්‍රණීතය. රසවත්ය. සුවිශේෂීය.

අපේ ගම්වල වැඩිහිටියන් සිංහල අවුරුද්දට රබාන වයද්දී මතුවන ආහාර පාන වල ගුණ අඟුණ බොහෝය.

තෙලෙන් බැද්දත් කොබෙයියා
කිරෙන් බැද්දත් කොබෙයියා
තෙලෙන් බැද්දත් කිරෙන් බැද්දත්
කොහොම බැද්දත් කොබෙයියා

එදා ගොවියා හේනේ, කුඹුරේ, කොරටුවේ වැඩපල කරන විට ඔහුගේ වෙහෙස මහන්සිය මඟ හරිනු වස් ගත සිත ප්‍රබෝධවත් කරනු අටියෙන් ගෙවිලියගේ යුතුකමව පැවතියේ කටට රසට බත උයා පිහා දීමය. මේ පිළිබඳ ජන කවියා මවන චිත්‍රය ඇතැම් විට කුඩා දරුවන්ට ඉවුම් පිහුම් ගැන ලබා දෙන පාඩමක් වැනිය. ජන කවියේ එවැනි රසබර හැඟුම් මතු කළ අවස්ථා බොහොමයකි.

තරිකිට තරිකිට තරිකිට මැල්ලුම්
දිරකිට දිරකිට දිරකිට මැල්ලුම්
තරිකිට මැල්ලුම් දිරකිට මැල්ලුම්
තරිකිට දිරකිට පොල්

ගැමි ජනතාවගේ ප්‍රධාන ආහාර වර්ග දෙකකි. බත් සහ කුරහන් ඒ ආහාර වර්ග දෙක වේ. ගොවියා වී සහ කුරහන් යන බෝග දෙකම කුඹුරු ගොවිතැන්දෙ හේන් ගොවිතැන්දෙ වගා කිරීම සඳහා යොදා ගැනීම සාමාන්‍ය සිරිතය. මේ නිසා ඔහුගේ වී බිස්සත් කුරහන් අටුවත් යල මහ කන්නවල පිරී පවතින බැවින් ආහාර හිඟයක් ඇති නොවීය.

යල් කන්නේ වී පෑලයි මම ඉස්සේ
වීකෙන් අමුණු හතරයි බැන්දේ බිස්සේ
කන්නය බලා නවදැලි හේනට බැස්සේ
කුරහන් අටුව පුරවන්නයි ඒ අස්සේ

ස්වයංපෝෂිත ගැමි ආර්ථිකය තුළ ශ්‍රම විභජනය සිදුවූයේ අත්තමට හෝ කයියට අනුරූපීව බව දැකගත හැකිය. මුදල් හෝ කුලිය මූලික නොවූ මේ සමාජ වපසරිය තුළ මිනිස්කම පෙරදැරිව සියල්ල සිදුවුණි. මේ නිසා කයියට පැමිණෙන ගම්වාසීන්ට මගුලකට වගේ ආහාරපාන පිළියෙල කර දීම මනාව සිදු වුණි.

මගුලට දෙන දේ ලොබ නොකරල්ලා
ඇඹුලට පුසුලුත් සරිකර ගල්ලා
අඟලට කපමින් මාළු කැබැල්ලා
මඟුලට වාගේ කෑම දියල්ලා

ගැමි ආහාර අතර කිරිබතට ලැබෙන්නේ ප්‍රධාන තැනකි. කිරිබත් සාදන ආකාර කීපයක්ද ගැමි ජනතාව අතර පවතී. ඉඹුල් කිරිබත්, මුරුතන් බත්, මුං ඇට කිරිබත් ඒ අතර කැපී පෙනේ.

යාළු මිතුරු නෑයිනි සැම අසන්නේ
පාළු ඇල පැලෙහි විමසා බලන්නේ
සාළු අඳින කිරි අඟනෝ නෙළන්නේ
මාළු නැති බතක් මද්දහනට දෙන්නේ

ලබු කිරිබත්ද ඇඹුලට දුන් බව ජන කවියේ සඳහන් වන්නේ මේ ආකාරයටය. එදා ගැමි ජනතාව මද්දහනට ලබු කිරිබත්ද අනුභව කළ බව මින් ගම්‍ය වේ.

ගැමි ජනතාව කැකුළු හාලේ බතට මහත් ප්‍රියතාවක් දැක්වූ බව කියවේ. එසේම කැකුළු හාලේ බත පෝෂ්‍යදායී මෙන්ම ගුණදායී ඖෂධීය ආහාරයකි. කැකුළු බත ලොකු කුඩා මහලු, තරුණ ඕනෑම වයසකට එක සේ ගැළපේ. එසේම කැකුළු බත යහමින් අනුභව කිරීමටද හැකියාව ලැබේ. කැකුළු බතටම ආවේණික රසමසවුළුද වෙන් වෙන්ව පිසීමට ගැමියා රුසියෙකි.

දුකක් නොවම මාගම් පුරයට පැමිණ
සැපක් නොවම දෙබරා වැවට පැමිනුණ
බතක් කැකුළු හාලින් වෙඬරුද ලැබුණ
කටක් හිස් මුදුනෙනුත් ඇත්නම් සිතුණ

මඤ්ඤොක්කා මාළුවට කරවල බැදුම සහිතව කැකුළු බත පිසින කල ඇතිවන ආහාර ගැනීමේ රුචිය අපරිමිතය. කොයි කාගේත් රසවත්ම කෑම වේල අතර යට කී ආහාරයට ලැබෙන්නේ ප්‍රමුඛස්ථානයකි. රතු කැකුළු බත සමඟ මී කිරිද ගිතෙල්ද මුසුකර අනුභව කිරීම ඇතැම් පළාත්වල පවතින සිරිතකි.

අද්දර පැලේ මම වැස්සට සිටින කල
ආවා ගොවිරාළ මුලකුත් ගෙන එකල
මොනවද කියා මම ලිහලා බැලුව කල
කැකුලෙන් බතුයි මාලුව මඤ්ඤොක්කා අල

අනායාසයෙන්ම ගැමි මුවින් ගිලිහුණු මේ ජන කවිය සිංහල හාලේ බත මොනතරම් රසවත්දැයි මතු කෙරෙන අපූරුව සහෘද සහනුභූතියක් බවට කවියා පත් කර ගෙන ඇත්තේ ස්වභාවික ගුණය මතු කරලමිනි. ජන කවියාගේ දිවි පෙවෙත සරල බව සැබෑය. ඔහු මතු කරන රසයද සරල සුගම බව අමුතුවෙන් පැවසිය යුතුද නැත. එනමුත් එක් කරුණක් පැහැදිලිය. එනම් අව්‍යාජ ගැමි ජීවන දර්ශනය ගැමි කවියෙන් වහනය වීම අතිශය ප්‍රතිභා පූර්ණය.

ආදරවන්තයන් වෙනුවෙන් පිළියෙල වූ බතක් ගැනද ජනකවියාගේ නිර්මාණාත්මක ඇසට හසු වී තිබේ. එනම් ඇල් හාලේ බතට පිළියෙල වන ලූලා මාළුව බව හේ කවියෙන් වනා ඇත. නෑනා මස්සිනාට ආදර සංග්‍රහ කළ අයුරු හෙළි වන ආහාර වේලක් ලෙස මෙය දැක්වීම යුක්ති යුක්තය.

ඇල් හාලේ බත් පිසුවයි කියාපන්
ලූල් මාළු හොදි පිසුවයි කියාපන්
මාළු නැතිව බත් නොක තෙයි කියාපන්
රෑට බතට මම එන බව කියාපන්

හීන් හාලේ බතද තණ හාලේ බතද පිසූ කල ඉතා රසවත්ය. ලූල් මාළුව රට එක්කල පසු දැනෙනා රස පැවසීමට භාෂාවේ වදන් මදිය. මෙයට අමතරව ඉරිඟු බතක් ගැනද ජනකවියෙන් මතුවේ. ඉරිඟු බත සමඟ වටු මස් පිළියෙල කර ගැනීමට ගැමියා පුරුදු වී සිටියේය. ඕලු හාලේ බත ගැන කියවෙනා ජන කවියක්ද ජන සාහිත්‍යයෙන් මතු වේ. ඕලු ඇටවලින් පිසූ බතට මාළු පිණියක් එක් කරගෙන නැති බව කියවෙනා ජන කවියක්ද හමු විය.

සොර බොර වැවේ සොඳි සොඳි ඕලු ඇති
ඒවා නෙළන්නට හොඳ හොඳ ලියෝ ඇති
එළි කරලා සුදු කරලා උයා දෙති
ඕලු හාලෙ බත් කෑමට මාළු නැති

මෙවන් සශ්‍රීකත්වයකින් පිරි ගැමි සමාජයේ ආර්ථිකය, සදාචාරය, සරල බව කාබාසිනියා කර දැමූ යුගයක් විය. ඒ 1815 න් පසුව පිටරටවල්වලින් හාල් ගේන්නට සිදු වූ කාලයේ සිටය. එවිට ජනකවිය අපේ ගැමි ජනතාවගේ සෝසුම විදාරණය කිරීමට යොමු විය.

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදාද මව්පියො දකින්නට

භෞතික නොවන සංස්කෘතික මූලාශ්‍රයන්ගෙන් ප්‍රභාස්වර වූ ජන කවියේ මතුවෙන සමාජ දර්ශනයේ එක් පැතිකඩක් ලෙස ආහාර සංස්කෘතිය දැක්විය හැකිය. ඉන් බිඳක් මිස ස්වල්පයක් වත් මෙවන් වදන් අනුරකින් දැක්වීම උගහටය. එහෙත් මේ පද්‍ය කීපය හරහා වුවද වින්දනීය චින්තනය මෙහෙයවන කළ පසක් වන එක් කාරණයක් වන්නේ ජන කවියා දිවි සරිකර ගන්නා කළ අල්පේච්ඡ වුවද දිවි නැණ හමුවේ බහුශ්‍රැතයකු බවය.

ඔබගේ සියලුම සංචාරක කටයුතු සඳහා

VMS TRAVELS AND TOURS හි

රාජ් අමතන්න

416 567 5104

VMS TRAVELS & TOURS INC.

3351, Markham Road, Unit 137A, Toronto Ont, M1X 0A6

416 293 5800 | 1 888 655 5575 www.flytrips.ca

48 A , Dr. Lester James Peries Mawatha (Dickmans Road) Colombo 5

94 11 250 21 98

info@vmstravels.ca | www.flytrips.ca

BEYOND YOUR EXPECTATIONS !

Residential & Commercial Real Estate

BUY or SELL your HOME with me

For Buyers

I will pay your first months mortgage*

*Limited to $300.00 for Each $100,000 Mortgage

For Sellers

My commission for your listing will be 0% when you Sell & buy a home with me.**

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.

5% DOWN ? No problem!

I will guide you through obtaining your DREAM HOME through my proven system!

RE/MAX 100% Club Award — 2016, 2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award — 2015, 2012

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

The Diamond Realty Inc Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

RE/MAX HALL OF FAME

With me as your agent, your dreams of finding the perfect home can be made a reality!

New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?

Call me Today !

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

Gamini Abeysinghe. ABR, CNE

Real Estate Sales Representative

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

Toll Free: 1-800 611 2882 Ext 102

Mobile : 416 822 2789

www.gaminiabeysinghe.com

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements

ඔබ සැමට

සාමය, සතුට, සෞභාග්‍යය, නිරෝග සුව පිරි

සුභ නව වසරක් වේවා....!

2018

HAPPY NEW YEAR

A sincere THANK YOU to all my Clients and Friends
who have made another year SUCCESSFUL for me.

The Diamond Realty Inc Brokerage

Gamini Abeysinghe. ABR, CNE

Real Estate Sales Representative

RE/MAX Hall of Fame

දිසත Dasatha

RE/MAX 100% Club Award

RE/MAX Platinum Club Award

KATPAKAM GROCERY

SALES START FROM DEC 15 - JAN 15 2018

CHRISTMAS NEW YEAR AND 7TH ANNIVERSARY SALE

MASOOR DHAL 8Lb - $ 4.99
URID DHAL - 8Lb - $ 9.99
URID DHAL - 4Lb - $ 4.99

PAPADAM 2 FOR $ 1.00
MALDIV CHIP - $ 5.99
SESAME OIL 1L - $ 4.99
GREEN JACK TIN 2 FOR - $ 3.00

MD CORDIAL 2 FOR - $ 10.00
CONDENSED MILK - $ 1.99
JAM - $ 1.99
NESTOMALT - $ 4.99

FROZEN COCONUT - $ 2.99
FROZ ROTI 30PC - $ 7.99

TUSK BASMATI RICE - $ 5.99
URITHIRA RED RAW RICE 8Lb - $ 6.99

EASTERN - DOSA PODI, PUTTU PODI,
IDLY PODI, IDIYAPPAM PODI, APPAM PODI
BUY TWO GET ONE FREE

MORE SPECIALS IN THE STORE

THANK YOU FOR A SUCCESSFUL SIX YEARS OF BUSINESS!

We wish you Merry Christmas & Happy New Year!

6970 Lisgar Drive, Unit B1, Mississauga, L5N 8C8
Derry/ 9th Line(Behind 7 Eleven Gas Station)

TEL: 905 785 0444